# ඥප්ති

## ශාස්ත්‍රීය සඟරාව 2022

පළමු වෙළුම - පළමු කලාපය



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

කොළඹ 07

# භූපති

## ශාස්ත්‍රීය සඟරාව

### පළමු වෙළුම - පළමු කලාපය

2022

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

කොළඹ 07

# භූපති
## ශාස්ත්‍රීය සඟරාව

### පළමු වෙළුම - පළමු කලාපය
### 2022


**ප්‍රධාන සංස්කාරක**

මහාචාර්ය අනුර මනතුංග

**උපදේශක සංස්කාරක මණ්ඩලය**

මහාචාර්ය නිමල් ද සිල්වා

ආචාර්ය මාලනී ඩයස්

ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ

ආචාර්ය සෙනරත් දිසානායක

මහාචාර්ය ඇලෙක්සැන්ඩර් කපුකොටුව

**සංස්කාරක මණ්ඩලය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කල්‍යාණි විජේසුන්දර

වාස්තු විද්‍යාඥ දීපාල් විජේතිලක

ඒ.එම්.ඒ. දිල්හානි දිල්රුක්ෂිකා



**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

**කොළඹ 07**

# භූපති ශාස්ත්‍රීය සඟරාව

**පළමු වෙළුම - පළමු කලාපය 2022**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07**

**© පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

**ISSN - 2950 6514**

**මෙහි ඇතුලත් ලිපිවල සහ එම ලිපිවලින් ඉදිරිපත් කර ඇති අදහස් සහ මතවාද පිළිබඳ**
**අයිතිය සහ වගකීම ඒ ඒ ලේඛකයා සතුවන අතර,**
**ඒ පිළිබඳ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වගකීමක් දරනු නොලැබේ.**

**ප්‍රකාශනය**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**පිටු සැකසුම**

මධූකා නෙරංජලී සඳමාලි

**කංචුක නිර්මාණය**

අර්ජුන ශ්‍රී සම්පත් සමරවීර

## සංස්කාරක සටහන

පුරාවිද්‍යා උරුමය යනු ශ්‍රී ලාංකේය ජන සමාජයේ අයිතියකි. එවන් උරුමය පිළිබඳ විශේෂ අවධානයක් දක්වන උරුම ලෝලීන්ගේ සහ වැඩිදුර අධ්‍යයනයන්හි නියැළෙන පර්යේෂකයන්ගේ ශාස්ත්‍රීය අවශ්‍යතා සඳහාත්, දැයේ උරුමයේ වගකීම උදෙසා අනාගත පරපුර කෙරෙහි උරුමය පිළිබඳ සවිඥාණික දෘෂ්ටිය උත්ප්‍රේරණය කිරීම සඳහාත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අලුතින් ආරම්භ කළ ශාස්ත්‍රීය සඟරාව 'භූපති' සඟරාව යි. මෙමඟින් ඉතිහාසය සහ පුරාවිද්‍යාව සම්බන්ධයෙන් කුතුහලයෙන් යුක්ත ආශාව අවදි කිරීම, දැනුම බෙදා හැරීම සහ දැනුම ප්‍රසිද්ධ කිරීමේ අරමුණින් විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ පුරාවිද්‍යාව පිළිබඳ ආකර්ෂණීය විද්වතුන් විසින් සිදුකරන ලද පර්යේෂණ අනාවරණ ප්‍රකාශයට පත් කිරීම මාර්ගගත ක්‍රමයට (online) සිදු කෙරේ.

ඉතිහාසය හා පුරාවිද්‍යාවේ නන්විධ ක්ෂේත්‍ර අධ්‍යයනය කරමින් ක්ෂේත්‍රයේ ප්‍රාමාණික විද්වතුන් විසින් සම්පාදනය කරන ලද ශාස්ත්‍රීය ලිපි මෙහි අන්තර්ගත වේ. අධ්‍යයනයන්ගේ නව මානයන් කරා ගවේෂකයන් යොමු කරවීමේ විශිෂ්ට පරමාර්ථයෙන් යුතු ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙසේ කැප වී කටයුතු කිරීම නව දැනුම සම්ප්‍රේෂණය කිරීමේ අනර්ඝ මාවතකි.

මෙහි දී පර්යේෂණ පත්‍රිකා පිළිබඳ තත්ත්ව සමීක්ෂණයක යෙදෙමින් ඒවා අධීක්ෂණය කර දෙමින් ශාස්ත්‍රීය වටිනාකම තීව්‍ර කරගැනීම උදෙසා මහාර්ඝ මෙහෙයක් කළ උපදේශක මණ්ඩලය කෘතවේදී හදවතින් සමරමු. අපගේ ආරාධනය පරිදි පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ විවිධ පර්යේෂණ ප්‍රතිඵල අන්තර්ගත කරමින් වටිනා ශාස්ත්‍රීය ලිපි සම්පාදනය කළ විද්වතුන් සියලු දෙනාට ද අපගේ ගෞරවය සහ කෘතඥතාව හිමි වේ. අවසාන වශයෙන් භූපති සඟරාවෙහි මංගල කලාපය සම්පාදනයෙහි ලා නන් අයුරින් සහය දුන් සැමට තුති පුද කරමු.

සංස්කාරක මණ්ඩලය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| **1.** | **පුරාවිද්‍යාත්මක ඡායාරූපකරණ පිළිබඳ මූලික හැඳින්වීමක්**<br>අමිල බණ්ඩාරනායක | 01 |
| **2.** | **ප්‍රාග් ඓතිහාසික කාන්තාවගේ භූමිකාව**<br>එච්. එම්. සමන් කුමාර ඇරැඟම | 09 |
| **3.** | **සීගිරි කුරුටු ගීයෙන් හෙළිවන සමකාලීන කාන්තාව හා සමාජය**<br>එම්.පී. අංජන ලක්ෂාන් චතුරංග | 29 |
| 4. | **ශ්‍රී ලංකාවේ ධාතු කරඬු ලිපි පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්**<br>පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි<br>රුසිරි කසුන් නානායක්කාර | 37 |
| **5.** | **ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ අභිචාර හා සුසාන චාරිත්‍ර**<br>කේ. ඒ. තුෂාරා අයිරාංගනී | 58 |
| **6.** | **ආදි මානව සිතුවම් නිර්මාණයේ දී උපයුක්ත කරගත් ජීවන අනුභූතීන් සහ මනෝ සංකල්ප හඳුනාගැනීම (රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරින්)**<br>කේ. උදේනි අරුණසිරි | 70 |
| **7.** | **ඌවේ කාර්මික උරුමය**<br>ආචාර්ය කුසුම්සිරි කොඩිතුවක්කු | 84 |
| **8.** | **ශ්‍රී ලාංකේය බිතුසිතුවම් හා බදාම නිර්මාණ තාක්ෂණයේ බන්ධන මාධ්‍යය භාවිතය**<br>ජනනි නාමල් සෙනෙවිරත්න | 98 |
| **9.** | **දියබැටේ කන්දෙන් හමුවන තබ්බෝව - මරදන්මඩුව ටෙරාකොටා සංස්කෘතික සාධක**<br>ජනක මහේෂ් අතපත්තු<br>සනිඳු දේවින්ද | 107 |
| **10.** | **පැරණි වාරි නිර්මාණ ආශ්‍රිත පාෂාණවල දක්නට ලැබෙන සංකේත මඟින් හෙළිවන සමාජ පුරාවිද්‍යාත්මක පසුබිම**<br>පුරාවිද්‍යාඥ මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි | 118 |
| 11. | **රන්මසු උයන, උද්‍යාන සංකල්පය, වාරි තාක්ෂණය හා කලා ශිල්ප**<br>ඩබ්.එම්. ඉරේෂා ශ්‍යාමලී වන්නිනායක | 131 |
| **12.** | **කොක්එබෙ මෙගලිතික සුසානය ආශ්‍රිත නව සොයා ගැනීම් හා තදාශ්‍රිත ප්‍රදේශයේ මානව ජනාවාසකරණය**<br>මහාචාර්ය ඩී. තුසිත මැන්දිස් | 142 |
| **13.** | **ශ්‍රී ලංකාවේ ස්තූප සංරක්ෂණ ඉතිහාසය**<br>වාස්තු විද්‍යාඥ දීපාල් විජේතිලක | 151 |
| **14.** | **වෘෂභ කුඤ්ජරය**<br>නලින් විශ්වනාත් | 164 |

# පුරාවිද්‍යාත්මක ඡායාරූපකරණ පිළිබඳ මූලික හැඳින්වීමක්

අමිල බණ්ඩාරනායක[1]

අතීතය පිළිබඳ සොයන්නෝ නිරන්තරයෙන් ම ඒ පිළිබඳ කුකුසකින් යුතු ව සිතමින් කටයුතු කරති. අතීතය පිළිබඳ පැහැදිලි අදහසක් ඔවුන් තුළ නොමැති වීම ඊට හේතු විය හැකි ය. ඉතිහාසය සහ පුරාවිද්‍යාව යන ශික්ෂණීය විෂයන් අතීතය පිළිබඳ ව පැන නැගී ඇති කුතුහලයට පිළිතුරු සෙවීමට ශික්ෂණීය වර්ධනයක් ලබා ඇති බව පැහැදිලි ය. සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ අතීතය පිළිබඳ ව සොයා බලන විෂය, ඉතිහාසය ලෙස සරලව ම හඳුනාගත හැකි ය. අතීත මානව චර්යාව අර්ථ නිරූපණය කළ හැකි ද්‍රව්‍යාත්මක අවශේෂ ඔස්සේ අතීතය පිළිබඳ විද්‍යානුකූල ව හැදෑරීම පුරාවිද්‍යාවයි. 'පුරාවිද්‍යාව එක් අතකින් අතීතයට අයත් වස්තූන් සොයා බලා ඒවා හෙළිපෙහෙළි කිරීමක් සේ පෙනේ. තවත් අතකින් එය සුපරික්ෂාකාරී විද්‍යාත්මක විශ්ලේෂණයකි. තවත් අතකින් එය දිස්වන්නේ නිර්මාණාත්මක කල්පිතයක් ලෙසිනි (Renfrew and Bahn 2016:13; සෝමදේව 2000:01). මෙම නිර්වචනයට අනුව අතීතයට අයත් වස්තූන් සොයා බලා ඒවා හෙළිපෙහෙළි කිරීමත්, එකී වස්තූන් විශ්ලේෂණය කිරීමත් පුරාවිද්‍යාවේ දී සිදු වේ. මෙම කාර්යයන් සඳහා පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුත් ද්‍රව්‍යාත්මක සාධක හෙවත් ද්‍රව්‍යාත්මක සංස්කෘතිය නිසි පරිදි වාර්තාකරණය අතිශය වැදගත් ය.

මානව කෘති ස්වාභාවික කෘති, පුරාවිද්‍යාත්මක අංග, පුරාවිද්‍යාත්මක ව්‍යූහ සහ සංස්කෘතික භූ දර්ශනය පුරාවිද්‍යාත්මක දත්ත වාර්තාවකට අයත් විය හැකි ය (Renfrew and Bahn 2016:50; Gamble 2007:45). ඒවා කිහිපයක් හෝ සියල්ල ම ඍජුව ම සිදුකරන පුරාවිද්‍යා ව්‍යාපෘතිය සමඟ සම්බන්ධතා පවත්වන දත්ත බවට පත් වේ. මෙම ද්‍රව්‍යාත්මක සංස්කෘතිය තමා ස්වයං අර්ථදක්වීම් ඉදිරිපත් නොකරන හෙයින් ඒවා විධිමත් පරිදි විශ්ලේෂණය කොට අර්ථකථන සඳහා යොමුවීම පුරාවිද්‍යාඥයාගේ කාර්යභාරයකි. පුරාවිද්‍යාත්මක දත්ත තනිව පැවැතීම අර්ථයක් නොමැති ක්‍රියාවක් සේ ම එම දත්ත තම වැදගත්කම ලබා දෙන්නේ ඉහත කී අර්ථ නිරූපණවල දී ය. එහෙයින් දත්ත සමඟ සිදුකරන්නා වූ විශ්ලේෂණ අර්ථාන්විත වීම අතිශය වැදගත් ය.

මෙලෙස ද්‍රව්‍යාත්මක සංස්කෘතිය අත්පත්කර ගැනීම (පුරාවිද්‍යාව සම්බන්ධ ක්ෂේත්‍ර කටයුතු) සහ විශ්ලේෂණයේ දී පුරාවිද්‍යාඥයා ඒවා වාර්තාගත කිරීම සඳහා විවිධ ක්‍රම භාවිතයට ගනී. විශේෂයෙන් ම පුරාවිද්‍යා කැණීමක දී නිසි වාර්තාකරණ ක්‍රමවේද භාවිත කළ යුතුවන අතර, ඒවා පිළිබඳ නිසි වගකීමකින් යුතු ව ක්‍රියා කළ යුතු ය. පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ දී පුරාවිද්‍යාඥයන් විසින් සිදුකරනු ලබන වාර්තාකරණයට සටහන් තබා ගැනීම, සැලසුම් සකස් කිරීම, සිතියම් සැකසීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම, ඡායාරූප ලබා ගැනීම, චිත්‍රණය, වීඩියෝගත කිරීම, හඬ පටිගත කිරීම ආදී නොයෙකුත් ක්‍රම ඇතුළත් වේ. පුරාවිද්‍යාඥයන් වෙත ඔවුන් විසින් ක්ෂේත්‍රයේ දී සිදු කරනු ලබන කාර්යයන් උසස්

[1] *අභ්‍යාසලාභී උපාධිධාරී (පුහුණු),*
*සමුද්‍ර කෞතුකාගාරය,*
*කෞතුකාගාර දෙපාර්තමේන්තුව.*
amilabandaranayake09@gmail.com

සහ නිවැරදි අයුරින් වාර්තාගත කිරීමට සදාචාරාත්මක වගකීමක් ඇති (Burke and Smith 2004:264) හෙයින් මෙම වාර්තාකරණය නිසි පරිදි සිදු කිරීම අවශ්‍ය ම කාර්යයකි. නමුත් අප දැන ගත යුතු කරුණක් වන්නේ පුරාවිද්‍යා පර්යේෂණය සම්පූර්ණ සහ නිවැරදි ලෙස වාර්තාගත කිරීම පමණක් පුරාවිද්‍යාත්මක විශ්ලේෂණයක් ලෙස හඳුන්වනු නො ලැබෙන බව ය (Shafer 2009:159). පුරාවිද්‍යා පර්යේෂණයක දී ඡායාරූපකරණය යනු එම පර්යේෂණය පිළිබඳ වාර්තා කිරීමේ මෙවලමක් වශයෙන් සැලකීම වැදගත් ය.

## ඡායාරූපයක් යනු කුමක්දැයි හඳුනා ගැනීම

ඡායාරූපය යන වචනය 1839 වසරේ දී ශ්‍රීමත් ජෝන් හර්ෂල් විසින් නිර්මාණය කරන ලද පදයකි (https://www.etymonline.com). ඉංග්‍රීසි භාෂාවේ photograph යන වචනය සිංහල භාෂාවේ ඡායාරූපය ලෙස අපි හඳුනා ගනිමු. photograph යන වචනය ග්‍රීක භාෂාවෙන් බිඳී ආ පදයකි. ග්‍රීක භාෂාවේ 'ෆොස්' සහ 'ග්‍රැෆේ' යන පද දෙකේ එකතුව ඉංග්‍රීසි භාෂාවේ photograph ලෙස හැඳින්විය. ග්‍රීක භාෂාවේ 'ෆොස්' යන වචනයේ අර්ථය ආලෝකය යන්නයි. 'ග්‍රැෆේ' යන්නෙහි අර්ථය ඇඳීම යන්නයි (Ibid). ඒ අනුව ඡායාරූපය යන්නෙහි සරල අදහස ආලෝකයෙන් ඇඳීම හෙවත් ආලෝකය භාවිතයෙන් යමක් ඇඳීම (Ibid) යන්නයි. කැමරාව භාවිතයෙන් නිපදවනු ලැබූ පින්තූරය (https://dictionary.cambridge.org) ඡායාරූපයක් ලෙස තව දුරටත් හඳුන්වා දී ඇත. ආලෝකය හෝ වෙනත් විකිරණ ශක්තියක ක්‍රියාකාරිත්වය මගින් නිපදවන රසායනික විපරියාසයන් යොදා ගනිමින් සිදුකරනු ලබන රූප නිපදවීමේ කලාව (https://www.etymonline.com) ඡායාරූපයක් ලෙස තවත් හඳුන්වාදීමකි.

ආලෝක සංවේදී පෘෂ්ඨයක් මත පතනය වන ආලෝකය මගින් සත්‍යයේ මායාව ද්විමාන තලයක ප්‍රතිබිම්බනය කිරීම ඡායාරූපයකින් සිදු වේ (බණ්ඩාරනායක 2018:75-76). එය තව දුරටත් විස්තරාත්මක ව දක්වන්නේ නම් ඡායාරූපකරණය යනු කැමරාවක් භාවිත කොට ආලෝක සංවේදී පටලයක් මත රූපයක් නිර්මාණය කිරීම සඳහා ආලෝකය අල්ලා ගැනීමේ කලාව වේ (https://photographylife.com/what-is-photography). ආලෝකය යන්න මෙහි දී අප සැලකිය යුතු එක් ප්‍රබලත ම කරුණකි. ඡායාරූපකරණයේ දී වැදගත්වන 'ආලෝකය' නම් ලක්ෂණය නොමැති නම් ඡායාරූපයක් ද නොමැති බව අප තරයේ මතක තබා ගත යුතු ය.

## පුරාවිද්‍යාත්මක ඡායාරූපකරණය

පුරාවිද්‍යාත්මක ප්‍රවේශයකින් යුත් ඕනෑ ම විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතියක 'ඡායාරූප' ලබා ගැනීම තුළින් තොරතුරු වාර්තාකරණය' යන්න ප්‍රමුඛ කාර්යයක් බවට පත් ව තිබේ. නමුත් පුරාවිද්‍යාව විෂයීය ශික්ෂණයක් වශයෙන් ආරම්භ වීමට පෙරාතුව සිට, "ඡායාරූපය" යන විෂය ක්ෂේත්‍රය, අතීතය සොයා යන්නන්ට බෙහෙවින් වැදගත් විය. පුරාවිද්‍යාත්මක ඡායාරූපකරණය දහනමවන දශකයේ මැද භාගයේ සිට පුරාවිද්‍යාත්මක ස්ථාන සහ මානව කෘති වාර්තා කිරීම සඳහා

යොදාගත් ප්‍රමුඛ වාර්තා කරන මාධ්‍යයකි. එය සෑම ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයෙකු ම ප්‍රාථමික අවශ්‍යතාවක් සහ අනුසංගික අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස භාවිතයට ගනී (Laidlaw 2017:01).

පුරාවිද්‍යා පර්යේෂණ උදෙසා සිදු කරන වාර්තාගත කිරීමේ ක්‍රමවේදයක් ලෙසත්, එලෙස රැස්කරගත් තොරතුරු දත්ත බවට පත් කළ හැකි ප්‍රබල මාධ්‍යයක් ලෙසත්, පර්යේෂණ වාර්තා පරිහරණය කරන අය (පශ්චාත් පර්යේෂණ හා මහජනතාව) උදෙසා විශ්වාසවන්ත සත්‍යයේ පිටපත පිළිබිඹු කිරීමට සමත් මාධ්‍යයක් ලෙසත් පුරාවිද්‍යාව තුළ ඡායාරූපකරණයට වැදගත් තැනක් හිමි ව තිබේ. ඊට අමතර ව ද්‍රව්‍යාත්මක අවශේෂවල දෘශ්‍යරූපීතාව ඒ අයුරින් ම දිගු කලක් පවත්වාගෙන යාමට හැකි සරල හා කාර්යක්ෂම මාධ්‍යයක් ලෙස ද ඡායාරූපය හඳුනාගත හැකි ය (බණ්ඩාරනායක 2018 :75-91).

පුරාවිද්‍යාත්මක සන්දර්භයක් තුළ දී ලබා ගත් ඡායාරූප සාමාන්‍යයෙන් රූපමය වාතාවරණයක් හෝ ලේඛනගත සාක්ෂිකරුවන් ලෙස කටයුතු කරයි (Shanks 1992:145). සාක්ෂිකරුවා පවසන්නේ 'මම එහි සිටියෙමි' යන්න වුව ද ඡායාරූපය පවසන්නේ බලන්න සහ දකින්න ( Shanks 1992:145) ලෙස ය.

## පුරාවිද්‍යා ඡායාරූපකරණයේ අවශ්‍යතාව

i. පුරාවිද්‍යා ක්ෂේත්‍රයක් හෝ මානව කෘතියක් වාර්තාගත කිරීම
ii. පුරාවිද්‍යා කැණීමක් හෝ ගවේෂණයක් ලේඛනගත කිරීම
iii. ක්ෂේත්‍රයේ පවතින තත්ත්වය වාර්තාගත කිරීම
iv. වාර්තාවක දක්වා ඇති තාක්ෂණික දත්ත නිදර්ශනය කිරීම
v. මහජනතාවගේ දැනුවත්භාවය උදෙසා පුරා ක්ෂේත්‍රය පිළිබඳ අර්ථ නිරූපණ ගෙනදීම (Burke and Smith 2004:264) ලෙස බෙදා දැක්විය හැකි ය.

Harry J. Shafer (2009) පහත පරිදි පුරාවිද්‍යාත්මක ඡායාරූපකරණය වඩා විධිමත් වර්ගීකරණයකට යොමු කරයි.

### i. වාර්තාමය පුරාවිද්‍යා ඡායාරූපකරණය

පුරාවිද්‍යා විමර්ශනයේ ආරම්භයේ සිට අවසානය දක්වා සවිස්තරාත්මක සහ නිවැරදි රූපමය වාර්තාගත කිරීමක් වෙනුවෙන් ඡායාරූප ප්‍රලේඛනය සිදු කිරීම මෙහි අර්ථය වේ.

### ii. නිදර්ශනමය පුරාවිද්‍යා ඡායාරූපකරණය

පුරාවිද්‍යා විමර්ශනයේ වාර්තා සහ ප්‍රකාශනය වෙනුවෙන් ඡායාරූප නිදර්ශන ඉදිරිපත් කිරීම මෙහි දී සිදු වේ (Shafer 2009).

මෙකී අදහස් දැක්වීම තුළ හැඟී යන්නේ පුරාවිද්‍යා ඡායාරූපකරණය යනු, අතීතයට අයත් මානව කෘති වර්තමානයේ දී අනාවරණය කර ගැනීමේ ක්‍රියාකාරකම් සහ එසේ අනාවරණය කර ගන්නා ලද මානව කෘති අත්පත්කර ගැනීමේ වාර්තාමය අංගයක් ලෙස ය.

## පුරාවිද්‍යා ඡායාරූපකරණයේ වස්තු විෂය

ස්තූප, ගොඩනැගිලි, අභිලේඛන, පබළු, ශිලා මෙවලම්, මැටි බඳුන්, සිතුවම්, පාංශු පැතිකඩ, නිවාස, ඓතිහාසික භූ දර්ශන, කාර්මික පුරාවිද්‍යා අවශේෂ, සත්ව සහ මානව අවශේෂ සහ ශාක අවශේෂ මෙන් ම ක්ෂේත්‍ර පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයන් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්, පරීක්ෂණ උපකරණ ආදී නොයෙකුත් දෑ පුරාවිද්‍යා ඡායාරූපයකට වස්තු විෂය විය හැකි ය.

මෙසේ දැක්වූව ද පුරාවිද්‍යාත්මක ඡායාරූපයකට හසු වන්නේ කුමක් ද? නැතහොත් පුරාවිද්‍යා ඡායාරූපකරණයට විෂය වන්නේ කුමක් ද? යන්න යමෙකු ඔබගෙන් ප්‍රශ්න කළ හැකි ය. ඒ සඳහා දිය හැකි පිළිතුර වන්නේ, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත දෑ පුරාවිද්‍යා ඡායාරූපකරණයට ලක් වේය යන්න යි. නමුත් මෙහි අදහස පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත සියල්ල ම ඡායාරූපකරණයට හසු විය යුතු ය යන්න ම නොවේ. පුරාවිද්‍යා පරීක්ෂණයේ අරමුණු මත මෙය තීරණය වේ යැයි පැවසීම වඩා සුදුසු ය.

උදාඃ-

1. කැණීමක් සිදු කරන ආකාරය ඡායාරූපකරණයට ලක් කළ යුතු වුව ද එහි පස් ඉවත් කිරීම හෝ පස් හැලීම සිදු කරන ආකාරය ඡායාරූපකරණයට ලක් කිරීම ඵල රහිත ය.
2. කැණීමකින් හමුවන ශිලා මෙවලම් පුරාවිද්‍යා මූලාශය වේ. ඒ සියලු ම ශිලා මෙවලම් අපට එකින් එක ඡායාරූපයට හසුකර ගැනීමේ අවශ්‍යතාවක් නොමැත. එම ශිලා මෙවලම් තුළින් හඳුනා ගන්නා විශේෂිත ශිලා මෙවලම් ඡායාරූපකරණයට ලක් කළ යුතු ය.

ඡායාරූපකරණයට ලක් විය යුත්තේ කුමක් ද යන්න ඡායාරූප ශිල්පියා අවධානයෙන් යුතුව බැලිය යුත්තක් බව ඉහත නිදර්ශන ඔස්සේ පැහැදිලි වේ. පුරාවිද්‍යා වාර්තාකරණයට අයිතිවන මානව කෘති, ස්වභාව කෘති, අංග, ව්‍යුහ, භූ දර්ශනය ආදිය ඡායාරූපයට හසු කර ගැනීම සිදුවිය යුත්තේ ඉහත දැක් වූ කරුණුවල අවබෝධය සහිතව ය. සරලව ම පවසන්නේ නම්, ඡායාරූපය ලබා ගැනීමේ අවබෝධය සහ ඡායාරූපයෙන් පිළිබිඹු වන පුරාවිද්‍යාත්මක වටිනාකම හඳුනාගත හැකි ඡායාරූප නිවැරදි වස්තු විෂයක් ග්‍රහණය කරගත් ඡායාරූපයක් වේ.

## ආධුනික පුරාවිද්‍යා ඡායාරූප ශිල්පියෙකුට උපදෙස් කිහිපයක්

ක්ෂේත්‍ර පුරාවිද්‍යා ඡායාරූපකරණයේ මූලික අංග තුනක් ආධුනික පුරාවිද්‍යා ඡායාරූප ශිල්පියෙකු අනුගමනය කිරීම වැදගත් බව Heather Burke and Claire Smith (2004) දක්වයි.

1. ඔබ හට ඡායාරූපයක් ගැනීමේ හැකියාවක් ඇති බව තහවුරු කර ගැනීමට අවශ්‍ය ය. එනිසා ඡායාරූපකරණයේ මූලික තාක්ෂණික අංග ඉගෙන ගන්න. ප්‍රායෝගික ව ඒවා නිතර ම භාවිතයේ යොදවන්න.
2. පුරා ස්ථලයේ හෝ මානව කෘතියේ ප්‍රමාණය කුඩා හෝ විශාලදැයි අවබෝධකර ගැනීම සඳහා පරිමාණයක් සහිත ව ඡායාරූපය ලබා ගන්න.
3. සෑම ඡායාරූපයක ම තොරතුරු ලිඛිත ව සටහන් කර ගන්න (Burke and Smith 2004:265).

පොදුවේ ගත් කල පුරාවිද්‍යාත්මක ඡායාරූපකරණයේ යෙදෙන කැමරා ශිල්පියා සිතිය යුතු අංග කිහිපයක් ඇත. එනම්,

i. ඡායාරූපය ලබා ගැනීමේ අරමුණ කුමක් ද?
ඔබ විසින් ලබා ගැනීමට අරමුණු කරන ලද ඡායාරූපය තුළින් ඔබ ගෙනහැර දැක්වීමට සූදානම් වන්නේ කුමක් ද යන්න මෙමගින් ප්‍රශ්න කර සිටියි.
ii. මෙම ඡායාරූප මඟින් නිදර්ශනය වන්නේ පුරාවිද්‍යා වාර්තාවේ හෝ ශාස්ත්‍රීය ලිපියේ කුමන කරුණ ද?
iii. ඔබට අවධාරණය කිරීමට අවශ්‍ය විශේෂිත ලක්ෂණ හෝ අංග තිබේ ද?
iv. ඔබ ලබා ගත් ඡායාරූපය පසු විශ්ලේෂකයෙකු කියැවීමෙන් ඔබ ඡායාරූපකරණය තුළින් අවධාරණය කිරීමට බලාපොරොත්තු වූ කාරණාව තේරුම් ගැනීමට හැකියාවක් පවතී ද?

ඡායාරූපකරුවෙකු ලෙස නිරන්තරයෙන් ඔබ ලබා ගත් ඡායාරූපය දෙස විවේචනාත්මක ව බැලීමට යොමු වීම හොඳ පුරුද්දකි. එවිට ඔබට නිවැරදි ඡායාරූපයක් කරා ප්‍රවේශ විය හැකි ය. ඡායාරූපයෙන් ඉවතට නොයන්න. එ තුළ ම රැඳී සිටින්න. ඉවසීම ප්‍රගුණ කරන්න. පසුගිය කාලය යළි නොඑන නිසා ඔබ වෙත ලැබී ඇති අවස්ථාව සුදුසු ම අවස්ථාව විය හැකි ය. එනිසා අවශ්‍ය මොහොතේ අවශ්‍ය පරිදි කටයුතු කරන්න.

ඔබ වෙත එක ම ක්ෂේත්‍රයක හෝ මානව කෘතියක ඡායාරූප බොහෝ ප්‍රමාණයක් ලබා ගැනීමට සිදු විය හැකි ය. නමුත් ඒ සියලු ම දේ සිදු වන්නේ වඩාත් සාර්ථක වාර්තාකරණයක් සඳහා මෙන් ම වඩාත් සාර්ථක පුරාවිද්‍යා ඡායාරූප ශිල්පියෙකු බිහිකිරීමට බව මතක තබා ගන්න.

## පුරාවිද්‍යා ඡායාරූපකරණයේ අවස්ථා/ස්ථාන

පුරාවිද්‍යා ඡායාරූප ලබා ගැනීමට සිදුවන අවස්ථා එසේත් නැතිනම් ස්ථාන ත්‍රිත්වයක් ඇත. එනම්, ක්ෂේත්‍රයේ, ක්ෂේත්‍ර කඳවුරේ දී සහ පුරාවිද්‍යා විද්‍යාගාරයේ දී ය (Shafer 2009).

i. **ක්ෂේත්‍රයේ දී** :- ක්ෂේත්‍රයේ දී සිදුකරන පුරාවිද්‍යා කටයුතු වාර්තාකරණයට ඡායාරූප ලබා ගනී. මෙහි දී දෛනික ව සිදු කරන පුරාවිද්‍යා කටයුතු පිළිබඳ දිනෙන් දින සටහන් තැබීමක් ද සිදු වේ.

එමෙන් ම ක්‍රමානුකූල ව සිදු ව ඇති අතීත මානව ක්‍රියාකාරකම් පිළිබඳ පියවරෙන් පියවර අවබෝධකර ගැනීමේ හැකියාව ද මෙහි පවතී. මෙය ඉහතින් දැක් වූ වාර්තාමය පුරාවිද්‍යා ඡායාරූපකරණයට අයත් වේ. ක්ෂේත්‍රයේ දී ලබා ගන්නා ඡායාරූප අවසන් ප්‍රකාශනයට හෝ අනෙකුත් ශාස්ත්‍රීය කටයුතු සඳහා ද භාවිත කළ හැකි ය.

ii. **ක්ෂේත්‍ර කඳවුරේ දී :-** පුරා ක්ෂේත්‍රයෙන් වැඩිදුර විමර්ශනය සඳහා ගෙන එන පුරාවිද්‍යාත්මක දත්ත ක්ෂේත්‍ර කඳවුරේ දී යළි සොයා බැලීම සහ මගහැරී ගිය දෑ වාර්තාගත කිරීමකට බඳුන් කිරීම හොඳ පුරුද්දකි. විශේෂයෙන් ම ක්ෂේත්‍රයේ දී සිදුවිය හැකි යම් යම් මගහැරීයාම් පිළිබඳ ව සොයා බැලීමේ හැකියාවක් ද ඉන් පිළිබිඹු වේ. මෙහි දී විමර්ශන කටයුතු සඳහා රැගෙන යාමට පෙර වාර්තාකරණය සඳහා ඡායාරූපය වැදගත් වේ. පුරාවිද්‍යාත්මක දත්ත ක්ෂේත්‍ර කඳවුරේ සිට විද්‍යාගාරය දක්වා ප්‍රවාහනයේ දී සිදුවිය හැකි හානි සහ අස්ථානගත වීම් නිසා ගැටලු මතුවිය හැකි ය. මෙනිසා ක්ෂේත්‍ර කඳවුරේ දී සිදු කළ හැකි ඡායාරූපකරණය ඉහත ගැටලුවලට ප්‍රාමාණික පිළතුරක් ලබා දේ.

iii. **පුරාවිද්‍යා විද්‍යාගාරයේ දී :-** මෙහිදී සිදුකරනු ලබන ඡායාරූපකරණයේ ප්‍රමුඛතම අරමුණ වන්නේ, පුරාවිද්‍යා වාර්තා සහ ප්‍රකාශන වෙනුවෙන් ඡායාරූප නිදර්ශන ඉදිරිපත් කිරීම ය. මීට අමතර ව විද්‍යාගාරයේ දී ලබා ගන්නා ඡායාරූප පුරාවිද්‍යා පර්යේෂණ අදාළ සියුම් දත්ත පිළිබිඹුවක් ලෙස ද හඳුනාගත හැකි ය.

**ක්‍රමවේද**

පුරාවිද්‍යාත්මක සාධක ඡායාරූපගත කිරීමෙහි ලා ඒ ඒ පර්යේක්ෂකයෝ එකිනෙකට වෙනස් වූ ක්‍රමවේද භාවිතයට ගනිති. ඒවා සඳහා පුරාවිද්‍යා පර්යේෂණ අරමුණ සහ ස්වරූපය, පුරාවිද්‍යාඥයාගේ අත්දැකීම්, ස්ථානීය ස්වරූපය, පාරිසරික තත්වය ආදී බොහෝ කරුණු බලපායි.

**පුරාවිද්‍යා ඡායාරූපය සහ පොදු ජනයා**

මෙලෙස ලබා ගන්නා ඡායාරූප පුරාවිද්‍යාත්මක වටිනාකමකට අමතර ව පුවත් බෙදාහරින මාධ්‍යයක් ලෙස ද භාවිත වේ. එනම් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය සඳහා පුරාවිද්‍යා පර්යේෂණ තොරතුරු ජනතාව වෙත ඉදිරිපත් කරයි. එහි දී ඡායාරූපයක් විසින් සිදු කරනු ලබන සේවාව අති මහත් ය. පුරාවිද්‍යාත්මක ව සොයාගත් දෑ ලෝකය වෙත වාර්තා කිරීමටත්, පුරාවිද්‍යාත්මක කාර්යයන් උදෙසා කැමැත්තක් ඇති උදවිය වෙත දැනුම ලබා දීමටත් ඡායාරූපය භාවිතයට ගැනේ (Shanks 1992:146). මෙම පුවත් සඳහා මාධ්‍ය වෙත ලබාදෙන ඡායාරූපයේ පරිමාණය, උතුර ආදී ඡායාරූපයට එක් කළ යුතු අංග එක්කිරීම අවශ්‍ය ම නොවේ. නමුත් ඒවා එකතු කර ඡායාරූප මාධ්‍ය වෙත නිකුත් කළ හැකිනම් වඩා වැදගත් ය.

**සාරාංශය**

පුරාවිද්‍යාඥයන් විසින් සිදුකරන ලද කාර්යයේ සත්‍යවාදී බව තහවුරු කිරීමත් ඒ බවට සාක්ෂ්‍ය ලෙස තමා ම පෙනී සිටින සාධකයක් ලෙසත් පුරාවිද්‍යාත්මක ඡායාරූපය හඳුන්වාදිය හැකි ය. එලෙස පෙනී සිටීමට අවශ්‍ය සාධක සියල්ල ග්‍රහණය කර ගැනීමට සමත් ඡායාරූපයක් ලබා ගැනීම ඡායාරූප ශිල්පියා සතු කාර්යයකි. එය ක්ෂේත්‍ර පරීක්ෂාවේ ගුණාත්මක භාවයට, සාර්ථක පර්යේෂණ ප්‍රතිඵලයක් ගෙන ඒමට, පුරාවිද්‍යාඥයා නිවැරදි කිරීමට සහ අවසානයේ අතීතය පිළිබඳ සත්‍යවාදී වූ අර්ථ නිරූපණයක් ඉදිරිපත් කිරීමට හේතු වේ.

## මූලාශ්‍රය


බණ්ඩාරනායක, ඒ. ඒ. (2018). **ක්ෂේත්‍ර පුරාවිද්‍යාව සඳහා නව හඳුන්වාදීම් කිහිපයක්.** ගාල්ලː කතෘ ප්‍රකාශන.

හැගොඩ, එල්. (2014). **ඩිජිටල් ෆොටෝග්‍රැෆි.** කොළඹː හැගොඩ සේයා ශිල්ප නිකේතනය.

සෝමදේව, ආර්. (අනුː). (2000). **පුරාවිද්‍යාවේ සිද්ධාන්ත ක්‍රම සහ භාවිතාව.** මහරගමː කර්තෘ ප්‍රකාශන.

Dorrell, P. (1994). *Photography in Archaeology and Conservation- 2nd edition.* Cambridge: University Press.

Drewett, P.L. (1999). *Field Archaeology*. Cornwall: T.J. International LTD.

Fagan, B. M., and Durrani, N. (2017). *Archaeology – A brief Introduction.* New York: Routledge.

Flatman, J. (2011). *Becoming an Archaeologist: a guide to professional pathways.* New York: Cambridge university press.

Grant, J., Gorin, S., and Fleming, N. (2005). *The Archaeology Course Book: An Introduction to Study Skills.* New York: Routledge.

Renfrew, C., and Bahn, P. (2016). *Archaeology: Theory, Methods and Practice.7th ed.* London: Thames and Hudson Ltd.

Anonymous. (2016). *Digital camera D 3400 user's Manual*. Nikon Corporation.

Bohrer, N. F. (2005). *Photography and archaeology; the image as object.* Sam Smiles and Stephanie.

Moser (Ed.). (2006). *Envisioning the past.* Blackwell Publishing Ltd.

Guha, S. (2013). *Ancient Asia*. Retrieved from https://www.ancient-asia-journal.com/articles/10.5334/aa.12314/

Shafer, H. J. (2016). *Archaeological Field Photography*. Thomas R. Hester, Harry J. Shafer, Kenneth L. Feder (Ed.). *Field Methods in Archaeology***.** (pp. 159-176*)*. New York: Routledge.

Shanks, M. (1992). *Experiencing the past.* London: Routledge.

Hauser, K. (2007). *Shadow Sites: Photography, Archaeology, and the British Landscape1927–1955***.** New York: Oxford University Press.

Pezzati, A. (2002). *Adventures in Photography: Expeditions of the University of Pennsylvania Museum of Archaeology and Anthropology***.** Philadelphia: University of Pennsylvania Museum of Archaeology and Anthropology.

Mcfadyen, L. and Hicks, D (Edt). (2020). *ARCHAEOLOGY AND PHOTOGRAPHY:Time, Objectivity and Archive.* Uk: Bloomsbury Publishing Plc.

Munro, N (Edt). (2018). *Digital Photography-An Introduction.* New York: DK Publishing.N
cky

https://www.etymonline.com/search?q=photography on 22.07.2020 at 7.35 p.m.

https://dictionary.cambridge.org/dictionary/english/photograph on 22.07.2020 at 7.40 p.m.

https://www.etymonline.com/search?q=photography on 22.07.2020 at 7.32 p.m.

https://library.aru.ac.uk/referencing/harvard.htm?q=photograph 16.10.2020 11.15 a.m.

https://libguides.murdoch.edu.au/APA/images 16.10. 2020 11.17 a.m.

http://www.woodnet.org.uk/woodlandweb/enjoy/excavat.htm

https://www.picturecorrect.com/tips/open-shade-lighting-for-photography/on 11.10.2020 at 06.29 a.m.

https://www.widewalls.ch/magazine/framing-in-photographyon 11.10.2020 at 06.11 a.m.

https://www.picturecorrect.com/tips/framing-in-photography/on 11.10.2020 at 06.14 a.m.

https://www.quora.com/What-is-the-meaning-of-a-frame-within-the-frame-in-photography on 11.10.2020 at 06.38 a.m.

# ප්‍රාග් ඓතිහාසික කාන්තාවගේ භූමිකාව

**එච්. එම්. සමන් කුමාර ඇරෑගම**[1]

මානව වංශකතාවේ මූලාරම්භයේ සිට අද දක්වා වූ අති විශාල කාලච්ඡේදය තුළ කාන්තාවගේ භූමිකාව තවත් කුමන හෝ නිර්ණායකයක් සමග සාපේක්ෂ කළ නොහැකි ය. ඒ මිනිසා නම් සත්වයාගේ ආරම්භයට මෙන් ම පැවැත්මට මුල්වන වස්තු බීජය වන්නේ ද කාන්තාව වන නිසා ය. මේ ලොව පැවැත්ම රඳාපවතින්නේ මවගේ උණුසුමත් හිරුගේ ආලෝකයත් මත පමණි. ඒ දෙක නොවන්නට ඉතිරිවන්නේ අන්ධකාරයත් සීතලත් පමණක් විය හැකි ය. සැමවිට ම මවක වන්නේ කාන්තාවකි. ඒ අනුව ඇයගේ සැබෑ භූමිකාව වසන්කර කතාකළ හැකි අයෙකු වේ නම් ඒ මවකගේ උණුසුමකින් තොරව මෙලොව එළිය දුටු අයෙකි. හැදි වැඩුණු පරිසරය, තමා ලබාගත් දැනුම, පවුල් පරිසරය, ඇසුරු කළ සමාජය, හා හැදියාව මතින් කාන්තාවගේ ස්වරූපය විවිධතා පෙන්නුව ද සමස්තයක් ලෙස ගත්කල මවක වන සෑම කාන්තාවක් ම මේ මිහිමතට අගය කළ නොහැකි වටිනාකම් සමුදායක් මුදාහරියි. මෙලෙස අද වනවිට විවිධ හැල හැප්පීම් මතින් දිගු ගමනක් සනිටුහන්කර ඇති කාන්තාවගේ භූමිකාව පිළිබඳ ව සාධක ප්‍රාග්ඓතිහාසික යුගයේ කෙබඳුදැයි විමර්ශනය කිරීම මෙම ලිපියේ මුඛ්‍ය අරමුණයි.

ප්‍රාග් ඓතිහාසික යුගයේ කාන්තාවගේ හැසිරීම, ජීවිකාව හා පොදුවේ දැකිය හැකි ගුණාංග, නැත්නම් ඇයගේ කාර්යය හා භූමිකාව කෙබඳුදැයි පවත්නා සාධක මතින් සාකච්ඡා කිරීමට පෙර ජීවින් පෘථිවිය මත ජනිත වීම සිදුවන්නට ඇත්තේ කෙසේදැයි යම්තමින් හෝ විමසා බැලීම යෝග්‍ය ය. වර්තමානයේ අපට දක්නට ලැබෙන පෘථිවිය අජීවි හා සජීවි වස්තූන් රැසකගේ එකතුවකි. සංකීර්ණ ක්‍රියාවලියක් මතින් වර්තමානයේ අප ජීවත්වන පෘථිවිය නිර්මාණය වී තිබේ. විශ්වය තුළ ඇති වූ කුමන හෝ භෞතික විද්‍යා, රසායන විද්‍යා විපර්යාසයක ප්‍රතිඵලයක් ලෙසින් පෘථිවිය නිර්මාණය වී ඇත්තේ ස්වභාවධර්මයේ ප්‍රතිඵලයකිනි. මිනිස් වර්ගයාගේ ආරම්භය, විකාශනය, පරිණාමය පිළිබඳ ව විවිධ මත පවතී. ඒවා විද්‍යාත්මක පදනමින් හා ආගමික පදනමින් පවතී. භෞතික විද්‍යාත්මක පදනමින් මේ වනවිට පරිණාම වාදය පිළිබඳ ව යම් විශ්වාසයක් ලෝකයෙහි පවතී. පෘථිවි පෘෂ්ඨයේ ඇරඹුම පිළිබඳ ව ද මත පවතී (විජේතුංග 1958:45-53). කෙසේ වෙතත්, 1900 දී පමණ විකිරණශීලීත්වය සොයාගැනීමත් සමග පෘථිවියේ වයස දළ වශයෙන් සොයාගැනීමට හැකි වී තිබේ. ඒ අනුව ආසන්න වශයෙන් පෘථිවියේ ආරම්භය අවුරුදු දශලක්ෂ 4500ක් පමණ වෙතැයි ගණනය කර තිබේ (විජේතුංග 1958:45-12). පෘථිවි කබොල්ල මත සිදුවන භෞතික ක්‍රියාවලිය හරහා මතුපිට පෘෂ්ඨය ආරම්භයේ සිට ම විවිධ වෙනස්වීම්වලට ලක් වූ බව මේ වනවිට සොයා ගෙන තිබේ.

[1] පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරි,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
eregama@gmail.com

ඉතා අධික උෂ්ණත්වයකින් යුතු පදාර්ථ සමූහයක් එකිනෙකට ඝනීභවනය වීමෙන් හටගත් පෘථිවිය මත ජීවීන් බිහිවීමට අවශ්‍ය පරිසර තත්ත්වය සකස් වූයේ අදින් වසර මිලියන 4500කට පමණ ඉහත දී බව භූවිද්‍යාඥයෝ අනුමාන කරති (විජේතුංග 1958). ජීවීන්ට සුදුසු පරිසරයක් වන වායු, ජල හා ඝන අවශ්‍යතා සහිත සිසිලසකින් යුතු පරිසරය මත මුලින් ම ඒක සෛලික, ද්වි සෛලික ජීවීන් හටගත් බව අනුමාන කරයි. ඉන් පසු ව බහු සෛලික ජීවීන් හටගැනීමත් සමඟ පෘථිවිය මත විවිධ ජීවීන් විවිධ ස්ථානවලින් හටගෙන ඇත.

මුල්කාලීන නොහොත් ප්‍රාථමික පේලියෝසොයික යුගයේ දී (Paleozoic Era) අන්තර්ගත පුරාණතම කේම්බ්‍රිය (Precambrian) අවධියේ දී දකුණු ඇමරිකාවේ සිට අප්‍රිකාව, ලංකාව ඇතුළු ඔස්ට්‍රේලියාව දක්වා සමකයේ උතුරට ද දකුණට ද විහිදුණු අතිවිශාල මහාද්වීපයක් තිබූ බව කියවේ. මෙය නමින් 'ගොන්ඩ්වානාලන්තය' ලෙසින් හඳුන්වා තිබේ. ඒ අනුව එම කාල වකවානුවේ දී ශ්‍රී ලංකාව ඉන්දියාව සමඟ ගොඩබිමින් යාව තිබූ බව පැහැදිලි වේ (විජේතුංග 1958:45-21). ලොව පහළ වූ මිනිසා ජීවත්වීමට අවශ්‍ය සාධක සොයා විවිධ පරිසර පද්ධතීන් හරහා සංක්‍රමණය වූ බව පැහැදිලි ය.

මීට වසර මිලියන 4-5 අතර කාලයේ පෘථිවි තලය මත බිහි වූවා යැයි අනුමාන කරන "ඔස්තොලෝපිතිකස්" (Australopithecus) නම් වානර විශේෂය (නැගෙනහිර අප්‍රිකාවේ) මානවයාගේ ආරම්භය ලෙසට පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති (කුලතිලක 2013:51). සැබෑ ලෙස ම මානව කෘති වශයෙන් පිළිගත හැකි ගල් මෙවලම් මුලින් ලැබී ඇත්තේ ද අප්‍රිකානු කලාපයේ (සර්ම කලාපීය පරිසර තත්ත්වයන්) 'පැලියෝලිතික' (Palaeolithic) අවධියට අයත් පුරාවිද්‍යා ස්ථානවලිනි (කුලතිලක 2008) .

ප්‍රීමාටා සතුන් වන වානරයන්, වඳුරන්, චිම්පංචින්සියන් වැනි සතුන්ට ද මිනිසාට මෙන් ම පොදු පූර්වජයෙක් වේ. එම පූර්වජයාගෙන් බෙදී ගොස් විවිධ ප්‍රභේද යටතේ වෙන් ව පරිණාමය වී වත්මන් මිනිසා හා අනෙකුත් ප්‍රීමාටාවන් දක්වා විකාශනය වී තිබේ. මේ නිසා ම මිනිසාට පවත්නා පරිසරය අනුව ජීවී මට්ටමෙන් අනුවර්තනය වීමටත් හැඩගැසීමටත් සිදුවේ (කුලතිලක 2013:36). මිනිසා සත්ත්වයෙකු වුව ද සංස්කෘතිය නමැති විශේෂ ලක්ෂණය නිසා සත්වයන්ගෙන් වෙන්වී යයි. අනෙකුත් ජීවීන් මෙන් ම මිනිසා ද පරිසරය හා අන්තර් සම්බන්ධතා පැවැත්ම තුළින් පරිසරය හා බද්ධ වේ. මිනිසාගේ ආරම්භක වකවානු පිළිබඳ ව මෙතෙක් අනාවරණය වී ඇති නිශ්චිත කරුණු මගින් පැහැදිලි වන්නේ අදින් වසර මිලියන 2.4කට පෙර දී මානව වර්ගයා ඇතිවූ බවකි (Haviland 1993:67-73).

මිනිසා බිහිවීමෙන් පසු ව ඔහුගේ වර්ධනය, ව්‍යාප්තිය සහ තාක්ෂණික වර්ධනය මෙන් ම නැඹුරු ව හටගත් ආකාරය පුරාවිද්‍යාඥයන් විග්‍රහ කරන්නේ 'ගල් යුගය' ලෙසින් ය. මිනිසා ශිලා මගින් නිපදවූ මෙවලම් භාවිතයට පටන්ගත් ආරම්භක අවධිය මේ නමින් හඳුන්වයි. මිලියන 2.4 පමණ කාලයේ සිට අඩු ම තරමින් 1.5 දක්වා කාලය පහළ පුරාතන ශිලා යුගය ලෙසත්, ඊට පසු ශිලා මෙවලම් තාක්ෂණයේ වර්ධන අවස්ථා එනම් 150,000 සිට 50,000 දක්වා කාලය මධ්‍ය පුරාතන යුගය ලෙසත්,

ඊට පසුව වසර 50000 - 37000 අතර වූ වර්ධන තාක්‍ෂණ අවධිය ඉහළ පුරාතන ශිලා යුගය ලෙසටත්, ඉන් පසු ව උදාවන මධ්‍ය ශිලා යුගය නවීන මානවයාගේ යුගය ලෙසත් දැක්විය හැකි ය. (කුලතිලක 2013:52) අප්‍රිකාවෙන් නික්මීමේ න්‍යායාත්මක පදනමට අනුව ලොව පුරා ව්‍යාප්ත වූ ප්‍රාග්ඓතිහාසික මානවයන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැන්න ආශ්‍රිත ව ව්‍යාප්ත වූ බව මේ වනවිට තහවුරු කරගෙන තිබේ (දැරණියගල 2003; දැරණියගල 1991; Deraniyagala 1992; Perera 2010). ඉහත ප්‍රාග්ඓතිහාසික යුගවල තොරතුරු වරින්වර ශ්‍රී ලංකාවේ විවිධ කලාපයන්ගෙන් අනාවරණය කරගන්නා ලද ප්‍රාග් ඓතිහාසික ජනාවාස මගින් සනාථ වේ. අදින් වසර 125,000කට පෙර සිට ප්‍රාග් ඓතිහාසික යුගකරණයේ දී ශ්‍රී ලංකාවේ විසූ ප්‍රාග් ඓතිහාසික මානවයන් හඳුන්වන්නේ "බලංගොඩ මානවයා" ලෙසිනි (Deraniyagala 1992:174; Perera 2010:12). දිවයිනේ සෑම පරිසර කලාපයකින් ම මෙම ප්‍රාග් ඓතිහාසික මානවයාගේ තොරතුරු හෙළිකරගෙන තිබේ.

වසර මිලියන 3-2.8 අතර කාලයේ දී ඔස්තොලෝපිතිකස්, ආඩිපිතිකස් වැනි සතුන් බිහිවීමත් සමඟ පෘථිවිය මත වානර මානවයන්ගේ ආගමනය සිදුවිය. ජීවීන් හටගැනීමේ දී කුමන සත්වයා මුලින් ස්ත්‍රී වූව ද පුරුෂ වූවා ද යන්න කිසිදු විද්‍යාවකට මෙතෙක් හසු ව නැත. ජීවවිද්‍යා පදනමට අනුව ජීවියෙකු හටගැන්මට ස්ත්‍රී හා පුරුෂ යන සංකලනය අනිවාර්ය වේ. එය විද්‍යාත්මක පදනමකි. වර්තමානය වනවිට ස්ත්‍රී පුරුෂ යන සුසංයෝගය විවිධ උපමාන නිර්ණායක මතින් ප්‍රමාණාත්මක ව වර්ගී වූව ද ජීවියාගේ බිහිවීමේ දී එය ප්‍රාමාණික ව සම මට්ටමේ පවතින්නට ඇත.

රැකවරණය, ආදරය, සෙනෙහස, මාතෘත්වය මත ලෝකයේ මිනිසා බිහිවිය. ප්‍රාග් ඓතිහාසික කාන්තාව සුරක්ෂිත ව තම දරුවන් බිහිකරමින්, පෘථිවිය මත දෙපයින් නැගිටින්නට හැකි දරුවෙකු ආරක්ෂා නොකළේ නම් අද අප ද මේ තරම් වික්‍රම සිදුනොකරනු ඇත. අතීත ප්‍රාග් ඓතිහාසික කාන්තාව සැමවිට ම ආහාර පිළිබඳ ව මූලිකත්වයක් පෙන්වා තිබේ. ඊට හේතුව වී ඇත්තේ දරුවන් බඩගින්නේ තැබීමට ඇති අකමැත්ත ය. යම් විටක දින ගණන් දඩයම් හෝ ආහාර සොයාගැනීමට නොහැකි වූ විට ආසන්නතම ස්ථානවලින් ගොඩ බෙල්ලන් හා දිය බෙල්ලන් ගෙනවිත් කුඩා දරුවන්ගේ කුසගිනි නිවා දැමූයේ දරුවන්ගේ මව ය.

ප්‍රාග් ඓතිහාසික යුගයේ දී කාන්තාව පුරුෂයාට මහත් අත්වැලක් වී ඇත. දඩයම් වෙනුවෙන් දිවා කාලය වෙහෙසෙන පිරිමියාගෙන් මඟහැරෙන සියලු කාර්යයන් තම කුටුම්භය වෙනුවෙන් සලසන්නේ ප්‍රාග් කාන්තාව ය. ඒ අනුව දරුවන් වෙනුවෙන් ඉටුවිය යුතු ආහාර පිළියෙල කරදීම්, ආරක්ෂාව සැලසීම්, ජනාවාස භූමියේ සිට කෙටි දුරක් තුළ වන ලැහැබේ ඇති වාණිජ ද්‍රව්‍ය හා ඵල එකතු කිරීම් මෙන් ම පරපුරේ පැවැත්ම වෙනුවෙන් ඇයට දැනෙන කාර්යය දැඩි උවමනාවෙන් යුතු ව ඉටුකළ බවක් පෙනේ. කිසිවිටකත් කාන්තාවගේ මාතෘ සෙනෙහස කාලයත් සමඟ කිසිඳු වෙනසකට බඳුන් ව නැත. ඇය උපරිමයෙන් යුතු ව දරුවන් වෙනුවෙන් දයාව, කරුණාව, සෙනෙහස නොදැක්වූයේ නම් කිසිවිටකත් නූතන මානවයා බිහිනොවනු ඇත. එය ඉතාමත් විශාල කාර්යභාරයක් ලෙසින් ලොව කිසිවෙකුත් වටහාගෙන ඇද්දැයි සැක සහිත ය. මාතෘත්වය තුළ දක්නට ඇති අව්‍යාජ හැඟීම් සමුදාය ලොව පැවැත්මේ වස්තු බීජය බව අපි පෙර ද සඳහන් කළෙමු. පරපුර බිහිකිරීමේ දී හා පරපුර පවත්වාගැනීමට සත්ත්ව ලෝකයේ සෑම ප්‍රජාවක් ම ස්ත්‍රීත්වය මවගේ

කාර්යය උතුම් ලෙසින් ඉටුකළ බව නිසැක ය. පිරිමි පාර්ශ්වය සැමවිට ම කුටුම්භයේ ආරක්ෂාව සිතන විට කාන්තාව සැමවිට ම දරුවන්ගේ රැකවරණය සොයන්නේ ලොව පැවැත්මට ඇය වෙත ස්වභාවධර්මයෙන් පැවරී ඇති වගකීමක් ලෙසිනි. ලොව පුරා කොතෙක් ශිෂ්ටාචාර බිහිවුව ද මවගේ කාර්යභාරයෙහි වෙනසක් සිදු වී නොමැත. සැමවිට ම දරුවන්ගේ කුසගින්නෙන් දරුවන් බේරාගත්තෙ, පෝෂණය දුන්නේ, මව්කිරි දුන්නේ මව ය. ඇය එම වගකීම අකුරට ම ඉටුකළා ය.

> ලෝක ප්‍රාග් ඉතිහාසය දෙස බැලීමේ දී කාන්තාවගේ කාර්යභාරය පැහැදිලි වන නිදසුන් බොහෝ ය. ඒ අතරින් ටැන්සානියාවේ ලෙටෝලි නම් පුරාවිද්‍යා ස්ථානයෙන් අනාවරණය කරගෙන ඇති සාධක ඉතා ම ඉහළ අගයක් ගනී. මෙය පැලියෝ ප්ලයිස්ටෝසීන කාලයට දිවයයි. මෙම හොමිනින් පා සටහන් ඔල්ටුවායි උද්‍යානයට කිලෝමීටර් 45ක් දකුණින් හමුවේ. 1976 දී මෙරී ලිකි හා ඇගේ කණ්ඩායමක් මෙම ස්ථානය සොයා ගෙන තිබේ. 1978 දී කැණීම් සිදුකර ඇත. එහි දී අදින් වසර මිලියන 2.7කට පෙර (අදින් වසර ලක්ෂ 27කට පෙර) වත්මන් ටැන්සානියාවේ ලෙටෝලි නම් ප්‍රදේශයේ ජීවත් වූ ප්‍රාග් මානව යුවළක් මඩ වගුරක් හරහා ගමන්කරන ලද පා සටහන් පෙළක් පුරාවිද්‍යාඥයන් කණ්ඩායමක් අනාවරණය කරගෙන ඇත. එය මේ වනතෙක් ආරක්ෂා වී ඇත්තේ එම යුවළ මඩ වගුර මතින් ගිය පසු ව එම පාසටහන් එලෙස ම තිබිය දී ආසන්නතම ගිනි කන්දක් විදාරණය වීමෙන් හටගත් අලු තැන්පතුවකින් එය වැසීයාම නිසා ය. පසුකාලීන ව පුරාවිද්‍යාඥයන් විසින් එම ප්‍රදේශය ආශ්‍රිත ව සිදුකරන ලද පුරාවිද්‍යා කැණීමක් මගින් මෙම ස්ථානය හඳුනාගෙන තිබේ (Harrison 2011; David et al 2010).

මෙම යුවළේ පා සටහන් පෙළ ඉතා ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් අනුමාන කරගෙන ඇත්තේ බරක් දරාගත් කාන්තාවක සමඟ පුරුෂයෙකු මෙම වගුර හරහා ගමන්කර ඇති බවකි. එම පිරිමි ප්‍රාග් මානවයා තරමක් ඉදිරියෙන් ද කාන්තාව තරමක් පිටුපසින් ද ගමන්කර ඇති බව හෙළි වී තිබේ. මේ අනුව කාන්තාව දරුවෙකු වඩාගෙන යන්නට ඇති බවට අනුමාන කරයි. මෙම පා සටහන් පෙළින් බොහෝ දේ කියවිය හැකි ය. පිරිමියා සැමවිට ම පවුල් ඒකකයේ ආරක්ෂාව සැලසීමට මෙන් ම ඉදිරියෙන් එල්ලවන අභියෝගවලට මුහුණදීමට ගමන් කර ඇති අතර අදින් වසර මිලියන 2.7කට පෙර සිට ද න්‍යෂ්ටික පවුල් ඒකකයේ වගකීම පිළිබඳ අදහස ඔහු තුළින් ඉස්මතු වී ඇත. කාන්තාව සැමවිට ම මව් සෙනෙහස කැටිකරගත් රැකවරණය දරුවන් වෙත සලසා ඇති බවක් ඇයගේ පා සටහනින් ඉස්මතු වී ඇති බවක් පෙනේ. ඇයගේ පා දෙකෙන් එක් පාදයක විළුඹ සැමවිට ම වැඩි බරකින් යුතු ව පොළොවට කිදා බැසීමෙන් පැහැදිලි වන්නේ දරුවා වඩාගත් අන්තය බව විද්‍යාත්මක ව පැහැදිලි කරගෙන තිබේ. සැමවිට ම පවුල් ඒකකයේ වගකීම මින් පැහැදිලි වන අතර හොමිනේඩ් තත්ත්වයේ පසු වූ එම වානර මානව විශේෂය තුළ ද කාන්තාවගේ කාර්යභාරය වඩාත් ඉස්මතු වී තිබේ.

කළමනාකරණය මතින් තම පරිශ්‍රය පවත්වාගෙන ගිය ඇය සැමවිට ම තමා අවට පරිසරයෙන් ශාකමය එලවැල නෙළාගෙන ආහාර අවශ්‍යතා පිරිමසා ගන්නට උදව් වී තිබේ. එමෙන් ම තම වාසස්ථානය ආසන්නයේ හෝ අවට පරිසරයේ ආහාර අවශ්‍යතා සඳහා ඔවුන් ගන්නා උත්සාහය පිළිබඳ ව ප්‍රාග් ඓතිහාසික චිත්‍ර අධ්‍යයන මඟින් පැහැදිලි වූ අවස්ථා ද වේ. එහි දී මීයන් ඇල්ලීම සඳහා ගුලක් හාරමින් සිටින කාන්තාවන් පිරිසකගේ චිත්‍රයක් ඉන්දියාවෙන් වාර්තා වී තිබේ (ධර්මවර්ධන 2003). මින් පැහැදිලි වන්නේ කුටුම්භ අවශ්‍යතා වෙනුවෙන් කාන්තාව බොහෝ දේ සිදුකර ඇති බව ය. සැමවිට ම ආහාර එක්රැස් කිරීමේ කාර්යය කාන්තාව සිදුකර තිබේ. විශේෂයෙන් පලතුරු, අල, විවිධ මුල් වර්ග, පැණි, මීයන්, වැනි කුඩා සතුන් මෙලෙස එකතුකර ඇත. එලෙස එකතුකර ගන්නා ආහාර කාන්තාවන් විසින් නිපදවන ලද කුඩා ගොටු ආකාර මලු (පැස) තුළ බහාලා ඇත (Wakankar 1992; ධර්මවර්ධන 2003). ඒ අනුව කාන්තාවන් ම යම් විටක තාල වර්ගයේ ශාක පත්‍ර භාවිතයට ගනිමින් කුඩා කුඩ නිපදවන්නට ඇත. ශ්‍රී ලංකාවේ ද කුඩ හෝ පැසවල් භාවිත කළ බවට සාධක බටදොඹලෙන ආශ්‍රිත ව සිදුකරන ලද තුනී පටල (Thin Section) පරීක්ෂාවෙන් අනාවරණය වී තිබේ. (Perera 2015), ඒ අනුව ශාක පත්‍ර මඟින් යම් යම් උපකරණ කුඩ හෝ මලු නිර්මාණය සඳහා කාන්තාව දායකත්වය දක්වා තිබේ. ඉන්දියාවේ 'රාජාත් පච්මාර්'හි ලෙන් සිතුවමක කාන්තාවක මාළු ඇල්ලීමේ කාර්යයේ නිරතවන දර්ශනයක් සිතුවමට නඟා තිබීමෙන් පැහැදිලි වන්නේ ඇය තරමක අවදානම් සහගත කාර්යයන්හි ද නිරත වී ඇති බවකි. මෙසොලිතික් අවධියේ දී ඉන්දියාවේ කාන්තාවන් කුඩ හිස තබාගෙන හෝ පිටේ බැඳගෙන ගමන්කරන දර්ශන ඇඳ තිබේ (Wakankar 1992; ධර්මවර්ධන 2003). ඉන් පැහැදිලි වන්නේ එක්කෝ අදාළ ප්‍රදේශය අතහැර වෙනත් ප්‍රදේශයක් කරා ගමන් කරන සිදුවීමක් හෝ දුර ප්‍රදේශයකින් ආහාර ද්‍රව්‍ය රැගෙන එන සිදුවීමක් විය හැකි ය. මේ සඳහා මූලිකත්වය ගෙන ඇත්තේ කාන්තාව ය.

ලෝක ප්‍රාග් ඓතිහාසික කාන්තාව පිළිබඳ ව කතාකිරීමේ දී යම් සිතුවම්වල නැටුම් ඉදිරිපත් කරන දර්ශන ද සිත්තම් කර තිබේ. එහි දී ගිනි මැලයක් වටා හෝ වෙනත් ස්ථානයක නටන දර්ශන සිත්තම්කර ඇත. මින් පැහැදිලි වන්නේ ඇය විනෝදකාමී සිතුවිලිවලින් ද පොහොසත් බවකි. යම් තැනක තනිවම ද තවත් විටක ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශ්වය ම ද නැටුම් ඉදිරිපත්කර තිබේ (Wakankar 1992). මොවුන් විසින් කණ්ඩායම් ලෙසින් නැටුම් ඉදිරිපත් කරන ලද අවස්ථා ද වේ. නැටුම් ඉදිරිපත් කරන අවස්ථාවල විවිධ වර්ණ භාවිතයට ගෙන තිබේ. (Wakankar 1992; ධර්මවර්ධන 2003). ස්වාභාවික ඛනිජ ද්‍රව්‍ය භාවිතයට ගනිමින් මෙම වර්ණ සකස්කර ගත් බවක් අනුමාන කළ හැකි ය. එවැනි ස්වාභාවික ද්‍රව්‍යයන්ගේ ශේෂ රැසක් ශ්‍රී ලංකාවේ කැණීම් මඟින් ද අනාවරණය වී ඇත (ඇරැගම 2017). ඉන්දියාවේ ප්‍රාග් ඓතිහාසික මෙසෝලිතික යුගයේ බොහෝ සිතුවම්වල අවමංගල අවස්ථා ද නිරූපණය කර තිබේ. මියගිය තැනැත්තා හෝ තැනැත්තිය වටකරගෙන හඬාවැටෙන සිතුවම් ද වේ (Wakankar 1992). කාන්තාව සැමවිට ම අනෙකා පිළිබඳ ව අනුකම්පාව, දයාව, දුක පිළිබඳ බොහෝ ගැඹුරින් මනසින් ක්‍රියාකරන ආකාරය මෙමඟින් පැහැදිලි ය. පිරිමින් සැමවිට ම දුක දරාගන්නා අතර ගැහැනිය සැමවිට ම දුක ප්‍රකාශ කරන බවට මේවා කදිම නිදසුන් ය. ඉන්දියාවේ බොහෝ මෙසොලිතික් ගුහා චිත්‍රවලින් ගර්භණී මව්වරුන්ගේ දර්ශන, බර උසුලන කාන්තාවන්, දරු උපත්, මව සහ දරුවා දැක්වෙන සිතුවම්, ලිංගිකත්වය දැක්වෙන

සිතුවම් මෙන් ම ලිංගික දර්ශන ද සිත්තම් කිරීම දැකිය හැකි ය (Wakankar 1992; ධර්මවර්ධන 2003). මවක වන්නේ කාන්තාවක බව අපි සියල්ලෝ ම හොඳින් දනිමු. එහෙත් මවකට ඇති ගෞරවනීය බව ඉස්මතු කිරීමට මෙවන් ගර්භණී මව්වරුන්ගේ දර්ශන සිතුවම් කළා විය හැකි ය. බර උසුලන කාන්තාවන්ගේ දර්ශන සිත්තම් කිරීම මතින් කාන්තාවගේ කාර්යභාරයේ වගකීම් සහිත බැරෑරුම් බව මැනවින් පැහැදිලි වේ. මෙවැනි සිතුවම් ඇන්දේ කාන්තාවන් ද එසේත් නැත්නම් පිරිමින් දැයි සොයාගත නොහැකි ය. ශ්‍රී ලංකාවේ මෙවැනි කාන්තා රූප සහිත සිතුවම් තිබිය හැකිමුත් මෙතෙක් පැහැදිලි ලෙසින් හඳුනාගෙන නොමැත. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව මිනිසාගේ ලිංගික අවශ්‍යතා අඩු වැඩි වශයෙන් පවතී. යම් විටක එහි ප්‍රතිඵලයක් ලෙසින් ස්ත්‍රීන් හෝ පුරුෂයන් ලිංගිකත්වයට අදාළ සිතුවම් නිර්මාණය කරන්නට ඇත.

මෙරට ප්‍රාග් ඓතිහාසික තොරතුරු ගවේෂණය ඉංග්‍රීසි පාලන සමයේ දී ආරම්භ කර ඇත්තේ මතුපිට ගවේෂණ මගින් ය. ඉන්පසු ව දේශීය විද්වතුන්ගේ සහභාගීත්වයෙන් ද පර්යේෂණ සිදු වී ඇත. ශ්‍රී ලංකාව තුළ ප්‍රාග් ඓතිහාසික කාන්තාව පිළිබඳ ව වෙන්කර හඳුනාගත් පර්යේෂණ නොමැත. කෙසේ වෙතත් ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ මතින් ලබාගත් පුරාවිද්‍යාත්මක දත්ත විමර්ශනාත්මක ව අධ්‍යයනයෙන් කාන්තාවන් පිළිබඳ ව යම් යම් තොරතුරු අනාවරණය කරගත හැකි ය.

ප්‍රාග් ඓතිහාසික යුගයේ දී එම මානවයාගේ තාක්ෂණික මෙවලම වූයේ ශිලා මෙවලම් ය. ශිලා මෙවලම් නිෂ්පාදනය වැඩිවශයෙන් ම පිරිමි පාර්ශ්වය සිදුකරන්නට ඇත. යම් විටක ඊට අවශ්‍ය අමුද්‍රව්‍ය කාන්තාවන් ඇළදොළවලින් ගෙනෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ගංගා, ඇළදොළ හරහා ගමන් කිරීමේ දී ප්‍රාග් ඓතිහාසික මානවයාගේ නෙතට හසුවන විවිධ ගල් වර්ග රැගෙන ගොස් කැබලිවලට කඩා ශක්තිමත් ගල් වර්ග තෝරා ගැනීමට උත්සාහ ගෙන ඇති බව මේ අනුව පැහැදිලි ය. ශ්‍රී ලංකාවේ මධ්‍යශිලා යුගයේ දී වැඩි වශයෙන් ම ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා මෙවලම් නිෂ්පාදනය කර ඇත. ඉතාමත් සුමට එමෙන් ම අලංකාර හැඩතල සහිත මෙම ශිලා මෙවලම්හි උපයෝගීතාව විවිධ ය. ඒ අනුව යම් විටක මෙම නිෂ්පාදනය දරුවන් පිළිසිඳ ගැනීමේ දී පෙකණි වැල කැපීම වැනි අති සංවේදී කාර්යයවලට පවා භාවිතයට ගන්නට ඇත. ඒ අනුව පුරුෂයන් කාන්තාවක ගැබ් ගැනීමෙන් පසු ව දරුවා ප්‍රසූත කරන අවස්ථාවේ දී භාවිතයට ගැනීමට තම මෙවලම් ගොන්නේ ඉතාමත් සුමට හැඩතල එකතු කළ ශිලා මෙවලමක් තබාගන්නට ඇත්තේ දැඩි පීතෘ සෙනෙහසකින් විය හැකි ය (ඇරැගම 2017). මධ්‍ය ශිලා යුගයේ ජ්‍යාමිතික හැඩැති ක්ෂුද්‍ර ශිලා මෙවලම් නිපදවීම සඳහා බහුල ව ම භාවිතයට ගෙන ඇත්තේ ද තිරුවානා ය. විශේෂයෙන් ම කිතුල්ගල බෙලිලෙන, කුරුවිට බටදොඹලෙන, කෑගල්ල අලුලෙන, හොරණ බුලත්සිංහල පාහියන් ලෙන, වරකාපොළ ඇතාබැදිලෙන, කුරගල මෙන් ම මධ්‍ය ශිලා යුගයේ සෑම පුරා ස්ථානයක ම පිරිසිදු තිරුවානා භාවිත කළ බවට පැහැදිලි සාධක ඇත (Perera 2015; Roberts et al 2015; ඇරැගම 2017).

ප්‍රාග් මානවයා "ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා ගල් මෙවලම්" වැඩි වශයෙන් ම නිපදවා ඇත්තේ " පළිඟු" ඛනිජයෙන් වීම විශේෂත්වයකි. ඒ අනුව ඔවුන්ගේ "ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශිලා ගල් මෙවලම්" භාවිතය ද පුළුල් ය. ඉතා සුමට කුඩා වූ මෙම මෙවලම් මානවයන් කැපීම, ඉරීම, සීරීම සහ විදීම සඳහා භාවිතයට ගෙන ඇති බව අනුමාන කළ හැකි ය. දිගු කලක් තිස්සේ භාවිතයට ගන්නා ලද හා "නැවත හැඩ ගැසූ" ශිලා මෙවලම් ද "ජ්‍යාමිතික ස්වරූපී ක්ෂුද්‍ර ශීලා මෙවලම්" එකතුවේ හඳුනා ගෙන තිබේ (Perera 2015; Roberts et al 2015; ඇරැගම 2017). තව ද පබළු වැනි අලංකාර නිර්මාණයන්ගේ සැකසුම් කාර්යයන් සඳහා සුමට මෙවලම් භාවිතයට ගත් බවක් අනුමාන කළ හැකි ය. බොහෝවිට ආභරණ වැනි දේ පිරිමි පාර්ශ්වය මෙන් ම කාන්තා පාර්ශ්වය ද භාවිතයට ගන්නට ඇත. වැඩි වශයෙන් කැපී පෙනීම සඳහා ආභරණ භාවිතයට ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. යම් විටක කාන්තාවන් කොණ්ඩයේ ගසා ගැනීමට සත්ව අස්ථීන්ගෙන් සකසන ලද කූරු භාවිත කළ බවට උපයෝගීතාව මැනවින් පැහැදිලි නැති දිගු අස්ථි කූරු හමුවීමෙන් අනුමාන කළ හැකි ය.

සත්ව අං කැබලි, සත්ව අස්ථි කැබලි, බෙලි කටු, මත්ස්‍ය කටු ආදියෙන් සකස් කරගත් අස්ථි මෙවලම් විවිධ කාර්යයන් සඳහා භාවිතයට ගන්නට ඇත (Perera 2015). එක් පසක් උල් කරන ලද අස්ථි මෙවලම් සේ ම දෙපස ම උල්කරන ලද ආයුධ ද කුරගල ප්‍රාග් ඓතිහාසික මානව ආයුධ ගොන්නේ පැවති බව වාර්තා වී තිබේ. (ඇරැගම සහ සිරිසේන 2013; Roberts et al 2015; Perera 2015)

ප්‍රාග් ඓතිහාසික මානවයන් විසින් භාවිතයට ගන්නා ලද වර්ණ ආලේපන මාධ්‍ය අතර හිරිගල්, ගුරුගල්, මිනිරන් වැනි ස්වාභාවික වර්ණ සහිත ඛනිජ ඉතා වැදගත් ය. වැඩි වශයෙන් ම වර්ණ පිළිබඳ ව උනන්දුවක් දක්වන්නෝ කාන්තාවෝ ය. ශරීරය වර්ණ ගැන්වීමට බොහෝ දුරට ප්‍රාග් මානවයන් භාවිතයට ගෙන ඇත්තේ මෙවැනි ස්වාභාවික ඛනිජ හා පාෂාණ ය. උරච්චි කිරීමට ලක්කරන ලද පුරාවිද්‍යාත්මක සාධක රැසක් පාහියන්ගල, බටදොඹලෙන හා කුරගල යන පුරාවිද්‍යා ස්ථානවලින් අනාවරණය කරගෙන ඇත (Perera 2015; ඇරැගම 2017). මින් පැහැදිලි වන්නේ ලෙන් ආශ්‍රිත ව හා එළිමහන් ජනාවාසවල වාසය කරන ලද මානවයන් විසින් වර්ණ හා අභිචාර අවශ්‍යතා වෙනුවෙන් ස්වාභාවික ද්‍රව්‍ය භාවිතයට ගෙන තිබෙන බව ය. භාවිතයට ගන්නා පැහැදිලි ලක්ෂණ සහිත රතු, කහ, සුදු හා මිනිරන් අනාවරණය වී තිබේ (ඇරැගම සහ සිරිසේන 2013:26-28). ඒ අනුව අනුමාන කළ හැකි වන්නේ එම මානවයන් අලංකාරය පිණිස ගත හැකි විවිධ ක්‍රම ස්වාභාවික ද්‍රව්‍යන්ගෙන් සකසාගත් බවකි. ස්වාභාවික ඛනිජ කුට්ටි වෙනත් පාෂාණ කුට්ටියක් මත උරච්චිකිරීම මගින් වර්ණ සකසා ඇති බව අනුමාන කළ හැකි ය. උරච්චි කරන ලද ලක්ෂණ එම ස්වාභාවික ගුරුගල් හා මිනිරන් කැබලි මත දක්නට ලැබීමෙන් ඒ බව පැහැදිලි ය. 2009 පාහියන්ගල පුරාවිද්‍යා පර්යේෂණ කැණීම් ස්ථානයේ මෙලෙසින් උරච්චි කිරීමට ලක්කරන ලද බිම් පාෂාණ (Base Rock) කීපයක් අනාවරණය කරගැනීමට හැකිවිය. අතීතයේ විසූ ප්‍රාග් ඓතිහාසික මානවයන් තම වරිගයේ පිරිස අතරින් අනෙකා ඉස්මතුවීම සඳහා ශරීරයට විශේෂතා එක්කර ගත් බවක් මින් පැහැදිලි ය. ආලේපන භාවිතය මගින් බාහිර ස්වරූපයේ වර්ණයේ වෙනසක් සිදුකර ගනිමින් මෙම ඉස්මතුවීම හා කැපී පෙනීමේ ලක්ෂණ ළඟා කරගත් බවක් මෙමගින් අනාවරණය වේ. ඒ අය කාන්තාවන් හා පිරිමින් ලෙසින් වෙන්කර හඳුනාගැනීම අපහසු ය.

කාන්තාවන් වනාන්තරයේ පවතින විවිධ වර්ණ සහිත මල් වර්ග කෙබදු ලෙසකින් භාවිතයට ගෙන ඇද්දැයි බැලීම කැණීම් ආශ්‍රිත කලාපයන්ගේ පාංශු කොටස්වල පවතින පරාග, ඩයටම හා ෆයිටොලික පරීක්ෂාවකින් සිදුකළ යුතු ය. විශේෂයෙන් ම ශාක ද්‍රව්‍ය වැනි ඉක්මනින් දිරාපත්වන සාධක වසර දහස් ගණනක් පවතින්ට නම් ඒ සඳහා වූ සුවිශේෂී පරිසර අවශ්‍යතාව ද රැදී තිබිය යුතු ය. එවැනි පරිසර තත්ත්වයක් වර්තමානයේ මෙන් ම අතීතයේ දී ද තිබූ බවක් විශ්වාස කළ නොහැකි ය. ඒ සඳහා විද්‍යාගාර මට්ටමේ පුළුල් විශ්ලේෂණයක් සිදුවිය යුතු ය. යම් විටක විවිධ විශේෂ අවස්ථාවල දී කාන්තාවන් කොණ්ඩයේ සහ ගෙලේ මල් පලදා නැටුම් ඉදිරිපත් කළ අවස්ථාවල සිත්තම් ඉන්දියාවෙන් වාර්තා වී තිබේ (Wakankar 1992; ධර්මවර්ධන 2003). ශ්‍රී ලංකාව පුරා සිදුකරන ලද ප්‍රාග් ඓතිහාසික කැණීම් මගින් අනාවරණය කරගන්නා ලද ශාක ද්‍රව්‍ය භාවිත සාධක බෙහෝමයක තොරතුරු දැකගත හැකි ය. ඒ අනුව කැකුණ, ගල් වෙරළු, වල් දෙල්, ඇට් කෙසෙල්, වැනි ශාකයන්ගේ පිළිස්සුණු කොටස් වරින්වර සිදුකර ඇති කැණීම් මගින් අනාවරණය වී තිබේ. (දැරණියගල 1991: 18-22; Adikari 1998; Perera 2010). එම ශාකමය ද්‍රව්‍ය අතරින් කැකුණ, ගල් වෙරළු වැනි ශාක, ආහාර සඳහා මෙන් ම ගින්දර දැල්වීම සඳහා ද භාවිතයට ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. මේවා එකතු කිරීම කාන්තාවන් සිදුකරන්නට ඇතැයි පුරාවිද්‍යාඥයෝ අනුමාන කරති. විශේෂයෙන් ම වල්දෙල් ඇට, කැකුණ ඇට, ගල් වෙරළු වැනි දේ බිම වැටුණු පසු ප්‍රාග් මානව කාන්තාවන් ඒවා එකතු කරගෙන තම යැපෙන්නන් වෙනුවෙන් ගෙනවිත් දෙන්නට ඇත. විදෙස් රටවල ප්‍රාග් ඓතිහාසික මානව කාන්තාවන්ගේ චිත්‍ර සටහන් පිරික්සීමේ දී පැහැදිලි වන්නේ ඔවුන්ගේ ශරීරයේ ඉඟ කොටස සිහින් බවින් යුතු ව ඇඳ අති බවකි. ඔවුන් චිත්‍රයට නගන්නේ තමන් දකිනා ජීවමාන දසුන් ය. මේ හරහා කියවිය හැකි බොහෝ දේ වේ. ඉන් පැහැදිලි වන්නේ වර්තමාන කාන්තාව තරම් තරබාරු බවින් යුතු නොවීමත්, මේද ස්තරය තුනී ව පවතින්නට ඇති බවත් ය. ඒ අනුව ඔවුන් කය වෙහෙසා ශක්තිය වැය කළ පිරිසක් බව පැහැදිලි ය.


ශ්‍රී ලංකාවේ මිනිරන්, නිර්මාණාත්මක ලෙසින් භාවිතයට ගන්නා ලද අවස්ථාවක් ප්‍රාග් ඓතිහාසික යුගයේ දී හමුවන්නේ කුරගල පුරාවිද්‍යා ස්ථානයෙන් අනාවරණය කරගන්නා අදින් වසර 16000ක් පැරණි පස් ස්තරවලින් අනාවරණය වූ පබළුවකිනි (ඇරැගම 2017; 98). ප්‍රාග් ඓතිහාසික තොරතුරු විමසීමේ දි ඛනිජ ද්‍රව්‍ය (graphite) භාවිතයට ගනිමින් කළ නිර්මාණයක් අනාවරණය කර ගන්නා ලද ප්‍රථම අවස්ථාව මෙයයි. මින් පෙර පබළු භාවිතය පිළිබඳ ව වසර 47000 සිට ශ්‍රී ලංකාවෙන් අනාවරණය වුව ද ඛනිජ ද්‍රව්‍යයක් භාවිතයෙන් සිදුකළ බවට වූ සාධක අනාවරණය කරගෙන ඇත්තේ 2013 දී කුරගල කැණීමෙන් ය. මෙම පබළුව නිසැක ව ම පලඳන්නට ඇත්තේ කුමන පාර්ශ්වයක් ද යන්න පැහැදිලි නැතත් කාන්තාවන් ද මෙවැනි පබළු භාවිත කරන්නට ඇත.

විවිධ හැඩ ඇති මුහුදු බෙල්ලන්ගෙන් සෑදූ පබළු බොහොමයක් 2013 දී කුරගල කැණීම් ස්ථානයෙන් පර්යේෂණයේ දී අනාවරණය කරගෙන ඇති අතර එම පබළු කාන්තා හා පිරිමි යන දෙපාර්ශ්වය ම භාවිතයට ගන්නට ඇති බවට පැහැදිලි සාධක වේ. විශේෂයෙන් ම අදින් වසර 8000කට දින නියම වූ පිරිමි අස්ථි සැකිල්ලක් ආසන්නයේ වැඩි පබළු ප්‍රමාණයක් තැන්පත්කර තිබීම ඊට හේතුව ය (ඇරැගම 2017). ඔවුන් විසින් භාවිතයට ගන්නා ලද පෞද්ගලික ආභරණ හා පලඳන ලද විලාසිතා ද මරණින් පසු ව ඔහුට හෝ ඇයට අභිචාරයක් ලෙසින් ළං කළා විය හැකි ය. ඒ අනුව ස්ත්‍රී පුරුෂ

භේදයකින් තොර ව මරණයට ගෞරවනීය සමුදීමක් ලබා දී තිබේ. මෙමගින් මානවයන්ගේ මිනිස්කම මෙන් ම අනෙකාට ගෞරව කිරීමේ පුරුද්ද පිළිබඳ ආදර්ශ සපයයි.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය දෙස විමර්ශනාත්මක ව බැලීමේ දී නවීන මානව සාධක අදින් වසර 48,000 දක්වා පහතරට තෙත් කලාපයේ ගල්ලෙන්වලින් හමු ව තිබේ (Perera: 2010; Deraniyagala 1992; Adikari 1998). ඒ සෑම ස්ථානයකින් ම පාහේ ආභරණ කාණ්ඩයට ගැනෙන පබළු හෝ පලඳනා වර්ග හමු වී තිබේ. මේවා නිසැක ලෙසින් ම කාන්තාවන් පැලඳුවේ ද එසේත් නැත්නම් පිරිමින් පැලඳුවේදැයි සොයාගෙන නැත. ලෝක ඉතිහාසය දෙස බැලීමේ දී සාමාන්‍යයෙන් ආභරණ පැලඳීම භාවිතයට පටන් ගැන්ම සිදු වී ඇත්තේ ඉහළ පුරාශිලා යුගයේ දී ය. මානව ඉතිහාසයේ මලවුන් භූමදනය හා ඒ සමඟ පෞද්ගලික ආභරණ හා භාණ්ඩ තැන්පත් කළ පළමු පුද්ගලයා නියන්ඩර්තාල් මානවයා ය (Haviland 1993). ඒ පහළ පුරාශිලා යුගයේ දී ය. ශ්‍රී ලංකාවේ කුරගල ලෙන් සංකීර්ණයේ සිදුකරන ලද පර්යේෂණ කැණීමෙන් මුහුදු බෙල්ලන්, සත්ව අස්ථි, මිරිදිය හා ගොඩබිම බෙල්ලන්, ආදියෙන් පලඳනා සකසා ඇති බවට සාධක හමු වී තිබේ. මෙලෙස සකසා ගත් පබළු බෙල්ලේ හෝ අත්වල එල්ලා භාවිතයට ගතහැකි අයුරින් මධ්‍ය සිදුරු කර ඇති අතර ඒවා සඳහා කලාත්මක හැඩතල ද එකතු කර තිබීම විශේෂත්වයකි (ඇරැගම 2017).

උක්ත කරුණු මතින් පිළිබිඹු වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ස්ත්‍රි ද පුරුෂ ද යන බව පැවැත්ම සඳහා කිසිඳු ගැටලුකාරි තත්ත්වයක් ඇති නොකරන බවයි. එහි දි ප්‍රාග් මානවයා වෙත ස්වභාවධර්මයෙන් ලබා දී තිබූ කාර්යය මැනවින් ඉටුකළ බවක් පැහැදිලි ය. සැමවිට ම ඔවුන් ප්‍රාග් ඓතිහාසික සමාජය වෙනුවෙන් පවත්නා පරිසරය හා සම්පත් කළමනාකරණයෙන් යුතු ව යුතුකම් ඉටුකරමින් දිගු ගමනක් පැමිණ ඇත්තේ කාන්තා පුරුෂ භේදයකින් තොර ව ය. කුමන අයුරින් ලෝකයේ සමස්ත සමාජ ක්‍රියාවලිය වෙනස් වුව ද, මානව පරිණාමය කෙබඳු ලෙසින් සිදු වුව ද, විවිධ සංස්කෘතීන් එකතු වුව ද, විවිධ ජන කොට්ඨාසවලට වෙන් වුව ද කාන්තාවගේ කාර්යභාරය සිදුවීම්වලින් වෙනස්කම් දැක්වුව ද වෙනසක් සිදු වී නැත. මවගේ කාර්යය වගකීම, සෙනෙහස, දයාව, කරුණාව, වෙනස් වී නැත. අද සමාජය ස්ත්‍රී පුරුෂ භේදය හුවා දක්වමින් කාලය ගෙවා දමමින් සිටින්නේ අනෙකාට නිහතමානි ව ගරුකිරීමට ඇති මැලිකමයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ කාන්තාවගේ කාර්යභාරය විමසීමෙන් පැහැදිලි වන්නේ ස්වභාව ධර්මය විසින් එම ජන කොට්ඨාස වෙත ශරීරයට කාවද්දන ලද යුතුකම් හා වගකීම් ඔවුන්ගේ ශක්ති පමණින් ඉටුකර ඇති බවකි. එලෙස නොවී ඔවුන් ස්ත්‍රි පුරුෂ භේදයෙන් යුතු ව කුලල් කාගත්තේ නම් අද වනවිට ලෝකය තුළ ඉතිරිවන්නේ කිසිවෙකුත් නොදන්නා පාලු හා වනගත පරිසරයකින් යුතු සතුන් පමණක් ජීවත්වන පරිසරයක් විය හැකි ය.




ඉන්දියානු ප්‍රාග් ඓතිහාසික චිත්‍ර (උපුටා ගැනීම - **www.google**)






ඉන්දියානු ප්‍රාග් ඓතිහාසික චිත්‍ර (උපුටා ගැනීම - **www.google**)



ටැන්සානියාවේ ලෙටෝලි පා සටහන් (හොමිනේඩි වානර මානවයා)
(උපුටා ගැනීම - **www.google**)



**ටැන්සානියාවේ ලෙටෝලි පා සටහන් (හොමිනේඩ් වානර මානවයා)**
**(උපුටා ගැනීම - www.google)**







ටැන්සානියාවේ ලෙටෝලි පා සටහන් (හොමිනේඩි වානර මානවයා)
(උපුටා ගැනීම - **www.google**)



මුහුදු සිප්පි - කුරුවිට බටදොඹලෙන **(Perera 2010)**



මුහුදු සිප්පි පබළුවක් - කුරුවිට බටදොඹලෙන **(Perera 2010)**




**කුරගලින් හමුවූ පබළු (ඇරෑගම 2017)**





කුරගලින් හමු වූ අස්ථි මෙවලම් (ඇරැගම 2017)




**ආලේපන හෝ වර්ණ සඳහා භාවිතයට ගත් කුරගලින් හමු වූ**

**ග්‍රැෆයිට් ඛණිජ කැබලි (ඇරැගම 2017)**




**කුරගලින් හමු වූ භාවිතයට ගන්නා ලද ආලේපන හෝ අභිචාර සඳහා යොදාගත්**

**විවිධ වර්ණ ගුරුගල් කැබලි (ඇරැගම)**

## මූලාශ්‍රය


ඇරැගම, එච්. එම්. එස්. කේ. සහ සිරිසේන, ඩබ්ලිව්. ඒ. කේ. එන්. (2013). **කුරගල පර්යේෂණ කැණීම**. (අප්‍රකාශිත), කොළඹ 07ː පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ඇරැගම. එච්. එම්. එස්. කේ. (2017). **කුරගල ප්‍රාග්ඓතිහාසික මානවයාගේ ජීවන රටාව පිළිබඳව අධ්‍යයනයක්**. (විද්‍යාපති උපාධි නිබන්ධය), අප්‍රකාශිත, කොළඹ 07ː පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

විජයතුංග, හරිස්චන්ද්‍ර. (1958) **පොළවේ කතාන්දරය**. මහරගමː සමන් මුද්‍රණාලය.

ධර්මවර්ධන රේෂාණි. (2003). 'ඉන්දියාවේ මෙසොලිතික ලෙන් සිතුවම් ආශ්‍රයෙන් හෙළිවන ජන සමාජය' **වසුන්දරා**, අටවන කලාපය, කැලණිය විශ්වවිද්‍යාලය.

කුලතිලක, සමන්ති. (2008). **මානව අතීතය III, නූතන මිනිසාගේ සම්භවය හා පරිණාමය**. මහරගමː තරංජි ප්‍රින්ටර්ස්.

කුලතිලක, සමන්ති. (2013). **මිනිසා සත්ත්වයෙකි, භෞතික මානව විද්‍යා පිවිසුම**. මහරගමː තරංජි ප්‍රින්ටර්ස්.

දැරණියගල, එස්. යූ. (2003) 'ප්‍රාග් ඓතිහාසික සබරගමුව', **සබරගමු වංශ කථාව- 1 වෙළුම**. සබරගමුව පළාත් සභාව. (193-221).

දැරණියගල, එස්. යූ., (1991). 'ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය', **පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා අංක 1**, කොළඹ 07ː පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

Adikari, G. (1994). *Excavations at the SigiriyaPotana cave complex: a preliminary account. In Senake Bandaranayake and Mats Mogren* (eds), *Further Studies in the Settlement Archaeology of the Sigiriya-Dambulla Region*, pp. 65-68. Colombo: Postgraduate Institute of Archaeological Research.

Adikari. G. (1998). *Aspect of prehistory of Sigiriya-Dambulla Region, unpublished, Thesis submitted for the degree master of Philosophy* (M. Phil.) PGIAR University of kelaniya.

Deraniyagala, S. U, (1992). *The Prehistory of Sri Lanka an Ecological Perspective, vol I & II,* Sri Lanka: Department of Archaeology.

Haviland. W. A, Aultural Anthropology. (1993). *University Of Verment*. Harcourt Brace College Publication. (53-80)

Perera, H. N, (2010). *Prehistoric Sri Lanka, Late Pleistocene rock shelters and an open air site*. Bar international series.

Perera, H. N, (2013). *Kuragala excavations, Field report to the derector-general of archaeology*. Department of Archaeology.

Perera. H. N, (2015). *The importance of Sri Lanka wet Zone Rock Shelters*. **එකසිය විසිපස් වසරක පියසටහන් (පුරාවිද්‍යා ශාසත්‍රීය සංග්‍රහය)**, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය. (104-117)

Roberts, Patrick., Nimal Perera, Oshan Wedage, Siran Deraniyagala, Jude Perera, Saman Eregama, Andrew Gledhill, Michael D. Petraglia, Julia A. Lee-Thorp1. (2015) human paleoecology Direct evidence for human reliance on rainforest resources in late Pleistocene Sri Lanka, (1246-49)

Wakankar, V.S. (1992). *Rock Painting in India*. InLorblanchet,M.(ed) Rock Art in the Old World, Thomson Press, New Delhi.

Harrison, Terry (27 January 2011). Paleontology and Geology of Laetoli: Human Evolution in Context: Fossil Hominins and the Associated Fauna. **2**. Springer Science & Business Media. pp. 141–188.

David A. Raichlen; Adam D. Gordon; William E. H. Harcourt-Smith; Adam D. Foster; Wm. Randall Haas, Jr (2010). "Laetoli Footprints Preserve Earliest Direct Evidence of Human-like Bipedal Biomechanics".

https://www.google.com/www.openart.in history Frock-art-from-india

https://www.google.com/imgres www.bradshawfoundation.com india central_india himbetka 20a.jpg&imgrefurl www.bradshawfoundation.com india central_india

# සීගිරි කුරුටු ගීයෙන් හෙළිවන සමකාලීන කාන්තාව හා සමාජය

**එම්.පී. අංජන ලක්ෂාන් චතුරංග**[1]

ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී ඒ සඳහා උපයෝගී කොටගත හැකි මූලාශ්‍රය විශේෂයන් අතර අභිලේඛන මූලාශ්‍රයවලට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. සාහිත්‍යය මූලාශ්‍රයගත සාධක සනාථ කිරීම, එම කරුණු මුළුමනින් ම ප්‍රතික්ෂේප කිරීම, ඌන පූර්ණ සැපයීම හෝ නව තොරතුරු අනාවරණය කරගත හැකි වීම මෙම අභිලේඛන මූලාශ්‍රයවල පවත්නා සුවිශේෂ ලක්ෂණ ය. ශ්‍රී ලංකාවේ අභිලේඛන අතර ක්‍රිස්තු පූර්ව යුගයට අයත් මුල්කාලීන බ්‍රාහ්මී ශිලාලේඛන බොහෝවිට ආගමික තොරතුරු සඳහා සීමා වුවත් කල්යත් ම එම ශිලාලේඛනවල මෙරට සමාජ, සංස්කෘතික තොරතුරු බහුල ව අන්තර්ගත වන්නට විය. එකී අභිලේඛන අතර සීගිරි කුරුටු ගීයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයක් යැයි කීම සාවද්‍ය නොවේ.

සීගිරි සිතුවම් මෙන් ම සීගිරි කුරුටු ගී ද ඉපැරණි සිංහල සංස්කෘතියේ විශිෂ්ටත්වය ප්‍රකට කරවයි. ක්‍රි.ව. 6 වන සියවසේ අග භාගයේ පමණ සිට ක්‍රි.ව. 13 වැනි සියවස පමණ දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ලියැවෙන්නට ඇතැයි විශ්වාස කෙරෙන සීගිරි ගී සිංහල පද්‍ය සාහිත්‍යයේ අපූර්වතම නිර්මාණයෝ වෙති. සීගිරි කැටපත් පවුරේ ගී ලියූ බොහෝ කවීන්ගේ මුඛ්‍ය වස්තු විෂය වූයේ සිතුවම් කර තිබෙන සජීවී භාවාත්මක කාන්තා රූපයි. සීගිරි මාළිගය, වැව් පොකුණු, උද්‍යාන වැනි කරුණුවලට වඩා මෙම කාන්තා රූප කවීන්ට වඩා ආකර්ෂණීය වීම ඊට හේතුවයි. එසේ වුවත් සිංහ රුව, පොකුණු, වන උයන් ආදිය ද ඇතැම් කවීන්ට වස්තු විෂය විය. නමුත් බොහෝ දෙනා ඇලුම් කළ සිතුවම්ගත කාන්තා රූපවලට වඩා සීගිරියට ආ ගිය ජීවමාන කාන්තාවට වසඟ ව ඇය උදෙසා කවි ලියූ කවීන් ද වූ බව පැහැදිලි ය. එසේත් නැතිනම් සීගිරි බෙයදෙහි ඇඳ තිබෙන රන්වනුන් හෝ නිල්වනුන් හෝ පිළිබඳ ව නොව සමකාලීන සමාජයේ සිටි සීගිරියේ සිරි නැරඹීමට පැමිණි සාමාන්‍ය කාන්තාවන් පිළිබඳ හඳුනාගත හැකි සීගිරි කුරුටු ගී ද වේ. එබැවින් අතළොස්සක් වූ එම සමකාලීන කාන්තාව පිළිබඳ ව කියවෙන සීගිරි ගීවලින් හඳුනාගත හැකි කාන්තාව හා ඇයට හිමි ව තිබූ සමාජ තත්ත්වය කෙබඳු ද යන්න පිළිබඳ සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය.

සීගිරිය වර්තමාන පාලන බෙදීම් අනුව මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. වියළි කලාපයට අයත් උතුරු තැනිතලාවේ (මධ්‍ය කඳුකරයට මායිම් ව) දකුණු පස සීමාවේ පිහිටා ඇත. සීගිරිය වනාහි රජරට සම බිමෙහි දකුණු අන්තයේ පිහිටි හුදෙකලා පර්වතයකි. පර්වතය, බයෝටයිට් හා ගානටයිෆෙරස් නයිස් පාෂාණයෙන් නිර්මිත ය. පර්වත මස්තකය මුහුදු

[1] සහය කථිකාචාර්ය
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
anjanalakshan1995@gmail.com

මට්ටමෙන් මීටර 360ක් උසැති ය. වටා වූ බිමෙහි සිට පර්වත මස්තකයට උස මීටර 200ක් පමණ වේ (Bandaranayake 1984:22).

සීගිරිය පිළිබඳ ඓතිහාසික පසුබිම හඳුනා ගැනීමේ දී අනුරාධපුරයෙහි රාජ්‍ය කළ ධාතුසේන රජුගෙන් (ක්‍රි.ව.463-476) රාජ්‍යය පැහැර ගත් ඔහු පුත් පළමුවන කාශ්‍යප (ක්‍රි.ව.479-497) සීගිරිය නම් වූ ප්‍රතාපවත් බලකොටුව නිර්මාණය කිරීමත් අටළොස් වසරක් රාජ්‍යය විචාරා මියයාමත් සම්බන්ධ ව වංශ කතාවේ සඳහන් තොරතුරු විමසා බැලිය යුතු ය. ඒ පිළිබඳ වංශ කතාවේ සඳහන් විස්තරය මෙසේ ය.

> හින්න මාතෘක කසුප් ය. සමාන මාතෘක මහා බල ඇති මුගලනැ යි උහු පුතුන් දෙදෙනෙක් වූහ. එසේම (දුටුවන්) සිත් අලවන්නා වූ එක දුවක් ද වූවාය. ඒ රජතෙමේ බෑණා හට සේනාපති තනතුර හා ඇය දිනි. ඒ සෙනවිරත් වනාහි සැමිටියෙන් දොසින් විනාම ඇත්තේ කලවාහි තැලී ය. රජතෙමේ දියණියන් ලෙහෙ වැකුණු පිළිදැක එබව දැන කිපී උහු මව නග්න කොට දැවී. එතැන් පටන් බඳනා ලද වෛර ඇති ඒ සෙනවිරත් කසුප් කුමර හා එක්ව රාජ්‍යයෙන් උහු පොලඹවා පියා කෙරෙහි බිඳුවා ජනයා මිත් කොටගෙන ජීවග්‍රහයෙන් රජුහු ගැන්වී. ඉක්බිති කසුප් කුමර ලබන ලද සියලු පවිටු යහළුවන් ඇත්තේ පිතෘ පාර්ශ්වික මිනිසුන් නසා සේසත් නැගී. අනතුරු ව මුගලන් කුමරා උහු හා මහා යුද කරනු කැමැත්තේ බල නොලත් බැවින් ඒ සඳහා දඹදිවට ගියේ ය. මහා ජනයාගේ විනාශයෙන් ද මිත්‍ර වියෝගයෙන් ද දඟ ගෙයි විසීමෙන් ද දුක්පත් වූ රජහු දුක් කරවනු පිණිස නැණැති ඒ සෙනවිරද්දු දුක් නින්දිත කසුප් රජු හට රජ්ජුරුවන් වහන්සේ ඔබ පියරජහු විසින් රජ කුලයෙහි නිදන් රක්නා ලද්දාහ'යි කී කල මහරජ මුදු සිත් නොදන්නෙහි හේ තෙමේ මුගලන් කුමරහට නිදන් රකිය'යි උහුට කීහ. ඒ අසා කිපියා වූ නරාධම තෙමේ නිදන් තැන් කියව'යි රජුහු කරා දූතයන් යැවී ය (මහාවංශය 38:80-92).
>
> ඉක්බිති පවිටු වූ කසුප් නම් ඒ රජතෙමේ අස් ගොව්වා ද අරක්කැමියා ද යවා මල් මුගලන් කුමරු මරවනු නොහැකිව මින් බිය ව සීගිරට ගියේ ය. මිනිසුන් විසින් නැංග නොහෙන ඒ පව්ව සිසාරා සිද්ධ කරවා පවුරෙකින් පිරිකෙව් කොට එහි ගිනිගෙවල් සිංහයන් බඳු කරවී ය. එහෙයින් සීගිරි නම් වී. හේතෙමේ වස්තු රැස්කොට එහි සුරැකි ව තබා තමා තැබූ ඒ වස්තු ඒ ඒ තැනින් ආරක්ෂා කොට තබා එහි දැකුම් කටයුතු සිත්කලු රජ ගෙයක් දෙවෙනි ආලකමන්දාවක් සේ කොට වෙසමුණු මහ රජහු සෙයින් විසී ය.
>
> ඉන් අටළොස් වන වස්හි මනා හට මුගලන් කුමර තෙමේ නිවටුන් ආශ්‍රයෙන් අහු වූ දොළොස් යහළු කෙනෙක් ඇත්තේ දඹදිවින් මෙහි අවුත් දඹකොළ පටුනෙහි පොරෝ වෙහෙර බල ඇණි බැන්දේ ය. රජතෙමේ එපවත් අසා උහු ගෙන කමැ'යි කියා නිමිත්ත පාඨකයන් විසින් නොහැක්කැ'යි කියාදින් මහා බල ඇති ව නික්මිණ.

> මුගලන් කුමරු ද සැරසුණු බලසෙන් ඇති ව සූරසෙන් යහළු කොට ඇත්තේ අසුර සමර වදනා සක්දෙව් රජහු සෙයින් අභිමුඛ විය. කසුප් රජ ඉදිරියෙහි මහා මඩවලෙක් දැක අනෙක් මගකින් යන්නට ඇතු පෙරලී ය. උෟ දැක උහු සේනා තොමෝ කොල, අප හිමියා මේ පලාගියේ'යි අරගල කළහ. ඒ කසුප් රජ සිරියෙන් සිය හිස සිඳ අහසට තමා සිරි කොපුවෙහි බැහී ය. ඒ මුගලන් කුමරු උහුලෝ ක්‍රියාවෙහි පැහැද ආදාහන කිස කොට සියලු උපකරණ ගෙන උතුම් නුවරට හෙවත් අනුරාධපුරයට ආහ (එම 39:1-28).

සීගිරි පව්වේ බටහිර බෙයදෙහි අද ද ජීවමාන ව දැක ගත හැකි කැටපත් පවුරත් එහි ලියා ඇති කුරුටු ගීත් සිංහල සංස්කෘතියේ කැඩපතක් බඳු ය. කැටපත් පවුරෙහි ලියා ඇති ගී අතර එන සියලු ගී ලියා ඇත්තේ සීගිරියෙහි ඇඳ තිබෙන ස්ත්‍රී සිතුවම් පමණක් ම අරමුණු කොට නොවේ. එබැවින් එම කුරුටු ගීවලින් කියවෙන පරිදි ඒවා විවිධ තේමා යටතේ නිර්මාණය කර තිබෙන බව හඳුනාගත හැකි ය. සීගිරි සිතුවමින් නිරූපිත අඟනන්, මාලිගය, කැටපත් පවුර, සිංහ මූර්තිය, පොකුණු, මංපෙත්, අවට පරිසරය, සීගිරිය නැරඹීමට පැමිණි ජීවමාන කාන්තාවන් හා පුරුෂයන් ඒ අතර ප්‍රමුඛ වේ.

කාන්තාවන් අරබයා කැටපත් පවුරේ ලියා ඇති සියලු ගී සීගිරි ළඳුන් උදෙසා ම ලියැවිණි ද යන්න හඳුනා ගැනීමේ දී ඇතැම් සීගිරි කුරුටු ගී සීගිරි ළඳුන් සඳහා ම නොවන බව පැහැදිලි වේ. එබඳු සමකාලීන සජීවී කාන්තාවන් විෂයෙහි සීගිරි ගලේ ගී ලියවුණේ මන්ද යන ගැටලුවට පිළිතුරු කැටපත් පවුර මත ගැබ්වී ඇත. ඒ පිළිබඳ සෙනරත් පරණවිතාන මෙසේ ප්‍රකාශ කොට ඇත.

> It will thus be seen that authors of our verses not only belonged to various stations in social life, but also hailed from places far distant from one another. A question that might arise is whether it was sightseeing alone that drew them to sigiri. In this connection it may perhaps be not too far – fetched to mention that, in ancient India, the rocks. In such festivities, called " Giragga-samajja" there may even have been theatrical performances of some sort. Could the writers of our stanzas have visited sigiri to attend a festival corresponding to the old giragga-samajja, probably celebrated annually? The information supplied incidentally by some of our verses for instance No.174 that in those days visitors come to sigiri in large crowds is not in consistent with such a surmise.

> මේ අනුව බලන කල අපගේ ගී රචකයන් සමාජ ජීවිතයේ විවිධ තරාතිරම්වලට අයත් වූවන් පමණක් නොව ඔවුන් එකිනෙකට බොහෝ දුර බැහැර පළාත්වලින් පැමිණියවුන් බව ද පෙනී යයි. මෙහි දී පැන නගින ප්‍රශ්නයක් නම්, ඔවුන් මෙසේ පැමිණියේ හුදෙක් සීගිරිය නැරඹීම සඳහා ම පමණක් ද යන්නයි. මේ ගැන විමසීමේ දී ඉන්දියාවේ පැවති ගිරි මුදුන්වල උත්සව පැවැත්වීමේ සිරිත ගැන සිතා බැලීම අදාළ නොවෙතැ'යි කිව නොහැකි ය. "ගිරග්ග සමජ්ජ" නමින් හැඳින්වුණු මේවා නොයෙකුත් නැටුම් ගැයුම් ආදියෙන් සමන්විත ක්‍රීඩෝත්සවයක් විය. එමෙන් ම මේ අවස්ථාවල කිසියම් ආකාරයක නාට්‍යමය සන්දර්ශන

පවා පවත්වන්නට ඇත. ඇතැම් විට සීගිරියේ වාර්ෂික ව පවත්වන්නට ඇතැයි සිතිය හැකි පුරාණ ගිරග්ග සමජ්ජ උත්සවවලට සමකළ හැකි උත්සවවලට සහභාගී වීමට අපගේ කාව්‍ය රචකයන් පැමිණියැ'යි සිතිය නොහැකි ද. ගීවලින් අහම්බෙන් ලැබෙන තොරතුරු අනුව (නිදසුනක් වශයෙන් 174 වන ගීය) එකල සීගිරියට විශාල වශයෙන් පිරිස් පැමිණි බව අනුමාන කිරීමට නුසුදුසු නොවේ (ලොකුබණ්ඩාර 2019 78-79).

ගිරග්ගසමජ්ජ වැනි උත්සව සඳහා හෝ එසේ නොවන උත්සවයක් සඳහා හෝ මහජනයා සංගීත භාණ්ඩ ආදිය වාදනය කරමින් සීගිරි කඳු මුදුන මත කෙළිදෙලෙන් කාලය ගත කළ බව 356 වන සීගිරි ගීය තුළින් මනාව පැහැදිලි වේ. එබැවින් මෙම ප්‍රීති උත්සව සඳහා රූ සපුවෙන් අගතැන් කාන්තාවන් ද සහභාගී වන්නට ඇත. ඊට සමගාමී ව පිරිමින් රූමත් ගැහැනුන් සමඟ පෙම් බස් දොඩන්නටත් ඔවුන්ගේ සම පාර්ශ්වය සමග විනෝදයෙන් කාලය ගත කරන්නටත් වූ බව ඇතැම් සීගිරි කුරුටු ගීවලින් මනාව පැහැදිලි වෙයි. මෙබඳු විවිධාකාර වූ අවස්ථාවල ජීවමාන කාන්තාවගේ විවිධ ස්වරූප සීගිරි ගීයට නැගී ඇත.

"හර්ෂදේව"යන නාමයෙන් පෙනී සිටින කවියා විසින් ලියන ලද ගීයට අනුව ඇය මහනෙල් මලක් අතින් ගෙන සිටි තැනැත්තියකි (Paranavithana 1956:405).

*"මට හො අත දියමිනි මනාකොට ගිය හැක්කැජ්*
*ම අස්වැසී බෙයඥ් [හි] - (2) ඥි මහනෙල් අති[න් ග]ත්ති*
*ශ්‍රී හ[ෂී]-දෙවැමි" (659 ගීය)*

**අර්ථය:** බෙයදෙහි සිටි මහනෙල් අතින් ගත් ඕතොමෝ, (තමා හට) මනා ලෙස ඇවිද ගිය හැකි නමුත් මට තම අත දී යමින් මා ඇසුවා ය.

මෙම ගීයෙහි සඳහන් පරිදි ඇය සීගිරිය නැරඹීමට පැමිණි ජීවමාන කාන්තාවක් ය. සීගිරි අප්සරාවන් මෙන් ඇය ද මහනෙල් මලක් අතින් ගෙන සිටින්නී ය. එබැවින් සීගිරි ළඳුන්ගේ කේශ කලාපය, මාල පලඳනා, අතින් ගත් මල් ආදිය කවීන්ගේ වර්ණනයට ලක් වී ඇත්තේ එකල ජීවමාන කාන්තාව ද එම විලාසිතා අනුකරණය කළ නිසා යැයි සිතිය හැකි ය. සීගිරි අප්සරාවන්ගේ වේශ නිරූපණයෙන් සැරසී සීගිරි බෙයදේ පැවති උත්සවවලට සහභාගී වීම පුරුෂයන්ගේ ප්‍රසාදයට පත්වන්නට හේතුවක් බව දැන සිටි එකල ජීවමාන කාන්තාව තමාට තිබූ උසස් ම රෙදිපිළි ආභරණවලින් සැරසී සිටි බව නම් නොරහසකි.

සීගිරි කුරුටු ගී අතර එන "කයබුරෙ සෙන්" නමැති පැවිදි කවියෙකු විසින් ලියන ලද ගීයෙන් ද උක්ත අර්ථය ම ගෙන එයි. එම ගීයට වස්තු විෂය වී ඇත්තේ සීගිරිය නැරඹීමට පැමිණි මහනෙල් මලක් අතැති නව යොවුන් තරුණියකි (Paranavithana 1956:245).

*"බඳු බැ[මැ] නිම්පත්තෙක්හි [සඳ] හය් එක් වනා*
*එම පැරයූ ළඳරිය තොල්හි ළ[ප]ලු න[ා]*
*ළගොබ්පතක් බඳු මහනෙල් ලමු කරනා*
*ම හය් කල් යෙහෙළි කී දිග අත් (සලමි) නා*
*කයුබුරෙ(සෙ)න් පැ(වි)ජ්ජ(මි)"   (394 ගීය)*

**අර්ථය** : ඇගේ බැම කොසඹ පත්‍රයක් බඳු ය. ඇගේ මුහුණ චන්ද්‍රයා හා සමාන ය. ළඳැරියගේ තොලින් නා දලුව පරදවන ලදී. මහනෙල් මලක් එල්බෙන අතින් යුතු, ළා දලුවක් බඳු පියකරු ය. යෙහෙළි තොමෝ දිගු අත් සලමින් (මෙසේ) මා සමග කීවා ය. කයුබුරෙ (වසන) සෙන් (නමැති) පැවිද්දා වෙමි. මෙම ගීයෙහි ඇති විශේෂත්වය නම් සීගිරි අප්සරා රුවකට සමාන ව යෙහෙළියගේ රූ සපුව ද කවියා වර්ණනය කර තිබීමයි. කවීන්, අතින් මල් ගත් සීගිරි අප්සරාවන් ගැන බොහෝ තැන්වල සඳහන් කරයි. එසේ ම යෙහෙළිය ද මහනෙල් මලක් අතින් ගෙන සිටින්නී ය. කවියා ඇය "යෙහෙළිය" යනුවෙන් හඳුන්වා ඇත්තේ ඇතැම් විට මින් පෙර දෙදෙනා හඳුනන නිසා ද විය හැකි ය. තම ආදරණීය භාර්යාව සමඟ සීගිරි බැලීමට පැමිණි පුරුෂයෙකු විසින් ලියන ලද පහත දැක්වෙන ගීයෙන් ද නිරූපිත ය. ඒ අනුව ඔහු සිය භාර්යාව සමඟ විනෝද වීමට සීගිරියට ආ බවක් හඳුනා ගත හැකි ය (පෙරේරා 2008:316).

*"ලබුතිරීයෙන් මා ලී ගනතයි සවලී*
*ගළවමිනි මලක් ආ(ත)බ(ය්) එහි රනවනතට" (365 ගීය)*

**අර්ථය** : මාගේ භාර්යාවගේ එල්බෙන උතුරු සළුවෙහි බහා ගත් සවලී මලක් ගළවමින් එහි (සිටි) රන්වනුන් (සඳහා) තබා ආවෙමි.

සීගිරි ගී ලියූ බොහෝ කවීන් පුරුෂයන් වූ අතර බොහෝ විට ඔවුන්ට ගී ලිවීමට වස්තු විෂය වූයේ සීගිරි බෙයදෙහි සිතුවම්ගත කාන්තා රූපයයි. නමුත් උක්ත ගීය ලියූ පුරුෂයාට නිමිත්ත වූයේ ඔහුගේ භාර්යාවයි. ඇය තුළ තිබූ මානව හිතවාදී ගුණය වූ බෙයදෙහි තනි වූ රන්වන් අප්සරාවක් වෙනුවෙන් මලක් තැබීම, සිය පුරුෂයා අගය කර ඇත. එසේ ම එමගින් කවියා සිය භාර්යාව කෙරෙහි දැක්වූ ගෞරවනීය හැඟීම ද මැනවින් පෙනී යයි.

සීගිරි ගී ලියූ කවීන් අතර කිවිඳියෝ ද වූහ. "දයල්" නමැති එක් කාන්තාවක තමා මූලිකකොට ගෙන ලියූ ගීයක් වේ. මෙම ගීය වූ කලී ඇය ම තමා පිළිබඳ කළ ප්‍රකාශනයකි (Paranavithana 1956:244).

*"දයල්මි මය් ගී*
*වල්විජ්නා පෙරෙටි මිණි පැය් දිග් ඇස්සක්*
*ගත් අතැ රන්සොලුයෙන් තොමොලීය් මෙ රනදම් පැලැන් දී"   (392 ගීය)*

**අර්ථය:** දයල්මි වූ මාගේ ගීතයයි. වල්විදුනාව අබියස මිණිකැට දැරූ සෙයක් පෑ රන් පටියක් අතින් ගෙන රන්දමින් හොබනා දිගැසිය තමා ම මේ ගීය ලියුවා ය.

මෙහි දී "වල්විදුනාව" නම් කේශ කලාපය බව ද "මැණික" නම් දෑස් බව ද සෙනරත් පරණවිතානගේ මතයයි. නමුත් ඇතැම් විචාරකයන් වල්විදුනාව යන්නෙන් ප්‍රකාශ වන්නේ කේශ කලාපය නොව කාන්තාවන් පවන් සැලීමට යොදාගන්නා විජිනිපත බවට අර්ථ දක්වා ඇත. ඉන් පැහැදිලි වන්නේ මෙම ගීය ලිවීමෙන් ඇය ම ඇගේ රූ සපුව වර්ණනා කිරීමට උත්සාහ දරා ඇති බව ය.

සීගිරියට පැමිණි කාන්තාවන් කිහිප දෙනෙකුගේ සාමූහික දායකත්වයෙන් ලියැවුණු ගීයකි. මෙම ගීයෙහි එක් කාන්තාවකගේ හෝ නම් ගම් ආදිය ලියා නොමැති මුත් ඔවුන්ගේ හැසිරීම මෙමඟින් මනාව ප්‍රකාශ වෙයි (Paranavithana 1956: 166).

*"අග්නු (වී) හිමියම්බුයුට ගී*
*කළ සිව් (තැ)නින් ගී ගොණෙන ආ සිහිගිරි*
*මුත් කී නො කිසි අස ගුලු අපට දුන් අබයුස්"* (272 ගීය)

**අර්ථය** : කාන්තාවන් වන අප විසින් අඟනුන්ට ගයන ලද ගීතයයි. සීගිරියට පැමිණි එම්බා මෝඩයනි, සතර උපායකින් (තෙපි) ගී කීමුත් ස්ත්‍රීන් (වන) අපට අස්-ගුළු ආදිය දුන් කිසිවෙක් නැත.

මෙම ගීය හරහා සමකාලීන සමාජයේ කාන්තා භූමිකාව හා බැඳි වෙසෙස් සමාජ පැතිකඩක් විග්‍රහ වෙයි. එනම් මෙම ගීයට අර්ථ සපයන සෙනරත් පරණවිතාන මෙහි සඳහන් "ආස" හා "ගුලු" යනු මත්ද්‍රව්‍ය විශේෂ ද්විත්වයක් වන බව විග්‍රහ කර තිබේ. එසේ ම "ආස" හෙවත් "ආසව" යනු මත්පැන් විශේෂයක් බව නන්දසේන මුදියන්සේගේ මතයයි. පුළුල් සමාජ පැතිකඩක් මැනවින් විශද කරවන මෙම ගීයෙන් සමකාලීන සමාජයේ පුරුෂ පාර්ශ්වය මෙන් ම කාන්තාවන් ද මත්ද්‍රව්‍ය භාවිතයට හුරුව සිටි බව හඳුනාගත හැකි ය. එසේ නැතිනම් ඔවුන් මතින් මත් වී පුරුෂයන් ඇසුරු කළ අභිසාරිකාවන් නො වූවා යැයි නො කීමට ද නුපුළුවන.

සීගිරි සිරි නැරඹීමට පැමිණි බොහෝ කාන්තාවෝ ද වූහ. ඒ අතර වල්විදුනා (පවන් පත්) අතින් ගත් අය ද වූ බව මෙම ගීයෙන් පැහැදිලි වෙයි (Paranavithana 1956:238).

*"සමනාහිමියන (ගැ)ගි*
*මෙයට එන මදනල වල්විජ්නා සියල්ලෙනි*
*සෙය් මෙ අය් (ග)ත ලියයුන ග(ල්) බෙයද ආ මු(දුන)ට"* (382 ගීය)

**අර්ථය** : සමනා (නම්) හිමියන් ගැයූ ගීය. මෙතැනට එන මද නල මේ ගල් බෙයද මුදුනට පැමිණි කාන්තාවන් ගත්තා වූ වල්විදුනා සියල්ලෙන් ආ සේ ය.

සීගිරි පව්ව මුදුනට නැගි කාන්තාවන් අති විශාල ප්‍රමාණයක් වූ බව මින් විග්‍රහ වේ. එසේ නොවන්නට කඳු මුදුන මතින් හමා යන සුළඟ කාන්තාවන් සිය විඩාව නිවා ගැනීමට විජිනිපතින් පවන් සලන විට ඇතිවන පවන් පොදට සමාන නොකරනු ඇත. එබැවින් සීගිරියට පැමිණි ජීවමාන කාන්තාවෝ බොහෝ දෙනෙක් විජිනිපත් අතැතිව සිටියහ'යි කීම සාවද්‍ය නොවේ.

"විජුර් අග්බෝ" නම් පැවිද්දෙකු විසින් ලියන ලද ගීයෙන් ද සීගිරිය නැරඹීමට කාන්තාවන් බොහෝ සෙයින් පැමිණි බවත් ඔවුන්ගේ ස්වභාවයත් තවදුරටත් පැහැදිලි කරවයි (Paranavithana 1956:231).

*"විජුරක්බො පැවිජ්ජන් ලි[මෙ] ගී*
*[ෙ]නලෙන් [වී]පිරිපත නළල කෙහෙ පිහිටි හුණු*
*ලදම ගෙනැ ලීය් විසිරි බියපත් වැ අප බෙයඤ නැගියෙ" (*372 ගීය)

**අර්ථය :** සුළඟ නිසා බාධා ඇති විය. නළලෙහි කෙස් පිටුපසට විසිවිය. (සුළඟ) මල්දම ගෙන විසිරලී ය. අපි බියට පත්ව බෙයඳ නැග්ගෙමු.

අග්බෝ නම් හිමි සුළඟ නිසා කාන්තාවන්ට වූ ආදීනව දැක බියපත් ව වහා ම බෙයඳට නැඟගත් බව මින් කියැවේ. මල් දම සුළඟට කැඩී විසිරී ගිය බව දක්වා තිබීමෙන් කාන්තාවන් මල්මාලා පැලඳ සිටි බව හෝ කාන්තාවන් සීගිරි නැරඹීමට පැමිණීමේ දී මල් හෝ මල්මාලා රැගෙන ඒම සිරිතක් ව පැවති බව හෝ සිතිය හැකි ය. නො එසේ නම් සමකාලීන කාන්තාව සීගිරි බෙයඳෙහි සිතුවම්ගත අප්සරාවන් අනුකරණය කළා ද විය හැකි ය.

සීගිරි කුරුටු ගී අතර එන "වැලිගම වැසි අග්බෝ" නමැත්තා විසින් ලියන ලද ගීය සමකාලීන කාන්තා භූමිකාවෙහි තවත් එක් සමාජ පැතිකඩක් විග්‍රහ කරවයි. එම ගීය වූ කලී රජක ස්ත්‍රියක පිළිබඳ ව කියැවෙන්නකි (Paranavithana 1956:254).

*"පිළි අපුලන තොට් නැත්තෙන් හළුගර් නැත්තෙන්*
*වැ[දැ] වෙසෙය් රිදියන් බෙයඳ්හි රන්වනුන් අතුරෙ*
*වැලිගම් [වැ]සිඅග්බො හිමි ලිමි ගී" (*410 ගීය)

**අර්ථය :** රෙදි ඇපිල්ලීම සඳහා තොටක් ද, වෙල්හැළියක් ද රෙදි වනා තැබීම සඳහා ගෙයක් ද (හළුගර්) නැති නිසා රජක ස්ත්‍රියක් බෙයඳෙහි රන්වනුන් අතරට වැදී සිටී.

මෙම ගීයෙන් කියැවෙන පරිදි රජක ස්ත්‍රියක සීගිරි නැරඹීමට පැමිණ ඇත. මැය රජක ස්ත්‍රියක බව කවියා දැනගත්තේ කෙසේ ද යන්න ගැටලුවකි. ඇතැම් විට කවියා ඇය මින් පෙර දැක හැඳින තිබෙනවා විය හැකි ය. නැතිනම් ඇය දුටු පමණින් රජක කුලයට අයත් ස්ත්‍රියක බව හඳුනා ගැනීමට හැකි බාහිර ස්වරූපයකින් යුක්ත විය යුතු ය. එය එසේ ම වූවා ද විය හැකි ය. වස්ත්‍රාභරණ භාවිතය තුළින් සමාජයේ පැවති කුල ධූරාවලිය හඳුනා ගැනීමට හැකි වූවා ද විය හැකි ය. ඇතැම් විට ඇගේ

උඩුකය නිරුවත් නොවූවා යැයි කීමට ද නුපුළුවන. කෙසේ මුත් මෙම ගීය මගින් සමකාලීන සමාජ ක්‍රමය තුළ කුල ධූරාවලි ක්‍රමය ක්‍රියාත්මක වූ බව නිසැක ව ම හඳුනාගත හැකි ය.

කැටපත් පවුරේ ගී ලියූ බොහෝ කවීන් බෙයදෙහි සිතුවම්ගත කාන්තාව කෙරෙහි පැහැද ඔවුන් උදෙසා කවි ලියා ඇති බව නො රහසකි. එම කවීන් අතර අතළොස්සක් වූ පිරිස සීගිරිය ආශ්‍රිත තොරතුරු මෙන් ම තමන් ජීවත් වන සමාජයේ අත්දැකීම් හා මිශ්‍ර වෙමින් ද ගී ලියා ඇත. ඒ අතර ජීවමාන කාන්තාව ද මෙම කවීන්ට කාව්‍යමය සංකල්පනාවක් විය. එලෙස ජීවමාන කාන්තාව අරබයා ලියා ඇති සීමිත කුරුටු ගී තුළින් වුව ද සමකාලීන සමාජයේ කාන්තාව හා ඇයට හිමි ව තිබූ සමාජ තත්ත්වය හඳුනා ගැනීමට අපහසු නොවේ. ඒ අනුව සමකාලීන අවධිය තුළ කාන්තා භූමිකාවෙහි සමාජ හා සංස්කෘතිකමය කරුණු රැසක් මෙම සීගිරි කුරුටු ගී තුළින් හඳුනාගත හැකි ය. එබැවින් සමකාලීන අවධිය තුළ සිංහල සංස්කෘතියේ කුල කාන්තාවගේ ස්වරූපය හා සමාජ පසුබිම මැනවින් හඳුනා ගැනීමට ජීවමාන කාන්තාව උදෙසා ලියැවුණු අතළොස්සක් වූ එම ගී මහාර්ඝ සාහිත්‍යාංගයක් වන්නේ ය.

**මූලාශ්‍රය**


**මහාවංශය.** (සංස්.) (2003) නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දිසානායක, සෙනරත්. (2011) **සීගිරිය එහි අප්‍රකට සිතුවම්, රජ උයන හා අනෙකුත් නගරාංග**. කුරුණෑගල: අනුර ප්‍රින්ටර්ස්.

පෙරේරා, ප්‍රිශාන්ත. (2008). **ගිරි බිතෙහි තී**. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

මුදියන්සේ, නන්දසේන. (1963). **සීගිරි ගී ප්‍රථම භාගය.** කොළඹ : ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

මුදියන්සේ, නන්දසේන. (1963). **සීගිරි ගී ද්විතීය භාගය.** කොළඹ : ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

ලොකුබණ්ඩාර, වී.ජේ. මු. (1990). **සීගිරි ගී සිරි**. කොළඹ 10 : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විතාන, ගුණසේන. (1992). **සීගිරි ගීයේ සමාජ දැක්ම**. කොළඹ : කුරුලු පොත්.

Paranavithana, S. (1956). **Sigiri Greffiti.** London: Oxford University Press.

# ශ්‍රී ලංකාවේ ධාතු කරඬු ලිපි පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

**පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි[1]**
**රුසිරි කසුන් නානායක්කාර[2]**

බුදු, පසේ බුදු, මහ රහත් සහ සක්විති රජ යන උතුම් පුද්ගලයන්ගේ ධාතූන් තැන්පත් කිරීමට යොදාගත් නිර්මාණය කරඬු නම් වේ. ලංකාවේ සිදුකළ කැණීම් රැසකින් විවිධ අමුද්‍රව්‍යවලින් නිර්මිත ධාතු කරඬු රැසක් හමු වී ඇත. මෙම ධාතු කරඬු අතුරින් ලිපි රචනා කර ඇති කරඬු කිහිපයක් හමු වී ඇති අතර කරඬුවල අභ්‍යන්තරය, පාදම, ගර්භය වටා සහ එම කරඬු අභ්‍යන්තරයේ තැන්පත් කළ ලෝහ තහඩුවල මෙම ලිපි රචනා කර ඇත. ඉන්දියාවේ අක්ෂර සහිත ධාතු කරඬු බහුල වශයෙන් හමු වුව ද මෙරටින් හමු වී ඇත්තේ ඉතා සීමිත ගණනකි. විශේෂයෙන් අභයගිරි ස්තූපය, දීඝවාපි ස්තූපය, විල්ගම්වෙහෙර නටබුන් වැව ස්තූපය, මයිලවැව ස්තූපය, ලාහුගල නීලගිරි සෑය, පොතුවිල් ස්තූපය, සේරුවිල මංගල මහා සෑය, රුවන්වැලි සෑය, උඩවලව රක්ෂිතය ආදි ස්ථානවලින් හා ප්‍රදර්ශනය සඳහා කොළඹ ජාතික කෞතුකාගාරය, බ්‍රිතාන්‍ය කෞතුකාගාරය හා පිට්රිවර් කෞතුකාගාරය ආදි ස්ථානවල තැන්පත් කර ඇති අභිලේඛන සහිත ධාතු කරඬු කිහිපයක් හමු වී ඇත. මෙම ධාතු කරඬුවල ඇති ලිපි අධ්‍යයනය කිරීමෙන් එම කරඬු ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දහවන සියවස දක්වා කාලයට අයත් බව තහවුරු වේ. මෙම අභිලේඛන අධ්‍යයනය කිරීමෙන් එකල පැවති ආර්ථික, සමාජීය, ආගමික, දේශපාලන සහ සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය වේ.

## හැඳින්වීම

ධාතු කරඬු (Relic caskets) බෞද්ධ සංස්කෘතිය තුළ බෞද්ධ ජනතාවගේ ඉමහත් ගෞරවාදරයට පාත්‍රවන පූජ්‍ය වස්තුවකි. පූජනීය ධාතු සහ භෂ්මාවශේෂ සුරක්ෂිත ව තැන්පත් කිරීම සඳහා කරඬු නිර්මාණය කර ඇති අතර එලෙස ධාතු තැන්පත් කළ කරඬු, ස්තූප ගර්භ තුළ තැන්පත් කිරීම පෙර සිරිත විය. මේ ආකාරයෙන් ධාතු තැන්පත් කිරීමට භාවිත කළ කරඬු විවිධ අමුද්‍රව්‍ය භාවිත කරමින් නිර්මාණය කර ඇත. එනම් ග්‍රැනයිට් (කුලතුංග 2014:377), තිරුවානා (නීලගිරිය ස්තූප කැණීම් වාර්තාව II කොටස 2016:123), රන් (විල්ගම් වෙහෙර නටබුන් වැව දාගැබ් කැණීම් වාර්තාව 2010:7), රිදී (නීලගිරිය ස්තූප කැණීම් වාර්තාව II කොටස 2016: 123), වීදුරු (කුලතුංග 2014:377), මැටි (නීලගිරිය ස්තූප කැණීම් වාර්තාව II කොටස 2016:123) සහ තඹ (පුරාවිද්‍යා පාලන වාර්තාව 1951:7) යන අමුද්‍රව්‍ය භාවිත කරමින් කරඬු නිර්මාණය කර ඇත. මෙම අමුද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණය කරන ලද කරඬු රැසක් ලක්දිව ස්තූප කැණීම් හා අනවසර කැණීම් කිහිපයකින් හමු වී ඇත.

[1] ksumiththa@gmail.com
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
[2] rusirikasun@gmail.com
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

විවිධ අමුද්‍රව්‍ය භාවිත කරමින් ධාතු කරඬු නිර්මාණය කළ ද අභිලේඛන සහිත ධාතු කරඬු හමු වී ඇත්තේ අතළොස්සක් පමණි. මෙම කරඬුවල අභිලේඛන රචනා කිරීමේ දී කරඬුවේ විවිධ ස්ථාන ඒ සඳහා භාවිත කර ඇත. විශේෂයෙන් කරඬුවල පාදම, ගර්භය වටා පියනෙහි ඇතුල්පස සහ ගර්භයේ තැන්පත් කළ රන් පත්තිරුවල අභිලේඛන රචනා කර ඇත.

ධාතු කරඬු තුළ අභිලේඛන රචනා කිරීම ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ භාරත සමාජයේ පැවති යම් සිරිතක් හෝ අභිචාර විධියක් මුල් කරගෙන ප්‍රභවය වී ඇත. විශේෂිත අවස්ථාවල දී මංජුසා හෝ කරඬුවල (ධාතු තැන්පත් කළ කරඬු නොවේ) ලිපි රචනා කිරීම පිළිබඳ තොරතුරු රැසක් අට්ඨකතා තුළ සඳහන් වේ. මහාමෝර ජාතකයේ රජෙකු රන්වන් මොණරෙකුගේ මස් අනුභව කිරීමෙන් අජරාමර වන බව රන්පතක ලියවා මංජුසාවක් තැන්පත් කළ බවත් (ජාතකට්ඨ කතා 2007:64), හස්තිපාල ජාතකයේ නිධානයක් පිළිබඳ රන්පතක ලියවා මංජුසාවක තැන්පත් කළ බවත් සඳහන් වේ (එම:231). සුත්ත නිපාතයේ දරුවෙකු රන් තහඩුවක ලියන ලද ලිපියක් සමග බඳුනක් තුළට දැමීම (පරමත්ථජෝතිකා නම් වූ සුත්තනිපාතට්ඨ කතා 2008:202) පිළිබඳ ව සඳහන් වන අතර කුමාරවරුන් තැන්පත් කළ කරඬුවල සක්‍රයා අකුරු රචනා කිරීම පිළිබඳ ව උප්පලවණ්ණා තෙරණි වර්ණනාවේ දැක්වේ (ථෙරිගාථට්ඨ කතා 2009:189). මේ අනුව ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ භාරත සමාජයේ විවිධ අවශ්‍යතා සඳහා මංජුසා, කරඬු හා විවිධ භාජන තුළ අක්ෂර රචනා කිරීමේ සිරිතක් පැවති බව තහවුරු වන අතර මෙම සිරිත බෞද්ධ ජනතාව ද ධාතු කරඬු තුළ ලිපි රචනා කිරීමෙන් නොකඩවා පවත්වා ගෙන ගොස් ඇති බව පෙනේ.

### පර්යේෂණ ඉතිහාසය

ලක්දිව ධාතු කරඬු ලිපි අධ්‍යයනය 19වන සියවසේ අගභාගයේ දී ඇරඹී ඇත. විශේෂයෙන් එස්. එම්. බරොස් අභයගිරි ස්තූපයේ දකුණු ආයකයේ සිදුකළ කැණීම් මගින් ලිපි සහිත කරඬු දෙකක් ඇතුළු පුරාවස්තු රැසක් අනාවරණය කර ගැනීමට හැකිවිය (Parker 1909:302). මෙම කැණීමෙන් හමු වූ අක්ෂර සහිත කරඬු දෙක පිළිබඳ ව අධ්‍යයනය කළ පාකර් එම ලිපිවලින් **"මළ තිස"** යනු කනිට්ඨතිස්ස රජු හැඳින්වූ නාමයක් බවත් ඒ අනුව මෙම ලිපි සහිත ධාතු කරඬු ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසට අයත් බවටත් නිවැරදි ව හඳුනාගන්නා ලදී (Ibid 1909:302). මේ අනුව ලංකාවේ ධාතු කරඬු ලිපි පිළිබඳ ව අධ්‍යයනය කළ ප්‍රථමයා වශයෙන් හෙන්රි පාකර් හඳුන්වා දිය හැකි ය. ඔහුගෙන් පසු ලක්දිව ධාතු කරඬු පිළිබඳ ව අධ්‍යයනය කරන්නේ පරණවිතාන ය (Paranavitana 2001:145). ඉන් පසු ව පුරාවිද්‍යා කොමසාරිස් එම්.එච්. සිරිසෝම (සිරිසෝම 1986 : 77), මහාචාර්ය සිරිමල් රණවැල්ල (Ranawella 2005:9) ආචාර්ය මාලනී ඩයස් (Dias 1991:66-67, 81) මහාචාර්ය ටී.ජී. කුලතුංග (කුලතුංග 2014:377) හා මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි (හෙට්ටිආරච්චි 2017: 59) වැනි උගතුන් ලක්දිව ධාතු කරඬු ලිපි පිළිබඳ ව අධ්‍යයනය කර ඇත.

### අන්තර්ගතය -

ධාතු කරඬු තුළ ලිපි රචනා කිරීම භාරතයේ දී ඇරඹි බවට සාධක හමු වේ. ක්‍රි:පූ 6වන සියවසේ එනම් බුදුරදුන් ජීවමාන සමයේ දී ම ස්තූප නිර්මාණය කිරීම ආරම්භ විය (ඛුද්දක නිකාය I කොටස

2005:147). විශේෂයෙන් බුදුරදුන් විසින් බුදු, පසේ බුදු, මහරහත් සහ සක්විති රජුන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කර ස්තූප නිර්මාණය කිරීම අනුමත කරන ලදී (මහා පරිනිබ්බාන සූත්‍රය 2005: 225). මෙහි දී එම භෂ්මාවශේෂ කරඬු තුළ බහා ස්තූප තුළ තැන්පත් කිරීම බුදුරදුන් ජීවමාන යුගයේ දී ම සිදුවිය (මහාවංශය 2012:3). මේ ආකාරයට ක්‍රි:පූ හයවන සියවසේ ධාතු හෝ භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා කරඬු නිර්මාණය වුව ද එම කරඬුවල අභිලේඛන රචනා කළ බවට කිසිදු සාධකයක් හමු නොවේ. දැනට හමු වී ඇති පැරණිතම අභිලේඛන සහිත කරඬු ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසට අයත් බැවින් (Cunnigham 1854:317) ධාතූන් හෝ භෂ්මාවශේෂ තැන්පත් කළ ධාතු කරඬු තුළ ලිපි රචනා කිරීම ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ ඇරඹි බව තහවුරු වේ. විශේෂයෙන් ඉන්දියාවේ සාංචි, සත්ධරා, සොනාරි ප්‍රදේශවල පිහිටි ස්තූපවල සිදුකළ කැණීම් මගින් ලිපි සහිත කරඬු රැසක් හමු වී ඇත (Ibid :286–317). වැලි ගලින් නිර්මිත කරඬුවල පාදම, ගර්භය වටා සහ පියන් ඇතුළත මෙම ලිපි රචනා කර ඇත (Ibid :317). සාංචි ස්තූපයේ අඟල් 12ක් දිග අඟල් 9 1/2ක් පළල වැලි ගලින් කරන ලද කරඬුවක ගර්භය වටා

***සවින විනයකන අරන කසප***
***ගොතම උපදිය අරන ච වච්ච***
***සුවිජයටම විනයක*** (Ibid:286). ලෙස දැක්වේ. එම ස්තූපයේ ම හමු වූ තවත් කරඬුවක පියනෙහි පිටත කොටසෙහි ***සපුරිස(ස) කසප ගොතශ සව හෙමවතවහරියස*** (Ibid :287) ලෙසත් එම කරඬුවෙහි ම ඇතුළත ***සපුරිස (ස) මජඣිමස*** (Ibid :287) ලෙසත් පාදම් කොටසේ ***සපුරිසස හරිත පුතස*** ලෙස සඳහන් වේ (Ibid :287). සාංචි ස්තූපයෙන් හමු වූ තවත් ගල් කරඬු කිහිපයක ***සපුරිසස ගොතිපුතස*** සහ ***සපුරිසස මොගලිපුතස*** ලෙස සඳහන් වේ (Ibid :289). මීට අමතර ව මධ්‍යම ඉන්දියාවේ පිහිටි සෝනාරි ස්තූපයෙන් හමු වූ ගල් කරඬුවක

***සපුරිසස මජඣිමස කොඩිනි පුතස***
***සපුරිසස කොටිපුතස කසප ගොතස සව හෙමවතචරියස***
***සපුරිසස කොසිකි පුතස***
***සපුරිස (ස) අලබගිරස*** ලෙස සඳහන් වේ (Ibid :317-318). ආන්ද්‍රා ප්‍රදේශයේ පිහිටි ස්තූපයක සිදු කළ කැණීමෙන් ***සපුරිසස වච්චිපුතස ගොටිපුත අතෙවසිනො*** (Ibid :346). ***සපුරිසස ගොටිපුතස කකනව පබහසනස කොඩිනයෙගොතස*** (Ibid :347), ***සපුරිසස මොගලිපුතස ගොටිපුත අතෙවසිනො*** (Ibid :347), ලෙස සඳහන් ධාතු කරඬු කිහිපයක් හමු වී ඇත. එසේ ම ඉන්දියාවේ උත්තර ප්‍රාන්තයේ කපිලවස්තු හෙවත් කිඹුල්වත් පුරයෙහි ප්‍රිපාවා නම් ගමෙහි නටබුන් ව ගිය මඳක් විශාල දාගැබක් පුරාවිද්‍යා නිලධාරී ඩබ්.ජී පෙප්පෙ සහ පී.ජී. මුකර්ජි විසින් කැණීමට ලක් කරන ලදි. එහි තිබූ පූජා වස්තු අතර මෘදු පාෂාණ විශේෂයකින් කරන ලද කරඬු කීපයක් ලැබිණි. සොයාගත් එම කරඬුවල අස්ථි අවශේෂ බහා තිබුණි. ඉන් එක කරඬුවක පියන මතුපිට ඉතා පැහැදිලි ලෙස බ්‍රාහ්මී අකුරින් පහත වැකිය සඳහන් කොට තිබිණි "***ඉයං සලිල නිධනෙ බුධස භගවතෙ සකියානං සුකිති භතිනං සභගිනිකානං සපුත දලනං***" (Sirkar 1942:84) මෙම ශිලා නිධානය භාග්‍යවත්

බුදුරජාණන් වහන්සේගේ ය. (එය) ශාක්‍ය වංශික සුකීර්තිගේ සහෝදර සහෝදරියන්ගේ හා පුත්‍රයන්ගේ ද බිරින්දෑවරුන්ගේ ද වන්නේ ය එහි අර්ථයයි (හෙට්ටිආරච්චි 2017:6).

ඒ අනුව පැහැදිලි වනුයේ ලිපි සහිත ධාතු කරඬු නිර්මාණය කිරීම ක්‍රි:පූ තුන්වන සියවසේ ඇරඹි බවයි. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ භාරතයෙහි ඇරඹි ධාතු කරඬු තුළ ලිපි රචනා කිරීමේ සම්ප්‍රදාය ක්‍රිස්තු වර්ෂ ආරම්භයත් සමග ශ්‍රී ලංකාවේ ද ප්‍රචලිත වූ බව මෙරටින් හමු වී ඇති ලිපි සහිත ධාතු කරඬු තුළින් තහවුරු වේ. විශේෂයෙන් ලක්දිව ධාතු කරඬු නිර්මාණය කිරීම ක්‍රිස්තු පූර්ව 6වන සියවසේ ඇරඹි බව බුදුරදුන්ගේ කේස ධාතු රන් කරඬුවක බහා මහියංගණ ස්තූපයේ තැන්පත් කිරීම පිළිබඳ මහාවංශ පුවතින් තහවුරු වේ (මහාවංශය 2012:3). ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ දී මෙරට ධාතු කරඬු නිර්මාණය කිරීම ආරම්භ වුව ද ධාතු කරඬු තුළ ලිපි රචනා කිරීම ආරම්භ වූයේ ක්‍රිස්තු වර්ෂ ආරම්භයත් සමග බවට සාධක හමු වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ඇති ස්තූප හා ආරාමික ප්‍රදේශවල සිදුකළ පුරාවිද්‍යාත්මක කැණීම් මඟින් ලිපි සහිත ධාතු කරඬු කිහිපයක් හමු වී ඇත. එනම්,

අභයගිරි ස්තූපයේ දකුණු ආයකය (Parker 1909:302)
දීඝවාපි ස්තූපයේ බටහිර ආයකය (සිරිසෝම 1986:77)
විල්ගම්වෙහෙර නටබුන් වැව දාගැබ (විල්ගම්වෙහෙර නටබුන් වැව දාගැබ් කැණීම් වාර්තාව 2010:1)
ලාහුගල නිලගිරිය ස්තූපය (නීලගිරිය ස්තූප කැණීම් වාර්තාව II කොටස 2016:109)
දිඝවාපි ස්තූපය
රුවන්වැලි සෑය (Paranavitana 1946:07)
ගෝමරන් කඩවල මයිලවැව ස්තූපය
සේරුවිල මංගල මහා සෑය (හෙට්ටිආරච්චි 2017:59)
පොතුවිල් නටබුන් ස්තූපය (දිසානායක 2013:363)
උඩවලව රක්ෂිතයේ මලලආර ප්‍රදේශය (දර්ශන සහ තවත් අය 2011: 95)
වැලියාය විහාරය (මේධානන්ද 2000:68) වශයෙනි.
බ්‍රිතාන්‍ය කෞතුකාගාරය (Silva 1975:255)
පිට්රිවර් කෞතුකාගරය ( Silva 1975:339)
කොළඹ ජාතික කෞතුකාගාරය (Ranawella 2005:9)

### අභයගිරි ස්තූපයේ දකුණු ආයකය

අභයගිරි ස්තූපයේ දකුණු ආයකයෙහි 1885 දි සිදුකළ පුරාවිද්‍යාත්මක කැණීම්වල දී එස්.එම්. බරොස් මහතාට පුරාවස්තු රැසක් හමුවිය (Parker 1909:302). හමු වූ පුරාවස්තු අතරින් ලිපි සහිත ධාතු කරඬු හමු වූ අතර ගර්භය වටා එම ලිපි රචනා කර ඇත (Ibid :302). ග්‍රැනයිට් පාෂාණයෙන් නිර්මිත මෙම ධාතු කරඬු වර්තමානයේ කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

## ධාතු කරඬු අංක 01




**පෙළ -**

01. සිදධම මළි තිස මහ රජහ රජිනි මිතබිය දතු නිජනෙ

**අර්ථය -**

යහපතක් වේවා මළිතිස මහා රජුගේ භාර්යාව වූ මිත්තා රැජිනියගේ ධාතු නිධානයයි.

## ධාතු කරඬු අංක



**පෙළ -**

01. සිදධම මළතිස මහරජහ මති සිරලය දතු නිජනෙ

**අර්ථය -**

යහපතක් වේවා මළිතිස මහරජගේ මැණියන් වූ සිරලයගේ ධාතු නිධානයයි.






ධාතු කරඬු අංක 01 ධාතු කරඬු අංක 02

## දීඝවාපි ස්තූපයේ බටහිර ආයකය

1980 දශකයේ දීඝවාපි ස්තූපයේ බටහිර ආයකයෙහි සිදුකළ කැණීම් මගින් ගල් කරඬුවක් හමු වූ අතර එහි රන් කරඬු තැන්පත් කර තිබුණි (සිරිසෝම, 1986:77). මෙම රන් කරඬු අතුරින් අඟල් හයක් පමණ වූ විශාලතම රන් කරඬුව තුළ අක්ෂර සහිත රන් සන්නසක් තැන්පත් කර තිබී හමුවිය (එම :77). මෙම රන් සන්නසෙහි ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසට අයත් පැරණි බ්‍රාහ්මී අක්ෂර දැකිය හැකි අතර මෙයත් මළි තිස්ස රජුට අයත් ලිපියකි. දිගින් සෙන්ටිමීටර් 14ක් වන රන් තහඩුවකින් නිර්මාණය කර ඇති මෙම සන්නසෙහි අක්ෂරයක් සෙන්ටි මීටර්යක් පමණ විෂ්කම්භයකින් යුක්ත වේ.

**ස්පර්ශ ලාංඡනය -**



**පෙළ -**

01. සිධ නක මහරජහ පුත මළිතිස රජහ සොවණ තුබෙ

**අර්ථය -**

යහපතක් වේවා නාග මහරජතුමාගේ පුත්‍ර මළුතිස්ස රජතුමාගේ ස්වර්ණ ස්තූපයයි.

## විල්ගම් වෙහෙර නටබුන් වැව දාගැබ

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි විල්ගම්වෙහෙර නටබුන් වැව අසල පිහිටි දාගැබක සිදු කළ අනවසර කැණීමකින් පුරාවස්තු රැසක් හමු වී ඇත (විල්ගම්වෙහෙර නටබුන් වැව දාගැබ් කැණීම් වාර්තාව 2010:7). එසේ හමු වූ පුරාවස්තු අතුරින් රන් කරඬුවක් තුළ තැන්පත් කර තිබූ අක්ෂර සහිත රන් සන්නසක් ද විය (එම :7). දිගින් සෙන්ටිමීටර් 8ක් හා පළල සෙන්ටිමීටර් 1.5ක් වන මෙම රන් පතෙහි අක්ෂර පේළි 2ක් සඳහන් කර ඇත (සමරනායක 2012:70). මෙම රන් පත්තිරුවත් මළි තිස්ස රජුට ම අයත් ලිපියකි.

**ස්පර්ශ ලාංඡනය -**



**පෙළ -**

01. නක මහරජහ පුත මළිතිස මහ

02. රජහ චෙත

**අර්ථය -**

නාග මහ රජතුමාගේ පුත් මළිතිස මහ රජතුමාගේ චෛත්‍යය.

## ලාහුගල නිලගිරි ස්තූපය

ලාහුගල නිලගිරි ස්තූපයේ කංචුකයේ සිදු කළ පුරාවිද්‍යාත්මක කැණීම් මගින් හමු වූ මැටි කරඬුවක පියනෙහි ඇතුළු පැත්තෙහි **'මළි'** ලෙස සඳහන් කර ඇත (නීලගිරිය ස්තූප කැණීම් වාර්තාව II කොටස 2016:109). අක්ෂරයක් සෙන්ටිමීටර 3ක් පමණ විෂ්කම්භය සහිත වන අතර සුදු වර්ණය භාවිත කර මෙම පාඨය රචනා කර ඇත.





**නිලගිරිය අක්ෂර සහිත මැටි කරඬුව** **අක්ෂර සහිත මැටි කරඬු පියන**

**විවරණ -**

අභයගිරි ස්තූපයේ ආයකය, දීඝවාපි ස්තූපයේ බටහිර ආයකය, විල්ගම්වෙහෙර නටබුන් වැව දාගැබ හා නිලගිරිය ස්තූපය යන ස්ථානවලින් හමු වූ අභිලේඛන සහිත ධාතු කරඬු සියල්ල ක්‍රි:ව 167-186 කාලයට අයත් වේ. එනම් කණිට්ඨතිස්ස රාජ්‍ය සමයට ය. ඒ බැවින් උක්ත ලිපි සියල්ලේ විවරණය මෙහි දී පොදුවේ සාකච්ඡාවට භාජනය කරන ලදි.

**සිදධම -**

අභයගිරි ස්තූපයේ ආයකයේ ධාතු කරඬු ලිපි දෙකක ම '**සිදධම**' ලෙසත් දීඝවාපි ස්තූපයේ බටහිර ආයකය රන් පත්තිරුවේ '**සිධ**' ලෙස සුභවාචී පදයන්ගෙන් ආරම්භ වී ඇත. මෙය සංස්කෘත පදයකි. යහපතක්, සෙතක්, ශාන්තියක් වේවා යන ආශිර්වාදාත්මක පැතුම මෙහි අරුතයි. මෙය පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිවල සංයුක්තාක්ෂර භාවිතය පිළිබඳ එක ම අවස්ථාවයි (විජේසේකර 1990:19). මෙම ආශිර්වාදාත්මක පාඨය පූර්ව බ්‍රාහ්මී යුගයේ සිට වර්තමානය දක්වා විවිධ වෙනස්කම් සහිත ව

භාවිතයේ පවතී. සෙල්ලිපිවල මෙය යෙදුණු විවිධ ආකාර මෙසේ දැක්විය හැකි ය. 'සි' පහළ කයිනාට්ටම ගිරි ලිපිය (Paranavitana 1933:162), 'සී' අභයගිරි විහාර පුවරු ලිපිය (විජේසේකර 1990 :83), 'සිධ' වෙස්සගිරි ගිරි ලිපිය (වික්‍රමසිංහ සහ කරුණාරත්න 2000:13), මළුතිස රජුගේ ජේතවනාරාම ලිපිය (එම :132), 'සිධම්' නාගිරිකන්ද ගිරි ලිපිය (Paranavitana 1943:123), මහරත්මලේ ගිරි ලිපිය (වික්‍රමසිංහ සහ කරුණාරත්න 2000:34), 'සිද්ධි' දඹුල්ල ගිරි ලිපිය (Paranavitana 1983:6), 'සිද්ධ' සිතුල්පව්ව ගිරි ලිපිය (Ibid :52), 'සිද්ධම්' පෙරුමියන්කුලම ගිරි ලිපිය (වික්‍රමසිංහ සහ කරුණාරත්න 2000:36), මෝලාහිටියවෙලේගල (Paranavitana 1983:4), අංගමුව ගිරි ලිපිය (Ibid :7), තුඹුල්ලෙගල (Ibid :12), බක්කිඇල (Ibid:17). 'සවස්ති' නෙළුබැව ටැම් ලිපිය (Paranavitana karunarathna,Veluppillai 1973:97), මාන්තායි දෙමළ ටැම් ලිපිය (Ibid:12), සවස්ති සිරි සිරිවත් (අමරවංශ හිමි 1969:167), සවස්ති ශ්‍රි සිරිවත් ය (විජේසේකර 1990:161). මෙම පාඨය ඉන්දීය සෙල්ලිපිවල ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ පටන් යෙදූ බව පරණවිතාන පවසයි. මෙය සත්‍යයක් නම් ශ්‍රී ලාංකිකයන් මෙය සෙල්ලිපි සඳහා යොදා ගැනීමේ පුරෝගාමීන් වශයෙන් සැලකිය හැකි වන්නේ ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් මිහින්තලේ (අමරවංශ හිමි 1969:73), රාත්‍රුවෙල (එම:77), සැස්සේරුව (එම:81) සහ වෙස්සගිරි ලිපිවල (Paranavitana 1970:110-38) මෙම පාඨය සඳහන් වීමෙනි. මේ පාඨය මෙරට සෙල්ලිපිවලට පැමිණියේ ආන්ද්‍රා බලපෑම නිසා බව ජයන්ත උඩුවර පවසයි.

**නක මහ රජ -**

'නක' යන්න නාග යන අර්ථය වෙනුවෙන් යෙදේ. පූර්ව බ්‍රාහ්මී (ක්‍රිස්තු පූර්ව 3-1 සියවස්) ශිලාලේඛනවල 'නක' යන වචනය බහුල ව යෙදේ. 'නාග' නම් තෙරුන් වහන්සේ නමක් (නකතෙර) හැඳින්වීම සඳහා ද (Paranavitana 2001:271,289) මහ රජවරුන් (නක මහරජ) (Ibid; Paranavitana 1983:30, 37) ආදී ලෙස ප්‍රාදේශීය රජවරුන් (නකරජ) (Paranavitna 1970:88 (1120) 96 (1198), අමාත්‍යවරුන් (නකමත) (Ibid 2001:227), හැඳින්වීමේ නාමයක් ලෙස ද මේ නම යෙදී තිබේ. පුද්ගල නාමවලට අමතර ව නාග නමින් වැවක් (නකවපි) (Ibid 2001:285) මෙන් ම නාග නමින් පර්වතයක් (නකපවත) (Ibid 1983:37), නාග නම් චෛත්‍ය 'නකචෙත' (Ibid 1983:43) නාග දිවයින් 'නකදිව' (Ibid 2001:53) ද බ්‍රාහ්මී ලේඛනවල දක්නට ලැබේ. ඒ අනුව 'නාග' යන්න එකල ජනප්‍රිය නාමයක් වූ බව ද පැහැදිලි ය. මෙම දීඝවාපි ස්තූපයේ බටහිර වාහල්කඩ හා විල්ගම්වෙහෙර නටබුන් වැව දාගැබ යන රන් පත්තිරුවල '**නක මහ රජ**' ලෙස සඳහන් වන්නේ ක්‍රි:ව 136-143 අනුරාධපුර රජකළ මහල්ලක නාග රජතුමා ය. මොහු ලම්බකර්ණ පෙළපතට අයත් රජ කෙනෙකි. හබැස්ස සෙල්ලිපියට අනුව මොහු වසභ රජුගේ මුණුබුරා ය (Paranavitana, 1983:85).

**මළිතිස මහරජ -**

උක්ත ලිපි සියල්ලෙහි ම මෙම සංඥා නාමය දැකිය හැකි ය. අභයගිරිය හා නිලගිරිය ලිපිවල හැර අනික් ලිපිවල සඳහන් කර ඇත්තෙ මොහු වනාහි නාග මහා රජුගේ පුත්‍රයා ලෙස ය. මහාවංසයට

අනුව මහල්ලක නාග රජුට පුතුන් දෙදෙනෙකු සිටි බවත් ඔහුගේ වැඩිමහල් පුතු භාතිය තිස්ස (ක්‍රිස්තු වර්ෂ 143-167) වූ අතර දෙවැන්නා කණිට්ඨතිස්ස නම් වේ. (ක්‍රි.ව. 167-186) පළමුවැන්නාගෙන් පසු දෙවැන්නා රාජ්‍යත්වයට පත් විය. මෙම රජුට අයත් ආගමික හා සාමාජික ක්‍රියාවන්ට අදළ ලිපි 13ක් පමණ ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමුවී ඇත (Paranavitana 2001:125-154) මෙම ලිපිවල ඔහුගේ නම ආකාර තුනකින් යෙදී ඇත. එනම් **මළිතිස, මළතිස** හා **මළුතිස** වශයෙනි. නිලගිරි මැටි කරඬුවේ දී **මළි** පමණක් දැකිය හැකි ය. එහෙත් කිසිදු සෙල්ලිපියක මහාවංසයේ මෙන් **කණිට්ඨතිස්ස** යන නම යෙදී නැත. පූජාවලියේ හා නිකාය සංග්‍රහයේ යෙදී ඇත්තේ චූලතිස්ස වශයෙනි (පූජාවලිය 1999: 775), මෙසේ වංසකථාවල හා සෙල්ලිපිවල ඔහුගේ නම ආකාර කිහිපයකින් සඳහන් වේ. සම්බුද්ධ ශාසනයේ දියුණුව වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටුකළ බව වංසකථා හා පුරාවිද්‍යාත්මක සාධක මගින් පැහැදිලි ය.

**සොවණ තුබෙ -**

සොවණ තුබෙ යන්නෙහි වචනාර්ථය ස්වර්ණයෙන් කළ ස්තූපය යන්නයි. මෙහි සොවණ යන්න විශේෂණ පදයක් ලෙස යෙදී ඇත. **තුබෙ** යන වචන සකස් වී ඇත්තේ සංස්කෘත භාෂාවේ ස්තූප හා පාලි භාෂාවේ ථූප යන වචන නිරුත්පන්න වීමෙනි (විජේසේකර 1990:110). ශ්‍රී ලංකාවේ ප්‍රථම ඓතිහාසික ස්තූපය වන්නේ ථූපාරාමයයි (සුමංගල හිමි සහ බටුවන්තුඩාව 1996:17, 54-64). බුදුදහම ශ්‍රී ලංකාවේ ව්‍යාප්තියට සමගාමී ව ස්තූප නිර්මාණය ද ව්‍යාප්ත වූ බව රිටිගල, වේවැල්තැන්න ලෙන් ලිපිය, රජගල මිහිඳු ලිපිය, බඹරකන්ද, සැස්සේරුව සහ බිල්ලෑවේගල යන (Paranavitana 1970:21, 35, 63, 79, 88) මූල බ්‍රාහ්මී ලිපිවල ද ස්තූප පිළිබඳ සඳහන් වීමෙන් පැහැදිලි වෙයි. ස්තූප නිර්මාණය සඳහා බරපැණ දැරූ අවස්ථාවන්, ස්තූප අංග පිළිබඳ ව මෙන් ම ස්තූප නාමකරණයට ලක් කළ අවස්ථා ආදී තොරතුරු සෙල්ලිපිවල අන්තර්ගත වේ (බණ්ඩාර 2008:128-130). ඒ අනුව දීඝවාපි ස්තූපයේ බටහිර ආයකයෙන් හමු වූ රන් පත්තිරුවේ **සොවණ තුබෙ** යනුවෙන් ස්තූපය හැඳින්වූ බව පැහැදිලි වේ.

**චෙත -**

චෙත යනු චෛත්‍ය යන්න අර්ථ ගන්වයි. චෙත යනු සංස්කෘත භාෂාවෙන් චෛත්‍ය, පාලි භාෂාවෙන් චෙතිය වේ. චෙත යන වචනය විවිධ රූපයන්ගෙන් කාලෙන් කාලෙට දැකිය හැකි ය. චෙත යන වචනය **චෙය** හෙවත් සෑය ලෙසින් විපරීත ව සටහන් වූ අවස්ථා ද වේ. උදාහරණ ලෙස හේරත් හම්මිල්ලෑව ගිරි ලිපියේ (Paranavitana 2001:197) **'චෙයහි'** යන්න සටහන් ව ඇත. කතරගම කිරිවෙහෙර අංක 02 පුවරු ලිපියෙහි ද **'මගල මහ චෙය'** ලෙස සඳහන් වේ. (Paranavitana 1933: 218) ක්‍රිස්තු වර්ෂ නවවන ශත වර්ෂයේ දී භාෂාවේ මේ වචනය 'සෙය' සහ 'සෑ' යන රූපවලින් දිස් වේ. මෙහි නවීන සිංහල පදය සෑය වේ (එම :216). විල්ගම්වෙහෙර නටබුන් වැව දාගැබ, 'චෙත' යනුවෙන් හැඳින්වූ බව පැහැදිලි වේ.

## දීඝවාපි ස්තූපය

1980 දශකයේ සහ 2012-2013 වර්ෂවල දීඝවාපි ස්තූපයේ ගර්භයේ සිදුකළ කැණීම් මගින් පුරාවස්තු රැසක් හමු විය. එම පුරාවස්තු අතුරින් සෙන්ටිමීටර 5ක් උස සහ සෙන්ටිමීටර 4.5ක විෂ්කම්භය සහිත කුඩා මැටි කරඬු හයක් හමු වූ අතර එම කරඬුවල විශේෂත්වය නම් ඒවායේ අභ්‍යන්තරයේ අක්ෂර රචනා කර තිබීමයි. කිසියම් මුද්‍රාවක් භාවිත කර රචනා කර ඇති මෙම අක්ෂර සංස්කෘත අක්ෂර ලෙස හඳුනා ගත හැකි ය. ක්‍රි.ව 6-8 සියවස්වලට අයත් මෙම අක්ෂරවලින් මහාවග්ග පාලියෙහි සඳහන් වන අස්සජි හිමියන් විසින් උපතිස්ස පිරිවැජියාට දේශනා කරන ලද ගාථා පාඨයක් වන

**'යෙ ධම්මා හෙතුපභවා තෙසංචයෝ හෙතුං**
**තථාගතෝ ආහ නිරොධො එවං වාදි**
**මහාමණොති''**

යන ගාථාව රචනා කර ඇත. අක්ෂරයක් සෙන්ටිමීටරයක් පමණ විෂ්කම්භයකින් යුක්ත වන අතර මැටි කරඬුව අභ්‍යන්තරයේ සකස් කළ කුහරයේ පාදම කොටසේ මෙම ගාථාව රචනා කර ඇත. මෙම අක්ෂර සහිත මැටි කරඬුව අධ්‍යයනය කිරීමෙන් ක්‍රිස්තු වර්ෂ 6-8 සියවස් අතර කාලයේ දීඝවාපි ස්තූප ගර්භයෙහි යම් ප්‍රතිසංස්කරණයක් කළ බවට තහවුරු වන අතර එමෙන් ම එම කාලයේ දීඝවාපි ස්තූපය ආශ්‍රිත ව මහායාන අදහස් ප්‍රචලිත ව පැවති බවට තහවුරු වේ. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසෙන් පසු රෝහණ රාජධානියට අයත් බොහෝ ආරාමික සංකීර්ණ තුළ මහායාන බුදු සමය ප්‍රචලිත ව පැවති අතර දීඝවාපි ස්තූපයෙන් හමු වූ සංස්කෘත අක්ෂර සහිත මෙම මැටි කරඬු තුළින් දිඝවාපි ස්තූපය සහ එහි ආරාම සංකීර්ණය තුළ ද මහායාන අදහස් ප්‍රචලිත ව පැවති බව තහවුරු වේ.

**අක්ෂර සහිත මැටි කරඬු -**







**රුවන්වැලි සෑය දකුණු ආයකය**

රුවන්වැලි ස්තූපයේ දකුණු ආයකයෙන් හමු වූ පුරාවස්තු අතර ලිපියක් සහිත ගල් කරඬුවක් ද විය (Paranavitana 1946:07). ගල් කරඬුවේ ගර්භය වටා මෙම ලිපිය රචනා කර ඇත.

**පෙළ -**

01. සිද(ධ)ම ලෙන (මන) ජිත නක දෙව(බි) උපසි(ක) තිසය ද(තු) (නි ජනෙ)

**අර්ථය -**

යහපතක් වේවා ලෙනමනගේ දියණිය හා නක දේවගේ බිරිඳ වූ උපාසිකා තිස්සාගේ ධාතු නිධානයයි.

**විවරණ -**

මෙම ලිපියේ සඳහන් දෙවනපිය නම් උපාධි නාමය පිළිබඳ ව අධ්‍යයනය කළ විමලකිත්ති හිමියන් පවසනුයේ මහාදාඨික මහානාග රජුගෙන් (ක්‍රිස්තු වර්ෂ 9-21) පසු දෙවනපිය උපාධි නාමය භාවිත කළ බවට සාධක හමු නොවීම නිසා මෙම කරඬුව එම කාලයට අයත් බවයි (එම :55). නමුත් 1946 වර්ෂයේ රුවන්වැලි සෑ සතර ආයකයෙහි සිදුකළ ප්‍රතිසංස්කරණ අතරතුර හමු වූ පුරාවස්තු අතර කණිට්ඨතිස්ස රාජ්‍ය සමයට (ක්‍රි. ව. 164-186) අයත් ශිලාලේඛනයක් හමුවීම නිසා (පරණවිතාන 2014 :60) රුවන්වැලි සෑයෙහි සතර ආයකය නිර්මාණය කිරීම මෙන් ම ඒවායේ තැන්පත් කළ පුරාවස්තු කණිට්ඨතිස්ස රාජ්‍ය සමයට අයත් බවට තහවුරු වන බැවින් ඒ අනුව රුවන්වැලි සෑයේ දකුණු ආයකයෙන් හමු වූ අක්ෂර සහිත ගල් කරඬුව ද එම කාලයට අයත් බවට තහවුරු කළ හැකි ය.

- **ගෝමරන්කඩවල මයිලවැව ස්තූපය -**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගෝමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මයිලවැව පැරණි ස්තූපය 1984 වර්ෂයේ සිදුකළ කැණීම් මගින් සෙන්ටිමීටර් 5 ක් පමණ උසකින් යුතු සහ විෂ්කම්භය සෙන්ටි මීටර 4.3ක් වන රන් කරඬුවක් හමු විය. මෙම රන් කරඬුව තුළ අක්ෂර සහිත රන් සන්නසක්

වූ අතර එය දිගින් සෙන්ටිමීටර් 12ක් සහ පළල සෙන්ටිමීටර් 2ක් පමණ වන අතර තුනී රන් කරඬුවකින් නිර්මාණය කර ඇත.

**ස්පර්ශ ලාංඡනය -**



**පෙළ -**

01. නමො තසස භගවතො අරහතො සමමා සම්බුධොහ
02. ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුදධො විජජාචරණ
03. සම්පනෙනා සුගතො ලොකවිදු අනුතතරො පුරිස දම්මසාරථි සතථා දෙවමනුසසානං බුදෙධා භගවාති.

**අර්ථය -** එම භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුන් වහන්සේට නමස්කාරය වේවා. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණු නිසා අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තර පුරිස දම්මසාරති, සත්තා දේව මනුස්සා, බුද්ධෝ, භගවා නම් වන සේක.



**මයිලවැව රන් කරඬුව**

## ➢ සේරුවිල මංගල මහා සෑය

සේරුවිල මංගල මහා සෑයේ සිදුකළ කැණීම් මගින් ස්තූපයේ බටහිර පැත්තෙහි මල් ආසනය අසල තිබී තඹ කරඬුවක් හමුවිය (රත්නසිරි 2002:105). ස්තූප ගර්භයේ තැන්පත් කර තිබූ මෙම කරඬුව නිධන් සොරුන්ගේ අනවසර කැණීම් නිසා ස්තූප මළුව තුළ තැන්පත් වන්නට ඇත. කරඬුව තුළ රන් සන්නසක් වූ අතර එය දිගින් සෙන්ටිමීටර 15ක් ද පළල සෙන්ටිමීටර 2ක් ද වන තුනී රන් තහඩුවකින් නිර්මාණය කර ඇත.

**ස්පර්ශ ලාංඡනය -**



**පෙළ -**

01. නමො තසස භගවතො අරහතො සමමා සම්බු
02. ධසස ඉතිපිසො භගවා අරහ සම්මා සම්බු
03. දෙධා විද්‍යා සරණ සමමපනෙනා සුගතො ලොක
04. විධු අනුතතරො පුරිස දම්ම සාරථී ස

**අර්ථය -**

එම භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුන් වහන්සේට නමස්කාරය වේවා. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණු නිසා අරහං, සම්මා, සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තර, පුරිසදම්මසාරති ... (හෙට්ටිආරච්චි 2017:59)

**විවරණය -**

ගෝමරන්කඩවල මයිලවැව ස්තූපය හා සේරුවිල මංගල මහා සෑය යන ස්ථාන දෙකෙන් හමු වූ ධාතු කරඬු ලිපි අයත් වන්නේ අක්ෂර ලක්ෂණ අනුව අනුරාධපුර යුගයේ අවසාන කාලයට ය. එනම් ක්‍රිස්තු වර්ෂ 9-10 සියවස්වලට ය. මයිලවැව පුරාවිද්‍යා ස්ථානය තිරියාය විහාරයට ආසන්නයේ පිහිටි ආරාම සංකීර්ණයකි. තිරියාය විහාරය සමකාලීන සමාජයේ මහයාන අභාසය යටතේ නැගෙනහිර පළාතේ පිහිටි මහා විහාරයක් ලෙස ධර්මය ව්‍යාප්ත කළ බව පුරාවිද්‍යා නටබුන් අනුව පැහැදිලි වේ. මෙම රන් පත්තිරුවල අක්ෂර හා පද මහායාන ආභාසය යටතේ පෝෂණ වූ බව පෙන්වා දිය හැකි

ය. සියල්ල අවබෝධ කළ උත්තම පුරුෂ වූ ආජඤ්ඤ පුරුෂ වූ ශ්‍රේෂ්ඨ පුරුෂ වූ බුදුරජාණන් වහන්සේගේ නව අරහාදි ගුණ මෙම රන් පත්තිරුවල සඳහන්වේ.

බෞද්ධ දර්ශනය කෙරෙහි ඇති වූ අසීමිත ශ්‍රද්ධාව මූලික කරගෙන රන් පත්තිරු ස්තූප තුළ තැන්පත් කර ඇත. පැරණි හා නව ස්තූප සංරක්ෂණ හෝ ප්‍රතිසංස්කරණ අවස්ථාවල මෙන් ම ස්තූපවල ධාතු තැන්පත් කරන විට මෙවැනි පත්තිරු තැන්පත් කිරීම නූතනයේ පවා දැකිය හැකි ය.

- **පොතුවිල් ප්‍රදේශයේ පිහිටි හඳුනා නොගත් ස්තූපය**

අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් ප්‍රදේශයේ පිහිටි ස්තූපයක සිදුකළ අනවසර කැණීමකින් හමු වූ මැටි කරඬු අතුරින් ගර්භය වටා ලිපි දෙකක් රචනා කර තිබූ කරඬුවක් විය (දිසානායක 2013:363). මෙම අක්ෂර ක්‍රි:ව 1-3 සියවස්වලට අයත් වේ. තිස්ස තෙරුන්ගේ හෝ ඵුස්ස තෙරුන්ගේ ධාතූන් වහන්සේලා හෝ ඔවුන් මෙම කරඬු පූජා කරන්නට ඇතැයි මෙම ලිපි අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

**ස්පර්ශ ලාංඡනය -**



**පෙළ -**

01. තිස තෙරහව පුස තෙරහව

**අර්ථය -**

තිස්ස තෙරුන්ගේ ද ඵුස්ස තෙරුන්ගේ ද


**විවරණය -**

තිස හා පුස යනු සංඥා නාමයන් ය. පද අර්ථය තිස්ස හා ඵුස්ස යන්නයි. මුල් බ්‍රාහ්මී ලිපි රාශියක ම මෙම සංඥා නාමයන් දැකිය හැකි ය. ගල්කන්දේගම ලෙන් ලිපියට අනුව තිස්ස තෙරුන් ඥාතින් හා එක් ව දෙමාපියන්ට පින් පැමිණවීමක් සඳහා ලෙනක් පූජා කිරීමක් පිළිබඳ ව තොරතුරු හමු වේ (Paranavitana 1970:1142). **'පුශ තෙර'** (Paranavitana 1970:226), **'පුශදෙව තෙර**' (Paranavitana 1970:407, 628) මුල් බ්‍රාහ්මී ලිපිවල සඳහන් වේ.

**තෙරහව -**

පාලි භාෂාවේ ථෙර හා සංස්කෘත භාෂාවේ ස්ථවිර යන වචන නිරුක්පන්න වී පැරණි සිංහල වහරට තෙර යනුවෙන් පැමිණ ඇත. සංඝයාගේ තවත් සාමාජිකයෙකු පුහුණු කිරීමේ වගකීම භාර ගැනීම

සඳහා භික්ෂුවක තමන් උපසම්පදා වී දස අවුරුද්දකට පසු පත්වෙන **"තෙර"** යන තනතුර ලබා සිටිය යුතු ය. රජගල ලිපියේ මිහිඳු සහ ඉට්ඨිය යන මහ රහතන් වහන්සේලා නම් කරන ලද්දේ වෙන කිසි ම ගෞරවවාචික පදයකින් නොව **"තෙර"** යනුවෙනි. **''යෙ ඉම දිප පටමය ඉදිය අගතන ඉඩික තෙර මහිද තෙරහ තුබෙ''** යනුවෙන් මේ දිවයිනට පළමුවෙන් සෘද්ධියෙන් පැමිණි ඉඩික තෙරුන්ගේ ද මහින්ද තෙරුන්ගේ ද ථූපයයි (Paranavitana 1970:468). රජගල ලිපියෙන් ඉට්ඨිය තෙරුන්ගේ නම මුලින් සටහන් කොට ධර්ම දූත මෙහෙවරේ නායකත්වය දැරූ මිහිඳු හිමියන්ගේ නම පසු ව යෙදීමෙන් පැහැදිලි වන්නේ නැගෙනහිර පළාතේ ධර්ම ප්‍රචාරය කිරීමේ කාර්යයභාරය ඉට්ඨිය තෙරුන් සතු වන්නට ඇති බවයි. ප්‍රදේශයට ධර්මය දායාද කළ හිමියන්ගේ නාමය මුලින් යොදා පසු ව මිහිඳු හිමියන්ගේ නම යෙදුවා විය හැකි ය. මිහිඳු හිමියන්ගේ නම සඳහන් වීමෙන් ශාරීරික ධාතු ශ්‍රී ලංකාව පුරා ම ස්තූප නිර්මාණය කිරීමට බෙදා හරින්නට ඇතැයි අනුමාන කළ හැකි ය. කඳුරුවැව ලිපිවලට අනුව මහාවිහාරවාසී දිතිම අපය තෙරුන් පිළිබඳව ද (Paranavitana 1970:1206) විනයධර දත්ත තෙරුන් පිළිබඳව සඳහන් වේ (Paranavitana 1970:1207). මූල ඓතිහාසික ශිලාලේඛන විශාල සංඛ්‍යාවක 'තෙර' යන්න සඳහන් වේ. ඇතැම් ශිලාලේඛනවල එක තෙර කෙනෙකු තවත් තෙර කෙනෙකුගේ "ශදිවිහරි" හෝ "අතෙවශික" හැටියට සඳහන් වෙයි. පරණවිතාන සූරීන් මෙය විග්‍රහ කරන්නේ සෙල්ලිපි කොටන අවස්ථාවේ දී "අතෙවශික" හෝ "ශදිවිහරිය" වශයෙන් හඳුන්වන ලද තෙරුන් අනිත් තෙරුන්ගේ භාරකාරත්වයේ සිටි බව නොගත යුතු බවත් එක තෙර කෙනෙකු තවත් තෙර කෙනෙකුගේ ශදිවිහාරි හෝ අතෙවශික යනුවෙන් හැඳින්වීමේ මේ ක්‍රමය යෙදෙන්නේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව දැක්වීමට බවත් ය (Paranavitana 1970:ci). මූල බ්‍රාහ්මී ශිලාලේඛනවල ශග, තෙර සහ ශමණ යන ආකාර තුනෙන් ම සංඝ සමාජය හඳුන්වා ඇත (Paranavitana 1970 cxix, cxxv).



**පොතුවිල් මැටි කරඬුව**

## ➢ මලලආර නටබුන් පරිශ්‍රය

උඩවලව රක්ෂිතය තුළ පිහිටි මලලආර වැව් ඉවුරෙහි තැන්පත් කරන ලද කුඩා මැටි කරඬු රැසක් හමු වී ඇත (බණ්ඩාර සහ වෙනත් අය 2011:91). සෙන්ටිමීටර් 5.5ක උසකින් සහ විෂ්කම්භය සෙන්ටි මීටර් 4.8ක් වන මෙම මැටි කරඬු තුළ සෙන්ටි මීටර් දෙකකට අඩු ප්‍රමාණයේ අක්ෂර සහිත මැටි එලකයක් තැන්පත් කර ඇත (එමඃ 94). මෙම අක්ෂර ක්‍රිඃව 5-8 සියවස්වලට අයත් වන අතර එක් කරඬුවක


***තෙ ඉම***

***ග තුය දත***

***තෙ සගන තුබ***

***ගතෙ සගනව***

යනුවෙන් සඳහන් වන අතර එහි අර්ථය වනුයේ යහ මාර්ගයට පිළිපන් සංඝයාගේ ස්තූපය ඔවුන්ගේ යන්නයි (එමඃ 95). මෙලෙස මැටි මුද්‍රා බහාලූ කරඬු රැසක් මලලආර වැව් ඉවුරේ තැන්පත් කර තිබීම යම් ප්‍රාදේශීය අභිචාර ක්‍රමයක් විය හැකියැයි අනුමාන කළ හැකි ය.



**මලලආර මැටි කරඬුව**

## ➢ වැලියායේ විහාරය

මොණරාගල ප්‍රදේශයේ පිහිටි වැලියාය විහාරයේ ගල් ලෙනක් තුළ තිබූ මැටි කරඬුවක් තුළ තැන්පත් කර තිබී ***'යෙධම්මා හෙතුප්පභවා'*** ගාථාව රචනා කළ මැටි එලක ගණනාවක් හමු වී ඇත (මේධානන්ද 2000 :68). මහියංගණ ස්තූපයේ ධාතු ගර්භයෙන් ද ***'යෙ ධම්මා හේතුප්පභවා'*** ලෙස සඳහන් කළ බුද්ධ ප්‍රතිමාවක් හමු වූ අතර එහි අක්ෂර පාල රාජ්‍ය සමයට අයත් බව පරණවිතානයන්ගේ මතයයි (පුරාවිද්‍යා පාලන වාර්තාව 1951:9). පාල රාජය සමය ක්‍රිස්තු වර්ෂ 5-8

සියවස්වලට අයත් බැවින් වැලියායේ විහාරයෙන් හමු වූ මැටි කරඬුව තුළ වූ සංස්කෘත අක්ෂර සහිත මැටි එලකය ද එම කාලයට අයත් බවට අනුමාන කළ හැකි ය.

### ➢ බ්‍රිතාන්‍ය කෞතුකාගාරය

බ්‍රිතාන්‍ය ජාතික කෞතුකාගාරයේ රසල් චතුරශ්‍ර මණ්ඩපයේ ලංකාවට අයත් අක්ෂර සහිත මැටි එලකයක් තැන්පත් කළ කුඩා කරඬුවක් වේ (Silva 1975:255). 1931-10-21 වන දින ඒ.ඩබ්.මැක්ඩොනල් නම් අයෙකු මෙම කරඬුව ප්‍රදානය කර ඇති අතර හමු වූ ස්ථානය පිළිබඳ කිසිදු සඳහනක් නොවන අතර නිශ්චිත ව ම පැරණි යුගයට අයත් ස්තූපයක් ආශ්‍රිත ව සිදුකළ කැණීමකින් මෙම කරඬුව හමු වී ඇතැයි අනුමාන කළ හැකි ය.

### ➢ පිට්රිවර් කෞතුකාගාරය

පිට්රිවර් කෞතුකාගාරයේ ප්‍රාග් ඉතිහාසය කලාව සහ පුරාවස්තු දෙපාර්තමේන්තුවට අයත් පුරාවස්තු එකතුවේ ශ්‍රී ලංකාවෙන් හමු වූ කරඬුවක් ද වේ (Silva 1975:255). 1854-1857 කාලයේ මෙරට මිනුම්දෝරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මොණරාගල දිස්ත්‍රික්කයේ පීකොක් රොක් (Peacock Rock) නම් ප්‍රදේශයේ ලෙනක තිබී හමු වී ඇති මෙම මැටි කරඬුව එම කෞතුකාගාරයට ප්‍රදානය කර ඇත (Silva 1975:339). මැටි කරඬුව තුළ සංස්කෘත අක්ෂර සහිත මැටි එලකයක් තැන්පත් කර ඇති අතර මෙම කරඬුව 13වන සියවසට අයත් බව ඇතැමුන්ගේ අදහස වුව ද (Silva 1975:339) සංස්කෘත අක්ෂර සහිත මුද්‍රාවන් භාවිත කිරීම ක්‍රිස්තු වර්ෂ 5-8 සියවස්වල තුළ සිදුවී ඇති බැවින් මෙම කරඬුව ද එම කාලයට අයත් විය හැකි යැයි අනුමාන කළ හැකි ය.

### ➢ කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති ලිපිය.

ග්‍රැනයිට් පාෂාණයෙන් නිර්මිත මෙම ධාතු කරඬුව වර්තමානයේ කොළඹ ජාතික කෞතුකාගාර ගබඩාවේ තැන්පත් කර ඇත. කරඬුව බඳෙහි මෙම ලිපිය දැකිය හැකි ය. නමුත් මෙම කරඬුව කිනම් ස්ථානයකින් රැගෙන ආවේ ද යන්න සඳහන් නොවේ. මේ පිළිබඳ අධ්‍යයනය කර ඇති අය අතර ***ලිය වෙසයයහ දත්ත (මදු) කරවි තුබය*** (Dias 1991:81) යනුවෙන් ද ***(ලෙ)ය වෙසයමදෙ තුම කෙරවිත චෙය*** (Ranawella 2005:9) යනුවෙන් ද ආකාර දෙකක් යටතේ කියවා ඇත. නමුත් දෙදෙනා ම මෙහි ඇති '**දත්තම්හ**' බැඳි අකුරු මඟහැර කියවා ඇත. මේ දෙදෙන **තුබය සහ චෙය** ලෙස කියවා ඇත. කෙසේ නමුදු මෙම කරඬුව ක්‍රිස්තු වර්ෂ 4 වන සියවසට අයත් බව අක්ෂර අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ය.

**ස්පර්ශ ලාංඡනය -**



**පෙළ -**

01. ලිය වෙසයහි දත්තම්හ කරවිත චෙය

**අර්ථය -**

01. ලිය වස වෙසෙන දත්ත වන්නෙමි (මා විසින්) කර වන ලද දාගැබයි



**කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති ලිපිය සහිත ගල් කරඬුව.**

**සමෝධානය -**

ධාතු කරඬු ලිපි අධ්‍යයනය කිරීම තුළින් සමාජයේ විවිධ පැතිකඩ අධ්‍යයනය කිරීමට හැකි අතර ආගමික, දේශපාලනික, ආර්ථික හා සාමාජික තොරතුරු රැසක් ඉන් අනාවරණය වේ. විශේෂයෙන් ම බහුල වශයෙන් කරඬු ලිපි ලම්බකරණ පෙළපත නියෝජනය වූ රාජ පරම්පරාවට අයත් වන අතර එම පරම්පරාව ලේඛන කලාව වර්ධනය වෙනුවෙන් හා බෞද්ධ ශාසනයේ උන්නතියට දැක්වූ දායකත්වය මෙම ලිපි සහිත කරඬුවලින් පැහැදිලි වේ. මේ අනුව ලක්දිව මෙතෙක් හමු වී ඇති සියලු ම ලිපි සහිත ධාතු කරඬු ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දහවන සියවස දක්වා කාලයට අයත් වූ බව අනාවරණය වේ. විශේෂයෙන් අනුරාධපුර රාජධානි සමයේ කාන්තාවට විශාල සමාජමය පිළිගැනීමක් පැවති බව කරඬු නිර්මාණය කර එම කරඬු ස්තූප තුළ තැන්පත් කිරීමෙන් තහවුරු වේ. එමෙන් ම ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ විශාල ආර්ථික සමෘද්ධියක් ලබා තිබූ බව රන් පත්තිරු ධාතු කරඬු තුළ තැන්පත් කිරීමෙන් පැහැදිලි වේ. ලක්දිව ස්තූපයේ වාස්තු විද්‍යාත්මක අංග නිර්මාණ හා එහි විකාශනය පිළිබඳ අධ්‍යයන කිරීමේ දී ද අභිලේඛන සහිත ධාතු කරඬු මගින් ලැබෙනුයේ මහඟු පිටුවහලකි. එනම් ලක්දිව ස්තූප තුළ කොත් කැරැල්ල නිර්මාණය වීම ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසෙන් පසු සිදු වූ බව බොහෝ උගතුන්ගේ පිළිගැනීම වුව ද කණිට්ඨතිස්ස රාජ්‍ය සමයේ දී (164-186) මෙරට ස්තූප කොත් කැරැල්ල නිර්මාණය වූ බව දිසවාපි හා නටබුන්වැව ස්තූපවලින් හමු වූ රන් පත්තිරු සහිත ධාතු කරඬු තුළින් තහවුරු කළ හැකි ය.

**මූලාශ්‍රය**


අමරවංශ හිමි, කොත්මලේ, (1969) **ලක්දිව සෙල්ලිපි.** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

**කුඹුක්කඩවල නිල්ගිරි ස්තූප කැණීම් වාර්තාව II අදියර** (2010) කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

කුලතුංග, ටී.ජී. (2014). **අභයගිරි විහාරය**. කොළඹ:මධ්‍යම සංස්කෘතික අරමුදල.

**කෞතුක වස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය: දැළිවල කොටවෙහෙර විහාරය** (2010) කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**ජාතකට්ඨ කතා**II (2007) නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ථෙරීගාථට්ඨ කතා** (2009) නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දිසානායක, රුක්ෂානි. ගීතිකා. (2013). 'අනවසර කැණීම් මගින් වාර්තා වූ මැටි බඳුන් පිළිබඳ පුරාවිද්‍යාත්මක අනාවරණයක්'. **පුන්කලස** (සංස්) සෙනරත් දිසානායක කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**නාවාගලස්තූප කැණීම් මූලික වාර්තාව.** (2013). කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**නිල්ගිරි ස්තූප කැණීම් වාර්තාව II අදියර.** (2010). කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පරණවිතාන, සෙනරත්. (2014). **පුරාවිදු පර්යේෂණ.** බොරලැස්ගමුව:විසිදුණු ප්‍රකාශකයෝ.

**පරමත්ථජෝතිකා නම් වූ සුත්තනිපාතට්ඨ කථා.** (2008). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**පුරාවිද්‍යා පාලන වාර්තා.** (1951). කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බණ්ඩාර සහ තවත් අය. (2011). **මලලආර වම් ඉවුරෙන් හමු වන කුඩා ස්තූප සංස්කෘතිය. පුන්කලස I වෙළුම.II කොටස** (සංස්) සෙනරත් දිසානායක කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බණ්ඩාර, නිලන්ති. (2008). **පුරාණ ශ්‍රී ලංකාවේ සමාජය (බ්‍රාහ්මී ශිලාලේඛන ඇසුරින්)**. කඩවත: කඩුල්ල ප්‍රකාශන.

**මහාවංශය** (2012). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මෙධානන්ද, එල්ලාවල, (2000). බුදු සසුන බැබලුණු පැරණි පුදබිම්. මරදාන :ගොඩගේ ප්‍රකාශකයෝ.

රත්නසිරි, පී.ඩී. (2002). **ඓතිහාසික සේරුවිල** අමුද්‍රිත විද්‍යාපති උපාධි නිබන්ධනය. කොළඹ : පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

වික්‍රමසිංහ, දොන් මර්තීනු ද සිල්වා (පරි) සද්ධාමංගල කරුණාරත්න (සංස්) (2000). **ශිලාලේඛන සංග්‍රහය, 1 වෙළුම.** කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසේකර, නන්දදේව. (1990). ***අභිලේඛන. දෙවන වෙළුම.*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය (1890-1990) සමරු පොත් පෙළ. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

**විල්ගම්වෙහෙර නටබුන්වැව දාගැබ් කැණීම් වාර්තාව.** (2010) කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සමරනායක, ගාමිණී. (2012). 'සොරුන්ගේ දැතින් උදුරා ජාතියට පුදකළ අගනා රන් තහඩු ලිපියක්' **පුන්කලස I වෙළුම.II කොටස** (සංස්) සෙනරත් දිසානායක. කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සිරිසෝම. එම්.එච්. (1986). **උතුරු නැගෙනහිර බෞද්ධ උරුමය.** වැල්ලම්පිටිය : චතුර මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාව (සංස්.) (1967). **මහාවංසය.** කොළඹ : රත්නාකාර මුද්‍රණ.

හෙට්ටිආරච්චි, කරුණාසේන. (2017). **ශ්‍රී සර්වඥ ධාතු අභිවන්දනා හබරකඩ ශ්‍රී ශෛලාන්තායතන විහාරස්ථ ධාතු පුද වත.** අතුරුගිරිය : ශ්‍රීජය ප්‍රින්ට් හවුස්.

හෙට්ටිආරච්චි, කරුණාසේන. (2017). **'ශ්‍රී ලංකාවේ රන් පත්තිරු ලිපි'** The Jouríl Of Archaeology and Heritage Studies. Rajarta University of Sri Lanka. Mihintale.

Cunnigham A. (1854) The Bhilsa Topes or Buddhist Monuments of Central India, Publkished by London Smith ELDER and Co 65. Cornhilꞓ

Dias, M (1991) Epigraphyical Notes. Colombo Department of Archaeology

Paranavitana, S. 1970 Inscription of Ceylon. Vol. i, Colombo: Department of Archaeology.

Paranavitana, S.,Karunarathna Saddhamangala & Veluppillai, A. 1973
**Epigraphia Zselanica vol ,**Ceylon. vi Archaeological Survey of Ceylon , Published by the Department of Archaeology.

Paranavitana, s. (1946) Journal of the Ceylon Branch of the Royal Asiatic Society **vol xxxvii part-I** ,Colombo, The Ceylon Observer, Printers

Paranavitana, S. (2001) **Inscription of Ceylon Vol II Part II**, Colombo Department of Archaeology

Paranavitana, S. (1933), **Epigraphia Zeylanica. Vol. iii,** Oxford University Press. London

Paranavitana, S., (1983) **Inscriptions of Ceylon, Vol. II, Part I,** Moratuwa, Department of Archaeology.

Parker, H. (1909) **Ancient Ceylon An Account of the Aboriginies and of part of the early civilization**, London Luzac & Co.

Ranawell. S (2005) **Sinhala Inscriptions In the Colombo National Museum,** Colombo. Department of National Museum.

Sirisoma, M. (1991) **Dighavapi Gold- leaf & Inscription** (ed) Jayantha Uduwara, Colombo Department of Archaeology

Sirkar, D. (1942) **Indian History and Civilization vol.i** University of Calcutta.

Silva , P. (1975) A Catalogue Antiquities and other cultural objects from **Sri Lanka (Ceylon) Abroad** Colombo. Department of National Museum.

# ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ අභිචාර හා සුසාන චාරිත්‍ර

කේ. ඒ. තුෂාරා අයිරාංගනී[1]

## හැඳින්වීම

මූල ඓතිහාසික යනු, ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සකස් වෙමින් පවතින යුගය ලෙස හඳුනාගෙන ඇත. සියවසකට වැඩි කාලයක් තිස්සේ මෙරට සිදු කරන ලද පුරාවිද්‍යා අධ්‍යයන තුළින් ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික ගමන් මගෙහි සංගත තොරතුරු ග්‍රහණය කර ගැනීමට හැකි වී තිබේ. ප්‍රාථමික යුගයෙන් ඇරඹුණ ශ්‍රී ලංකා මානව සංස්කෘතිය විවිධ හැඩගැසීම් ඔස්සේ ගමන් කරමින් මධ්‍යශිලා යුගය පසු කොට යකඩ යුගයට පිවිසෙන ආකාරය පර්යේෂකයන් පෙන්නුම් කර තිබේ (Draniyagala 1992:18-47; Senaviratne 1984:237-307). මෙම කාල පරිච්ඡේදය ලෙස වර්තමානයේ සාමාන්‍යයෙන් පිළිගැනෙන්නේ ක්‍රි.පූ. 900 සිට ක්‍රි.පූ. 300 දක්වා කාල පරාසයයි. එහෙත් එම කාල පරාසය වර්තමාන පර්යේෂණ මගින් වෙනස් වුව ද එය තවත් පාර්ශ්ව ගණනාවකින් තහවුරු විය යුතු ය. එම පර්යේෂණවලට අනුව ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ක්‍රි.පූ. 5000 තරම් ඈතට දිවෙන බව සොයාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධිය ක්‍රිස්තු පූර්ව 2400 දී පමණ ආරම්භ ව විකාශනය වූ බව පර්යේෂකයන් පෙන්වා දී තිබේ (Somadeva 2006:13). මෙම සංස්කෘතික අවධිය හඳුනාගැනීම සඳහා පර්යේෂණ දායකත්වය දැක්වූවන් අතර පෝල් ඊ. පීරිස්, රාජා ද සිල්වා, සුදර්ශන් සෙනෙවිරත්න, පොන්නම්බලම් රඝුපති, එස්.කේ. සිත්‍රම්පලම්, සිරාන් දැරණියගල, සේනක බණ්ඩාරනායක, නිමල් පෙරේරා, ප්‍රියන්ත කරුණාරත්න, රාජ් සෝමදේව, ගාමිණී අධකාරී, ඩී.කේ. ජයරත්න, මෙලාති සල්ඩින්, රංජිත් බංඩාර දිසානයක, තුසිත මැන්දිස්, මංගල කටුගම්පොළ ආදි පර්යේෂකයන් පෙන්වාදිය හැකි ය. එම පර්යේෂකයන් සිදු කර ඇති පර්යේෂණ අනුව මේ වන විට ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධියට අයත් සුසාන සම්බන්ධ කාල නිර්ණ මෙසේ ලැබී තිබේ. බෙරගල කළුපහණ වත්ත ක්‍රිස්තු පූර්ව 2400, හල්දුම්මුල්ල ක්‍රිස්තු පූර්ව 1750 (මනමේන්ද්‍රආරච්චි හා අදිකාරී 2014:227) රංචාමඩම ක්‍රිස්තු පූර්ව 1359 (Somadeva, Disanayake & Fernando 2006:13) කොක්එබේ ක්‍රිස්තු පූර්ව 790 (මැන්දිස් 2017:177-179), ඉබ්බන්කටුව ක්‍රිස්තු පූර්ව 700-400 (Bandaranayake & Deraniyagala 1992:734) ඉහළ කලවැල්ලා උල්පත (සීගිරිය) ක්‍රිස්තු පූර්ව 520 (Jayaratne 2014:25-40), තම්මැන්නාගොඩැල්ල ක්‍රිස්තු පූර්ව 490 (Disanayake 2013) නිකවලමුල්ල ක්‍රිස්තු පූර්ව 400 කලඔටුවාව ක්‍රිස්තු පූර්ව 130 (Deraniyagala 2007:69) පිංවැව ගල්සොහොන්කනත්ත ක්‍රිස්තු පූර්ව 112 (Deraniayagala 2007:69) කුලියාපිටිය (දුම්මලසූරිය) ක්‍රිස්තු වර්ෂ 100-350 වශයෙන් ලැබී තිබේ. පූර්ව ඓතිහාසික අවධියේ පැවති සුසාන චාරිත්‍ර වැදගත් වන්නේ ඊට පෙර පැවති සංස්කෘතියට එනම් මධ්‍ය ශිලා යුගයට වඩා විධිමත් ආකාරයට එම කටයුතු හඳුන්වාදීම නිසා ය.

[1]. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
thusharairangani@gmail.com

පූර්ව ඓතිහාසික සංස්කෘතිය විධිමත් සංස්කෘතියක් මෙරටට හඳුන්වා දුන් අතර එම සංස්කෘතිය තුළ ජීවත් වූ මිනිසුන් ශ්‍රී ලංකා සමාජයට හඳුන්වා දුන් විධිමත් භූමදාන ක්‍රමවේද හා සුසාන චාරිත්‍ර ද වැදගත් වේ. මෙම යුගයේ දී ශ්‍රී ලංකාව තුළින් හඳුනාගත හැකි ශවෝපචාර ක්‍රම අතරින් විධිමත් ලෙස ස්ථාපිත කළ සුසාන ආකෘති ගණනාවක් තිබේ. මෙම සුසාන සංකීර්ණයේ ගති ලක්ෂණ අර්ධද්වීපික ඉන්දියාවට සමානය (Senaviratne 1984:237-307). පර්යේෂකයන් හඳුනාගෙන ඇති ආකාරයට එම සුසාන ආකෘති අතර මැටි ඔරු සුසාන (Clay canoe/Clay cist), ශිලා මංජුසා සුසාන (Cist ඉමරස්ක), ශිලා මණ්ඩල සුසාන (Cairn circle), ශිලා කේතුක සුසාන (Cairn mound/Cairn heap), ශිලා පෙළ සුසාන (Alignment), ශිලා ටැඹ සුසාන (Men hire), බරණි සුසාන (Urn pot) ශිලා මඤ්චක සුසාන (Delmenoid) යන සුසාන ආකෘති ශ්‍රී ලංකාවෙන් හඳුනාගෙන ඇත (Senavirathne 1984:237-306; 2007:135-167; මැන්දිස් 2016 :150-153).

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ සංස්කෘතිය ඔවුන් භාවිත කළ අවමංගල්‍ය විධික්‍රමය අනුව කොටස් දෙකකට බෙදා දක්වයි.

1. මැටි කුටීර සංස්කෘතිය - Clay Cist Culture
2. මෙගලිතික සංස්කෘතිය - Megalithic Culture

## 01. මැටි කුටීර සංස්කෘතිය - Clay Cist Culture

මැටි කුටීර සංස්කෘතිය ශ්‍රී ලංකාවට ම ආවේණික එකක් ලෙස සැලකිය හැකි ය. මේවායින් ලෝහ ද්‍රව්‍ය හෝ කාලරක්ත මැටි බඳුන් හමු නොවේ. මේවායේ ව්‍යාප්තිය බැලූ විට මැටි කුටීර සංස්කෘතිය තෙත් සහ අන්තර් කලාපවල ව්‍යාප්ත වී තිබේ. 1952 වසරේ දී දැරණියගල මාතර බණ්ඩත්තර දී මුල්වරට මෙම සුසාන වර්ගය වාර්තා කර තිබේ (Wanninayake 2016:216). නමුත් මෙය සුසානයක් ලෙස නිශ්චිත ලෙස ඔහු එවක හඳුනාගෙන නැත. 1982 වර්ෂයේ දී ඉබ්බන්කටුව සුසාන භූමිය තුළින් මෙවැනි සුසානයක් පුරාවිද්‍යා කැණීමකට ලක් කළ ද එය හඳුනාගෙන ඇත්තේ ගිනි දල්වන ස්ථානයක් ලෙස ය. එම සුසානය තුළ තිබී කානීලියන් පබළු හමු වී ඇති අතර එයින් ලබාගත් අඟුරු සාම්පල ආශ්‍රිත ව සිදු කරන කාලනිර්ණවල දී එම සුසානය ක්‍රිස්තු පූර්ව 720ට කාල නිර්ණය වී ඇති බව නිමල් පෙරේරා විසින් ප්‍රකාශ කරන ලදි. 1996 වර්ෂයේ දී නිමල් පෙරේරා අත්තනගල්ල වාරණ ලෙන ආසන්නයේ ඇති ඕගොඩපොළ ස්ථානයේ හමු වූ සුසානයක් කැණීම් කර එය ක්‍රිස්තු පූර්ව 250ට අයත් වන බවට කාබන් කාල නිර්ණ අනුව පෙන්වා දී ඇත. රංජිත් දිසානායක රුවන්වැල්ල, නිකවලමුල්ල සුසානය ආශ්‍රිත ව කැණීම් සිදු කර එය ක්‍රිස්තු පූර්ව 400ට අයත් බව කාල නිර්ණය කර තිබේ. 2006 වර්ෂයේ රාජ් සෝමදේව ඇඹිලිපිටිය රංචාමඩම සුසාන කැණීම් කර එම සුසානය ක්‍රිස්තු පූර්ව 1359 (Somadeva 2006:) හා දියතලාව හල්දුම්මුල්ල සුසානය කැණීම් කර එය ක්‍රිස්තු පූර්ව 1750ක් පැරණි බව හා බෙරගල කළුපහණවත්ත ක්‍රිස්තු පූර්ව 2400 කාල නිර්ණය කර තිබේ

(මනමේන්ද්‍රආරච්චි සහ අදිකාරී 2014:227). 2013 වර්ෂයේ නිමල් පෙරේරා විසින් හලාවත දුම්මලසූරිය ප්‍රදේශයේ සුසාන ආශ්‍රිත සිදු කරන ලද කැණීම අනුව එම සුසානය ක්‍රිස්තු වර්ෂ 350ට අයත් බව කාලනිර්ණය කර ඇත. මෙවැනි ආකෘතියේ සුසාන ඉන්දියාවේ ද නොමැති බව ඉන්දීය පූර්ව ඉතිහාසය සම්බන්ධ විශේෂඥයකු වන මහාචාර්ය කේ. රාජන් ද පෙන්වා දී ඇති බව නිමල් පෙරේරා සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවේ දී පැහැදිලි විය. ඒ අනුව ඉතා ඈත ඉතිහාසයේ සිට ම ඓතිහාසික යුගය දක්වා සහස්‍ර වර්ෂ තුනකට ආසන්න කාලයක් මැටි ඔරු සුසාන ආකෘතිය ශ්‍රී ලංකාව තුළ බලපවත්වා තිබේ. මෙතෙක් හමු වූ මැටි ඔරු සුසාන බොහොමයක් ස්ථාපිත වී ඇත්තේ කඳුකර කලාපයේ හා අන්තර් මධ්‍යම කලාපයේ වීම ද විශේෂ වේ. මෙම සුසාන තුළ මළ මිනිය සම්පූර්ණ වශයෙන් හෝ මානව අස්ථි කොටස් දවා තිබීම හෝ මුට්ටි තුළ බහා දැවීම සිදු කළ බව එහි අභ්‍යන්තරයේ හමුවන තැන්පතු තුළින් හඳුනාගත හැකි වේ.

## රංචමඩම

මෙම සොහොන්වලින් ක්ෂුද්‍ර ශිලා මෙවලම් හමු වී තිබේ. මෙම සොහොන් මුළුමනින් ම මැටියෙන් නිමවා තිබේ. ඒවා ඇතුලත ගිනි දැල්වීම මගින් ශක්තිමත් කර තිබේ. රංචාමඩමින් හමු වූ සොහොන්වලින් ගැඹුරු ම කුටීරය අඩි 4ක් විය. එම කුටීරයේ ශරීර ආදාහනය කර ඉතිරිවන කොටස් අනෙක් කුටීරවල තැන්පත් කරන්නට ඇත. එම කුටීරය ගැඹුරු වන්නේ ඒ නිසා ය. ශරීර කොටස් තැන්පත් කර ඉන්පසු මැටි ගුලි ඒ තුළ දමා ඇත. එමනිසා ඇට කැබලි පොඩි වී ගොස් තිබේ. මෙම කුටීර කුඩා, අසමාන මැටි ගඩොල් එක මත එක තබා තනා තිබේ (වරිච්චි මෙන්). වරිච්චි බැඳීමට ඉලුක් ලී යොදාගෙන ඇත. මෙහි කාලනිර්ණයෙන් ක්‍රි.පූ. 1359 ලැබී තිබේ.



**රංචමඩම කැණීම් බිමෙන් හමුවන මැටි කුටීර සුසාන කිහිපයක්**

## නිකවලමුල්ල

මෙහි නොගැඹුරු මැටි කුටීර තුළ බඳුන් තැන්පත් කර තිබී ඇත. අභිචාරය කිරීමට පළමු කුටීරයේ අමු මැටි පිළිස්සෙන සේ පහළින් ගිනි දැල්වූ බවට සාධක හමුවේ. එහි දී පිටත පස් ද පිළිස්සුණු බවට සාධක හමුවේ. භෂ්මාවශේෂ තැන්පත් කරන ලද මුට්ටි තැන්පත් කළ මැටි ගර්භ ද මෙහි තිබී හමුවිය. මේවා ආදාහන ගර්භවලට වඩා ප්‍රමාණයෙන් කුඩා වේ. යකඩ ආයුධවලින් කපන ලද සලකුණු සහිත අඩක් පිළිස්සුණු දර කොටස් මෙහි දී හමුවූ අතර, ඒවා කාලනිර්ණය කළ විට ක්‍රි.පූ. 400 ක්‍රි.පූ. 130 ලැබුණි. භෂ්මාවශේෂ තැන්පත් කළ කුටීරවල තිබී දර කොට හමු නොවූ අතර මැටි බඳුන් තැන්පත් කළ පසු අභිචාර විධියක් ලෙස විශාල මැටි ගුලි ඒ මතට දමා ඇති බව ද සොයාගනු ලැබී ය. මෙම ක්‍රියාව හේතුවෙන් එම මැටි බඳුන් කැබලිවලට කැඩීතිබේ. එම මැටි ගුලි ද පුළුස්සා ඉන්පසු දමා තිබේ. මෙම සොහොන් ඉදිකර ඇත්තේ රංචාමඩමට වඩා වෙනස් ලෙස ය. මෙහි ආදාහන කුටිරය, පොළොව හාරා ඉන්පසු එහි බිත්තිවල මැටි ආලේප කිරීමෙන් බිත්තියක්

තනා ඇත. රංචාමඩමේ ඊට වඩා වෙනස් ලෙස මැටි ගඩොල් යොදාගනු ලැබිණ. එම බිත්තිය සවිවර කිරීමට පතුලේ ගිනි දැල්වූ බවට සාධක එහි පතුලේ පොළොව පිළිස්සුණු සලකුණුවලින් හෙළිවේ. මෙම ආදාහන කුටීරය නැවත නැවත භාවිත කළ බවට සාධක හමු වී තිබේ. ඒ ස්තර කිහිපයක ම පිළිස්සුණු සාධක හමුවීමෙනි. කලින් මළවුන්ගේ පිළිස්සුණු අඟුරු අවශේෂ පසෙකට ඇද නව පිළිස්සීම කර තිබූ අතර, එසේ ඉවත් කළ අඟුරු විශාල ප්‍රමාණයක් ගර්භය තුළ ගොඩගැසී තිබී හමුවේ.

භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා භාවිත කළ ගර්භවල තත්ත්වය මීට වඩා වෙනස් වේ. ඒවා එතරම් ගැඹුරු නොවේ. මැටිවලින් බිත්ති බැඳ ඉන්පසු ව එහි භාණ්ඩ තැන්පත් කර භෂ්මාවශේෂ තැන්පත් කර තිබේ. මෙහි ද පිළිස්සීම් සලකුණු, පිළිස්සුණු වළං කැබලි දක්නට ලැබේ. එය අභිචාර ක්‍රමයක් ලෙස ගිනි දැල්වීමක් මිස ආදාහනය කිරීමක් නොවේ. පිළිස්සීම් නිසා කළු පැහැති වූ වළං කැබලි, කාලරක්ත මැටි බඳුන් යැයි පැවසීම, එම නිසා සාවද්‍ය වේ. මැටි ගුලි ද පුළුස්සාවලට දැමීම නිසා මැටි බඳුන් කැඩී තිබේ.



නිකවලමුල්ලේ පිහිටි මැටි කුටීර සුසානයක්

හල්දුම්මුල්ල කාලනිර්ණයෙන් ක්‍රි.පූ. 1700 ලැබේ. කලඔටුවාව ක්‍රි.පූ. 130 ද දුම්මලසූරිය ක්‍රි.ව. 300 ද ලබා දේ. මෙම සංස්කෘතිය වියළි කලාපයට සංක්‍රමණය වූ බවට සාධක හමුවන්නේ නැත.

## 02. මෙගලිතික සංස්කෘතිය Megalithic Culture

මෙම සංස්කෘතිය ලොව පුරා පැතිර තිබූ එකකි. එය ලෝකයේ උතුරු යුරෝපය, අග්නිදිග සහ දකුණු ආසියාව ඇතුළු කලාප රාශියක පැතිර තිබී ඇත. මෙගලිතික සංස්කෘතිය වියළි කලාපයේ හා අතරමැදි කලාපයේ දැකිය හැකි ය.

ශ්‍රී ලංකාවෙන් හමුවන පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන අතරින් සුලභ ලෙස වාර්තාවන සුසාන විශේෂය වන්නේ මෙගලිතික සුසාන ය. මෙම සුසාන මීට පෙර විස්තර කරන ලද මැටි ඔරු සුසානවලට වෙනස් වේ. මෙගලිතික යන වචනය පුරාවිද්‍යාඥයන් විසින් භාවිතයට ගනු ලබන්නේ 19 වැනි සියවස අග භාගයේ සිට ය. මෙහි පුරෝගාමියා ප්‍රංශ ජාතික ග්ලීන් ඩැනියෙල් ය. Meges යන ග්‍රීක වචනයෙන් නිෂ්පන්න මහා යන්නත් Lithic යන වචනයෙන් නිෂ්පන්න ශිලා යන්නත් එකතුකර Megalithic හෙවත් මහා ශිලා යන්න නිර්මාණය වී ඇත. මහා ශිලා යන්නෙන් ස්මාරකය ඉදිකිරීමට භාවිත කරන ලද ද්‍රව්‍ය ගම්‍ය නොවන බවත් එ මගින් අවමංගල්‍ය හෝ අනුස්මරණ විධියක් නිරූපණය වන බවත් ගෝල්ඩන් චයිල්ඩ් පෙන්වා දී ඇත. මෙගලිතික සුසාන සඳහා ශිලා මාධ්‍ය


භාවිත කර ඇති අතර ඒ සඳහා ශිලා පුවරු, ශිලා ටැඹ, ශිලා කුට්ටි භාවිත කර සුසාන ඉදිකර තිබෙන බැවින් මෙම සුසාන මෙගලිතික සුසාන වශයෙන් අර්ථ දක්වා තිබේ. මේ වර්ගයේ සුසාන වර්ග කිහිපයක් තිබේ.

## ශිලා මංජුසා සුසාන (Cist burial)

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධිය තුළින් බහුල ලෙස වාර්තා වී තිබෙන මෙගලිතික සුසාන වර්ගය ලෙස ශිලා මංජුසා සුසාන පෙන්වාදිය හැකි ය. මෙම වර්ගයේ සුසාන යාපන අර්ධද්වීපය, උතුරු මැද, වයඹ, අග්නිදිග හා නැගෙනහිර හා දකුණු පළාත යන පළාත් තුළින් වාර්තා වී තිබේ. ශිලා මංජුසා සුසාන ඉදිකිරීම සඳහා ශිලා පුවරු භාවිත කර තිබෙන අතර ඒවා තරමක් විශාල හා කුඩා ප්‍රමාණවලින් ද යුක්ත වේ. සිරස් අතට සිටුවන ලද ශිලා පුවරු හතරක් පෙට්ටියක් ලෙස සකස් කර මෙම සුසාන ඉදිකර තිබේ. එසේ සකස් කරන ගල් පෙට්ටිය හතරැස් හා ඍජු කෝණාස්‍රාරාකාර හැඩවලට සකස් කර තිබෙන අතර සමහර ශිලා මංජුසා සුසාන ස්වස්තිකාකාර ලෙස ද ඉදි කර තිබේ. මෙසේ සකස් කළ සෙල් පෙට්ටිය අභ්‍යන්තරයේ මැටි මුට්ටි තුළ බහා තිබූ මානව අස්ථි හෝ මළ මිනිය දහනය කළ අගුරු තැන්පත් කර ඒ සමග මියගිය පුද්ගලයා විසින් භාවිත කරන ලද පලඳනා මෙන් ම ඊ හිස්, නියන් හා තල, තඹ අංජන කූරු ඇතුළු විවිධ උපකරණ පූජා මුට්ටි තුළ බහා සොහොන අභ්‍යන්තරයේ තැන්පත් කර විශාල පියන්ගලකින් වසා තිබේ. මෙය එක් අතකින් අභිචාර කටයුත්තක් ලෙස සැලකිය හැකි අතර, එමගින් මියගිය පුද්ගලයාගේ මරණින් මතු ආත්මය පිළිබඳ ඔවුන් තුළ වූ ආකල්පයක් විය හැකි බව පෙන්වාදිය හැකි ය. ශ්‍රී ලංකාවේ ශිලා මංජුසා සුසාන වැඩි ම ප්‍රමාණයක් දැනට වාර්තා වන්නේ මල්වතු ඔය, යාන් ඔය, කිරිදි ඔය, දැදුරු ඔය ආදී ගංගා නිම්න ආශ්‍රිත ව ය. ඒ අතරින් යාන්ඔය මධ්‍ය නිම්නයේ වර්ග කිලෝමීටර් 1400ක භූ වපසරිය තුළ වැඩි ම ප්‍රමාණයක් මෙගලිතික සුසාන ස්ථානගත වී තිබේ. එම නිම්නයේ පමණක් මෙගලිතික සුසාන ස්ථාන 29ක් පමණ පවතින වන බව මේ වන විට වාර්තාකර තිබේ (මැන්දිස් 2008:105). යාන් ඔය නිම්නය ආශ්‍රිත ව පූර්ව ඓතිහාසික සංස්කෘතියට අයත් මුළු සුසාන ප්‍රමාණය 32ක් වේ. ඒ අතරින් මධ්‍ය යාන් ඔය නිම්නයේ සුසාන ස්ථානගත ව ඇති ස්ථාන ලෙස තම්මැන්නාගොඩැල්ල, ගල්ඇදකටුව, කල්පෙ, ගුරුගල්හින්න, නෙළුගොල්ලාකඩවල, ඇලපත්වැව, මහපොතාන, බෙරවායගල, කොක්එබේ, පන්වත්ත, පඬරුල්ලාව, දිවුල්වැව, රබෑව, මල්පෝරුවල, කිරිමැටියාව, ඕලුවැව, නෙතුගොල්ලව, කනගහඋල්පත, කරුවලගස්වැව, වාහල්කඩ, මාවතවැව, ගුරුගල්හින්න, මරදන්මඩුව, පරංගියාවාඩිය දික්වැව, ඇතාබැඳිවැව, පන්කැටියාව, පළුකැටිවැව ආදි ස්ථාන පෙන්වාදිය හැකි ය.

මෙම සුසාන භූමි අතරින් 1970 දශකයේ දී රාජා ද සිල්වා ගුරුගල්හින්න ආශ්‍රිත ව කැණීම් සිදු කර තිබෙන අතර එම සුසානය විද්‍යාත්මක ලෙස කාල නිර්ණය කර නොමැත. 2013 වර්ෂයේ දී රංජිත් දිසානායක තම්මැන්නාගොඩැල්ල ආශ්‍රිත ව පුරාවිද්‍යා කැණීම් සිදු කර එම සුසාන භූමිය ක්‍රි.පූ. 490 අදින් අවුරුදු 2490ක් පැරණි බව තහවුරු කර ගෙන තිබේ. එසේ ම 2016 වර්ෂයේ දී තුසිත මැන්දිස් විසින් කොක්එබේ මෙගලිතික සුසාන භූමිය ආශ්‍රිත ව සිදු කරන ලද පුරාවිද්‍යා කැණීම්වලට අනුව එම සුසානය ක්‍රි.පූ. 790ට අයත් බව කාල නිර්ණය කර තිබේ (මැන්දිස් 2017:177-179). මෙම කාල


නිර්ණය මෙතෙක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මෙගලිතික සුසාන සම්බන්ධ ව ඇති පැරණිතම කාල නිර්ණ වන අතර මීට පෙර පැවති පැරණි කාල නිර්ණය ඉබ්බන්කටුවෙන් වාර්තා වූ කාල නිර්ණයයි, එය ක්‍රි.පූ. 750 ලෙස ය (මනමේන්ද්‍රආරච්චි සහ අදිකාරී 2014:21). මෙයට අමතර ව ශිලා මංජුසා සුසාන මාමඩුව, අලුත්බෝමුව, කදිරවේලි, ඉබ්බන්කටුව, ගල්ගමුව අන්දරවැව, වට්ටක්කවාඩිය, පිංවැව ගල්සොහොන් කනත්ත, පොල්පිතිගම, ආනෙයිකොඩ්ඩායි,ගලේවෙලයටිගල්පොත්ත, හම්බන්තොට තඹරව ආදී ස්ථානවල ද පවතින බව පෙන්වාදිය හැකි ය.



ඉබ්බන්කටුවේ පිහිටි ශිලා මංජුසා සුසාන

## ශිලා කේතුක සුසාන (Cairn heap burial)

ශිලා කේතුක වර්ගයේ සුසාන හෙවත් ගල් ගොඩැලි සුසාන පූර්ව ඓතිහාසික යුගයේ දී මෙරට ශවෝපාචාර කටයුතුවල දී නිර්මාණය කර ඇති තවත් සුවිශේෂ සුසාන විශේෂයක් ලෙස පෙන්වාදිය හැකි ය. කේතු ආකාර ලෙස ගල් ගොඩවල් ගැසීමෙන් තැනූ සොහොන් මේවා වේ. මෙම සුසාන නිර්මාණය කිරීමේ දී මියගිය පුද්ගලයාගේ භෂ්මාවශේෂ හා ඔහු විසින් භාවිත කරන ලද ආභරණ ඇතුළු අනෙකුත් භාණ්ඩ මැටි බරණි හා පූජා මුට්ටිවල දමා වළ දමා ඒ මත කැටගල් හෝ ගල් පුවරු කන්දක් ආකාරයට ගොඩගසා සුසානය සකස් කර තිබේ. මෙවැනි සුසාන ශ්‍රී ලංකාව තුළින් දැනට වාර්තා වී ඇත්තේ කහටගස්දිගිලියට නුදුරු කොක්එබේ, හොරොව්පොතානට නුදුරු තිකවැව (පරංගියාවාඩිය), මොරගොඩයාය, ඕලුවැව, කනගහ උල්පත, හබරත්තවල, මාමඩුව, වෙලන්විට, ගොරක පැලැස්ස, ඇලපත්වැව යන ස්ථානවලිනි (Dissanayake 2017:2-35 ; මැන්දිස් 2016 :150-153).





කොක්එබේ පිහිටි ශිලා කේතුක සුසාන

## මැටි බරණි සුසාන (Clay urn burial)

ශ්‍රී ලංකාව තුළින් මෙවැනි සුසාන කතරගම මැණික් ගඟ, කළු ගඟ දූවේගම, තෙක්කම්, කරම්බන්කුලම, මාකේවිට, කොක්එබේ, ඉබ්බන්කටුව, තම්මැන්නාගොඩැල්ල, ගල්අතර, පොම්පරිප්පුව, අන්දරවැව ආනෙයිකොඩ්ඩායි, යාන් ඔය ආදී ස්ථානවලින් වාර්තා වී තිබේ. පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මිනිසුන් සිය අවමංගල්‍ය කටයුතු සඳහා භාවිත කළ තවත් සුසාන

විශේෂයක් ලෙස මැටි බරණි තුළ භෂ්මාවශේෂ හෝ අස්ථි තැන්පත් කර වළ දැමීම පෙන්වාදිය හැකි ය. මෙම සුසාන ක්‍රමය තුළ දී සිදු වන්නේ මියගිය තැනැත්තාගේ භෂ්මාවශේෂ හෝ සැකිලි කොටස් මහා කුම්භයක බහා වළ දැමීම ය. එම බරණි ප්‍රමාණයෙන් විශාල හා තරමක් කුඩා බඳුන් වන අතර ඒවා කාල රක්ත වර්ණ මෙන් ම සාමාන්‍ය රක්ත වර්ණ බඳුන් වේ. පොම්පරිප්පුව සුසාන භූමිය ආශ්‍රිත ව කැණීම් කරන ලද විමලා බෙග්ලි පෙන්වා දී තිබෙන ආකාරයට එම සුසාන බරණි තුළ තිබී මානව අස්ථි, දත්, පබළු, තඹ වළලු, ලෝහ කොටස් වාර්තා වී තිබේ (Begly 1981:51-95). මෙම සුසානයේ බරණි නිර්මාණය කිරීමේ දී සමහර සුසාන බරණිවල පතුල උල් ආකාර ලෙස ද සමහර සුසාන බරණිවල පතුල රවුම් ආකාර ලෙසට ද නිර්මාණය කර තිබේ.




**පොම්පරිප්පුවෙන් හමුවන සුසාන බරණියක්**

### ශිලා පෙළ සුසාන (Alignment)

ශ්‍රී ලංකාවෙන් හමුවන ශිලා පෙළ වර්ගයේ එක ම සුසානය පිහිටා ඇත්තේ කහටගස්දිගිලියට නුදුරු කොක්එබේ මෙගලිතික සුසාන භූමියේ ය. මීටර් එකක් පමණ උස ශිලා පුවරු සිරස් අතට පොළවේ සිටුවා තිරස් අතට පෙළක් ලෙස මීටර් 15 පමණ දිගට සකසන ලද ශිලා පෙළක දෙපැත්තේ ම සුසාන බරණි හා පූජා මුට්ටි වළ දමා තිබේ. මෙය සුවිශේෂ සුසාන ක්‍රමයක් වන අතර එය ශ්‍රී ලංකාවෙන් වාර්තාවන දුර්ලභ සුසාන වර්ගයක් ලෙස ද හඳුන්වාදිය හැකි ය. 2016 වර්ෂයේ දී මෙම සුසානයේ කොටසක තුසිත මැන්දිස් කැණීම් සිදුකර එය ක්‍රි.පූ. 770 අයත් බවට කාල නිර්ණය කර තිබේ.

### ශිලා ටැඹ සුසාන (Men hire)

ශ්‍රී ලංකාවේ හමුවන දුර්ලභ ගණයේ සුසාන විශේෂයක් ලෙස ශිලා ටැඹ සුසාන හැඳින්විය හැකි ය. දැනට වාර්තාවන අන්දමට මෙවැනි සුසානයක් මැදවච්චිය හොරොව්පොතාන මාර්ගයේ

තම්මැන්නාගොඩැල්ල ස්ථානයේ පිහිටා තිබෙන බවට උපකල්පනය කළ හැකි ය. මෙම සුසානය ඉදිකර ඇත්තේ විශාල ශිලා ටැඹක් සිරස් අතට සිටුවා එම ශිලා ටැඹ වටා මැටි මුට්ටි තුළ මියගිය තැනැත්තාගේ භෂ්මාවශේෂ හා ඔහු විසින් භාවිත කරන ලද ආභරණ ඇතුළු සුසාන තැන්පතු පූජා මුට්ටි තුළ බහා ඒ වටා තැන්පත් කර තිබේ. රංජිත් දිසානායක (2013) තම්මැන්නාගොඩැල්ල තුළ ඇති මෙම සුසානය කැණීම් කර තිබේ. වර්තමානය වන විට එය කඩා දමා තිබෙන අතර එය වටා ඇති කඩා දමන ලද ශිලා කොටස් අනුව මෙය ශිලා ටැඹ සුසානයක් බව උපකල්පනය කළ හැකි ය.

## ශිලා මඤ්චක සුසාන (Delmenoid)

ශිලා මඤ්චක වර්ගයේ සුසාන ද පූර්ව ඓතිහාසික අවධියේ ශ්‍රී ලංකාවේ ශවෝපචාර කටයුතු සඳහා ඉදිකරන ලද සුසාන විශේෂයකි. මෙම සුසාන ආකෘතිය ශිලා මංජුසා සුසාන ක්‍රමවේදයට සමාන ලෙස ඉදිකර තිබුණ ද එයින් වෙනස් වන්නේ ඒවා පොළවෙන් ඉහළට සිරස් අතට සිටුවන ලද විශාල ගල් පුවරු යොදා ගල් ගෙයක් ආකාරයට ඉදිකර තිබීම නිසා ය.


එම ගල්ගෙය අභ්‍යන්තරයේ සුසාන බරණි තැන්පත් කර තිබෙන අතර මෙවැනි සුසානයක් රඹුක්කනට නුදුරු පදවිගම්පොළ නම් ස්ථානයෙන් වාර්තා වේ. පදවිගම්පොළ සුසානය තරම් විශාල නොවූ මෙවැනි සුසාන හොරොව්පොතානට නුදුරු වාහල්කඩ ප්‍රදේශයේ හා කහටගස්දිගිලියට නුදුරු ගල්ඇඳකටුව නම් ස්ථානයේ ද දක්නට තිබේ (Senavirathne 1984:237; මැන්දිස් 2016:150-153). මෙම සුසානයේ විශේෂත්වය වන්නේ එහි ඉදිරිපස විවෘත ව තැබීම හෝ ඉදිරිපස වසා දමා තිබීම ය. වසාදමන ලද සුසානයක නම් වසා දමන ලද ඉදිරිපස පාෂාණ පුවරුවේ වෘත්තාකාර සිදුරක් හෝ සෘජුකෝණාස්‍රාකාර කවුළුවක් තබා තිබේ. ශ්‍රී ලංකාවෙන් හමුවන මෙම සුසාන නිධන් හොරුන් දැඩි ලෙස විනාශ කර තිබෙන බැවින් මෙම තත්ත්වය හඳුනා ගැනීමට නොහැකි වී තිබේ.



**වාහල්කඩ ප්‍රදේශයෙන් හමුවන ශිලා මඤ්චක සුසානය**

## ශිලා වට සොහොන් (Stone circle burial)

ශ්‍රී ලංකාවෙන් වාර්තාවන මෙගලිතික සුසාන ආකෘති අතර හඳුනාගත හැකි තවත් වැදගත් සුසාන ආකෘතියක් වන්නේ ශිලා මණ්ඩල වර්ගයේ හෙවත් ශිලා වට සුසානයන් ය. එම සුසාන නිර්මාණය කිරීමේ දී ශිලා මංජුසා සුසානයක් තනා එය වටා රවුමට ශිලා කුට්ටි කවයක් ලෙස හෝ කව දෙකක් ලෙස යොදා සුසානය නිර්මාණය කර තිබේ. මෙවැනි සුසාන වව්නියාව මාමඩුව ප්‍රදේශයේ පවතින බව පෙන්වා දී ඇති අතර (Senavirathne 2007:135-191).කහටගස්දිගිලියට නුදුරු පළුකැටිවැව (වළහවිද්දවැව) ද මෙම සුසාන පවතින බව පෙන්වා දී තිබේ (මැන්දිස් 2016:152). මීට අමතර ව මොරගොඩයාය, ඕලුවැව, ගොරකපැලස්ස, නීලගිරි සෑය, කෝවිල්තැන්න, සෙට්ටිවත්ත, කල්කනෙ පාලම යන ස්ථානවලින් ද මෙබඳු සුසාන පිළිබඳ වාර්තා වී තිබේ.



**පළුකැටිවැව කැණීම් මඟින් සොයාගත් ශිලා වට සුසානය**

## ස්ථාවර පුවරුව සහිත චෛත්‍ය ආකාරයේ සුසාන (Standing slab with cairn burial)

ඍජු ගල් පතුරකට එක් බිත්තියක් සමපාත වන සේ චතුරස්‍රාකාර ලෙස වළක් හාරා මෙම සොහොන් විශේෂය තනා තිබේ. අනෙක් බිත්ති කුඩා ගල් කැබලිවලින් (rubble) සමන්විත ය. ඍජු ගල් පතුර පොළොවෙන් ඉහළට එසවී ඇත. කුටීරය තුළ කිසිවක් තැන්පත් කර තිබී නැත. මුට්ටි ආදී සියලු ම දේවල් තබා තිබී ඇත්තේ එම ගල් පතුරුවලින් තැනූ බිත්ති (rubble wall) මත ය. යාන් ඔය, තම්මැන්නාගොඩැල්ලෙන් මෙවැනි සොහොනක් හමුවිය. තවත් හඳුනා නොගත් සුසාන විශේෂයක් ද හමු වී ඇත. ලෝහ ආයුධ විශාල ලෙස භාවිත කර කපා ගත් විශාල වෘත්තාකාර ශිලා පතුරකින් මේවා සමන්විත වේ. තම්මැන්නා ගොඩැල්ලෙන් ම මෙම සොහොන් විශේෂය හමුවේ.

ඉබ්බන්කටුව සොහොන්වල අවකාශීය සැකැස්ම වූයේ කුඩා පොකුරු වශයෙනි. ඒ ඒ පොකුරට ගර්භ 47, 21 වැනි ප්‍රමාණ අයත් විය. මෙම තත්ත්වය නිරීක්ෂණය කළ කරුණාරත්න එම පොකුරු සොහොන් එක් වර්ගයකට අයත් යැයි සඳහන් කළේ ය. ඒ අනුව පූර්ව ඓතිහාසික යුගයේ වර්ගය මත පදනම් වූ සමාජ ක්‍රමයක පැවැත්ම ඔහු විසින් පැහැදිලි කරන ලදී. පූර්ව ඓතිහාසික අවධි මේ අනුව මුළුමනින් ම අවමංගල චාරිත්‍ර මත පදනම් වූ සංස්කෘතියක් ලෙස සැලකිය හැකි ය. ඉබ්බන්කටුවේ සොහොන් තුළින් හමුවූ ආභරණවලින් ගම්‍ය වන්නේ එකල සමාජ ක්‍රමයේ මව්පියන්ගේ භාණ්ඩ දරුවන්ට උරුම වීමක් නොපැවති බවයි.

## සුසාන අභිචාර

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී මිනිසකු මියගිය පසු ව ඔහුගේ මතු ආත්මභවය වෙනුවෙන් සිදු කළ අභිචාරමය ක්‍රියාවලිය මෙම යුගයේ සුසාන ඇසුරින් හඳුනාගත හැකි ය. ඒ අතර සුසානයට රැගෙන එන මියගිය පුද්ගලයාගේ දේහය සුසාන භූමියේ තබා යම්කිසි ආගමික කටයුත්තක් සිදු කළ බවට හඳුනාගත හැකි සාධකයක් තම්මැන්නාගොඩැල්ල සුසානය තුළ පවතී. එම සුසාන භූමියේ මැද කොටසේ ඇති වෘත්තාකාර ලෙස සකස් කරන ලද ශිලාමය නිර්මාණ දෙකක් (විශාල හා කුඩා) හඳුනාගත හැකි අතර, එම ශිලා නිර්මාණය ගැටියක් සහිත ව නිර්මාණය කර තිබේ. එය එසේ නිර්මාණය කරන්නට ඇත්තේ සුසාන භූමියට රැගෙන එන මෘත දේහය ඒ මත තබා යම් ආගමික චාරිත්‍ර ඉටුකිරීමේ උවමනාවෙන් විය යුතු බව උපකල්පනය කළ හැකි ය. තම්මැන්නාගොඩැල්ල මැද ඇති මෙම නිර්මාණය තුළ අඩි හයක පුද්ගලයකු පහසුවෙන් දිගාකර තැබිය හැකි අතර එයට වඩා කුඩා රවුම තුළ කුඩා දරුවකු ඒ ආකාරයට ම දිගාකර තැබිය හැකි ය. මෙවැනි අභිචාරමය කටයුතු වර්තමානයේ දී ද සුසාන භූමි තුළ සිදු කරනු ලැබේ.

## සුසාන තැන්පතු

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන ආශ්‍රිත ව ඒවායේ තැන්පත් කර තිබී හමුවන තැන්පතු අතර ප්‍රධාන වශයෙන් ම විවිධ වර්ගයේ පබළු දක්නට ලැබේ. එම පබළු අතර කානීලියන්, ඇගේට්, ඔනික්ස්, රන්, වීදුරු හා බෙලිකටුවලින් තැනූ පබළු වර්ග ඉබ්බන්කටුව, තම්මැන්නාගොඩැල්ල, කොක්එබේ, ගලේවෙළ, පොම්පරිප්පුව, ආනෙයිකොඩ්ඩායි, රංචාමඩම ආදී ස්ථානවලින් වාර්තා වී තිබේ. එසේ ම සුසාන තැන්පතු අතර යකඩින් නිර්මිත වළලු, කරාබු, ඊ හිස්, තල හා විවිධ කෘෂි උපකරණ සුසාන තුළ තැන්පත් කර තිබී වාර්තා වී ඇත. එයට අමතර ව තඹවලින් නිර්මාණය කළ වළලු මෙන් ම ඇස් අලංකරණය සඳහා භාවිත කරන අංජන කූරු තම්මැන්නාගොඩැල්ල සුසානයෙන් ලැබී තිබෙන බව රාජා ද සිල්වා වාර්තා කර තිබේ.

පොම්පරිප්පු සුසාන භූමිය තුළ සිදු කරන ලද කැණීම්වල දී තිරිවාණා හා කහඳවලින් නිර්මාණය කරන ලද ශිලා මෙවලම් ලැබී තිබේ (Begly 1981:69-81). එසේ ම ඉබ්බන්කටුව හා රංචාමඩම කැණීම්වල දී ද ශිලා මෙවලම් ලැබී ඇති බව පෙන්වා දී ඇත (Somadeva, Disanayake & Fernando 2006; Senevirathne 1990:125). කොල්ලන්කනත්ත සුසානය ආශ්‍රිත ව සිදු කරන ලද කැණීම්වල දී හක් බෙල්ලන් හා මුතු එම සුසාන තුළ තැන්පත් කර තිබූ බව පෙන්වා දී ඇත (Deraniyagala 1955:56-133). එසේ ම පොම්පරිප්පු සුසානය ආශ්‍රිත ව මිනිරන් හමුවීම හා තඹ කැබලි හමුවීම ද ද විශේෂ වේ (ASCAR 1957:30-31). මෙම සුසාන තැන්පතු බොහෝ විට කාල රක්ත වර්ණ මැටි බඳුන් හෝ කාල වර්ණ හෝ රක්ත වර්ණ බඳුන්වල බහා තැන්පත් කර තිබීම ද විශේෂ ය. එමඟින් එකල සමාජය මියගිය තැනැත්තා භාවිත කළ ද්‍රව්‍ය හා උපකරණ සුසාන තුළ තැන්පත් කර

තිබීම තුළින් මියගිය තැනැත්තාගේ මතු ආත්මය සුඛිත කිරීමට අදහස් කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

**නිගමනය**

පූර්ව ඓතිහාසික යුගයේ සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ක්‍රමවත් සුසාන චාරිත්‍ර මෙරටට හඳුන්වා දීමයි. දැනට වාර්තා කර ඇති ආකාරයට 40කට වැඩි විශාල සොහොන් සංකීර්ණ මෙරට පුරා ව්‍යාප්ත වී ඇත. මෙම යුගය වනාහි ප්‍රාග් ඓතිහාසික යුගය මෙන් ලිඛිත සාධක නොමැති යුග වේ. එබැවින් එම යුග තුළ ක්‍රියාත්මක වූ ශවෝපාචාර කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ඇත්තේ පුරාවිද්‍යා ප්‍රභවයන් මත පදනම් වෙමිනි. ඒ අනුව මෙම අධ්‍යයනයේ පුරාවිද්‍යා ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමු කර අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වූයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ දී සරල ව ආරම්භ වූ සුසාන චාරිත්‍ර පූර්ව ඓතිහාසික යුගයේ දී සංකීර්ණ වළ දැමීමේ ක්‍රම භාවිත කළ බව හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම පුද්ගලයකු මියගිය විට ඔහුගේ මෘත දේහය වළ දමා මස් දිය වී ගිය පසු ව අස්ථි කොටස් මැටි බරණි තුළ බහා සුසානයක් තුළ තැන්පත් කිරීම හෝ ආදාහනය කරන ලද සිරුරෙන් ලබා ගත් මිනී අළු මැටි මුට්ටි තුළ බහා සුසාන තුළ තැන්පත් කිරීම සිදු කර ඇත. එහි දී විශේෂයෙන් ම මියගිය පුද්ගලයාගේ මතු ආත්මභවය සඳහා මියගිය පුද්ගලයා සමඟ ඔහු විසින් පරිහරණය කරන ලද විවිධ ද්‍රව්‍ය සුසානය තුළ තැන්පත් කර තිබීමෙන් ඒ බව මැනවින් පැහැදිලි වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සුසාන චාරිත්‍ර ඉතා දිගු කලක සිට ආරම්භ ව විධිමත් ව හැඩගැසී වර්තමානය දක්වා ම පැමිණ ඇති බව පෙන්වාදිය හැකි ය.

**මූලාශ්‍රය**


මනමේන්ද්‍රආරච්චි, කේ. එන්. ජී. අදිකාරී. (2014). **අනුරාධපුර පුරා ජෛව විවිධත්වය හා වර්තමාන ජෛව විවිධත්වය.** ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය.

මැන්දිස්, ඩී. ටී. (2016). මධ්‍ය යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික සුසාන ආශ්‍රිත වාස්තුවිද්‍යාවල ARSUR 2016, ***The Proceeding of Second Archaeology Symposium***, Rajarata University of Sri Lanka: Department of Archaeology and Heritage Mangement.

මැන්දිස්, ඩී.ටී. සහ විතානාච්චි, සී.ආර්. (2017). **මධ්‍ය යාන් ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව**. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය: පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල.

මැන්දිස්, ඩී.ටී. සහ වගලවත්ත, තුසිත. (2008). **ශ්‍රී ලංකා සංස්කෘතියේ මුල් පිය සටහන්**. කොළඹ 10: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

Adikari, G. (1994). Approches to the Prehistory of the Sigiri Dambulla region, ***Futher studies in the settelment archaeology of the Sigiriya Dambulla region*** (eds. Bandaranayake, S. and M. Morgon).

Begly, V. (1981). 'Excavation of Iron Age burials at Pomparippu 1970', ***Ancient Ceylon No. 04*** : 49 - 142, Colombo: Archaeology Survey Department.

Deraniyagala, S. (1992).*'**The Prehistory of Sri Lanka'An Ecological Perspective**,* Colombo: Archaeological Survey Department.

Deraniyagala, S. (2007). 'The Pre history and Proto history of Sri Lanka', ***The Art and Archaeology of Sri Lanka***, Central Cultural fund, Ministry of Cultural Affairs.

Deraniyagala, P.E.P. (1958). ***The Pleistocene of Ceylon, Sri Lanka.*** Colombo: National Museums.

Dissanayake, R.B. (2017). 'Petroforms: Stone Circles, Bolder Rectangules, and Cairn Features discoverd at Yan Oya Middle Basing', ***The Journorl of Archaeology and Heritage Studies***. Rajarata University of Sri Lanka, Mihinthale: Department of Archaeology and Heritage Management.

Kennedy, K.A.R. (2000). '***God Apes and fossil men***', Palioantropology in South Asia, Michigan: University of Michigan.

Perera, H. N. (2010). '***Prehistoric of Sri Lanka***' Late Plestocene rockshlters and an open- air site, BAR International Series 2142.

Seneviratne , S. (1984). 'The Archaeology of the Megalithic – Black and Red Ware Complex in Sri Lanka', *Ancient Ceylon* ***No. 5***: 237-305.

Seneviratne, S. (2007). 'The Archaeology of the Megalithic – Black and Red Ware Complex in Sri Lanka', ***Art and Archaeology of Sri Lanka***, Central Cultural Fund, Ministry of Cultural Affirs.

Somadeva, R. (2006). ***Urban Origins in Southern Sri Lanka***, Postgraduate Institute of Archaeology, Department of African and Comparative Archaeology, Uppsala University: Department of Archaeology and Ancient History.

Wanninayake, A. (2016). A Protohistoric Burial Tradition in Sri Lanka, ***Ancient Ceylon*** *No. 25*. Colombo: Archaeology Survey Department.

Wijepala, W.H. (2007). Possible Neolithic evidence in Sri Lanka, ***Art and Archaeology of Sri Lanka***. Central Cultural Fund, Ministry of Cultural Affirs

# ආදි මානව සිතුවම් නිර්මාණයේ දී උපයුක්ත කරගත් ජීවන අනුභූතීන් සහ මනෝ සංකල්ප හඳුනාගැනීම (රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරින්)

කේ. උදේනි අරුණසිරි[1]

## හැඳින්වීම

මිනිසාගේ මූලික අවශ්‍යතා වනුයේ ආහාර, ලිංගිකත්වය හා ආරක්ෂාවයි. මෙම මූලික අවශ්‍යතා සපුරා ගැනීමෙන් අනතුරු ව ඉන් සෑහීමකට පත්නොවන ඔහු තවත් අවශ්‍යතා ගණනාවක් සපුරාගනී. ඒවා ද්විතීය අවශ්‍යතා නම් වන අතර අධ්‍යාපනය, ආගම, දේශපාලනය හා කලාව යනු ඒවා වේ. මෙහි දී කලාව යනුවෙන් හඳුනාගන්නේ සංස්කෘතික අංගයකි. මානව විද්‍යාඥයන් සංස්කෘතිය අධ්‍යයනයට ලක්කිරීමේ දී කලාව ද සැලකිල්ලට ගෙන ඇත. මෙම නිසා ඕනෑ ම මානව විද්‍යා නිර්දිෂ්ට ග්‍රන්ථයක කලාව පිළිබඳ විග්‍රහයක් ද හඳුනාගත හැකි ය. කලාව පෞද්ගලික මෙන් ම සාමූහික උත්සාහයක ප්‍රතිඵලයකි (පෙරේරා 1992:27). කිසියම් සමාජයක වන ගතිලක්ෂණ එනම්, සරල බව මෙන් ම සංකීර්ණත්වය ඔවුන් විසින් නිර්මාණය කෙරෙන කලා කෘති තුළින් පෙන්නුම් කෙරේ. එය නිරායාසයෙන් ම සිදුවන දෙයකි. කලා සහ ශිල්ප (Arts and Crafts) යන වචන ද්විත්වය එකිනෙකට බැඳී ඇත. ඉංග්‍රීසි භාෂාවේ Arts නම් වචනයේ හා ලතින් හා ජර්මන් භාෂාවේ වන Arts හා Kust යන වචනවල ප්‍රධාන අරුත වන්නේ කුසලතාව යන්නයි (ලගමුව 1994:26). මේ අනුව කලාව යනු කුසලතාව වශයෙන් ද, කලාකරුවා යනු කුසලතාවක් ඇති පුද්ගලයා වශයෙන් ද හැඳින්වීම සුදුසු වේ. මිනිසා භාෂාව හැසිරවීම සඳහා අක්ෂර මාලාවක් නිර්මාණය කර ගැනීමට පෙර පැවතියේ දෘශ්‍ය හා සංයුක්ත (Visual and concrte) ශිල්පීය ක්‍රමයකි. එම ශිල්ප ක්‍රමවල පොදු ලක්ෂණ දෙකකි. ඉන් පළමුවැන්න ඒවා යම් යම් සිදුවීම්, ලැයිස්තු, බඩු මුට්ටු සහ දේපළ ආදිය පිළිබඳ ව යළි මතකයට නංවා ගත හැකි කල් පවත්නා දෘශ්‍ය සලකුණු වීමයි. දෙවැන්න එම සලකුණු අන්‍යයන් දැනුවත් කරන දෘශ්‍ය නිවේදන වීමයි (රණවීර 2008:90). ලෝකයේ විවිධ ප්‍රදේශවලින් හමු වී තිබෙන ආදි මානව සිතුවම් පිළිබඳ අධ්‍යයනය කළ ඇබේ හෙන්රි බෘයිල් සහ ආන්ද්‍රෙ ලෙරෝයි ගුර්හම් "එම සිතුවම් ලිවීම ආරම්භ වීමට පෙර මානව සමාජයේ පැවති ප්‍රබල සන්නිවේදන ස්වරූපයක්" ලෙස ප්‍රකාශ කරති.

ශ්‍රී ලාංකේය ආදි මානවයා විසින් නිර්මාණය කරන ලද සිතුවම් ස්ථාන 95ක් වර්තමානය වන විට මෙරටින් වාර්තා වී තිබේ. මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ මෙරට පළකරන ලද ආසන්නතම ශාස්ත්‍රීය ලේඛනය වූ 'ශ්‍රී ලාංකේය ආදි වාසීන්ගේ සෙල් චිත්‍ර' කෘතියේ දී ස්ථාන 93ක් පිළිබඳ ව වාර්තාකරන අතර පර්යේෂකයා රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා කරන ස්ථාන ද සමඟ මෙම සංඛ්‍යාව 95 ක් වේ

[1] *පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව*
udenisjp@yahoo.com

(ඉලංගසිංහ 2017:38). මෙම පර්යේෂණයේ මුඛ්‍ය පර්යේෂණ ගැටලුව රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන ආදි මානව සිතුවම් නිර්මාණයට පසුබිම් වූ වස්තු විෂය කුමක්ද යන්නයි. ඒ අනුව පර්යේෂණයේ අරමුණ වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වන ආදි මානව සිතුවම් ස්ථාන හඳුනාගැනීම හා ඒවායෙහි වස්තු විෂයයන් හඳුනාගැනීමයි. මෙහි දී මූලාශ්‍රය අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් ලබාගන්නා ලද දත්ත විශ්ලේෂණය කර අවසන් නිගමනවලට එළඹෙන ලදි. මූලාශ්‍රය අධ්‍යයනයේ දී බී.ඩී.නන්දදේවගේ *Rock Art sites of Sri Lanka-A catalogue* (1986) ලිපිය, සෙලිග්මාන් යුවළගේ *The Veddas* (1911) කෘතිය සේනක බණ්ඩාරනායකගේ *The Rock and wall Painting* (1986) කෘතිය රාජ් සෝමදේවගේ *Rock Painting and Engraving sites in Sri Lanka* (2012) කෘතිය හා සත්සර ඉලංගසිංහගේ "**ශ්‍රී ලාංකේය ආදි වාසීන්ගේ සෙල් චිත්‍ර**" කෘතිය (2017) ප්‍රධාන කරගත් දේශීය හා විදේශීය ආදි මානව සිතුවම් පිළිබඳ රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි රාශියක් මේ යටතේ දී අධ්‍යයනය කරන ලදි. එසේ ම මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයා හා වැදි ජනයා පිළිබඳ රචිත ග්‍රන්ථ හා ලිපි රාශියක් ද මෙහි දී අධ්‍යයනය කළේ ය. පර්යේෂකයා මෙරට ආදී මානව සිතුවම් වර්තාවන රජගල කන්ද, නීලගිරි කන්ද, පුළුකුණාව, තන්තිරිමලය, තරුලෙන්ගල, කරඳගොල්ල, දොරවක්කන්ද, හෙනන්නේගල හා වෙට්ටඹුගල යන ස්ථාන මෙම පර්යේෂණයට පූර්වයෙන් නිරීක්ෂණය කර තිබුණි. එසේ ම රත්නපුර දිස්ත්‍රික්කයෙන් පූර්වයේ වාර්තාවී තිබූ ආදි මානව සිතුවම් සහිත බුදුගල, කොණ්ඩගල හා ලිහිණිගල් ලෙන ක්ෂේත්‍රගත ව අධ්‍යයනය කරන ලදි. එසේ ම පර්යේෂකයා රත්නපුර දිස්ත්‍රික්කයෙන් අභිනවයෙන් හඳුනාගත් වෙහෙරගල කන්ද ලෙන, විහාරගල ලෙන හා සංඛපාල ලෙන යන ස්ථානයන්ගේ ආදි මානව සිතුවම් ද පර්යේෂණයට ලක් කළේ ය.

**පර්යේෂණ ක්ෂේත්‍රයේ පිහිටීම**

**බුදුගල** - N $6^{0}38^{1}03.2^{11}$/ E $80^{0}$ $52^{1}$ $30.7^{11}$ - රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුදුගල ග්‍රාම නිලධාරී වසමේ බුදුගල ආරණ්‍ය සංකීර්ණය පිහිටා තිබේ. බලන්ගොඩ නගරයේ සිට දකුණු දෙසට දිවෙන කල්තොට මාර්ගයෙන් කි.මී. 32ක් ගියවිට හමුවන කල්තොට උපනගරයේ සිට වැලිපතයාය-කපුගල දක්වා ඇති මාර්ගයේ කි.මී. දෙකහමාරක් පමණ ගියවිට ආදි මානව සිතුවම් ශේෂ වී පවතින බුදුගල ඓතිහාසික ආරණ්‍ය සංකීර්ණය හමුවේ. මෙහි ඇති නිධන් ගල ලෙස හඳුන්වන ගල් තලාව මත ආදි මානව සිතුවම් වේ. මුහුදු මට්ටමේ සිට අඩි 630ක් උසින් මෙම ගල්තලාව පිහිටා ඇත.

**කොණ්ඩගල** - N $6^{0}44^{1}25.99^{11}$/ E $80^{0}$ $39^{1}$ $11.63^{11}$ - රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගුරුබැවිලාගම ග්‍රාම නිලධාරි වසමේ මැද්දේගම ග්‍රාමයේ කොණ්ඩගල කඳු වැටිය අසල පිහිටි කඳු බෑවුමක මෙම සිතුවම් දක්නට ඇත. රත්නපුර-වේවැල්වත්ත මාර්ගයේ කි.මී.33ක් බලන්ගොඩ දෙසට පැමිණ වැල්ලවල හන්දියෙන් දකුණට හැරී කිලෝමීටරයක් ඉදිරියට ගියවිට ගුරුබැවිලාගම හන්දිය හමුවේ. එතනින් දකුණට හැරී කිලෝමීටරයක් ගියවිට ගයිරුනගම පාසල හමුවන අතර එතනින් වමට ඇති මාර්ගයේ කි.මී.1.7ක් ගිය පසු හමුවන ජී.එල්. විජේරත්න මහතාගේ නිවස අසලින් දකුණට ඇති පෞද්ගලික මාර්ගයේ මඳ දුරක් ගියවිට මෙම සිතුවම් සහිත

ගල් පෘෂ්ඨ හමුවේ. ජී.එල්. විජේරත්න මහතාගේ සහ පී.එම්.ඩබ්. රූපසිංහ මහතාගේ ඉඩම් දෙක අතර වන අක්කර 8ක භූමිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්වන අතර එම කොටසේ මෙම පාෂාණ සටහන් සහිත ගල් කුළු පිහිටා තිබේ. රූපසිංහ මහතාගේ නිවසේ සිට බස්නාහිර දිශාවට මීටර 75ක් දුරින් මෙම ගල් කුළු පිහිටා ඇත. නුවරඑළිය දිස්ත්‍රික්කයට ඉතා ආසන්න ව මෙම කඳුවැටිය පිහිටා තිබේ. මෙම සිතුවම් පූර්ව මූලාශ්‍රයවල කොණ්ඩගල සිතුවම් ලෙස හැඳින්වුව ද කොණ්ඩගල කඳු වැටිය පිහිටා ඇත්තේ මෙම ස්ථානයට මීටර 500ක් පමණ බස්නාහිර දිශාවෙනි. එහෙත් මූලාශ්‍රය ගණනාවක මෙම සිතුවම් එම නාමයෙන් හඳුන්වා ඇති නිසා මෙහි දී ද හඳුනා ගැනීමේ පහසුව සඳහා එම නාමය ම භාවිතා කෙරේ.

**ලිහිණිගල ගල්ගේ** - N $6^0$ $42^1$ $29.11^{11}$ / E $80^0$ $37^1$ 42. $34^{11}$ - රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දුරකන්ද ග්‍රාම නිලධාරී වසමේ ඌවැල්ල-වතුකන්ද දෙනිගල ඇල්ල අසල ලිහිණිගල ගල්ගේ පිහිටා තිබේ. බලන්ගොඩ රාස්සගල මාර්ගයේ කි.මී. 12.5ක් ඌවැල්ලට පැමිණ එතැනින් දකුණට හැරී කි.මී. 0.5ක් ගියවිට කුඩා දියපහරක් හමුවේ. ඉන් එතෙර වී මීටර 200ක් පමණ දුෂ්කර මාවතක ගිය විට මෙම ස්ථානයට ප්‍රවේශ විය හැකි ය. එසේ ම රත්නපුරයේ සිට වේවැල්වත්ත මාර්ගයේ මෙම ස්ථානයට ගමන් කරන්නේ නම් හල්වතුර හන්දියෙන් වමට හැරී වතුකන්ද පාරේ කි.මී. 1.7ක් ඉදිරියට ගියවිට වතුකන්ද ග්‍රාමය හමුවේ. එහි දකුණු පසින් පිහිටි තේ වතු යායක් මැදින් වැටී ඇති අඩි පාරක් ඔස්සේ මීටර 100ක් පමණ පහළට බැස්ස විට මෙම ස්ථානයට ළඟා විය හැකි ය. මෙම ලෙන වර්තමානයේ කුඩා තේ වත්තක් මධ්‍යයේ පිහිටා ඇති අතර ලෙන දිගින් අඩි 60ක් ද, පළලින් අඩි 26ක් ද හා ඇතුළත උස ක්‍රමයෙන් අඩි 8,7,6 ආදී වශයෙන් ඇතට යන විට අඩුවේ. ලෙන ආසන්නයේ ම එන්.ඩබ්. සෝමාවතී මහත්මියගේ නිවස පිහිටා ඇති අතර මෙම ලෙන සහිත ඉඩම ඇය ඇතුළු පවුලේ ඥාතීන්ට අයත් බව ඇය සඳහන් කළා ය. ලෙන අසලට ගිය පසු ලෙනට පිවිසීම සඳහා පොළොව මට්ටමේ සිට අඩි 5ක් පමණ ගැඹුරට බැසිය යුතු ය.

**සංබපාල ලෙන** - N $6^0$ $26^1$ 45.07/$^{11}$ E $80^0$ $45^1$14. $25^{11}$ - රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංබපාල ග්‍රාම නිලධාරි වසමේ මෙම සිතුවම් සහිත ලෙන පිහිටා තිබේ. රත්නපුර-ඇඹිලිපිටිය මාර්ගයේ ඇඹිලිපිටිය දෙසට කි.මී. 55ක් ගියවිට වම් පසින් දක්නට ලැබෙන ගල් තලාව මත ඉපැරැණි දාගැබක නටබුන් හමුවේ. (පුස්සදේව සොහොන) එම දාගැබේ සිට මීටර 50ක් පමණ ඇතින් වනය තුළ මෙම සිතුවම් සහිත ලෙන පිහිටා ඇත. කටාරම් කොටා සකස් කරන ලද ලෙනෙහි දිග මීටර 23.66ක් වන අතර පළල මීටර 7ක් වේ. ලෙන් පියස්සේ උපරිම උස මීටර් 461කි. ලෙනේ මුහුණත නිරිත දිශාවට මුහුණලා ඇති අතර ඓතිහාසික යුගයේ දී කොටන ලද කටාරමේ දිග මීටර 13ක් වේ.

**වෙහෙරගල කන්ද ලෙන** - N $6^0$ $39^1$ $36^{11}$ / E $80^0$ $53^1$ $51^{11}$ - රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නෙළුයාය ග්‍රාම නිලධාරි වසමේ වෙහෙරගල රක්ෂිතයේ මීටර් 150ක් පමණ උසැති කන්දක මධ්‍යයේ මෙම සිතුවම් සහිත ලෙන පිහිටා තිබේ. ලෙන සහිත කන්දට පිවිසෙන මාර්ගය මැදබැද්ද ග්‍රාම නිලධාරි වසමෙන් ආරම්භ වන අතර කන්ද මධ්‍යයේ දී එම වසම

අවසන් වී නෙළුයාය වසම ආරම්භ වේ. ලෙනේ සම්පූර්ණ දිග මීටර 45ක් වන අතර ලෙන් පියස්සට ඇති උපරිම උස මීටර් 5 කි. ලෙනෙහි මුහුණත ගිනිකොන දිශාවට යොමු ව ඇත. ලෙනෙහි පියස්සට ඉහළින් වෙහෙරගල කන්ද තවදුරටත් පැතිර යයි. ලෙන ඇතුළත වම් පසින් සක්ක ගලින් බැඳ, ඇස්බැස්ටෝස් තහඩු සෙවිලි කරන ලද මීටර් 7ක් දිගැති ආවාස කුටියක් වේ. මෙය වර්තමාන නිමවුමක් වන අතර එහි කිසිවෙක් රැඳී නොසිටියි. එම කුටියට ඉදිරිපසින් වැසිකිළියක් තනා තිබේ. ලෙනේ දකුණුපස කොටසෙන් පිට වූ විට (ඊසාන දිශානුගතව) දිය නො සිඳෙන පොකුණක් වේ (අරුණසිරි 2018:152).

**විහාරගල ලෙන (කරඳන ලෙන)** - N $6^{0}$ $47^{1}$ 07.3 $^{11}$/ E $80^{0}$ $12^{1}$ $42.2^{11}$ **-** රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර කරඳන ග්‍රාම නිලධාරි වසමට අයත් විහාරහේන ග්‍රාමයේ විහාරහේනවත්ත නම් පෞද්ගලික රබර් වතු යායක මෙම ලෙන පිහිටා තිබේ. රත්නපුර කොළඹ-මාර්ගයේ කොළඹ දෙසට ගමන් කර ඇහැළියගොඩ නගරය පසු කළ විට හමුවන ගැටහැත්ත හන්දියේ සිට විහාරහේන ගමට පිවිසීමට වමට හැරී කි.මී. 15ක් පමණ ගමන් කළ යුතු ය. එසේ ම රත්නපුර-පානදුර පාරේ පානදුර දෙසට ගමන් කර මඩල හන්දියෙන් දකුණට හැරී කි.මී. 5ක් පමණ ගිය පසු මෙම ගම්මානයට පිවිසිය හැකි ය. විහාරහේන ගම්මානයේ තිබෙන විහාරගල කන්දට පිවිසීමට ඇත්තේ ඉතා දුෂ්කර මාවතකි. කරඳන ලෙන ලෙස මූලාශ්‍රයන්හි සඳහන් මෙම ලෙන ප්‍රදේශවාසීන් විසින් හඳුන්වනු ලබන්නේ විහාරගල ලෙන යනුවෙනි. දිගින් මීටර 41ක් වන මෙම ලෙනෙහි උපරිම පළල මීටර 6.6කි. පොළොව මට්ටමේ සිට කටාරම දක්වා ඇති උස මීටර 5කි. ලෙනෙහි මුහුණත නැගෙනහිර දිශාවට මුහුණලා ඇති අතර ලෙන් පියස්සේ කොටා ඇති කටාරම දිගින් මීටර 18ක් වේ.

**සාකච්ඡාව** - ආදි මානවයන්ගේ සිතුවම්වලින් කුමන අරුතක් ජනිත වන්නේදැයි එනම් කුමක් අරබයා මේවා නිර්මාණය කරන්නට ඇතිදැයි යන්න පිළිබඳ ව උගතුන් අතර ඇත්තේ මතභේදයකි. සිතුවම් ඇඳීම හා අකුරු ලිවීම යනු එකිනෙකට වෙනස් ප්‍රකාශන මාධ්‍ය දෙකක් වුව ද මෙම ආදි මානව සිතුවම්වලින් ඔවුන් අපේක්ෂා කළේ අක්ෂර ලිවීමෙන් වර්තමාන මිනිසුන් විසින් අපේක්ෂා කරන ලද දේ ම විය හැකි ය. මෙරට ආදි මානවයන් නිර්මාණය කළ සිතුවම්වල වස්තු විෂය කුමක්දැයි යන ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන හබරකඩ වජිර හිමි එම සිතුවම් කොටස් හතරකට බෙදා තිබේ.

1. මානව රූප
2. සත්ත්ව රූප
3. ස්වාභාවික වස්තු
4. ජ්‍යාමිතික හැඩතල (1998:7)

මෙම වර්ගීකරණය ආදි මානව සිතුවම්හි වස්තු විෂයට වඩා හැඩතල වර්ගීකරණයක් ලෙස හැඳින්වීම වඩාත් සාධාරණ වේ.

වෙහෙරගල කන්ද ලෙනේ ආදි මානව සිතුවම් පිළිබඳ අවධානය යොමු කළ විට පෙනීයන්නේ එහි සිද්ධි අවස්ථා නිරූපණ 7ක් හඳුනා ගත හැකි බවයි. පළමුවන අවස්ථා නිරූපණයේ දී පිළිවෙළින් උසින් අඩුවන ලෙස එක් අයෙකු පිටුපස එක් අයෙකු ලෙස අඳින ලද මානව රූ ත්‍රිත්වයකි. එම මානව රූ ත්‍රිත්වයේ ම අත් ඉහළට ඔසවා ගෙන සිටින අතර පළමු හා දෙවන මානව රූපවල ශරීරයේ දුන්නක් බැගින් දක්වා තිබේ. මිනිස් රූප ත්‍රිත්වයට ඉහළින් සත්ව රූපයක් දක්වා ඇත. මිනිස් රූප ත්‍රිත්වයේ පළමු හා දෙවන රූපවල එක් අත බැගින් හා තෙවන රූපයේ දෑත ම එම සත්වයා ස්පර්ශවන ලෙස යොදා තිබේ. මිනිසුන් පිරිසක් සතෙකු දඩයම් කර ඔසවා ගෙන යන අවස්ථාවක් මෙමගින් නිරූපණය කර ඇති බව උපකල්පනය කළ හැකි ය. ඉදිරියේ වන මානව රූ ද්විත්වයේ දුන්න බැගින් ඇඳ තිබීමෙන් ඒ බව වඩාත් තහවුරු වේ. දඩයමක් සිදුකර එම ගොදුර ඔසවාගෙන යන දර්ශනයක් මෙරට කිසිදු ආදි මානව සිතුවම් ස්ථානයකින් වාර්තා නොවේ. නමුදු දුනු අතෙහි තබාගත් මානව රූ ඇතැම් ස්ථානවලින් හමුවී තිබේ. මෙම සිතුවමට සමාන නිරූපණයක් ඉන්දියාවේ කුමායොන් හිමාලයෙහි පෙට්සල්හි නම් ස්ථානයේ වන ආදි මානව සිතුවම් අතර වේ. එහි වන්නේ කාන්තාවන් තිදෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සත්වයෙකු ඔසවාගෙන යන ආකාරයයි. කතුවරයා මේ කාන්තා දඩයක්කරුවන් යනුවෙන් නම් කර තිබේ. නැම්බියාවේ බ්‍රැන්ඩ්බර්ග ප්‍රදේශයේ ආදි මානව සිතුවම් අතර ද මෙයට සමාන සිතුවමක් ලැබී ඇත. නමුත් එහි වන්නේ අත් ඉහළට ඔසවාගෙන එක පෙළට සිටින මානවයන් තිදෙනෙකු මියගිය මිනිසෙකු ඔසවාගෙන යන අවස්ථාවකි.

වෙහෙරගල ලෙනෙන් හමුවන දෙවන අවස්ථා නිරූපණයේ දී මානව රුවක් හා සත්ව රූප 5ක් නිරූපිත ය. මෙය පහළ සිට ඉහළට ගලායන ලෙස නිර්මාණය කර තිබේ. මානව රුවෙහි එක් අතක දණ්ඩක් වැනි මෙවලමක් ඇති අතර එමගින් පැහැදිලි වන්නේ මානවයෙකු සත්ව පිරිසක් හඹායන හෝ රැගෙන යන අවස්ථාවක් මෙයින් නිරූපිත බව ය. මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන ක්‍රමයේ ප්‍රමුඛ ම කාර්යය වූයේ දඩයමයි. එසේ ම නියොලිතික යුගයවන විට මොවුහු ක්‍රමයෙන් සත්ව පාලනය සඳහා ද යොමු වූහ. මෙම ලෙනෙහි වන තෙවන අවස්ථා නිරූපණයේ දී එක සමීපයේ වන සතුන් දෙදෙනෙකු ඇඳ ඇත. ඉදිරියෙන් ම ඇති රූපයේ හිස පහළට නැමී ඇත. එම සත්වයන්ගේ හැඩය අනුව බොහෝවිට ගවයන්ගේ රූප විය හැකි අතර හිස පහළට යොමා තිබීමෙන් ආදි මානවයා තමන් දුටු ගවයන් උලාකමින් සිටින දර්ශනයක් නිරූපණය කරන්නට උත්සාහ ගන්නට ඇතැයි සිතිය හැකි ය. හතරවන අවස්ථා නිරූපණයේ දී සිව් දෙනෙකුගෙන් යුත් සත්ව පිරිසක් එක සමීපයේ නිර්මාණය කර තිබේ. විශාලතම රූපයේ ශරීරය ස්ථූල ලෙස නිර්මාණය කර ඇත. සෙසු රූප ඇඳ තිබුණේ ක්‍රමයෙන් එකින් එක කුඩාවන ලෙසනි. සමස්ත රූප පෙළ දෙස අවධානය යොමු කිරීමේ දී මෙමගින් සුනඛ රංචුවක් නිරූපණය කර ඇති බව උපකල්පනය කළ හැකි ය. ආදි මානවයා සුනඛ රූපය නිර්මාණය කිරීමේ දී එම සත්වයන්ගේ ආවේණික ලක්ෂණය ලෙස යොදා ඇත්තේ ඉහළට වක්‍රවී ගිය වලිගයයි. මේ අනුව ඉහළට වක්‍රවී ගිය වලිගය සහිත සුනඛයන්ගේ රූප බුදුන්ගේ හෙළ, බුද්ධංගල, නන්දාගල, පුළුකුණාව, සමන්ගල හා කණකෙකිනියන්ගේ හෙළ නයිපෙණ ගුහාවෙන් හමුවී තිබේ. සුනඛයා සහ ආදි වාසී වැදිජනයා අතර පවතින සම්බන්ධය පෙන්වා දෙන ජයසේන හුරුලුවැව තම '**ලාංකේය ආදි වාසී ජන සමාජය**' කෘතියේ දී මෙසේ සඳහන් කරයි.

> ආදි වාසී වැදි ජනයාගේ සෑම නිවසක ම පාහේ බල්ලෙක් සිටියි. ඌ පවුලේ සාමාජිකයෙකු තරමට සමීප ය. සතුන් දඩයම් කිරීමේ දී බල්ලෝ උන් ලුහුබැඳ ගොස් සතා වටලා ගැනීමට වැද්දන්ට අපිරිමිත සහායක් ලබාදෙති. එහෙයින් තම ජීවනෝපාය සඳහා සහය වන්නෙකු යන යුක්ති ගරුක සැලකීම වැද්දෝ බල්ලන්ට ඉටුකරති. එබැවින් තමන් කුසගින්නේ සිටිය ද බල්ලන් සාගින්නේ නොතැබීමට මොවුහු උත්සාහ කරති. එමෙන් ම තම බල්ලන්ට දරුවෙකුට මෙන් සලකන වැද්දෝ වෙති. එහිලා සුරතල් නම් භාවිත කරන තරමට ආදිවාසී ජන සමාජයට බල්ලා සමීප ය (හුරුලුවැව 2011:191).

> සුනඛයා දඩයමෙහි නියුතු ආදි මානවයන්ගේ දඩයම් ක්‍රියාවලියට බොහෝ සෙයින් උපකාරී වූ නිසා මෙසේ ආදි මානව සිතුවම්වල දී නිරූපණය කර ඇත (ඉලංගසිංහ 2017:53).

වෙහෙරගල කන්ද ලෙනේ පස්වන අවස්ථා නිරූපණයේ දී ඉහළින් රේඛාත්මක ලෙස පූර්ණ වෘත්තයක් හා එය අසල රේඛාත්මක ලෙස ඇතුළු රේඛාව ද ඇතුළට වක්‍රවී ගිය අඩකවයක් ඇඳ තිබේ. එම රූප යුග්මයට පහළින් ඒ දෙසට දෑත් යොමා සිටින ප්‍රමාණයෙන් විශාල හා කුඩා මානව රූප ද, විශාල මානව රුව ඉදිරියේ විශේෂ වස්තුවක් ද ඇඳ ඇත. එම විශේෂ වස්තුවට පහළින් ඇඳි කුඩා මානව රුවේ ඉහළට එසවූ දෑත මත යම් උපකරණයක් හෝ දිගැති වස්තුවක් ඇඳ ඇත. සමස්ත සිතුවම දෙස විමර්ශනාත්මක ව අවධානය යොමු කරන විට පෙනීයන්නේ මෙමගින් ඉර-හඳ වෙනුවෙන් පවත්වන යාතු කර්මයක් හෝ පූජාවක් හෝ එවන් අභිචාරමය සිද්ධියක් නිරූපණය කර ඇති බව ය.

> මෙරට ආදි මානව සිතුවම් අතර ඉර හඳ-රූප සිතුවම් කර තිබෙන බවට සාධක හමුවී තිබේ. එහි දී ආඬියාගල (ඉර), දිඹුලාගල (ඉර), ඌරාකන්ද අඳුරු ගුහාව (ඉර-හඳ), උස්සාගල (හඳ), මලයඩිකන්ද (ඉර), තන්තිරිමලය (ඉර), පිහිල්ලේගොඩ ගල්ගෙය (ඉර), කොනත්තේගොඩගල ගල්ගෙය (ඉර), දොරවක්කන්ද (ඉර) හා අරන්ගොඩගල (ඉර) හඳුනාගත හැකි ය (ඉලංගසිංහ, 2017); Nandadeva 1986:182-189).

ලොවේ දියුණු යැයි සම්මත මනුෂ්‍යයන්ට ද, ප්‍රාථමික ගෝත්‍රික ජනයාට ද ආවේණික වූ විවිධාකාර ආගමික මතිමතාන්දර හා විශ්වාස රාශියක් තිබේ. ඔස්ට්‍රේලියාවේ ඇබොර්ජින්වරුන් අතර ද, බාලි දූපතේ වෙසෙන ප්‍රාථමික ජනයා අතර ද ඔවුනොවුන්ට උරුම වූ ආගමික විශ්වාස පවතී. මේ ආගමික විශ්වාස සමඟ එකට බඳුනු ඇදහිලි ක්‍රම සමූහයක් ද පවතී. වැද්දන් අතර පවතින බොහෝ ආගමික විශ්වාස හා චාරිත්‍ර පාරම්පරික ව ඔවුන්ට හිමිවුණු ඒවා වේ (හුරුලුවැව 2011:232). ඒ අනුව වැදි ජනයාට එම සංස්කෘතිය උරුමවන්නට ඇත්තේ ඔවුන්ගේ අතීත වර්ගයා වූ ප්‍රාග් ඓතිහාසික මානවයාගෙනි. මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ ව කරන ලද පර්යේෂණවල දී ඔවුන්ගේ සුසාන ක්‍රම තුළින් අභිචාරමය සාධක ලැබී තිබේ. සිරුර වකුටු කොට වළ දැමීම, ද්විත්ව වළලෑම (සිරුර වළ දමා මාංශ දිරාපත් වූ පසු අස්ථි සැකිල්ල නැවත පිටතට ගෙන ඒවාහි ගුරුගල් ආලේපකර නැවත වළ දැමීම) හිස නැගෙනහිර හෝ ගිනිකොන දිශාවට පිහිටන සේ වළ දැමීම යනු

ඉන් කිහිපයකි. මෙරට ආදි මානව සිතුවම් අතරවන ඉර-හඳ රූප එම වස්තූන් ඇදහීමේ ප්‍රතිඵලයක් ලෙස ඇඳි බවට ද මත වේ (ගමගේ 2009:163).

මිනිසා ආගමික ඇදහිලි-විශ්වාස පහළ කරගත්තේ කවදා කෙසේදැයි පෙන්නුම් කිරීමට සාධක සෙවීම ඉතා ම දුෂ්කර ය. භාරතීය දේව ධර්මවාදයේ ප්‍රභවය පිළිබඳ අදහස් දක්වන වින්ටර්නිට්ස් පඬිවරයා ඍෂිවරුන් මුලින් ම වැඳුම් පිදුම් කළේ ස්වභාවධර්මයට අයත් අපූර්ව වස්තූන්ට සහ සූර්යයාට ද, විදුලියට ද හා තමන්ට ඇස නොගැටෙන නොයෙක් ස්වාභාවික වස්තූන්ට බව පවසයි. මෙම ස්වාභාවික වස්තූන්ට වන භිය නිසා ම ඒවට ගරු කිරීම හා පුද පූජා කිරීමට පුරුදු වන්නට ඇත (සීලරතන 2013:31). සියලු කරුණු විමසා බැලූ කල මෙම සිතුවමෙන් නිරූපණය කර ඇත්තේ ඉර හඳ වෙනුවෙන් කරන පූජාවක් විය යුතු ය. ප්‍රමාණයෙන් විශාල මානව රුව ඉදිරියේ ඇති විශේෂ නිර්මාණය වර්තමානයේ බලි-තොවිල් පූජාවලට තබන තටුවකට සමාන හැඩයක් ගනී. වැදි සමාජයේ ද සියලු කලා අංග ගොඩනැගී ඇත්තේ ඔවුන්ගේ ඇදහිලි හා විශ්වාස පදනම් කරගෙන ය. එම නිසා වැදි ජනයා හෝ ඊට පූර්වයේ සිටි ප්‍රාග් මානවයා එවන් අවස්ථාවක් නිරූපණය කිරීම පිළිගත හැකි කරුණකි.

වෙහෙරගල කන්ද ලෙනේ හයවන අවස්ථා නිරූපණයේ දී දුන්නක් දරූ මානවයෙකු හා එම රූපයට ඉදිරියෙන් සත්ව රූපයක් නිර්මාණය කර තිබේ. සත්ව රූපයේ වලිගය ඉහළට කරකැවී ඇති ලෙස නිර්මාණය කර ඇති බැවින් එම සත්වයා සුනඛයෙකු ලෙස හැඳින්වීම සුදුසු වේ. එසේ නම් මෙයින් පෙන්නුම් කරනුයේ සුනඛයෙකු පෙරටුකරගෙන දඩයමේ යන මානවයෙකු විය යුතු ය. මෙරට ආදි මානව සිතුවම් වාර්තා වන පන්සල්කන්ද ආලෝක ලෙන, රජගල කන්ද, හෙනන්නේගල, උස්සාගල හා බෝවත්ත ගල්ගේ තුඹස් ලෙන යන ස්ථානවලින් දුනු දරූ මානව රූප දැකගත හැකිවේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත්වූ මානවයන් පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ ඔවුන්ගේ ප්‍රධානතම අභිමතාර්ථය වූයේ ආහාර රැස් කිරීම බව ය. ඒ අනුව දඩයම හා රැස්කිරීම යන ක්‍රමවේද ද්විත්වය පදනම් කරගනිමින් දිවි පෙවෙත ගෙනගිය ඔවුහු දඩයම සඳහා මෙන් ම තවත් විවිධ වූ කාර්යයන් සඳහා ආයුධ කට්ටලයක් නිර්මාණය කර ගත්හ. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සාධක ලැබී ඇති බොහෝ ස්ථානවලින් එම අවධියේ විසූ මානවයාගේ තාක්ෂණය පිළිබඳ අවශේෂ හමුවේ. ඒවා නම් ශිලා හා අස්ථි මෙවලම් ය. එසේ ම ශිලා මෙවලම් නිර්මාණයේ දී ඉවත් ව ගිය පතුරු, බෝල ගල්, න්‍යෂ්ටි කොටස්, ඇඹරුම් ගල් හා ගිනි මොළවා ගැනීමට භාවිත කරන ලද මධ්‍යයේ සිදුර සහිත ගල් ද හමුවේ. මෙම අවධියේ දී දුනු ඊතල භාවිත කරන ලද බවට සාධක ශේෂ වී නොමැති අතර ඒවා දිරායන ද්‍රව්‍යයන්ගෙන් නිපදවා තිබීම ඊට හේතුවන්නට ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු ව අවධානය යොමුවන ආදිවාසී වැදි ජනයාගේ ජීවිතය ද බෙහෙවින් සරල එකක් වූ බව පෙනේ. ප්‍රාග් මානවයාගේ මෙන් ම වැදි ජනයාගේ ද මූලික අවශ්‍යතාව වී ඇත්තේ ආහාරයයි. එහි දී ආහාර සපයාගැනීමේ ප්‍රමුඛතම ක්‍රමවේදය වී ඇත්තේ දඩයමයි. සෑම වැද්දෙකු ළඟ ම දුන්නක්, ඊතල හා කෙටේරියක් වූ බව සෙලිග්මාන් යුවල පෙන්වා දෙති (සෙලිග්මාන් සහ සෙලිග්මාන් 2009:49). දුන්න තනා ගැනීම සඳහා හේනේ බැද්දේ වැද්දන් භාවිත කළ තාක්ෂණය පිළිබඳ ව ඔවුහු තව දුරටත් සඳහන් කරති. ඒ අනුව වැද්දන් ඒ සඳහා භාවිත කර ඇත්තේ කොබෝවැල් (Allophylus Cobbe) දැවයයි. පළමු ව කොබෝවැල් ශාකයක පිට පොත්ත ඉවත් කර

තමාට අවශ්‍ය නම්‍යශීලී තත්ත්වයට පත්වන තුරු ලීය පෙරන් ගා ගනු ලැබේ. එය කළු පැහැ ගන්වන්නේ ඉන් අනතුරු ව ය. දුනුදිය තනාගනු ලබන්නේ අරළු (Terminalia Chebula) ගසෙහි පට්ටයෙනි. හීයේ දණ්ඩ හෙවත් හී මිට තුළට හී තුඩෙහි කරුළල බැස්සූ පසු ව එය මනාව බද්ධ ව සිටීම සඳහා වෙලීමට භාවිත කරන්නේ ද එම පට්ටා ම ය. පසු ව එම වෙළුම තිඹිරිගසෙහි (Diospyros embryopteris) ලාටු ගා ආවරණය කෙරේ. ඊතලයේ දණ්ඩ සාමාන්‍යයෙන් තනාගනු ලබන්නේ වෙලං ගසේ (Pterospermum suberifolium) ලීයෙනි (එම :478). වර්තමානයේ ද මෙම සම්ප්‍රදාය අනුව යමින් මෙරට ආදිවාසී වැදි ජනයා දුනු, ඊතල හා කෙටේරිය තමා සමීපයේ තබාගෙන සිටිති. ආදිමානවයන් විසින් ස්වකීය ප්‍රාණය මෙන් ආරක්ෂා කර භාවිත කරන ලද භාණ්ඩ වනුයේ දුන්න හා ඊතලයයි. භාණ්ඩ හා මෙවලම් රාශියක් භාවිත කළ ද චිත්‍ර සටහන්වල දක්නට ලැබෙනුයේ දුන්න හා ඊතලයයි. මේවා ඉතා සරල ව ගොඩනගා ඇත (ඉලංගසිංහ 2017:56). මෙම තොරතුරු සමඟ සැසඳීමේ දී වෙහෙරගල කන්ද ලෙනෙහි දක්නට ලැබෙන දුනු සහිත මානව රූපවලින් එම යුගයේ පැවැති දඩයම් දිවි පෙවෙත පෙන්නුම් කරන බව පැහැදිලි ය.

මෙම ලෙනෙහි නිරූපිත හත්වන අවස්ථාවේ දී එක සමීපයේ වන සත්ව රූප ත්‍රිත්වයක් ඇඳ තිබේ. ඉදිරියෙන් ම වන සත්ව රූපයේ පාද සතර පැහැදිලි ව දක්වා ඇත. එසේ ම ඉහළට වක්‍ර වී ගිය වලිගය, කන් යුවල මනාව දක්වා තිබේ. පෙර ද සඳහන් කරන ලද පරිදි මෙම ලක්ෂණය යෙදීමෙන් ආදි මානවයා බලාපොරොත්තු වන්නට ඇත්තේ සුනඛයෙකු නිරූපණය කිරීමට ය. එම සත්ව රූපයෙන් පසු ව ඊට සමීප ව ම තිරස් රේඛාවක් කැපෙන ලෙස කෙටි සිරස් රේඛා දෙකක් සමාන්තර ව ඇඳ තිබේ. මෙයට සමාන රූප මෙරට කෝමාරිකා ලෙන, ආඩියාගල, දොරවක්කන්ද, ඌරුකන්ද මුක්කුගල ලෙන, බුදුන්ගේ හෙළ, ගණේගම ගල්ගේ, තරුලෙන්ගල, පන්සල් කන්ද ආලෝක ලෙන, රජගලකන්ද, මාවරගල වක්ගල්ගේ, මාවරගල බෝරුක ලෙන හා තන්තිරිමලයෙන් ලැබී තිබේ. එම සෑම අවස්ථාවකදී ම මෙබඳු රූපයක් මගින් තලගොයෙකුගේ රූපයක් නිරූපණය වන බවට හඳුනාගෙන ඇත. ඉහළ සිට බැලූ විට පෙනෙන ආකාරයට මෙම සත්වයා ඇඳ තිබේ. වර්තමානයේ පවා වැදි ජනයාගේ ප්‍රණීත ආහාරයක් වන තලගොයා ආදි මානවයාගේ ආහාර ලැයිස්තුවේ ද සිටි බවට සැක නැත. වැදි ජනයා පමණක් නොව සාමාන්‍ය ගැමි ජනයා ද තලගොයාගේ මස් අනුභව කරති. මෙරට ආදි මානවයා විසින් තලගොයා නිරූපණය කරන ලද ආකාරයට ම අඳින ලද රූප සටහන් දකුණු ඕස්ට්‍රේලියාවේ පනරාමිටී නම් ස්ථානයේ වන ඇබොර්ජිනිවරුන්ගේ සිතුවම් අතර ද වේ. නමුත් පර්යේෂකයන් එම රූප කටුස්සන්ගේ බවට හඳුන්වා ඇත. මෙම සිතුවමේ වන තෙවන රූපය වන්නේ මැදින් නැමීගිය රේඛාවක් කැපීයන ලෙස අඳින ලද කෙටි හරස් රේඛා සමූහයකි. මීට සමාන වූ රූප කොනත්තේගොඩගල, බුදුන්ගේ හෙළ, පිහිල්ලේගොඩ ගල්ගේ හා ගණේගම ගල්ගෙයින් ද ලැබී තිබේ. මේ අවස්ථා ත්‍රිත්වයේ දී ම මෙම සටහන පැත්තෑයෙකුගේ බවට හඳුනාගෙන ඇත. පාද රාශියකින් යුත් පත්තෑයා ආදි මානවයන්ට තර්ජනයක් වූ කුඩා සත්වයෙකු වූ බවට වැදි ජන සමාජය තුළින් ද සාධක ලැබේ. සෙලිග්මාන් යුවළ සඳහන් කරන ආකාරයට පත්තෑයාගේ දෂ්ටනයෙන් වන වේදනාව සහ විෂ නැසීම සඳහා භාවිත කරන ලද මන්තර වැදි ජනයා සතු ව පැවත ඇත.

> නාන්ගර ගුරු, නාන්ගර ගුරු, නාන්ගර පොතකුන් ඇරගෙන විසකුං, මන් ඇතු බිඳගෙන රත්තැයා පාගගෙන, ඇලි මොඩරා පිට සිටගෙන, අපේ ගුරුං සිහිකරගෙන, මම යන්නේ විස බාගෙන, තෝ නො දූන තෝ දස්ට කළේ නම් මට දූන විස බැම් නම්, එයින් තැකැ(?) විසේ නැත බහු ගුරුප්ප්‍රරාජයනම්, ඕන් නමෝ ! (සෙලිග්මාන් සහ සෙලිග්මාන් 2009:281).

පත්තැයාට මෙහි දක්වා ඇත්තේ කොඳු ඇට ඇති සත්වයන්ට (සර්පයාට) වඩා බෙහෙවින් පහළ මට්ටමේ සැලකිල්ලක් වන අතර අවසාන පද දෙක උත්ප්‍රාසයකි. මෙම සමස්ත සිතුවමෙන් ආදි මානවයා හා සතුන් අතර පවතින බැඳීමේ පැතිකඩ තුනක් හෙළිදරව් වේ. සත්ව රූප ත්‍රිත්වයෙන් පළමු රූපය වන සුනඛයාගෙන් තමන්ගේ ජීවිකාව පවත්වාගෙන යාමට ලබා දෙන සහාය ද, දෙවන රූපය වන තලගොයාගෙන් ආහාරය ද හා තෙවන රූපය වන පත්තැයාගෙන් සතුන්ගෙන් වන තර්ජන එනම් බලපෑම් ද විද්‍යමාන වේ. මෙම සතුන් තිදෙනා ආදී මානව පිවිතයේ දී නිරන්තරයෙන් ම නෙත ගැටෙන්නට ඇති නිසා මෙසේ සිතුවමට නගන්නට ඇත.

වෙහෙරගල ලෙනෙහි ඉහළින් ම ඇඳ තිබෙන සිවුපාවාගේ රුවේ ඉදිරි කොටස මැකී තිබුණ ද එහි විශාලත්වය, වලිගයේ ස්වභාවය, පාදවල යට කොටස දක්වා ඇති ආකාරය අනුව මෙය හස්තියෙකුගේ විය යුතු බවට උපකල්පනය කළ හැකිවේ. මෙරට ආදී මානව සිතුවම් හමුවන ස්ථානවලින් හස්ති රූප බහුල ව හමුවේ. වෙහෙරගල රක්ෂිතයේ අතීතයේ සිට ම අලි ඇතුන් වාසය කළ බැවින් එම හස්තීන් දුටු ආදි මානවයා මෙසේ එම රූපය නිර්මාණය කරන්නට ඇත. මෙම රූපයේ වර්තමාන ශේෂ දිග සෙ.මී. 120කි. මෙයට පෙර මෙරටින් වාර්තාවී තිබූ විශාලතම හස්ති රූප වන්නේ මොණරාගල මණ්ඩගල්ගෙයි ඇඳ තිබු අඟල් 18ක් දිගැති රූපය හා කෑගල්ල දිස්ත්‍රික්කයේ දොරවක්කන්ද ලෙනේ පාෂාණය සූරා ඇඳ තිබු අඟල් 15ක් දිගැති රූපයයි (Nandadeva 1986:196,186). ඒ අනුව වෙහෙරගල කන්දේ මෙම හස්ති රූපය මෙරට ආදි මානව සිතුවම් අතර වන විශාලතම කේවල හස්ති රූපය වේ. මොණරාගල උස්සාගල ලෙනේ මෙවැනි කේවල හස්ති රූප සටහන් 41ක් හමුවී තිබේ. වෙට්ටඹුගලින් ද කේවල හස්ති රූප විශාල ප්‍රමාණයක් හමු වී තිබේ (වික්‍රමසිංහ 2001:62,63). එසේ ම මෙරට ආදි මානව සිතුවම් හමුවන පන්සල්කන්ද ආලෝක ලෙන, දුම්බැදිලෙන, කණකෙකිනියන්ගේ හෙළ නයිපෙණ ලෙන, මාවරගල වක්ගල්ගේ, ඩුකියුලා ගල්ගේ, ඒ.සී.කැම්ප්ලෙන, ගණේගම ගල්ගේ, කඳුරුපොකුණ, ලෙනම, පුළුකුණාව, පුංචිකිරිඅම්මා ගල්ගේ, බුදුන්ගේ හෙළ, මණ්ඩාගල, මයිල්ලකන්ද, වැලඑල්ලූගොඩ කන්ද, යකින්න ගල්ගේ, රබ්බිඩිගල, මාවරගල බෝරුක ලෙන, බෝවත්තගල්ගේ නුග ගස ලෙන යන ස්ථානවලින් කේවල හස්ති රූප හමුවේ. මෙසේ හස්ති රූප බහුල ව නිර්මාණය කිරිමට හේතුව හස්තියා ආදි මානවයන්ගේ ජීවිතයට අභියෝගයක් වීම හා වනයේ ඔවුන් දුටු විශාලතම සත්වයා වීම විය හැකි ය. වනාන්තරයේ ජීවත් වූ ආදි මානවයාට මෙම සත්වයා නිරන්තරයෙන් ඇස ගැටෙන්නට ඇත. වැදි ජනයා අතර අලින් පලවා හරින මන්තර තිබීමෙන් ඒ බව තවදුරටත් පැහැදිලි වේ. ''ඉච්චට වල්ලය්, පච්චට වල්ලය්, දැල දෙවල්ලය්, සිටුඅප්පා සිටු" යනු එවන් අලි මන්තරයකි (හුරුලුවැව 2011:241).

සංඛපාල ලෙනෙන් සිතුවම් සටහන් 21ක් දක්නට ලැබෙන අතර ඉන් 11ක් කේවල මානව රූප ද, මුවාගේ රූප 3ක් ද, කේවල හස්ති රූපයක් ද, හස්තියා මත මානව රූප සහිත අවස්ථා 3ක් ද හා

හඳුනා නොගත් රූ සටහන් 3ක් ද වේ. වෙහෙරගල ලෙන සමඟ සැසඳීමේ දී සංඛපාල ලෙනෙහි වන්නේ සිද්ධි නිරූපණ ත්‍රිත්වයක් පමණි. අනෙක් රූප හුදකලා ලෙස ගොඩනගා තිබේ. මෙහි අවස්ථා තුනක දී හස්තියා මත මානව රූප සටහන් කර තිබේ. එක් සිතුවමක හස්ති රූපය මත මානව රූ ත්‍රිත්ත්වයක් දැක ගත හැකි ය. එහි දී හස්තියාගේ පිට මධ්‍යයේ මානවයන් දෙදෙනෙකු සිටගෙන සිටින අයුරින් දක්වා ඇති අතර තවත් මානව රූපයක් හස්තියාගේ පිට මත ඇඳීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා තෙවන මානව රූපය ගොඩ නගා ඇත්තේ හස්තියාගේ වලිගය මත ය. ආදි මානවයාට අවශ්‍ය වන්නට ඇත්තේ මානවයන් තිදෙනෙකු හස්තියෙකු පිට මත නැගී යන දර්ශනයක් නිර්මාණය කිරිම වුව ද මූලික සැලසුම් කිරීමකින් තොරව ඇඳීම නිසා තෙවන මානව රූපය ඇඳීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නට ඇත. අනෙක් අවස්ථා ද්විත්වයේ දී හස්තියා මත මානව රූපයක් බැගින් ඇඳ ඇත. ආදි මානව සිතුවම් වාර්තා වන මයිල්ලකන්ද කටාරම් ලෙන, උස්සාගල, යකින්නගල්ගේ, තරුලෙන්ගල, කඳුරුපොකුණ, කිරිපොකුණහෙළ, උමගේකන්ද, පන්සල්කන්ද මුළුතැන්ලෙන, ගොනාගොල්ල හා කිරිපොකුණහෙළ වක්ලෙනේ දී මේ ආකාරයට හස්තීන් මත මානව රූප නිරූපිත අවස්ථා හමු වේ. එහි දී තරුලෙන්ගල හා උමගේ කන්ද ලෙනේ දී සංඛපාල ලෙනේ දී මෙන් හස්තියා මත එකවර එක් මානවයෙකුට වඩා සටහන් කර තිබේ. සංඛපාල ලෙනෙහි එක් හස්ති රූපයක් මත මානව රූප ත්‍රිත්වයක් දක්වා ඇති පරිදි උමගේකන්ද හා තරුලෙන්ගල ලෙනේ දී හස්තියා මත මානව රූප ද්විත්වය බැගින් දන්වා තිබේ. එහි දී තරුලෙන්ගල ලෙනේ දී හස්තියාගේ පිට මධ්‍යයේ මානව රූ ද්විත්වය දක්වා තිබුණ ද උමගේකන්ද ලෙනේ දී එක් මානව රූපයක් හස්තියාගේ පිට මධ්‍යයේ ද අනෙක් මානව රූපය හස්තියාගේ වලිගය මත ද දක්වා ඇත්තේ සංඛපාල ලෙනෙහි ස්වරූපයට ය. එනම් හස්තියාගේ පිට මත මානව රූප සියල්ල දැක්වීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවූ නිසා වලිගය ද භාවිත කර තම අභිමතාර්ථය සාධනය කරගෙන තිබේ. මේ ආකාරයට එක හස්තියෙකු මත මානව රූප කිහිපයක් දක්වා ඇති සිතුවමක් ඉන්දියාවේ සගාර් දිස්ත්‍රික්කයේ නර්යඔලි ප්‍රදේශයෙන් ලැබී තිබේ. එහි හස්තියා මත මානව රූ පහක් නිරූපණය කර තිබේ.

ආදි මානවයන් විසින් අඳින ලද සිතුවම් අතර වන හස්තියා මත මානව රූ දක්වන සිතුවම් තුළින් අදහස් වන්නේ කුමක් ද යන්න පිළිබඳ ව ඇත්තේ විවාදයකි. එක් මතයක් වන්නේ මෙමගින් ආදි මානවයන් හස්තින් හීලෑ කරගෙන සිටි බව පෙනෙන බව ය (ගමගේ 2009.162). මෙරට මානවයාගේ අලි ඇතුන් හීලෑ කරගැනීමේ අතීතය පිළිබඳ ව විමසා බලන විට වංශකතාවේ එන සාධක වැදගත් වේ. මිහිඳු මහ රහතන් වහන්සේ මෙරටට වැඩම කළ අවස්ථාවේ දී නුවර වැස්සන්ට ධර්මය දේශනා කිරීමට රජ මාළිගයෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවූ නිසා ඇත් හල පිරිසිදු කර එහි සිට ධර්මය දේශනා කර තිබේ (ම.ව.පරි.14 පෙළ :61,62.) එමගින් පැහැදිලි වන්නේ ක්‍රි.පූ. 3 වන සියවස වන විට ද මෙරට අලි ඇතුන් හීලෑකරගෙන සිටි බව ය. දුටුගැමුණු රජ සමය වන විට ඉදිකිරීම් කර්මාන්තය සඳහා ද, යුද කටයුතු සඳහා ද හීලෑ අලි ඇතුන් යොදාගත් බවට වංශකතාවක් සාධක වේ. මෙම සිතුවම් ඓතිහාසික යුගයේ දී වැදි ජනයා නිර්මාණය කළේ නම් ඒ සමය වන විට අලි ඇතුන් හීලෑකරගෙන සිටි බවට පැහැදිලි සාධක වේ. ප්‍රාග් ඓතිහාසික සමයේ දී මෙම සිතුවම් නිර්මාණය වී තිබේ නම් ඒ පිළිබඳ ව පිවිසිය හැක්කේ උපකල්පනවලට පමණි. මෙම සිතුවම් මඟින් ප්‍රාග් මානවයා අලි ඇතුන් හීලෑ කරගෙන ප්‍රවාහන කටයුතු සඳහා භාවිත කළ බව හෝ වනයේ සිටි විශාලතම හා

අභියෝගාත්මක සත්වයා මත තම රුව ඇඳ දැක්වීමෙන් එම නිර්මාණ ශිල්පියා තම බලය හා අභිමානය පෙන්නුම් කිරීමට උත්සාහ ගන්නට ඇත.

විහාරගල ලෙනෙහි සහ කොණ්ඩගල පාෂාණ පෘෂ්ඨය මත නිර්මාණිත රේඛා සටහන්හි වස්තු විෂය හඳුනාගැනීමේ දී ඒ අතර ජීව රූප හෝ ඒ හා බැඳුණු සිද්ධි නිරූපණය නොවන බව පෙනේ. හුදෙක් විවිධ දිශාවලට ඇඳි තිරස්, සිරස් රේඛා හා විවිධ කෝණවලට එකට බැඳුණු රේඛා පමණක් මෙම ස්ථානවල දක්නට ලැබේ. පූර්ව සාක්ෂර සමාජයක අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මාධ්‍ය සංකේතයයි. සරල රේඛා, කඩ රේඛා, තිත් ආදිය භාවිත කර සංකේත ගොඩනඟා තිබේ (ඉලංගසිංහ 2017:57). කොණ්ඩගල සීරුම් සිතුවම් සටහන්වලට බෙහෙවින් සමාන සිරුම් රේඛා සටහන් හක්බෙලිකන්ද ත්‍රිකෝණ ගුහාව, එහි ම අක්වක් ගුහාවෙන් හා දොරවක්කන්ද ලෙනෙන් ලැබේ. එසේ ම මෙම සිතුවම් සටහන් ඌරාකන්ද මුක්කුගල ලෙනෙහි සීරුම් සටහන්වලට සමානාත්මකත්වයක් දක්වයි. කොණ්ඩගල සිතුවම් සටහන්වලට සමාන රේඛා සටහන් (සිග්-සැග් වර්ගයේ) ආජන්ටිනාවේ පැටයෝනියාහි රියෝපින්ටුරාස්වලින් ලැබෙන රේඛා සටහන්වලට සමානත්වයක් දක්වයි (එම. 62). එසේ ම මෙම රූපවලට සමාන සටහන් ඉන්දියාවේ කේරලයේ ටෙන්මලයිවලින් (Tenmalai) ද ලැබී තිබේ. මෙම ස්ථානය පළමුවරට හඳුනාගත් ජී.එල්. විජේරත්න සඳහන් කරන්නේ මෙහි සිතුවම් සහිත විශාල ගල් කුළෙහි මානව රූප දක්නට ලැබුණු බව ය. එසේ ම අදෘශ්‍යමාන තොරතුරු ඉදිරිපත් කිරීමට පෙලඹෙන ඔහු මෙහි වන ඇතැම් සිතුවම් ඇතැම් අවස්ථාවල මිනිසාගේ ඇසට දර්ශනය වන බවත් තවත් විටක ඒවා නොපෙනී යන බවත් පවසයි. මෙම ස්ථානය පිළිබඳ ව දැඩි ආගමික භක්තියකින් සිටින නිසා එම මිථ්‍යා විශ්වාස ගොඩනැඟී ඇති බව තොරතුරු සාකච්ඡා කිරීමේ දී පැහැදිලි විය.


ලිහිණිගල ගල් ගේ ඇඳ තිබෙන ආදි මානව සිතුවම්හි වස්තු විෂය හඳුනාගැනීමේ දී මෙහිවන ආයත චතුරස්‍රාකාර පනේල රූප යම් සන්නිවේදන කාර්යයක් උදෙසා භාවිත කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. ඇතැම් විට මේවා ගණිත ක්‍රමයක් හෝ රූපාක්ෂර ක්‍රමයක් වීමේ ඉඩකඩ පවතී. ඉතා සැලසුම් සහගත ලෙස එක ම ස්වරූපයකින් හා තනි වර්ණයකින් නිර්මාණය කර ඇති මෙම පනේල රූපවල අන්තර්ගත සිරස් රේඛා ප්‍රමාණය විවිධ ය. මෙම සිතුවම් දුටු විට ආවර්ජනය වනුයේ ඊජිප්තු හෝ ඉන්දුනිම්න රූපාක්ෂර ක්‍රමයයි.

බුදුගල විවෘත පාෂාණ සීරුම් සිතුවම්වලට පසුබිම් වූ වස්තු විෂය පිළිබඳ මතවාද රාශියක් හඳුනාගත හැකි ය. මෙහි වන විවෘත ගල් තලයේ එක් කෙළවරක සිංහ රූපයක් ද, අනෙක් පස මාළු වැලක්, මානව රුවක්, එම මානව රුවේ ඉහළට එස වූ දකුණු අත මත ත්‍රිශූලයක් ද, ඒ රුව අසල විශාල මානව මුහුණක් හා එම සිතුවම් පෙළට පහළින් ස්වස්ථිකයක් ද වේ. මෙරට විසූ ප්‍රාග් ඓතිහාසික මානවයා සිංහයා පිළිබඳ ව දැන සිටි බවට සාධක වේ. රත්නපුරයේ මැණික් පතලකින් ප්‍රථමවරට සොයා ගන්නා ලද සිංහ දතක් පී.ඊ.පී.දැරණියගල මහතාට යොමු කිරීමෙන් පසු ව එය කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබේ. එසේ ම කුරුවිට බටදොඹ ලෙන කැණීමෙන් සිංහයෙකුගේ අස්ථි කොටස් සොයාගෙන ඇති අතර ඒවා අදින් වසර 12000-15000ත් අතර කාලයට යන බව තහවරු කරගෙන ඇත. සිංහරාජයට එම නාමය ලැබීමට පදනම් වී ඇත්තේ එම වනයේ


සිංහයන් වාසය කිරීම බව ජනප්‍රවාදිත මතයයි. මෙරට ආදි මානව සිතුවම් හමුවන පන්නල්ගම, දිඹුලාගල හා නැවිගල යන ස්ථානවලදී ද සිංහ රූප නිර්මාණය කර තිබී හමු වී ඇත. නැවිගල සිංහ රුවේ කඳ කොටස පාර්ශ්ව දර්ශනයෙන් ද, මුහුණ ඉදිරියට දර්ශනය වන ආකාරයෙන් ද නිර්මාණය කර ඇත. වලිගය යොදා ඇත්තේ ඉහළට ය. පන්නල්ගම විවෘත පාෂාණ පෘෂ්ඨයේ වන සිංහ රුව නිර්මාණය කර ඇත්තේ ද නැවිගල මෙන් මුහුණ ඉදිරි දර්ශනයෙන් හා කඳ කොටස පාර්ශ්ව දර්ශනයෙනි. බුදුගල සිංහරුව නිර්මාණයේ දී කඳ කොටස මෙන් ම මුහුණ පාර්ශ්ව දර්ශනයෙන් නිර්මාණය කර තිබේ. මුව අයා සිටින සිංහයාගේ ඉදිරිපාද යුග්මය හා පිටුපස එක් පාදයක් පමණක් දක්වා තිබේ. ඉදිරි වම් පාදයේ ඇඟිලි සූක්ෂ්ම ව මතුකර ඇත. ප්‍රාග් බෞද්ධ යුගයේ වන්දනාවට පාත්‍ර වූ භෞතික වස්තූන් අතර සූර්ය දේව වන්දනය ද වේ. සූර්ය දෙවියාගේ ධජය සිංහ රූපය සහිත ධජයක් බව මූලාශ්‍රයවල සඳහන් වේ. සුමේරියාව හා මධ්‍ය ආසියාව ඇතුළු අතීත ශිෂ්ටාචාරවල දේවත්වයටපත් ඉස්තාර්, සර්වානි, චණ්ඩි සහ කෝර්වාසි දෙවඟනන්ගේ රථය ලෙස යොදා ගෙන ඇත්තේ ද සිංහයා වේ. සිංහයා සූර්ය දෙවියන්ගේ සූර්ය ශක්තිය පිළිබිඹු කරන දේව සංකේතයකි. රාශි චක්‍රයේ සිංහ රාශිය පිළිබඳ ව එන මතවාද පැරණි මිනිසාගේ සිට පැවත එන්නකි (ජයවර්ධන, 2015:217). මෙහි වන මත්ස්‍යයා, ස්වස්තිකය, ත්‍රිශූලය හා මානව රූ ද්විත්වය පිළිබඳ ද මතවාද රාශියක් වේ. මානව රූ ද්විත්වයෙන් කතරගම දෙවියන් (ස්කන්ධ කුමරු) හා වල්ලි අම්මා නිරූපණය කරන බව ප්‍රදේශවාසීන්ගේ අදහස වේ (Nandadeva 1986:182). මෙරට වැදි ජනතාව ස්කන්ධ කුමරුගේ දෙවන භාර්යාව වූ වල්ලි අම්මා කුඩා කල රැකබලා ගත් බවට ජනප්‍රවාදයේ එයි (සෙලිග්මන් සහ සෙලිග්මන් 2009:225). වැදි ජනතාව ඔවුන්ගේ ප්‍රධාන යක්ෂයා සහ කන්දේ යකා ද සමඟ කතරගම දෙවියන් ද අදහති. කන්දේ යකා හා කතරගම දෙවියන් යනු එක් අයෙකු බවට ද මත පළ වේ. ත්‍රිශූලය වනාහි යුද්ධායුධයකි. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සංකේත අතර මෙන් ම පැරණි කාසි අතර ද මෙම සංකේතය වේ. ශිව දෙවියන් හා සම්බන්ධ ත්‍රිමූර්තිය නිරූපණය කිරීම සඳහා ද මෙය භාවිත කර ඇත. මෙම සිතුවමේ දී ත්‍රිශූලය භාවිත කර ඇත්තේ ආගමික අර්ථයෙන් නොවන බව බිනරගම සඳහන් කරයි. ඔහු දක්වන්නේ මෙහි දී ත්‍රිශූලය යොදාගෙන ඇත්තේ දඩයම් ආයුධයක් සංකේතවත් කිරීමට බව ය (2003 :117). බෞද්ධ කලා සංකේතයක් වන ත්‍රිරත්නය නිර්මාණයවී ඇත්තේ තිශූලය පදනම් කරගෙන බවට මතවේ. එසේ ම මෙහි ආරම්භය මොහොන්දෝජාරෝ ශිෂ්ටාචාරය දක්වා දිවෙන බවට මත ඇත (විමලරතන 1995:64). මෙම සිතුවමේ වන ස්වස්තිකය හා මත්ස්‍ය සලකුණ වනාහි දීර්ඝ කාලයක් තිස්සේ විවිධ ජන සමාජවල භාවිත කරන ලද සංකේත යුග්මයකි. අක්ෂර භාවිතය ආරම්භයට පෙර පවා මෙම සංකේත ද්විත්වය භාවිත වී තිබේ. "සිංහල 'ම' අක්ෂරයේ ආරම්භයට බලපා ඇත්තේ මත්ස්‍ය සලකුණයි" (වජිර හිමි 2000:14). එසේ ම මත්ස්‍ය සලකුණ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආගමික කටයුතු සම්බන්ධයෙන් අංශ කිහිපයකින් වැදගත් වී ඇත. මත්ස්‍යයා විෂ්ණුගේ දස අවතාරවලින් එකකි. මීන රාශිය පිළිබඳ නක්ෂත්‍රයේ දී ද කතිකාවට ලක්වේ. ඉන්දු නිම්න සංකේත අතර යෙදුණු මුල් ම ස්ථාවර සංකේතය වන්නේ ස්වස්තිකයයි. එය යොදන ශිල්පියාගේ අභිමතය පරිදි ඉතා සුළු වෙනස් කිරීමක් හැරුණකොට මෙම සංකේතය වසර දහස් ගණනක් තිස්සේ එක ම ස්වරූපයකින් යොදා ඇත. එනම් ඉන්දු නිම්න මුද්‍රා අතර යෙදුණු ස්වස්තිකය ම අශෝක ලිපිවල යොදා ඇති ආකාරය හඳුනාගත හැකි ය. මෙරට ද කේවල ව හා වෙනත් අංග සහිත ව ස්වස්තිකය සංකේත අර්ථ ප්‍රකාශනය සඳහා යොදා ගෙන ඇත (එම 14). මැකස් මුලර් ස්වස්තිකය කොටස් දෙකකට බෙදා

ඇත. ඒ අනුව බාහු කෙළවර දකුණු අතට නැමී ඇති ස්වස්තිකය නියම ස්වස්තිකය බවත් බාහු කෙළවර වම් අතට නැමී ඇති සංකේතය ස්වස්තිකය බවත් ය (සේනාධීර 1999:25).


මෙම සමස්තය විග්‍රහ කිරීමෙන් ආදි මානව සිතුවම් යනු එම සිතුවම් අඳින ලද ජන කොටස්වල දිවි පැවැත්මේ ප්‍රතිබිම්බයක් ලෙස හැඳින්විය හැකි ය. ඒ මන්ද ඒවාහි වස්තු විෂය හා හැඩතල නිර්මාණ මගින් එම සමාජයේ සරල දිවි පැවැත්මේ එන අවස්ථා හා සිද්ධි නිරූපණය වන බැවිනි.




**සංඛපාල ලෙනේ වර්ණ සිතුවම්**




**වෙහෙරගල ලෙනේ වර්ණ සිතුවම්**




**විහාරගල (කරඳන) ලෙනේ සීරුම් සිතුවම්**



**ලිහිණිගල ලෙනේ වර්ණ සිතුවම්**



**බුදුගල විවෘත ශෛල සීරුම් සිතුවම්**



**කොණ්ඩගල විවෘත ශෛල සීරුම් සිතුවම්**

## මූලාශ්‍රය


අරුණසිරි,කේ.යු. 2018. බලන්ගොඩ වෙහෙරගල රක්ෂිතයේ ලෙනකින් හමු වූ ප්‍රාථමික සිතුවම්හි සුවිශේෂත්වය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්. **Proceeding of the national Archaeological Symposium.** Colombo, Department of Archaeology. P 150-159

ඉලංගසිංහ,එස්.2017. **ශ්‍රී ලාංකේය ආදි වාසීන්ගේ සෙල් චිත්‍ර.** පන්නිපිටිය, ස්ටැම්ෆර්ඩ් ලේක් පුද්ගලික සමාගම.

ගමගේ,ජේ.එස්.2009. **මහින්දාගමනයට පෙර ශ්‍රී ලාංකේය වංශ කතාව**. නුගේගොඩ, සී/ස දීපානි මුද්‍රණ/ප්‍රකාශන (පෞද්) සමාගම.

ජයවර්ධන,ජේ.එම්.ටී.කේ.2015. බුදුගල පුරා පරිශ්‍රයේ දක්නට ලැබෙන චිත්‍ර සහ කැටයම් පිළිබඳ විමර්ශනයක්. **අවලෝකන.** සංස්:සම්පත් ප්‍රසන්න ඇතුළු පිරිස. රුහුණු විශ්වවිද්‍යාලය.

පෙරේරා,බී.ඒ.ටී.1992. **මානව විද්‍යාව හා කලාව.** කලා සඟරාව. සංස්:තෙරිපැහැ සෝමානන්ද ඇතුළු පිරිස. ශ්‍රී ලංකා කලා මණ්ඩලය.

බිනරගම,ඩී.2003. බුදුගල ප්‍රධානඝර ආරණ්‍ය සේනාසනය. **සබරගමුව වංශ කතාව-2** වෙළුම. සබරගමු පළාත් සභාව. පි 484-490

**මහාවංශය.**2007. දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රණවීර,එස්.2008. **භාෂාවේ උපත සහ විකාශනය.** දන්කොටුව, වාසනා ප්‍රකාශකයෝ.

ලගමුව,ඒ.1994. ප්‍රාථමික කලාව. **සංස්කෘතික පුරාණය-1 වෙළුම-8 කලාපය.** සංස්: ටී.ජී.කුලතුංග. මධ්‍යම සංස්කෘතික අරමුදල.

වජිර,එච්.1998. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් කලාව, **කෞතුකාගාර-5 කලාපය** සංස්:එච්.ඒ.ඒකනායක;රංජිත් හේවගේ. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

වජිර,එච්.2000. ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් ආශ්‍රයෙන් බිහි වූ සිංහල අක්ෂර මාලාව. **සංස්කෘතික පුරාණය-3 වෙළුම-3 කලාපය.** මධ්‍යම සංස්කෘතික අරමුදල.

වික්‍රමසිංහ,එස්.2001. උස්සාගලින් ප්‍රාග් ඓතිහාසික හෝ වැදි සිතුවම් සහිත ගල් ගුහාවක්. **කෞතුකාගර-7 කලාපය.** රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

විමලරත්න,බී.1995. **බුදුපිළිමය මුද්‍රා සහ ආසන.** සිස්ටමැටික් ප්‍රින්ටර්ස්, නැදිමාල, දෙහිවල

සීලරතන,ඒ.2013. **පූජා චාරිත්‍ර විධි හා බුදු සමය.** මහරගම, තරංජි ප්‍රින්ට්ස්.

සෙලිග්මාන්,සී.ජී;සෙලිග්මාන්,බී.ඉසඩ්.2009. **වැද්දෝ.** පරි:චන්ද්‍ර ශ්‍රී රණසිංහ. ෆාස්ට් ෆබ්ලිෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සේනාධීර,ජී.1999. **මංගල සංකේත හා සඳකඩ පහණ.** රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

හුරුලුවැව,ජේ.2011. **ලාංකීය ආදි වාසී ජනසමාජය.** මීගමුව, අකුර පොත් ප්‍රකාශකයෝ.

Nandadeva,B.D. 1986. Rock Art sites of Sri Lanka-A catalogue. **Ancient Ceylon**. p 175-207.

# උඟුවේ කාර්මික උරුමය

ආචාර්ය කුසුම්සිරි කොඩිතුවක්කු[1]

## හැඳින්වීම

කාර්මික පුරාවිද්‍යාව (Industrial Archaeology) යනු කාර්මිකරණයෙහි සිට මෑත අතීතය දක්වා සමාජ, ආර්ථික හා තාක්ෂණික සංවර්ධනයේ ස්පර්ශනීය සාධක පිළිබඳ ව අධ්‍යයනය කෙරෙන පුරාවිද්‍යාවේ නව උපශික්ෂණයකි. මෙම අධ්‍යයනයේ මුල් ම වකවානුව ලෙස කාර්මික විප්ලවය හැඳින්විය හැකි ය (Jones 2006:198). කාර්මික පුරාවිද්‍යාව පදනම් කරගෙන හඳුන්වා දෙන ලද, සංස්කෘතික උරුමයෙහි ම තවත් පැතිකඩක් ලෙස කාර්මික උරුමය (Industrial Heritage) දැක්විය හැකි ය. 2003 වර්ෂයේ දී ප්‍රකාශිත කාර්මික උරුමය පිළිබඳ නිෂ්නි ටාජිල් ප්‍රඥප්තිය (The Nizhny Tajil Charter) අනුව කාර්මික උරුමය යනුවෙන් අදහස් වනුයේ ඓතිහාසික, තාක්ෂණික, සමාජීය, වාස්තුවිද්‍යාත්මක හෝ විද්‍යාත්මක අගයකින් යුතු කෘතීන් ය. මීට ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, වැඩපොළවල්, මෝල් හා කර්මාන්ත ශාලා, ආකර හා පිරිපහදු ක්‍රියාවලිය හා සම්බන්ධ ස්ථාන, ගුදම් හා ගබඩා, බලශක්ති උත්පාදන හා සම්ප්‍රේෂණය කිරීමේ ස්ථාන, ප්‍රවාහනය හා එහි යටිතල පහසුකම් මෙන් ම කර්මාන්ත හා බැඳුණු සමාජ ක්‍රියාකාරිත්වයට සම්බන්ධ නිවාස, ආගමික හා අධ්‍යාපන ස්ථාන ද අයත් වේ (TICCIH 2003; Douet 2012:238). කාර්මික උරුමය යුරෝපා රටවල සංචාරක ව්‍යාපාරයේ නව ප්‍රවණතාවක් බවට ද පත් ව ඇති අතර එය කාර්මික උරුම සංචරණය (Industrial Heritage Tourism) නමින් ප්‍රචලිත ය (Xie 2015).

කාර්මික රටක් නොවූවත් බ්‍රිතාන්‍ය පාලන සමය තුළ දී වැවිලි කර්මාන්තය හා එහි යටිතල පහසුකම් ඇසුරෙන් බිහි වූ "කාර්මික උරුමය" ශ්‍රී ලංකාවට දායාද වී ඇත. ශ්‍රී ලංකාව දිගු ඉතිහාසයක් සහිත පුරාවිද්‍යාත්මක සාධකවලින් පෝෂිත රටක් බැවින් ක්‍රි.ව. 1800-1950 තරම් මෑත ඉතිහාසයට අයත් කාර්මික උරුමය කෙරෙහි යොමු වී ඇත්තේ ඉතා අඩු අවධානයකි. ඒ නිසා වැවිලි කර්මාන්තය, ප්‍රවාහනය, තැපැල් හා සන්නිවේදන ක්‍රම සහ අනෙකුත් පොදු පහසුකම් යන ක්ෂේත්‍රවලට අයත් මෙම උරුමය නූතන සංවර්ධන කටයුතු හේතුවෙන් ශීඝ්‍ර ලෙස විනාශයට ලක් වෙමින් පවතින බවක් ද දැකිය හැකි ය (කොඩිතුවක්කු 2013:100). අපගේ සංස්කෘතික උරුමයෙහි ම කොටසක් බවට පත් ව ඇති මෙම කාර්මික උරුමය ශ්‍රී ලංකාවෙහි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා උපයෝගී

[1] *බාහිර කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,*
*ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,*
*ජේතවන කෞතුකාගාර පාලක, මධ්‍යම සංස්කෘතික අරමුදල*
kusumsiriko@gmail.com

කරගත හැකි නව මං පෙතක් ලෙස ද හඳුන්වා දිය හැකි ය. ජාත්‍යන්තර කාර්මික ඉතිහාසයේ මුල් කාලයට අයත් කෘති රාශියක් මෙම උරුමයට අයත් වන බැවින් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයන්ට නවතම අත්දැකීමක් ලබා දීමට එම කෘති ඉවහල් වන බව නිසැක ය. වැවිලි කර්මාන්තයට කේන්ද්‍රස්ථාන වූ මධ්‍යම පළාත, ශ්‍රී ලංකාවේ කාර්මික උරුමයට අයත් කෘතීන්ගෙන් බහුතරයක් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි ය. තේ කර්මාන්ත ශාලා ඇතුළු තේ වගාව හා සම්බන්ධ ඉදිකිරීම්, යන්ත්‍ර සූත්‍ර ආදිය ඒ අතරෙහි ප්‍රමුඛ වේ. ඒ හැරුණු විට, වැඩි ම කෘති සංඛ්‍යාවක් දැකිය හැකි වනුයේ ඌව පළාතෙහි ය. දිවයිනේ සෙසු පළාත්වල, විවිධ ක්ෂේත්‍රවලට අයත් කාර්මික නිර්මාණ, විසිරුණු ව්‍යාප්තියක් යටතේ හඳුනාගත හැකි ය.

ඌව පළාතේ පුරාවිද්‍යාත්මක පසුබිම ප්‍රාග් ඓතිහාසික යුගය තරම් අතීතයට විහිද යන බවට සාධක හඳුනා ගෙන ඇති අතර අනුරාධපුර යුගයේ මුල්කාලීන ව ජනාවාස ව තිබූ බව බෝගොඩ රජමහා විහාරය, මැටිගහතැන්න හා වැල්ලවාය අසල කන්දේ විහාරය යන ස්ථානවල මුල් බ්‍රාහ්මී ශිලාලේඛන ද සාධක සපයයි (විජේපාල 1991:159-161; දිසානායක 1991:162; ඩයස් 1991:169-174). බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව 1818 විමුක්ති අරගලයට මුල් වූ මෙම ප්‍රදේශය බ්‍රිතාන්‍යයන්ගේ වතු වගාව නිසා විශාල සමාජ පරිවර්තනයකට පාත්‍ර වූවකි. මෙම පරිවර්තනය කැපී පෙනෙන අයුරින් දැකගත හැකි වනුයේ බදුල්ල දිස්ත්‍රික්කයෙහි ය. එහෙත් ගැමි ආර්ථිකයක් පැවති ඌවේ සිදු වූ එම පරිවර්තනය බටහිර රටවල වූ නවීකරණයේ පූර්ණ පරිවර්තනයක් නොවුණු බවට ද අදහස් ඉදිරිපත් වී තිබේ (ධර්මසේන 1991:381). කෙසේ වෙතත්, වතු වගාව මුල් කොටගෙන බිහි වූ නව සංස්කෘතියෙහි අංග ලෙස හඳුනාගත හැකි විදේශීය සම්භවයක් සහිත හා මෙරට නිෂ්පාදනය කරන ලද කෘතින්ගෙන් සැදි “කාර්මික උරුමයක්” ඒ ඇසුරෙන් හඳුනාගත හැකි ය. එම උරුමය වැවිලි කර්මාන්තය, ප්‍රවාහනය සහ පොදු පහසුකම් සම්පාදනය හා වෙනත් නිර්මාණ ක්ෂේත්‍ර තුන යටතේ හඳුනාගත හැකි ය.

## 1. වැවිලි කර්මාන්තය

අතීතයේ දී සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් පෝෂිත ඌව ප්‍රදේශයෙහි, 19 වන සියවසේ දී බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙන ලද වැවිලි කර්මාන්තය පදනම් කරගත් ආර්ථිකය යටතේ, මුලින් කෝපි වගාවත් පසු ව තේ වගාවත් ව්‍යාප්ත වන්නට විය. විශේෂයෙන් ම ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ භූ විෂමතාව හා දේශගුණය වඩාත් යෝග්‍ය වීම ඊට හේතු වී තිබේ. 1897 වර්ෂයේ ඌව පළාතේ තේ වගා බිම් ප්‍රමාණය අක්කර 50,500ක් වෙමින් ශ්‍රී ලංකාවේ තේ වගා කරන පළාත් අතරින් තෙවන ස්ථානයට පත් වී තිබේ. 1958-59 සංඛ්‍යා ලේඛනවලට අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ තේ අක්කරයකින් රාත්තල් 1720ක අස්වැන්නක් ලබා ඇත. දිවයිනේ තේ අක්කරයකින් ලැබෙන අස්වැන්න (1958) වන රාත්තල් 771 හා සසඳන විට මෙය සතුටුදායක තත්ත්වයකි (ධම්මදස්සි හිමි 2010:72; සැබිහෙළ හා දිසානායක 1966:63). බදුල්ල දිස්ත්‍රික්කයේ තේ වගා කරන ප්‍රදේශ අතරින්

බදුල්ල, හපුතලේ හා බණ්ඩාරවෙල කැපී පෙනේ. වැඩි ම තේ වතු සංඛ්‍යාවක් බදුල්ල හා හපුතලේ ප්‍රදේශවලින් හඳුනාගත හැකි ය (Forrest 1967:254–302). තේ තරම් වැඩි ඵලදාවක් හා ව්‍යාප්තියක් නොමැති වුවත් රබර් වගාව ද ඌව ප්‍රදේශයේ දෙවෙනි ස්ථානය හිමිකර ගනී (සැබිහෙළ හා දිසානායක 1966:64). තේ වගාව ව්‍යාප්ත වීමට පෙර හපුතලේ, බණ්ඩාරවෙල, බදුල්ල, පස්සර, බිබිල යන ප්‍රදේශවල දුම්කොළ හා කෝපි වගාවන්ට අයත් කර්මාන්ත ශාලා බිහි ව තිබුණු අතර තේ වගාව ව්‍යාප්ත වීමත් සමඟ ම එම කර්මාන්ත ශාලා ද තේ කර්මාන්ත ශාලා බවට පරිවර්තනය වී තිබේ. බෙරගල - විහාරගල තේ කර්මාන්ත ශාලාව එලෙස පරිවර්තනය වූ දුම්කොළ කර්මාන්ත ශාලාවකි (ඡායාරූප 1). හපුතලේ - පංකැටිය, දෙමෝදර - බත්ගොඩ තේ කර්මාන්ත ශාලා කලින් පැවති කෝපි කර්මාන්ත ශාලා ය. දැනට මෙම ප්‍රදේශයේ පවතින තේ කර්මාන්ත ශාලා අතරින් බහුතරය 20 වන සියවසේ මුල් දශකය තුළ බිහි වූ ඒවා වේ. මහා පරිමාණ තේ කර්මාන්ත ශාලා ද ඒ අතරෙහි දැකිය හැකි ය. බදුල්ල - ලුණුගල යුරි (Ury) තේ කර්මාන්ත ශාලාව මීට නිදසුනකි. මෙම තේ කර්මාන්ත ශාලා උස් බිම්වල හා නිම්න ප්‍රදේශවල පිහිටි ලෙසින් ප්‍රභේද දෙකකින් හඳුනාගත හැකි ය. හපුතලේ, බෙරගල, දඹේතැන්න උස් බිම්වල පිහිටි තේ කර්මාන්ත ශාලා වන අතර බණ්ඩාරවෙල, හාලිඇළ, දෙමෝදර, බිබිල හා වෙල්ලස්ස නිම්න ප්‍රදේශවල පිහිටි කර්මාන්ත ශාලා ලෙස හඳුනාගත හැකි ය. මේ අතරින් නිම්න ප්‍රදේශවල පිහිටි කර්මාන්ත ශාලා මුලින් කෝපි කර්මාන්ත ශාලා ලෙස භාවිතයේ පැවති ස්ථාන වේ. කෝපි කර්මාන්ත ශාලාවන්ට ජලය අවශ්‍ය වන බැවින් නිම්න ආශ්‍රිත ව එම කර්මාන්ත ශාලා ඉදි කර තිබුණි. ක්‍රි.ව. 1890 දී තෝමස් ලිප්ටන් විසින් ආරම්භ කරන ලද දඹේතැන්න තේ කර්මාන්ත ශාලාව ශ්‍රී ලංකාවේ දිග ම තේ කර්මාන්ත ශාලාවයි. මීටර් 106 ක් දිගැති එහි පළල මීටර් 12කි (ඡායාරූප 2).



**(ඡායාරූප 1) බෙරගල විහාරගල තේ කර්මාන්ත ශාලාව**



**(ඡායාරූප 2) දඹේතැන්න තේ කර්මාන්ත ශාලාව**

මහල් තුනකින් හෝ හතරකින් සැදි මෙම තේ කර්මාන්ත ශාලා සියල්ල ම එක ම සැලැස්මකට අනුව නිමවා තිබේ. බිත්ති සඳහා කළුගල් මෙන් ම ලෝහ තහඩු ද භාවිතයට ගෙන තිබේ. හපුතලේ තේ කර්මාන්ත ශාලාව කළුගලින් බඳින ලද බිත්තිවලින් සමන්විත ය. බිබිල තේ කර්මාන්ත ශාලාව ලෝහ තහඩුවලින් නිම වූ බිත්ති සහිත තේ කර්මාන්ත ශාලාවකට නිදසුනකි. මෙම තේ කර්මාන්ත ශාලාවල, තේ සැකසීමේ යාන්ත්‍රික ක්‍රියාවලිය හා සම්බන්ධ යන්ත්‍ර සූත්‍ර පද්ධතියක් ම හඳුනාගත හැකි

ය. එලිවේටර්, දලු මැලවීමේ බක්කි, දලු කැපුම් යන්ත්‍ර, ඕතොඩොක්ස් ඇඹරුම් යන්ත්‍ර, ද්විත්ව ක්‍රියාකාරී ඇඹරුම් යන්ත්‍ර, රොටවේන් ඇඹරුම් යන්ත්‍ර, කුඩු හැලීමේ යන්ත්‍ර, උෂ්ණත්ව පාලන යන්ත්‍ර, වියළුම් යන්ත්‍ර, කෙදි ඉවත් කිරීමේ යන්ත්‍ර, බලශක්ති උත්පාදන යන්ත්‍ර මේ අතරෙහි දැකිය හැකි ය. ඒවා සමකාලීන ව තේ කර්මාන්ත ශාලා සඳහා යන්ත්‍රසූත්‍ර නිෂ්පාදනය කළ කලම්බු කොමර්ෂල් සමාගම (CCC), වෝකර්ස් සහ පුත්‍රයෝ (Workers & Sons), පී.පී. පියසේන ජිනදාස සමාගම (PPPJ), හේලිස්, බ්‍රවුන්ස් යන සමාගම්වල නිෂ්පාදන ලෙස හඳුනාගත හැකි ය. මෙම වතු ප්‍රදේශවල, වතු කම්කරුවන් සඳහා ඉදිකළ තනි පේළි, එකිනෙක පිටුපස පිහිටි හා ද්විත්ව යන තෙවර්ගයට ම අයත් නිවාස දැකිය හැකි ය. එම නිවාස තැනීම සඳහා ගල්, මැටි සහ දැව භාවිතයට ගෙන තිබේ. නිවාස පේළි ඉදිරිපස මඩ වීම වැළැක්වීම සඳහා ගලින් බඳින ලද වේදිකා ද දැකිය හැකි ය. ඒ සඳහා ගල් තාර ගැලුම් 2 ක්, කීල රාත්තල් 1 1/2 ක්, ගල් දුම්මල රාත්තල් 1/2 ක් හා පිරිසිදු වැලි බුසල් 2 ක් බැගින් යොදා ගත් මිශ්‍රණයක් ද භාවිතයට ගෙන තිබේ (සිල්වා 2005:200). බෙරගල, හපුතලේ, හාලිඇළ හා බිබිල වතුවල, තේ කර්මාන්තශාලා අසල ම කම්කරු නිවාස ඉදිකර තිබේ. මේ හැරුණු විට වතු බංගලා සහ වෙනත් යටිතල පහසුකම් හා සම්බන්ධ ඉදිකිරීම් ද වතු ආශ්‍රිත ව දැකිය හැකි ය.

## 2. ප්‍රවාහනය

### 2.1. දුම්රිය

1867 දී උඩරට දුම්රිය මාර්ගය මහනුවර දක්වා දීර්ඝ කිරීමෙන් අනතුරු ව 1870 දී ඌව පළාතේ ප්‍රධාන නගරය වන බදුල්ල දක්වා දීර්ඝ කිරීම සඳහා පියවර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 1874 දී බදුල්ල දක්වා වන දුම්රිය මාර්ගයේ පේරාදෙණියේ සිට නාවලපිටිය දක්වා වූ කොටස නිම කරන ලදී. අනතුරු ව අදියර කිපයක් ලෙසින් 1924 දී දුම්රිය මාර්ගය බදුල්ල දක්වා දීර්ඝ කරන ලදී (Ferguson 1887/1994:19 ; Perera 1925:286; de Silva 1991:xxii). නාවලපිටිය සිට බදුල්ල දක්වා වූ දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු අධික කඳු සහිත භූ විෂමතාව නිසා අතිශයින් දුෂ්කර කාර්යයක් වුවත් එම දුෂ්කරතා ජයගෙන තැනූ දීර්ඝ දුම්රිය මාර්ගය 1924.02.05 දින සර් විලියම් මැනිං ආණ්ඩුකාරවරයා විසින් විවෘත කරන ලදී.

"ලංකාණ්ඩුවේ ධූම රථ මාර්ගය" ප්‍රධාන දුම්රිය මාර්ග ලෙස නම් කරනු ලැබුවේ, කොළඹ නව බදුල්ල දක්වා වූ මාර්ගයයි. දුම්රිය මාර්ග ඉදිකිරීමේ කටයුතුවල වර්ධනයත් සමඟ ම, තේ නිෂ්පාදනයේ ද සැලකිය යුතු වර්ධනයක් හඳුනාගත හැකි විය. 1874 දී උඩරට දුම්රිය මාර්ගය නාවලපිටිය දක්වා දීර්ඝ කිරීමේ දී තේ වගා බිම් ප්‍රමාණය අක්කර 1750 ක් වූ අතර 1924 දී එම දුම්රිය මාර්ගය බදුල්ල දක්වා දීර්ඝ කිරීමේ ප්‍රතිඵලක් ලෙස එම බිම් ප්‍රමාණය අක්කර 40,000. දක්වා වැඩි කර ගත හැකි වී තිබේ (De Silva 1952:155). ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ පවතින

දුම්රිය මාර්ගයේ දෙමෝදර, බණ්ඩාරවෙල, හපුතලේ, දියතලාව, බදුල්ල යන දුම්රිය ස්ථාන 19 වන සියවස අවසාන දශක දෙක තුන හා 20 වෙනි සියවස මුල් දශක තුනට අයත් ය. වික්ටෝරියානු සම්ප්‍රදායේ සැරසිලිවලින් තොර මෙම ගොඩනැගිලි ගේබල් බිත්ති (gable walls), ආරුක්කු හැඩයේ දොරවල් හා ජනේල්, සරල කොරින්තියානු කුලුනු, සරල අල්ලුවලින් (brackets) පරික්ෂිප්ත ය. බණ්ඩාරවෙල හා දියතලාව මෙම ප්‍රදේශවල ඇති දිගින් වැඩි ම දුම්රිය ස්ථාන ලෙස හඳුනා ගත හැකි ය. මේ සැම දුම්රිය ස්ථානයක් ම කළුගලින් නිමවා තිබේ ( ඡායාරූප 6,7).



**(ඡායාරූප 6) දෙමෝදර දුම්රිය ස්ථානය**



**(ඡායාරූප 7) බණ්ඩාරවල දුම්රිය ස්ථානය**

දෙමෝදර දුම්රිය ස්ථානයෙහි පමණක් ශිලාමය පදනමක් මත පිහිටුවා ඇති දැව කුලුනු දැකිය හැකි අතර එහි පියස්සේ සිවිලිම් වඩිම්බු අලංකාර රටාවකට අනුව නිමවා ඇත්තේ ද දැවයෙනි. සෙසු ස්ථානවල දක්නට ලැබෙනුයේ ලෝහමය කුලුනු ය. උඩරට දුම්රිය මාර්ගයෙහි දෙමෝදර දුම්රිය ස්ථානය ආශ්‍රිත ව පිහිටි දුම්රිය ගැටය (loop), ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග පද්ධතිය ආශ්‍රිත ව දැකිය හැකි සුවිශේෂී නිර්මාණයකි. දෙමෝදර දුම්රිය ස්ථානයට යටින් ඇති අංක 42 දරන උමඟ ඔස්සේ විහිදෙන ආකාරයට එය නිර්මාණය කර තිබේ. දෙමෝදර දුම්රිය ස්ථානය පිහිටා ඇත්තේ ද යථෝක්ත උමඟ මත ය. උඩරට දුම්රිය මාර්ගය උමං (tunnels) 43කින් සමන්විත වන අතර ඉන් වැඩි ම උමං සංඛ්‍යාවක් දැකිය හැකි වනුයේ හපුතලේ සිට බදුල්ල දක්වා කොටසෙහි ය. එම උමං අතර මීටර් 150ක් ඉක්ම වූ උමං කීපයක් ද දැකිය හැකි ය. මෙම උමං සියල්ල ම නිර්මාණය කර ඇත්තේ අශ්ව ලාඩමක හැඩයට (horse shoe shaped) ය. උමං අභ්‍යන්තරයේ පහළ කොටස් කැපූ කළුගල් කුට්ටිවලින් (dressed stone) නිර්මාණය කර ඇත. බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති කඳු වැටිවලින් ගහන භූ දර්ශනය තුළ ජල මාර්ග රැසක් විහිදෙන බැවින් පාලම් හා බෝක්කු (bridges and culverts) ද විශාල ප්‍රමාණයක් දැකිය හැකි ය. පාලම් අතර උළුවම් ආරුක්කු (mesonary arch) හා යකඩ පාලම් (iron bridges) යන ප්‍රභේද දෙක ම හඳුනාගත හැකි ය. මෙම පාලම් හා බෝක්කු 19 වන සියවසේ දෙවන භාගය සිට 20 වන සියවසේ මුල් භාගයට අයත් වන බැවින් ශ්‍රී ලාංකේය පාලම් ඉතිහාසය තුළ යකඩ පාලම් භාවිත කළ පරිවර්තනාත්මක අවධිය (transitional phase) හා කොන්ක්‍රීට් භාවිත කළ පශ්චාත් පරිවර්තනාත්මක අවධිය (post transitional phase) නියෝජනය

කරයි (කොඩිතුවක්කු 1998:19). මේ අතරින් 1918-21 අතර කාලය තුළ දී ඉදිකර ඇති ආරුක්කු නවයකින් යුතු දෙමෝදර පාලම විශිෂ්ට නිර්මාණයකි (ඡායාරූප 8).



**(ඡායාරූප 8) දෙමෝදර පාලම**

දිගින් මීටර් 118.7 වන, "අහස් නවයේ පාලම" නමින් හැඳින්වෙන මෙම පාලම කැපූ කළුගල් කුට්ටිවලින් (dressed stones) නිමවා ඇති අතර හිරගල් (keystones) හා ආරුක්කු වළලු (archrings) සිමෙන්තියෙන් ශක්තිමත් කර තිබේ (Kodithuwakku 2000:48). මෙම විශිෂ්ට නිර්මාණය සඳහා බ්‍රිතාන්‍ය ජාතික ඉංජිනේරුවන්ට අමතර ව දේශීය ඉංජිනේරුවරයෙකු වූ ඩී.ජේ. විමලසුරේන්ද්‍ර ද දායක වී තිබේ. ජනප්‍රවාදානුගත තොරතුරු අනුව කළුගලින් මෙම පාලම තැනීමේ කාර්යය ඉටු කිරීමට මුල් වී ඇත්තේ වැලිමඩ කැප්පෙටිපොළ පෙරලිවින්නේ අප්පුහාමි නම් පෙදෙර්රුවෙකි (අප්පුහාමි බාසුන්නැහේ). මේ හැරුණ විට තනි ආරුක්කුවේ හා ආරුක්කු දෙකකට වැඩි සංඛ්‍යාවකින් යුතු පාලම් කිහිපයක් ම හපුතලේ - බදුල්ල දුම්රිය මාර්ගයෙහි දැකිය හැකි ය. යකඩ පාලම් (iron bridges) කිහිපයක් ද මෙම මාර්ගයෙහි දක්නට ලැබෙන අතර දෙමෝදර දුම්රිය ස්ථානය අසල පිහිටි "කළුපාලම" ඒ අතරින් කැපී පෙනෙන්නකි. මීටර් 167 ක් දිගැති මෙම පාලමේ දෙපස කාප්ප (trusses) වෙනුවට යකඩ වැටවල් දෙකක් දැකිය හැකි ය. මෙහි පාලම් කණු (piers) හා යාබැම් (abutments) කළුගලින් නිර්මිත ය. මාර්ගයෙහි විහිදීමට අනුව මෙම පාලම ද වක්‍රතා සහිත ව නිර්මාණය කර තිබේ. දුම්රිය ස්ථාන ආශ්‍රිත ව දුම්රිය උරුමය යටතට අයත් වන ඉදිකිරීම් හා යන්ත්‍ර සූත්‍ර රැසක් ද දැකගත හැකි ය. දුම්රිය එන්ජින් (locomotives) හැරවීම සඳහා ස්ථාපනය කර ඇති හැරවුම් යන්ත්‍ර (turntable) ඒ අතරින් සුවිශේෂි නිර්මාණයයි. මෙම හැරවුම් යන්ත්‍ර

නිෂ්පාදනය කර ඇත්තේ කොවන්ස් ෂෙල්ඩෝ සමාගමයි (Cowans Sheldo & Co. Ltd). බණ්ඩාරවෙල දුම්රිය ස්ථානය අසල ඇති හැරවුම් යන්ත්‍රය එම සමාගමේ නිෂ්පාදිත අංක 2005 දරන යන්ත්‍රය වන අතර එය නිෂ්පාදනය කර ඇත්තේ 1893 දී ය.

දුම්රිය සඳහා අවශ්‍ය ජලය සැපයීමට තනා ඇති ලෝහමය ජල ටැංකි තවත් නිර්මාණයකි. ලෝහමය ආධාරකයක් මත සවි කර ඇති යථොක්ත ජල ටැංකි, රවුම් හා හතරැස් හැඩවලින් යුක්ත ය. රවුම් හැඩයෙන් යුත් ජල ටැංකි ප්‍රමාණයෙන් කුඩා වන අතර හතරැස් හැඩයේ ජල ටැංකි ප්‍රමාණයෙන් විශාල වේ. පිළිවෙළින් බණ්ඩාරවෙල හා හපුතලේ දුම්රිය ස්ථාන ආශ්‍රිත ව මෙවැනි ජල ටැංකි දැකිය හැකි ය (ඡායාරූප 9 a හා 9 b).



**a.** හපුතලේ



**b.** බණ්ඩාරවෙල

**(ඡායාරූප 9) ලෝහමය ජල ටැංකි**

මෙම ටැංකි එංගලන්තයේ ග්ලැස්ගෝහි ටී. එඩින්ටන් සමාගමේ (T.Edington & Son) නිෂ්පාදනයකි. වාෂ්ප බල දුම්රිය එන්ජින් සඳහා ජලය පිරවීමට ස්ථාපනය කර ඇති ජල කුලුනු (water columns) ද තවත් නිර්මාණයකි. හපුතලේ සිට බදුල්ල දක්වා සෑම දුම්රිය ස්ථානයක ම මෙවැනි කුලුනු දැකිය හැකි ය. වාත්තු යකඩින් (cast iron) නිමවා ඇති මෙම ජල කුලුනු ද හැඩ දෙකකින් යුක්ත ය. දැනට භාවිතයෙන් තොර ව පවතින මෙම ජල කුලුනු ද එඩින්ටන් සමාගමේ මෙන් ම, එංගලන්තයේ ඩර්බිහි විනී ඒබල් (Wini Abell) සමාගමේ ද නිෂ්පාදනයි. ඊට අමතර ව දුම්රිය උරුමය හා බැඳුණු ඉදිකිරීම් හා උපකරණ රැසක් ම බදුල්ල, දෙමෝදර, හපුතලේ, බණ්ඩාරවෙල යන දුම්රිය ස්ථාන ඇසුරෙහි දැකගත හැකි ය. භාණ්ඩ ගබඩා, දුම්රිය මැදිරිවල බර මැනීම සඳහා වූ විශාල තරාදි සහිත "තරාදි කාමර", ලෝහමය හිටි නළ ("වතුර පයිප්ප" / stand pipes), ලෝහමය ඉන්ධන ටැංකි, දොඹකර, තරාදි වර්ග, සංඥා පද්ධති හා සම්බන්ධ ටැබ්ලට් යන්ත්‍ර, පීලි මාරුකරන යන්ත්‍ර (පයින්ටු) හා සෙමෆෝ සංඥා (semaphore signals) ඒ අතර වේ. මෙම කෘති සියල්ල ම පාහේ බ්‍රිතාන්‍ය

සමාගම්වල නිෂ්පාදනය කර මෙරටට ගෙන්වන ලද ඒවා ලෙස හඳුනාගත හැකි ය. ඉහත දුම්රිය ස්ථාන ඇසුරෙන් හඳුනාගත හැකි පරිදි එම නිෂ්පාදන සමාගම් පහත පරිදි වේ.

| යන්ත්‍රය / උපකරණය | පිහිටි ස්ථානය | නිෂ්පාදන ආයතනය |
|---|---|---|
| දොඹකර | හපුතලේ<br>දෙමෝදර<br><br>බණ්ඩාරවෙල | Cowans Sheldo & Co. Carlisle, England<br><br>Thomas Smith & Sons<br>Steam & Electric Crane Works<br>Rodly Leeds, England |
| තරාදි<br>1 භාණ්ඩවල බර මැනිම<br>2 දුම්රිය මැදිරි සමග බර මනින විශාල තරාදි | හපුතලේ<br>දෙමෝදර | W&T Avery, London & Birmingham<br>Hodson & Stead Markers, Manchester (1891) |
| පීලිමාරු කරන යන්ත්‍ර (පයින්ටු) | හපුතලේ<br><br>බණ්ඩාරවෙල | W B & S S Ltd London & Chippenham, England (1949)<br>White Widnes (1926) |
| ටැබ්ලට් | හපුතලේ | Tuer's Patent Train Tablet Apparatus - London |
| සෙරමික් ජල පෙරන උපකරණ (water filter) | හපුතලේ | British Berkteld Filter Ltd - England |

දුම්රිය ප්‍රවාහන කටයුතුවල දී දුම්රිය ස්ථාන ආශ්‍රිත ව දුම්රිය මැදිරි අංගනගත කිරීම, පීලි මාරු කිරිම වැනි කාර්යය සඳහා භාවිතයට ගන්නා ලද (shunting) යන්ත්‍ර අතර බහුතරයක් ම එංගලන්තයේ හන්ස්ලට් (Hunslet) සමාගමේ යන්ත්‍රයි. ඊට අමතර ව 20 වෙනි සියවස මුල් භාගයේ දී එංගලන්තයේ ජෙනරල් ඉලෙක්ට්‍රික් සමාගමේ (The General Electric Co.Ltd) යන්ත්‍ර ද මෙරට භාවිතයට ගෙන ඇති අතර එම යන්ත්‍රයක් දැනට බණ්ඩාරවෙල දුම්රිය ස්ථානයේ ප්‍රදර්ශනයට තබා තිබේ. එය 1949 වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලද බව එහි සඳහන් කර තිබේ.

**2.2. මහා මාර්ග**

දුම්රිය මාර්ග පරිදි ම ඌව පළාතේ මහා මාර්ග පද්ධතිය හා ඒ ආශ්‍රිත ප්‍රවාහන කටයුතුවල වර්ධනය කෙරෙහි ද බලපා ඇත්තේ වතු වගාවයි. 1861-70 කාලයේ ලෝක වෙළෙඳපළේ ශ්‍රී ලංකාවේ කෝපි

මිළ ඉහළ යාමත් සමඟ ම කෝපි වගාව ව්‍යාප්ත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නව මාර්ග කිහිපයක් ම බිහිවිය.

එනම්,

1. මහනුවර සිට නුවරඑළිය හරහා බදුල්ල
2. බදුල්ල සිට මඩකලපුව
3. මහනුවර සිට මඩොල්සිම හරහා බදුල්ල
4. පැල්මඩුල්ල සිට බලංගොඩ, හපුතලේ හා බණ්ඩාරවෙල හරහා බදුල්ල මාර්ගයයි (මුණසිංහ 2000:86).

1921 වන විට ඌව පළාතේ ප්‍රවාහනය සඳහා විවෘත ව තිබූ මාර්ග ප්‍රමාණය කි.මී. 765.39 වූ අතර එය මුළු මාර්ග ප්‍රමාණයෙන් 10.9% විය (The Ceylon Blue Book 1921). මුල්කාලීන ව එම බොහෝ මාර්ග බොරලු ඇතිරූ ඒවා වූ අතර ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගත්තේ ගොනුන් බැඳි ගැල් සහ තවලම් ය. අධික කඳු සහිත භූ දර්ශනයක් වූ බැවින් එම මාධ්‍යයන්ගෙන් කරනු ලැබූ ප්‍රවාහනය අතිශයින් දුෂ්කර කාර්යයක් විය. එම දුෂ්කරතාව ජනකවියට පවා පහත පරිදි තේමා වී තිබේ.

තණ්ඩලේ දෙන්නා දෙපලේ දක්කනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
කටු කැලේ ගාලේ නොලිහා වද දෙනවා
පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා (වීරසූරිය 1993:87)

එම මාර්ග පසුකාලීන ව ටෙල්ෆඩ් හා මැකඩම් ක්‍රම යටතේ ගල් ඇතුරූ මාර්ග බවට සංවර්ධනය වී තිබේ. මාර්ග තැනීමේ කාර්යය යටතේ පාලම් ඉදිකිරීම ප්‍රමුඛ කාර්යයක් වූ අතර මුල්කාලීන ව ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ද යොදා ගෙන ඇත්තේ ගැල් ගොනුන් බව ජන කවිවලින් පැහැදිලි වේ.

කළුවර කැලේ ලී කපලා ලී ඇද්දා
මඩකලපුවේ ගොනුන්ගෙන් ලෑලි ද ඇද්දා
අලින් උසට ගල් පෙරලා බිම (බැමි) බැන්දා
බදුලු ඔයට අගනා පාලම බැන්දා (විජේසිංහ 1986:01)

මෙම ජනකවියට අනුව බදුලු ඔය හරහා වූ මුල් ම පාලම කළුගල් බැමි හා දැව යොදා සැකසූ බව කියැ වේ. කෙසේ වෙතත්, සී. ඩබ්ලිව්. බින්හැම් සඳහන් කරන පරිදි 1855 දී පී. කමින්ස් නම් ඉංජිනේරුවරයා බදුලු ඔය හරහා පාලමක් ඉදි කර තිබේ. අනතුරු ව, 1870-1891 කාලසීමාව තුළ බදුල්ල ප්‍රදේශයේ තල්දෙන - පහළ බදුලු පාර, බදුල්ල - මඩකලපුව පාර, බෙලිහුල්ඔය - පහළ බදුලු පාර, බදුල්ල - අළුත් නුවර පාර ආශ්‍රිත ව පාලම් ගණනාවක් ම ඉදිකර තිබේ. එම සියලු ම පාලම්,


ඩබ්ලිව්. එච්. හෝල්, ජේ. ආර්.නීල්, ඩබ්ලිව්. බර්ටන්, එච්.ජී.එම්. හේයස්, ජී.සී. ස්පූනර් යන විදේශ ඉංජිනේරුවන්ගේ මූලිකත්වයෙන් ඉදි වී තිබේ. මොණරාගල වතු වගාව ව්‍යාප්ත නොවුණු දිස්ත්‍රික්කය වූ බැවින්, බදුල්ල දිස්ත්‍රික්කයේ පරිද්දෙන් මාර්ග පද්ධතියේ ශීඝ්‍ර වර්ධනයක් දැකගත නොහැකි විය. 1869 වර්ෂයේ දී කොස්ලන්ද - වැල්ලවාය මාර්ගයේ නිකපොත හා ලෙමස්තොට ඉදි කළ පාලම් මොණරාගල දිස්ත්‍රික්කයේ පැරණි ම පාලම් වේ. එම්. ෂර්මන් මෙම පාලම්වල ඉංජිනේරුවරයා ලෙස කටයුතු කර ඇත. 1882 දි වැල්ලවාය - හම්බන්තොට මාර්ගයේ එච්. මේයස්, ජී. වෙනින්, ජී. එච්. බෝවයර් හා ආර්. ඕම්ස්බි යන ඉංජිනේරුවන් විසින් ඉදිකරන ලද කුඩා ඔය පාලම ද ඒ අතර වේ (Bangham 1921).

මෙම පාලම් අතරින් බහුතරය ගලින් කළ උළුවම් ආරුක්කු පාලම් (mesonry arch bridges) විය. වර්තමානයේ ඌව පළාතේ පැරණි පාලම් අතරින් දැනට ඉතිරි ව ඇත්තේ පාලම් කීපයක් පමණි. 1898 දී ඉදිකර ඇති තල්දෙන පාලම දිගින් වැඩි ම පාලමයි. මීටර් 80ක් දිගැති එම පාලම මීටර් 6ක් පළල ය. යකඩ පාලමක් වන එහි කාප්ප (trusses), හොව් (howe) ක්‍රමයට තනා තිබේ. එම පාලම එෆ්.ඒ කූපර්, එච්.බී ක්‍රිස්ටි හා ඒ.ආර්. ටොකේ යන ඉංජිනේරුවන් විසින් නිර්මාණය කරන ලද්දකි. බදුල්ල - බිබිලේ මාර්ගයේ පැල්ගහතැන්න පාලම ද එවැනි යකඩ පාලමක් වන අතර එය දිගින් මීටර් 24ක් වේ. ඒ හැරුණු විට තවත් කුඩා ප්‍රමාණයේ යකඩ පාලම් රාශියක් එම ප්‍රදේශයේ මාර්ග පද්ධති ආශ්‍රිත ව දැකිය හැකි ය. සෙසු පැරණි පාලම් සියල්ල උළුවම් ආරුක්කු පාලම් වන අතර එම ආරුක්කු අර්ධකවාකාර ව නිර්මාණය කර තිබේ. ආරුක්කු තුනකින් යුතු මීටර් 36ක් දිගැති ලුණුගල පාලම දිගම ආරුක්කු පාලම වේ. බදුල්ල- බිබිල මාර්ගයේ 9, 10 හා 11 සැතපුම් කණු ආශ්‍රිත පාලම් හා මීදුම්පිටිය පාලම හා බදුල්ල - පස්සර මාර්ගයේ වේවැස්ස පාලම සෙසු ආරුක්කු පාලම් වේ. කුඩා ජල මාර්ග ආශ්‍රිත ව ඉදිකර ඇති මෙම පාලම් තනි ආරුක්කුවකින් සමන්විත ය (ඡායාරූප 10).

මහා මාර්ගයක් හා සම්බන්ධ නොවූවත් උමා ඔය හරහා ඉදිකර ඇති හාලබ පාලම ද ශ්‍රී ලංකාවේ පාලම් ඉතිහාසය තුළ සුවිශේෂී නිර්මාණයකි. බෝගොඩ සිට බඹරපනේ, මාලගමුව දක්වා පිවිසීමට තනා ඇති මෙම පාලම මාර්ගයකට සම්බන්ධ නොවන බැවින් ''වැරදුණ පාලමක් ''ලෙස ද ප්‍රදේශවාසීන් තුළ ප්‍රචලිත ය. 1919 දී ඉදිකර ඇති එම පාලම මීටර් 114ක් දිගැති වන අතර පරායණ (span) 3 කින් සමන්විත ය. එහි පාලම්කණු (pirs) කළුගලින් නිර්මිත ය. මෙම පාලමේ විශේෂත්වය නම් දෙකෙළවර කොටස් පළලින් වැඩි වීමත් (මීටර් 3), මධ්‍ය කොටස පටු වීමත් (මීටර් 2.3) ය. ඒ අනුව එසේ පළල වෙනස්වන ලංකාවේ ඇති එක ම පාලම ලෙස මෙය හඳුනා ගත හැකි ය. මෙහි පාලම් තට්ටුව (decking) දැවයෙන් තනා ඇති අතර පාලම දෙපස සහ ඉහළ යකඩ කාප්පවලින් ආවරණය කොට ඇත (ඡායාරූප 11).



(ඡායාරූප 10) ලුණුගල ආරුක්කු



( ඡායාරූප 11) හාලබ පාලම

ඊට අමතර ව වතු ප්‍රදේශවල අඩි පාරවල් හා සම්බන්ධ වානේ අවලම්බිත පාලම් (suspension bridges) රාශියක් ද දැකිය හැකි ය. ශ්‍රී ලංකාවේ පාලම් ඉතිහාසය තුළ දැනට ඉතිරි ව ඇති පැරණි ම දැව පාලම වන ඓතිහාසික බෝගොඩ පාලම පිහිටා ඇත්තේ ද බදුල්ල දිස්ත්‍රික්කයේ ය. මීටර් 15ක් දිගැති හා මීටර් 1 1/2ක් පළල ඇති මෙම පාලම උළු සෙවිලි කළ පියස්සකින් ද සමන්විත ය. මෙහි ඇති විශේෂත්වය නම් පාලම් කණු සඳහා ද දැව භාවිතයට ගෙන තිබීම යි. මෙම පාලම "අම්බලම් පාලමක්" (ඩයස් 1991: 26) ලෙසත්, "හේ ගෙයක්" (හේරත් 1991: 239) ලෙසත් හඳුන්වයි.

### 3. පොදු පහසුකම් සම්පාදනය හා වෙනත් නිර්මාණ

වැවිලි කර්මාන්තය හා ප්‍රවාහනය හැරුණ විට කාර්මික උරුමය යටතේ පොදු පහසුකම් හා වෙනත් නිර්මාණ ලෙස හඳුනාගත හැකි කෘතීන් රැසක් ද ඌව පළාතේ දැකිය හැකි ය. දේශීය වාස්තු විද්‍යාත්මක තාක්ෂණය ද මුසු කොට 1932 දී ඉදිකර ඇති බදුල්ල නගරයේ ඔරලෝසු කණුව (clock tower), බදුල්ල හා හල්දුම්මුල්ල නගරවල පිහිටි වාත්තු යකඩින් කළ පහන්කණු (cast iron lamp posts), බදුල්ල උද්‍යානයේ ඇති වතුර මල, දියතලාව ජලය බෙදාහැරීමේ මධ්‍යස්ථානයේ හා පංකැටිය රෝහලේ ඇති ජල ටැංකි ඉන් කිහිපයකි. (ඡායාරූප 12,13)



(ඡායාරූප 12)
බදුල්ල ඔරලෝසු කණුව



(ඡායාරූප 13) දියතලාවේ
ජලය බෙදාහැරීමේ **(lamp post)**
මධ්‍යස්ථානයේ ලෝහමය ජල ටැංකිය

ඊට අමතර ව 19වන සියවස අගභාගයේ සිට 20වන සියවස මුල් භාගය ඇතුළත ඉදිකරන ලද බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් අනූන ගොඩනැගිලි රැසක් ද මෙම ප්‍රදේශයෙහි දැකිය හැකි ය. බදුල්ල නගර සභා ගොඩනැගිල්ල, බදුල්ල තානායම, බදුල්ල මහජන පුස්තකාල ගොඩනැගිල්ල, දියතලාව නිවාඩු නිකේතනය, හල්දුම්මුල්ල උසාවිය, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, හල්දුම්මුල්ල තනායම, ඇඩිසන් බංගලාව, හල්දුම්මුල්ල පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉන් කිහිපයකි. තේ වතු ආශ්‍රිත ව බිහි වූ නගරවල දැකිය හැකි වූ සුවිශේෂි වාස්තු විද්‍යාත්මක අංගයක් වූ සොල්දර කඩ සහ සොල්දර නිවාස කිපයක් ද හල්දුම්මුල්ල, හපුතලේ නගරවල තවමත් ශේෂ ව පවතිනු දැකිය හැකි ය. (ඡායාරූප 14)



**(ඡායාරූප 14) හල්දුම්මුල්ල නගරයේ පැරණි සොල්දර කඩය**

**සමාලෝචනය**

ක්‍රි.ව. 1800 – 1950 අතර කාල පරිච්ඡේදයට ඇතුළත් කළ හැකි ශ්‍රී ලංකාවේ කාර්මික උරුමය අපට ආගන්තුක උරුමයක් ලෙස පෙනුණත්, එය අද්‍යතනය වන විට අපගේ ඓතිහාසික උරුමයෙහි ම කොටසක් බවට පත් වී තිබේ. මෙම උරුමය හැදෑරීම සඳහා කාර්මික පුරාවිද්‍යාව (Industrial Archaeology) නම් උප විෂය ධාරාවක් ද පුරාවිද්‍යාවට එක් වී ඇති අතර වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක විෂය ධාරාවට එක් වී ඇති අතර එම උරුමය පිළිබඳ ආකල්ප පෝෂණය කිරීමෙහිලා සහ ඒවා රැකගැනීමට මග පෙන්වීමෙහිලා අතිශයින් මහෝපකාරී වී තිබේ. ශ්‍රී ලංකාවේ කාර්මික උරුමය යටතට ගැනෙන බොහෝ නිර්මාණ වැවිලි කර්මාන්තය හා එහි යටිතල පහසුකම් ලෙස බිහි වූ ඒවා වේ. වතු වගාවට පාත්‍ර වූ ප්‍රදේශයක් ද ඇතුළත් ඌව පළාත එවැනි නිර්මාණ රැසකින් ම සමන්විත ප්‍රදේශයකි. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික යුගය තරම් අතීතයට විහිද

යන ඌව ඉතිහාසයේ එක් කාලපරිච්ඡේදයක් නියෝජනය කරන පුරාවිද්‍යාත්මක උරුමයක් වන බැවින් ඒවා ද මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කර ගැනීම ජාතික මෙහෙවරක් වන්නේ ය.

## මූලාශ්‍රය


කහඳගමගේ, පී. (1998). **බින්තැන්නේ ජනකවි.** කොළඹ: ඇස්.ගොඩගේ හා සහෝදරයෝ.

කොඩිතුවක්කු, කේ. (1998). **ශ්‍රී ලංකාවේ මාර්ග පාලම්**. ශාස්ත්‍රපති උපාධි නිබන්ධය (අප්‍රකාශිත), කොළඹ: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කොඩිතුවක්කු, කේ. (2013). **ශ්‍රී ලංකාවේ කාර්මික උරුමය: සංචාරක ප්‍රවර්ධනය සඳහා නව විභවතාවන්**.The Proceeding of First National Annual Research Symposium, Extended Abstracts. Mihinthale:Dept.of Archeology and Heritage Management, Rajarata University of Sri Lanka.

ද සිල්වා, ආර්. (2005). **ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය**. ජා ඇල: සමන්ති පොත් ප්‍රකාශන.

දිසානායක, එස්. (1991). **ඌවේ මුල් ජනාවාසකරණය හා ඓතිහාසික ස්ථාන, ඌව වංශ කථාව, 1 කාණ්ඩය.** තිලකසිරි බණ්ඩාර, වී. වා.මූ. (සංස්), බදුල්ල: ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.

ධම්මදස්සි (හිමි), බඩල්කුඹුරේ. (2010). **සරල සංක්ෂිප්ත ඌවේ ඉතිහාසය සහ සංස්කෘතිය**. බදුල්ල: සිද්ධි ප්‍රකාශන කතෘ මණ්ඩලය.

ධර්මසේන, කේ. (1991). **ඌවේ ආර්ථිකය, ඌව වංශ කථාව, 1 කාණ්ඩය.** තිලකසිරි බණ්ඩාර, වී. වා.මූ. (සංස්), බදුල්ල: ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.

ඩයස්, එම්. (1991). **ඌවේ අභිලේඛන, ඌව වංශ කථාව, 1 කාණ්ඩය.** තිලකසිරි බණ්ඩාර, වී. වා.මූ. (සංස්), බදුල්ල: ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.

ඩයස්, එම්. (1991). **ඓතිහාසික බදුල්ල.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**පාරිභාෂික ශබ්ද මාලාව, සිවිල් හා යාන්ත්‍රි ඉංජිනේරු විද්‍යාව,** (1989) කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

විජේපාල, ඩබ්ලිව්. එච්. (1991). **ඌවේ ප්‍රාග් ඉතිහාසය, ඌවේ මුල් ජනාවාසකරණය හා ඓතිහාසික ස්ථාන, ඌව වංශ කථාව, 1 කාණ්ඩය**.තිලකසිරි බණ්ඩාර, වී. වා.මූ. (සංස්), බදුල්ල: ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.

විජේසිංහ, පි. (1986). **ඌවේ ජනකවි**. කොළඹ: ජාතික පුස්තකාලය.

වීරසූරිය, පී. බී. එස්. (1993). **ජනකවි සාහිත්‍යය**. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සැබිහෙළ, අලවිඉසි හා දිසානායක, හියුබත්, (1966). **ඌව දනව්ව**. කොළඹ: ඇම්. ඩී.ගුණසේන සහ සමාගම.

හේරත්, සු. බ. (1991). **ඌව සම්පත්. ඌව වංශ කථාව, 1 කාණ්ඩය.** තිලකසිරි බණ්ඩාර, වී. වා.මූ. (සංස්), බදුල්ල: ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.

Bingham, P.M. (1921). *History of Public Works Department*. Ceylon, 1796 to 1923, Ceylon Gorvenment Printer

de Silva. L.S.(ed) (1991). *A History of the Sri Lankan Government Railway*. Colombo:The Institute of Engineers, Sri Lanka

de Silva , S.F. (1952). *A Regional Geography of Ceylon.* Colombo: The Colombo Apothicaries Company Ltd

Douet, J. (ed) (2012) *Industrial Heritage*. Re- tooled: the TICCIH Guide 40 Industrial Heritage
Forrest, D.M .(1967). *A Hundred Years of Ceylon Tea*. London: Chatto and windus Ltd.

Furguson, J.(1877 /1994). *Ceylon in the Jubilee Year.* New Delhi: Asian Education Services.

Government of Ceylon. (1921) *The Blue Book Series*. Colombo: Governnment Press.

Jones. W. (2006) *Dictionery of Industrial Archaeology*. Gloucestershire: Sutton Publishing Ltd

Kodithuwakku, K. (2000). *Brief History of the Sri Lanka Railway* ගවේෂණ 1 කලාපය, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

Perera,G.F. (1925). *The Ceylon Railway*. Colombo: The Ceylon Obsever:

TICCIH :2013.https://www.ICOMOS.org/18thapril/2006 nizhny-tajil-chater-e.pdf

Xie, P.F .2015, Industrial Heritage Tourism. Bristal: Channel View Publication

# ශ්‍රී ලාංකේය බිතුසිතුවම් හා බදාම නිර්මාණ තාක්ෂණයේ බන්ධන මාධ්‍යය භාවිතය

**ජනනි නාමල් සෙනෙවිරත්න**[1]




ශ්‍රී ලාංකේය බිතුසිතුවම් නිර්මාණ තාක්ෂණය පිළිබඳ සාධක සම්මත වර්ෂයෙන් පෙර දෙවැනි සියවස තරම් ඈත අතීතයට දිව යයි. එහි දී සාම්ප්‍රදායික සිත්තරා වර්ණ සැකසීම සඳහා සිතුවම් නිර්මාණයට අවශ්‍ය පසුතලය සැකසීමේ දී එය හොඳින් සවිමත් කර ගැනීම සඳහා බන්ධන මාධ්‍යයක් භාවිත කර ඇත. ස්වාභාවික ව තිබූ ගල් ලෙන් ගිනි ගසා ගල් පෘෂ්ඨය පළුදු කර බදාමයක් යොදා එය නැවත සමතලා කොට මුල් යුගයේ දී සිතුවම් නිර්මාණය කරන ලදි. ලෙන් පෘෂ්ඨයේ ස්වභාවය අනුව බදාම දැමීමේ ගනකම නිරන්තරයෙන් වෙනස් විය. ඇතැම් අවස්ථාවල ගල් පෘෂ්ඨය මත කපරාරු බදාමය නොයොදා හුණු හෝ මකුළු බන්ධන මාධ්‍යයක් සමග යෙදූ අවස්ථා දක ගත හැකි වෙයි. ඒ කුමන ආකාරයකින් සිතුවම් නිර්මාණය කළත් පැරණි සිත්තරා ස්වාභාවික අමුද්‍රව්‍ය ආශ්‍රයෙන් සකසා ගත් බදාම හෝ වර්ණක සවිමත් කර ගැනීම සඳහා බන්ධන මාධ්‍යයක් භාවිත කර ඇත.


සිතුවම් නිර්මාණයේ දී ටෙම්පරා හා ෆ්‍රෙස්කෝ වශයෙන් ක්‍රම දෙකක් පැරණි සිත්තරා විසින් භාවිත කරන ලදි. ශ්‍රී ලංකාවේ දකිය හැක්කේ ඉන් ටෙම්පරා ක්‍රමයයි. එනම් ආධාරකයට තදින් ඇලෙනසුලු බන්ධන මාධ්‍යයක් යෙදීම හා තෛලෝදයක් භාවිතයෙන් සිතුවම් සවිමත් කිරීමයි. මෙම ටෙම්පරා ක්‍රමයේ දී වර්ණයක හා බන්ධන මාධ්‍යයක සුදුසු මිශ්‍රණයකින් සාදන සායම් තුනී වියළුණු පදනමක් මත ඇතුරූ පසු මඳ පවනේ වියළෙන්නට ඉඩ හරියි. එවිට එය ක්‍රමයෙන් සවිවර වේ. සීගිරි සිතුවම් සඳහා වියළෙන තෙල් වර්ගයක් භාවිත කර ඇති බව ස.ව. 1965 හා 1971 දී ප්‍රකාශයට පත් කර තිබේ (සිල්වා 1965:89-103). එහෙත් එම තෙල් වර්ගය කුමක් ද යන්න පිළිබඳ විද්‍යානුකූල ව තහවුරු වී නොතිබුණි. පසු ව ඔහුගේ එම මතය තහවුරු කරමින් සම්මත වර්ෂයෙන් 2013-2018 කාලය තුළ දී සිදු කරන ලද විද්‍යාත්මක විශ්ලේෂණ අනුව එම තෙල් වර්ගය දොරණ හා තල තෙල් බවට තහවුරු වන සාක්ෂ්‍ය ලැබී ඇත. ඒ අනුව සීගිරි සිතුවම් තාක්ෂණය පිළිබඳ පෙර පැවැති මතයක් වූ ෆ්‍රෙස්කෝ යන්න සම්පූර්ණයෙන් ම බැහැර කළ හැකි වේ (Seneviratne 2018:72-88).

මෙහි දී සැලකිය යුතු කරුණක් වන්නේ පෞරාණික සිත්තරුන් භාවිත කළ වියළෙන තෛලෝද සෑම අතින් ම එහි සංඝටක අතින් සමාන ස්වරූපයක් ගැනීමයි. ඒ අනුව තල තෙල් හා දොරණ තෙල් එකිනෙකින් වෙන් කර හඳුනාගත නොහැකි තරමට සමානත්වයක් පෙන්වයි. පර්යේෂණ නියැදි ලෙස ගනු ලැබූ සීගිරියේ හා තිවංක පිළිම ගේ සිතුවම්වල වර්ණ හා බදාම ස්තරයේ බන්ධන මාධ්‍ය කාලයාගේ ඇවෑමෙන් වියකී යාම හේතුවෙන් දත්ත සංසන්දනය ඉතා දුෂ්කර කාර්යයක් විය. එහෙත් ලැබී ඇති විද්‍යාත්මක විශ්ලේෂණ අනුව සාම්ප්‍රදායික ව භාවිත කළ දොරණ තෙල් හා තල

[1] පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
janani.namal@gmail.com


තෙල් යන වියළෙන තෛයිලෝද මෙන් ම දිවුල් මැලියම් බන්ධන මාධ්‍ය ලෙස භාවිත කර ඇති බව විද්‍යාත්මක ව තහවුරු වී ඇත (Seneviratne 2018:72-88).



**FTIR දත්ත විශ්ලේෂණය**

සීගිරිය හා තිවංක පිළිම ගේ සිතුවම්වල වර්ණක සමඟ මෙම තෛලෝද හා දිවුල් මැලියම් භාවිත කිරීමේ දී වියළීමට යම්තාක් කාලයක් ගෙන ඇත. මේ ප්‍රතිඵලයක් ලෙස එම වර්ණක බදාමය තුළට තදින් කා වැදීම සිදු වී ඇත. පසුකාලීන යුගවල අඳින ලද මහනුවර සම්ප්‍රදායේ සිතුවම් හා දකුණු සම්ප්‍රදායේ සිත්තම්වල භාවිත ටෙම්පරා ක්‍රමයෙන් වෙනස් ටෙම්පරා ස්වරූපයක් සම්භාව්‍ය සිතුවම් නිර්මාණ ශිල්පියා භාවිත කර ඇති බව මේ අනුව තහවුරු වෙයි. මුල් කාලයේ භාවිත තාක්ෂණය අනුව බදාමය හොඳින් වියළුණු පසු වර්ණ දරන ආලේපයක් යොදා ඒ මත සිතුවම් ඇඳීම වෙනුවට, බදාමය හොඳින් පිරිමැද බදාමය තුළට වර්ණ උරා ගැනීමේ හැකියාව ඇති පරිදි වියළෙන තෙල් හා මැලියම් සමඟ වර්ණ කවලම් කර බදාමය මත ආලේප කොට ඇත. මෙම ක්‍රමවේදය අනුව වර්ණ පතුරු හා කුඩු වශයෙන් ගැලවී යාමේ ප්‍රවණතාව හීන වේ.





**සීගිරි වර්ණ සහිත බදාමයේ පර්යේෂණ නියැදිය**



**තිවංක පිළිමගේ වර්ණ සහිත බදාම පර්යේෂණ නියැදිය**

එහෙත් මහනුවර හා දකුණු සම්ප්‍රදායේ සිතුවම් එපමණ කලක් රඳා නොපැවතීමට හේතුව ඒවා වෙන් වෙන් වශයෙන් පැහැදිලි ව හඳුනාගත හැකි ස්තරායන ලෙස සැකසී තිබීමයි. එහි දී එක් එක් ස්තරය මත මෙන් ම ඒ ඒ ස්තාරයන අතර ද බන්ධන මාධ්‍යය කාලයාගේ ඇවෑමෙන් වියැකී යාමේ ප්‍රවණතාවක් පවතී. එමෙන් ම මෙම සම්ප්‍රදායන්හි සිත්තරුන් හොඳින් වියළුණු මතුපිටක් මත වර්ණ ගැන්වීම සිදු කර ඇති බව පෙනී යයි. සිතුවම් හරස්කඩක් නිරීක්ෂණය කළ විට පෙනී යන්නේ බදාමයත්, වර්ණ ස්තරයත් අතර වර්ණ දැරීමේ ස්තරයක් හා ඇතැම් විට වර්ණ ස්තරයට පසු ආරක්ෂිත ආලේපයක් ද පවතින බවයි. ඒ අනුව පෙර යුගයන්ට සාපේක්ෂ ව මෙම සිතුවම් හායනය වේගවත් වී ඇත.



**මිරිස්ස වෙහෙරගල්ල විහාර සිතුවම් හා දඹුල්ල රජමහා විහාරයේ වර්ණ බදාම වෙන් වෙන් වශයෙන් පෙනෙන අයුරු.**

මහාථූප අත්තිවාරම පිළියෙල කිරීමේ දී ලෝහ තහඩු ඇතිරීම සඳහා දිවුල් මැලියම් හා තලතෙල් භාවිත කළ බව මහාවංසයේ සඳහන් වේ. සම්මත වර්ෂයට පෙර දෙවැනි සියවස තරම් ඈත කාලයේ දී මැලියම් පමණක් නොව වියළෙන තෙල් තදින් ඇලෙන ස්වභාවයක් තිබෙන බව දේශීය ඉපැරණි සිත්තරු දැන සිටියහ. මහා ස්තූපය ගොඩ නැගීමේ දී රතු ආසනික් (මනෝසීල) පෙර සඳහන් බදාමයට එක්කර කපරාරුව සඳහා භාවිත කර ඇත. මෙම සමයේ ම එම ස්තූපයේ ඇතුල් ගර්භයේ අඳින ලද බිතුසිතුවම් සඳහා ද මෙම ස්වාභාවික පාෂාණමය වර්ණකය කවලම් කිරීමට පෙර සඳහන් පරිදි මැලියම් හා වියළි තෙල් භාවිත කර ඇත (ද සිල්වා 2013:100).

පාලි බසින් රචිත බෞද්ධ ධර්මයේ විනය කොටසක් වන චුල්ලවග්ගයේ බැදුම් මාධ්‍යයක් වන ඉක්කසම් කසාවත් (ගස්වලින් වෑස්සෙන කහට හින්ද වීම) ගැන සඳහන් වේ. මෙය කළු වර්ණය සකසා ගැනීම සඳහා භාවිත කර ඇති බව එහි සඳහන් ව ඇත. සම්මත වර්ෂයෙන් පස්වැනි සියවසේ බුද්ධඝෝෂ හිමි රචනා කළ සමන්තපාසාදිකාවේ විනය ටීකාවේ උන්වහන්සේ ප්‍රකාශ කරන්නේ 'ඉක්කසම් කසාවත් යනු ගස්වලින් ලබා ගන්නා ලද මැලියම් බවයි.' ඒ අනුව විහාර සිතුවම් කරන ලද සිත්තරුන් භික්ෂූන්ගේ මඟපෙන්වීම අනුව පුරාණ ග්‍රන්ථවල ඇති කරුණු සිය අත්දැකීම් හා මිශ්‍ර කරගන්නට ඇති බව සනාථ වේ (ද සිල්වා 2013:100).

සිත්තරුන්ගේ ශිල්පීය ක්‍රියාමාර්ග විශේෂයෙන් ම පදනමේ හා සිතුවම් ස්තරයේ යන දෙකෙහි ම බන්ධන මාධ්‍යයක් භාවිත කිරීම චාරිත්‍රානුකූල ව සිදු කළ බව බුද්ධඝෝෂ හිමි රචනා කළ ටීකාවේ සඳහන් වේ. කපරාරුව (Plaster) හා හුණු බදාම (Mortar) සූදානම් කිරීමේ දී බදාම මාධ්‍යයක් ලෙස කපිථ මැලියම් (දිවුල් ලාටු) භාවිත කළ බව මහාවංසයේ සඳහන් වේ. සම්මත වර්ෂයෙන් 13 වැනි සියවසේ රචිත කෘතියක් වන සද්ධර්මරත්නාවලියේ ඇති තොරතුරු අනුව ද සායම් දිය කිරීමට බිත්තර සාරු භාවිත කර ඇත. සම්මත වර්ෂයෙන් 19 වැනි සියවසේ අඳින ලද සිතුවම්වල ද බන්ධන මාධ්‍යයක් ලෙස බිත්තර සාරු භාවිත කළ බව සඳහන් වේ. ඒ අනුව සිතුවම්වල හොඳ ම බන්ධන මාධ්‍යය වන්නේ දිවුල් ගසේ මැලියම් (*Feronia elephantum*) හා දොරණ තෙල් (*Dipterrocarpus glandulosus*) බව සනාථ වේ (කුමාරස්වාමි 1962:165-177).

සම්මත වර්ෂයෙන් 2020 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් අංශය විසින් දීඝවාපියේ දකුණු වාහල්කඩ සිදු කරන ලද කැණීමෙන් මුනින් නවන ලද ලෝහ පාත්‍රයක් හමුවුණි. එහි ලම්භකර්ණ වංශික රාජකීය පරම්පරාවෙන් පැවත එන වසභ රජුගේ මුණුපුරෙකු වන මහල්ලක නාග (ක්‍ර.ව.134-140) රජුගේ පුත්‍ර කනිෂ්ඨ තිස්ස රජතුමාට (ක්‍ර.ව.164-192) අයත් යැයි පිළිගත හැකි අන්දමේ රාජකීය ලාංඡනයක් විය. (මෙය ක්‍ර.ව. දෙවනි සියවසට අයත් බවත් එය කනිෂ්ඨතිස්ස රජුගේ බවත් කිව හැකි වන්නේ ඒ කැණීමෙන් ම හමු වූ ශිලාමය කරඬුවත් ඒ තුළ බහා තිබූ රන් ධාතු කරඬු හතර හා පලිඟු කරඬුව මෙන් ම එම රජුට අයත් රන් සන්නසක් හමු වීම හේතුවෙනි.) මේ වන තුරු එහි විද්‍යාත්මක විශ්ලේෂණයක් මගින් මූලද්‍රව්‍යවල සංයුතිය පරීක්ෂා නොකළ ද මෙම සංකේත සහිත ලෝහ තහඩුව හා පබළු ඇතුරුම සවි වී තිබුණේ ද මෙම වකවානුවේ භාවිත කළ රන්, රිදී, මුතු මැණික්වලට තල තෙල් හා දිවුල් ලාටු එක්කර අඹරන ලද මැලියම් සහිත බදාමයකින් බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රසායන සංරක්ෂණ අංශය මගින් කළ අන්වීක්ෂ පරීක්ෂාවේ දී අනාවරණය විය.



**දීඝවාපී චෛත්‍යය වාහල්කඩින් හමු වූ ලෝහ මංජුසාව තැන්පත් කර තිබූ පාදමේ බදාමය**

සම්මත වර්ෂයෙන් දෙවන සියවසේ දී බන්ධන මාධ්‍ය ලෙස වියළෙන තෙල් වර්ග හා දිවුල් මැලියම් භාවිත කළ බවට තවත් වංසකතා සාධකයක් හමු වේ. භාතිකතිස්ස රජු (ස.ව.143-167) විසින් රථ සියයකින් ගෙනෙන ලද මුතුබෙලිකටු ප්‍රවේශමෙන් මැලියම් හා තෙල්වල පොඩිකර බදාම බවට පත්කර මහාථූපය පිළිසකර කළ බව සඳහන් වේ (මහාවංසය 1837:34-36). මේ අනුව අතීත ශිල්පීන් සිතුවම් සැකසීමේ දී මෙන් ම වෙනත් කලාත්මක කාර්යයන් කිරීමේ දී එහි කල්පැවැත්ම හා සවිමත් බව සඳහා බදාමයට බන්ධන මාධ්‍යය එක් කළ බව තහවුරු වේ.

ශිල්පීන් බදාම සකස් කර ගත් තවත් ක්‍රමයක් වන්නේ හුණු හා වැලි, කහට පොතු සමඟ මිශ්‍ර කර ගැනීමයි. මෙහි දී සියුම් වැලි කොටස් තුනකට බෙලිකටු හුණු කොටස් දෙකක් හලා ගත් වැලි කොටස් දෙකකට හුණු කොටස් දෙකක් ගෙන දින 20 ක් පමණ පල් වෙන්නට තබා එයට කිතුල් පැණි, කදුරු හා තල තෙල් මිශ්‍ර කර බදාමය සකස් කර ගනියි. සිතුවම් හා කැටයම් වැඩ සඳහා අරළු, කහට පොතු, කුරුම්බා ඇට්ටි මද හා ගොඩපර ලෙලි තම්බා ගත් ජලය සමග මැටි, වැලි මිශ්‍රණයට කපු පුළුන් හා මී පැණි සමඟ අනා ගැනීමෙන් අවශ්‍ය බදාමය සකස් කරගෙන ඇත. බිත්තියේ දිස්නය ලබා ගැනීම සඳහා බිත්තර සාරු මිශ්‍ර කර ඇත (සෝමතිලක 2004:300-305).

නීලවල පරම්පරාවට අයත් වර්තමානයේ විහාර කර්මාන්තයේ යෙදී සිටින සිත්තරෙකු වන ජයසේන නයිදේ පවසන පරිදි ඔවුන්ගේ සිත්තර පරම්පරාවට අයත් ජීවන් නයිදේ ඇතුළු සිත්තරුන් විසින් බදාම සකසන ලද බදාම වට්ටෝරුවට අනුව ගොඩපර, පුවක් ලෙලි, කහට පොතු, කුරුම්බා ලෙලි සහ දඹ පොතු යන අමු ද්‍රව්‍ය හොඳින් කොටා දින හතක් පමණ පල්වෙන්නට තබයි. එම කාඩි ජලය පෙරා සිහින් වැලි හා කිරිමැටි සමඟ කවලම් කර දින හතක් හෝ අටක් හොඳින් පවනේ වියළෙන්නට තබයි. ඉන් පසු එම මැට්ට හොඳින් අඹරා හලා ගනු ලැබේ. අනතුරු ව කෙසෙල් ගසේ පට්ට ඇර මඳ කොටස මිරිකා එම යුෂ ඒ බදාමයට කවලම් කරයි. කපු පුළුන් එම මිශ්‍රණයට දමා හොඳින් අනා ගනියි. පසු ව සිතුවම් පෘෂ්ඨයේ දිවුල් මැලියම් ගා සකසාගත් බදාමය ඇඟිල්ල භාවිතයෙන් හොඳින් ගා ගනියි. වියළුණු පසු එම බදාමය මත මකුළු මැටි ගල්වා පසු ව වර්ණ මගින් සිතුවම් ඇඳීම ආරම්භ කරයි.



**ජයසේන නයිදේ සිත්තරා විසින් සිතුවම් නිර්මාණය කරන අයුරු**

පැරණි ශිල්පීහු වර්ණ සැකසීමේ දී ද ස්වාභාවික පාෂාණ කුඩුකර ඒවා හොඳින් අඹරා ඒ සඳහා බන්ධන මාධ්‍යයක් එක් කළහ. මෙම තාක්ෂණය සනාථ කිරීමට ලියන ලද ලිඛිත තොරතුරු වංසකතා තුඩපත් සහ සන්නස්වල ලියවී ඇත. ඒවායේ නිරවද්‍යතාව සනාථ කිරීම සඳහා FTIR (Fouier

Transform Infra Rod Speotroscopy) හෝ GCMS (Gas Chromatography/ Mass spetroscopy) වැනි නූතන විද්‍යාත්මක විශ්ලේෂණ ක්‍රමයක් භාවිත කළ හැකි ය.

විද්‍යාගාර පර්යේෂණ බොහොමයක දී හෙළිදරව් වී ඇත්තේ පැරණි සිත්තරුන් කහ පැහැය සඳහා **ආසනික් සල්ෆයිඩ්** අඩංගු හිරිගල් භාවිත කර ඇති බවයි. ගොකටු යුෂ, හිරියල් සහ රතු, කහ සම ව ගෙන ඊට පරණ කොහොල්ලෑ එක් කර දොරණ තෙලින් අඹරා කහ වර්ණය සකස් කර ගෙන ඇත. කළු පැහැය ලබා ගැනීමට ශිල්පීන් භාවිත කළ ශිල්ප ක්‍රමය තරමක් සංකීර්ණ වේ. මේ සඳහා කොහොල්ලෑ, කැකුණ හෝ දොරණ තෙල් හා හල්දුම්මල යොදාගෙන ඇත. මේ සියල්ල එකට අඹරා කපු රෙදි කැබලි සමග මිශ්‍ර කර පිරිසිදු මැටි බඳුනක දමා තවත් බඳුනකින් වසා ගිනි තබනු ලැබේ. පසු ව වසා ඇති බඳුනේ රැස් ව තිබෙන දැලි එකතු කර ගනියි. මේවා අඳුන් දැලි නමින් හඳුන්වයි. අඳුන් දැලි තෙල් ස්වභාවයෙන් යුක්ත ය. ජලයේ දිය නොවන හෙයින් මැලියම් මිශ්‍රණයකින් දිය කර ගත යුතු ය. මීට අමතර ව පොල් කටු අඟුරු දොරණ තෙලින් අඹරා ගැනීම ද පරණ කොහොල්ලෑ ද පහන් දැලි හා පාන්කඩ යන ද්‍රව්‍ය කිහිපයක් කැප්පෙට්ටියා ලාටු සමග එකට උණු කර අඹරා ගැනීම වැනි ක්‍රම භාවිත විය (සෝමතිලක 2004:310-311).

සායම් සාදන පිළිවෙළ පුස්කොළ පිටපතේ මෙසේ සඳහන් වේ.

> වරකා මුල සිහින් ව කපා වතුර කොටස් 12ක් වත්කර දවසක් තබා හොඳින් කකාරා ඉන් දෙගුණයක් කොරකහ කොළ ඉස්ම ගෙන එයට එක්කර කොටස් 04කට සිඳුවා ගුරුගල් හුඹස් මැටි හොඳින් පුළුස්සා එයට දිවුල් ලාටු එකතුකර බිම් දුම්මල යන වර්ග දමා උකු නැගෙන පදමට බා පෙරා මැටි භාජනයකට වත් කළ විට රක්ත වර්ණ සායමක් ලැබෙන බව සඳහන් වේ (සෝමතිලක 2004,312).

දේශීය සිතුවම් කලාවේ අතීතයේ නිල් වර්ණය භාවිත වී තිබෙන්නේ විරල ව වුවත් සම්මත වර්ෂයෙන් 19වන සියවසේ දී මෙම පැහැය ජනප්‍රිය වී ඇත. පුස්කොළ ග්‍රන්ථවල නිල් පැහැති සායම් නිපද වූ ආකාරය පිළිබඳ ක්‍රමය දක්වා ඇති ආකාරයෙන් අනාවරණය වේ. "වල් වරකා, බෝම්, කපු, ඇසතු බෝ, තොටිල්ල, තිඹිරිය මේවා පොතු ගෙන කොටා යුෂ මැටි භාජනයකට ගෙන අව්වේ තබා පිටි ගෙන කහ මදය හැර කිකිළි බිත්තර සාරු එපමණට ගෙන කලවම් කොට ඉන් පංගුව මුහුදු කළු වැලි කබලෙන් බැද සිනිඳු ව අඹරා එයට අරක්කු එකතු කර කිකිළි බිත්තර සාරු මෙන් තුන් ගුණයක් බෙහෙත් එඬරු කොළ යුෂ ගෙන ඊට බෙහෙත් කවලම් කර එකට සිඳුවා මැටි භාජනයකට වත් කොට නිවෙන්නට හැරි විට නිල් පැහැය ලැබෙන බව සඳහන් වේ (සෝමතිලක 2004:314). සීගිරි සිතුවම්වල සඳහන් නිල (මෙය කොළ පැහැයට බර වූ පැහැයකි) මේ සියල්ලෙන් වෙනස් වේ. එය පරීක්ෂණ මඟින් අනාවරණය වූ ආකාරයට ටෙරාවයිට් (Terre Verte-$Fe_2O_3$) සහ වේවලයි (Whewellit- $CaC_2O_4H_2O$) යන මූල ද්‍රව්‍යවලින් සමන්විත බවත් ඒවා සීගිරිය අවට ඇති පාෂාණවලින් ලබා ගෙන ඇති බවත් තහවුරු වී ඇත (Seneviratne 2018:84).

පසු කාලයේ ස.ව. 18 වැනි සියවසින් පමණ පසු සිත්තරුන් සිතුවම් තෙතමනයෙන් ආරක්‍ෂා කර ගැනීම සඳහා වලිති ආලේප කර ඇත. වලිති ක්‍රම තුනකට අනුව සකස්කර ගෙන තිබේ.

1. පිරිසිදු දුම්මල කුඩු දොරණ තෙල් හෝ කැකුණ තෙල් සමග මිශ්‍ර කොට උණු කර නිමෙන්නට හැර වාර කිහිපයක් පෙරා ගැනීමෙනි. මෙය වහා වියැළෙන සුලු ය. තද දීප්තියකින් ද යුක්ත වේ.
2. ගොකටු සායම ද තද දීප්තියකින් යුක්ත ජලයේ දියවන ආරක්‍ෂකයකි.
3. කැප්පිටියා ලාටු උණුකර තනි ආලේපයක් වලිතිය ලෙස යොදා ගෙන ඇත. විද්‍යාත්මක විශ්ලේෂණවලින් ද මේ බව තහවුරු වී ඇත (Seneviratne 2018:12).

එකල ශිල්පියා සිතුවම් පමණක් නොව පැරණි පුස්කොළ කම්බා, කුඩා දැව භාණ්ඩවල ආරක්‍ෂාව සඳහා මෙම වලිතිය යොදාගෙන ඇත. මෙලෙස විවිධ ක්‍රම භාවිත කරමින් සකස් කර ගන්නා වර්ණ ඉතා උසස් ගුණාත්මක භාවයෙන් යුක්ත වීමට නම් අවශ්‍යයෙන් ම කළ යුත්තේ දිගු කලක් ඇඹරීම ය. මෙම ක්‍රියාවලිය බහුල ව සිදු කරනු ලබන්නේ සිත්තරා යටතේ පුහුණුව ලබන ශිෂ්‍යයින් විසිනි. කොටාගත් සායම් දිය මුසුකොට ගල් වංගෙඩියේ ලා ඉතා සිනිඳුවන තුරු නැවත නැවතත් කොටනු ලැබේ. ඉතා සාර්ථක ක්‍රමය වන්නේ මෙම සායම්, දිවුල් ලාටු හා ජලය සමග මිශ්‍රකොට භාවිත කිරීම ය. මහනුවර ශිල්පියා මෙන් ම දකුණේ ශිල්පියා ද බිතුසිතුවම් සඳහා මෙලෙස වර්ණ නිපදවා ගැනීම සඳහා දේශීය ක්‍රම භාවිත කළ අතර වර්ණ බන්ධන මාධ්‍ය ලෙස දිවුල් ලාටු භාවිත කර ඇත. එහි වර්ණ කල් පැවැත්ම සඳහා බදුල්ල කිරි මිශ්‍ර කර ඇත. සිත්තරුන් බන්ධන මාධ්‍යය නිපදවා ගැනීමට මුදවපු කිරි ද භාවිත කර ගත් අවස්ථා ඇත. පළමු ව මුදවපු කිරි ගෙන ජලය පෙරා හරී. ඉන්පසු එය පිරිසිදු රෙදි කැබැල්ලකින් ඔතා මදක් ගණ වනතුරු උණුසුම් ජලයේ පැය කිහිපයක් තබා හුණු සමග මිශ්‍ර කර භාවිතයට ගනු ලැබේ. පසු ව භාවිතයට ගැනීමට අවශ්‍ය වූ විට ද ගත හැකි පරිදි කල් තබා ගත හැකි බන්ධන මාධ්‍යයකි.

වතුරේ දිය කරන සායමින් සිතුවම් ඇඳ වලිති ගෑම ද සිදු කර තිබේ. කාලයත් සමග වලිති ක්‍ෂය වී යාම හේතුවෙන් මෙවැනි සිතුවම්වල ජලයෙන්, දූහුවිලි ඇතුළු අපද්‍රව්‍ය ද ඉවත් කළ නොහැකි තත්ත්වයේ පවතී. සායම් දිය වී යාම ඊට හේතුවයි. මෙම වලිති සාදා ගැනීමේ දී උඩරට දී (දඹුල්ල, දෙගල්දොරුව, ගංගාරාමය ඇතුළු බොහෝ විහාරවල) ද පහත රට දකුණු ප්‍රදේශවල දී ද දොරණ තෙල් වලිති ලෙස (දකුණු සම්ප්‍රදායේ සිතුවම් ඇති සියලු ම විහාරවල) භාවිත කර ඇත. වලිති සැකසීමේ දී දුම්මල තෙල් ද මිශ්‍ර කර ඇති බවට සාධක හමු වේ. දැනට ද පහතරට ප්‍රදේශයේ වලිති සාදා ගත් බවට සාධකයක් මුල්ගිරිගල විහාරයේ හා මිරිස්ස සමුද්‍රගිරි විහාරයේ දක්නට ලැබේ. විහාර සිතුවම් කර මසක් හෝ දෙකක් ගත වූ පසු වලිති යෙදීම කර ඇත. වලිති ගැල් වූ අලුත එහි තද දිස්නයක් ඇති වුවත් කාලයත් සමඟ දිස්නය අඩු වී යයි. වලිති සැකසීමේ දී මහනුවර හා දකුණේ ශිල්පීන් බහුල ව අනුගමනය කර ඇත්තේ එක ම ශිල්ප ක්‍රමයකි. පිරිසිදු හල් දුම්මල ගෙන සිනිඳුවට අඹරා දොරණ තෙල් හෝ කැකුණ තෙල් සමඟ කවලම් කර පිරිසිදු බඳුනකට දමා හැඳි ගාමින් මඳ ගින්නේ උණු කර පදම බලා ලිපෙන් බා නිමෙන්නට හැර පිරිසිදු රෙද්දකින් පෙරා සිතුවම මත ආලේප කිරීමයි. විද්‍යාත්මක විශ්ලේෂණවලින් ද මේ බව තහවුරු වී ඇත (Seneviratne 2018:12).

මහනුවර සම්ප්‍රදායට අයත් බුදු පිළිම විශාල, මධ්‍යම හා කුඩා යන තුන් ප්‍රමාණයෙන් ම ඉදි වී ඇත. මෙම සම්ප්‍රදායට අයත් ප්‍රතිමා සඳහා වැඩි වශයෙන් යොදා ගත් ද්‍රව්‍ය වූයේ ගඩොල් හා හුණු බදාමයයි. මධ්‍යම පළාත ආශ්‍රිත ව මෙන් ම දිවයිනේ දකුණු හා බටහිර වෙරළබඩ ප්‍රදේශවල විහාර මන්දිරවල දක්නට ලැබෙන විශාල සැතපෙන බුද්ධ ප්‍රතිමා ඉදි කර ඇත්තේ මේ ද්‍රව්‍ය යොදාගෙන ය. මහනුවර අවධියේ දී සුලබව මැටි භාවිතයෙන් පිළිම ඉදි විය. මෙහි දී හුඹස් මැටි එක් කොටසක් ද දහයියා අළු ඉන් භාගයක් ද මෙම දෙකොටස ම වැනි කොටස් දෙකක් වැලි ද ගෙන එකට අඹරා බදාමය සකස් කර ගන්නා ලදී. එමෙන් ම වෙල් මැටි සමග ඉඹුල් පුළුන් මිශ්‍රණයක් සමඟින් බදාමය සකසා ඇත. එයට ඇතැම් විට කපු පුළුන් සමග මී පැණි මිශ්‍ර කළ බව ද සඳහන් වේ. කුඹුරු හෝ වැව් ආශ්‍රිත මැටි පුරාණ ශිල්පීන් යොදා ගෙන තිබේ. නියමිත ප්‍රමාණයට ගත් මැටි සමග වැලි හා මැලියම් වර්ග මිශ්‍ර කිරීමෙන් ඇඹීම් කර ඇත. හොඳින් බන්ධනය වීමට හා කල් පැවැත්මට මැලියම් වර්ගයක් යොදා ගත් බව ද පෙනේ. මැටි හෝ හුණු යන කවර බදාමයකට වුව ද එහි බන්ධනය ස්ථිර කිරීමටත් ඉරි තැලීම්, පිපිරීම් වැලැක්වීමටත් මෙබඳු සම්ප්‍රදායික මුහුම් වර්ග භාවිත විය. තල තෙල්, කපු තෙල් වැනි තෙල් වර්ග හෝ දිවුල් වැනි මැලියම් වර්ග කිතුල් පැණි, උක් පැණි වැනි පැණි වර්ග මැටි හෝ හුණු බදාම සමඟ මිණුම් ලෙස මිශ්‍ර කිරීමෙන් ප්‍රතිමාවල ද බන්ධන ශක්තිය තහවුරු විය (ද සිල්වා 2013:100).

ඉහත සඳහන් තොරතුරු අනුව අනාවරණය වන්නේ පැරණි ශිල්පීන් සිය පරපුරෙන් පරපුරට දායාද වූ ක්‍රමවේදවලට අනුව වර්ණ හා බදාම සැකසීමේ දී බන්ධන මාධ්‍යයක් ලෙස මැලියම් හා වියැළෙන තෛලෝදයන් භාවිතය මඟින් අනාදිමත් කාලයක් සිය කලා කෘති රැක ගත් බවකි. ශ්‍රී ලාංකේය සිතුවම් කලාවේ තාක්ෂණික පාර්ශ්වයේ දැකිය හැකි ගුණාත්මකභාවයත් සුවිශේෂී ලක්ෂණයත් මෙය ම වේ.

## මූලාශ්‍රය


අමරතුංග, වි. (1993). **ශ්‍රී ලංකාවේ චිත්‍ර හා මූර්ති**. වරකපොළ: ආරිය ප්‍රකාශකයෝ.

උල්ලුවිස්හේවා, පී. (1993). **උඩරට සිතුවම් මග.** කොළඹ: රජයේ මුද්‍රණාලය.

කුමාරස්සාමි, ඒ. කේ. (1962). **මධ්‍යකාලීන සිංහල කලා.** කොළඹ: සංස්කෘතික දෙපාර්තමෙන්තුව.

ගුණසේන, පී. (2006). **පැරණි ලක්දිව තාක්ෂණ වේදය සහ ශිල්ප ඥානය -1**. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

චාල්ස්, එස්. පී. (1986). **පාරම්පරික සිංහල බිතුසිතුවම්**. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

චාල්ස්, එස්. පී. (2001). **මහනුවර යුගයේ විහාර බිතුසිතුවමින් පෙපෙන වර්ණ තෙළිකූරු හා බදාම**. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

චාල්ස්, එස්. පී. සංස්: අබේවික්‍රම ටියුරින් චන්ද්‍රසෝම. (1986). **ලංකා පාරම්පරික චිත්‍ර ශිල්පී පරපුර.** කොළඹ: සංස්කෘතික අමාත්‍යාංශය.

තිලකසිරි, ජේ. (1994). **ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පී ගම් හා පාරම්පරික ශිල්පීන්ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක්**. නුගේගොඩ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.
ද සිල්වා, ආර්. එච්. (2013). **අතීතය සෙවීම හා කැණීම.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

පෙරේරා, එස්. එන්. (1995). **බෞද්ධ සිතුවම් කලාව හා සිත්තරු**. සංස්කෘතික ලිපි සංග්‍රහය.

සෙනෙවිරත්න, බී. ජේ. එන්. (2005). **ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ තීරයේ විහාර සිතුවම් කලාව**. (අමුද්‍රිත ශාස්ත්‍රපති පර්යේෂණ නිබන්ධය) කොළඹ: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

සෙනෙවිරුවන් .එම්. (1998). **හෙළ බදාම වරුණ**. මතුගම: ලිවේකා ප්‍රින්ටර්ස්.

සෝමතිලක, එම්. (2004). පුරාණ **ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සමාගම.

සෝමතිලක, එම්. (2002). **මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ සිතුවම් කලාව**. වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

Bandaranayake, S. (1986) ***The Rock and Wall Paintings of Sri Lanka***, Colombo: Lake House.

Seneviratne, B.J.N. (2018). ***Instrumental Analysis of the Plaster, Pigment and Preservative Coatings in Sri Lanka,*** Colombo: Department of Archaeology.

Turnour, G. (1837). ***Mahavanso, Vol.1,*** Colombo: cotta church Mission.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
DEPARTMENT OF ARCHAEOLOGY
SRI LANKA
ශ්‍රී ලංකා

# දියබැටේ කන්දෙන් හමුවන තබ්බෝව - මරදන්මඩුව ටෙරාකොටා සංස්කෘතික සාධක

**ජනක මහේෂ් අතපත්තු**[1]
**සනිදු දේවින්ද**[2]

මේ පර්යේෂණයට බඳුන් වූ වන්නි හත්පත්තුවේ පිහිටා ඇති දියබැටේ කන්ද ඓතිහාසික වශයෙන් යුග ගණනාවකට අයත් පුරාවිද්‍යාත්මක සාධක ලැබෙන ස්ථානයකි. වර්තමාන පිහිටීමට අනුව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රිකයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කට්ටඹුවාව ගමේ දියබැටේ කන්ද පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ ටෙරාකොටා ගැන අධ්‍යයනයේ දී 1921 දී තල්ගස් වැව දී හමුවූ ටෙරාකොටා පිළිබඳ ව හොකාට් මුලින් ම වාර්තා කර ඇත (Horkat1922 :23). මෙම ටෙරාකොටා සම්ප්‍රදාය ගැන වැඩිදුර අධ්‍යයනය කළ දැරණියගල ඊට තබ්බෝව මරදන්මඩුව සංස්කෘතිය ලෙස නම් කළේ ඒවා හමු වූ ප්‍රදේශ පදනම් කරගෙන වේ (Deraniyagala 1953). මෙම සංස්කෘතියට අයත් යැයි සැලකෙන ටෙරකොටා දිවයිනේ ස්ථාන ගණනාවකින් හමු වී ඇති අතර, එම ස්ථාන සියල්ල අයත් වන්නේ දිවයිනේ උතුරු වියළි කලාපයට වේ. මෙලෙස ශ්‍රී ලංකාවෙන් හමු වූ ටෙරාකොටා පිළිබඳ ව මූලික අධ්‍යයන ගණනාවක් පි.ඊ.පී දැරණියගල, ශිරාන් දැරණියගල, නන්දදේව විජේසේකර, අනුර මනතුංග, ප්‍රිශාන්ත ගුණවර්ධන යන අයවලුන් සිදු කර තිබේ (Coningham & Gunawardhana 2012:2). ඒ නිසා මෙම ටෙරාකොටා සංස්කෘතිය පිළිබඳ අර්ථකථන වගේ ම කාල නිර්ණය පිළිබඳ ව වන අදහස් ද ගණනාවක් ඉදිරිපත් වී තිබේ. දියබැටේ ශේෂ කන්දේ කළ ගවේෂණයේ දී හමුවූ ටෙරාකොටා හා මැටි බඳුන් කැබලි පිළිබඳ අධ්‍යයනය කිරීමට හා වාර්තා කිරීමට මෙම පර්යේෂණයෙන් මූලික ව ම බලාපොරොත්තු වේ.

මෙම පර්යේෂණය මූලික වශයෙන් පුස්තකාල ගවේෂණය හා ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද ඔස්සේ සිදු කරන ලදී. පුස්තකාල ගවේෂණය සිදු කරන ලද්දේ, ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම පිළිබඳ ව අදහසක් ගොඩනගා ගැනීමට හා මේ පිළිබඳ සිදුකළ පර්යේෂණ පිළිබඳ ව විමර්ශනය සිදු කිරීම සඳහා ය. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යොදා ගත්තේ එම කන්දෙන් හමුවන මැටි බඳුන් හා ටෙරාකොටා පිළිබඳ ව වන පුරාවිද්‍යාත්මක දත්ත එකතු කිරීම හා ඒ සමගාමී ව ලැබෙන අනෙකුත්

[1] *අභ්‍යාසලාභී පුහුණු උපාධිධාරී,*
*පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය,*
*jmathapaththu@gmail.com*

[2] *අභ්‍යාසලාභී පුහුණු උපාධිධාරී,*
*පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය,*

පුරාවිද්‍යාත්මක දත්ත එක්රැස් කිරීමට ය. මේ සඳහා අහඹු ගවේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. ඒ වගේ ම දියබැටේ කන්දෙ මානව ක්‍රියාකරාකම්වල වෙනත් ඓතිහාසික සාධක හඳුනා ගැනීම සඳහා කන්ද පදනම් කරගෙන නිර්මාණය කර ඇති පුරාවිද්‍යා ස්ථාන ද ක්ෂේත්‍ර ගවේෂණය සඳහා යොදා ගන්නා ලදී. ලබාගත් දත්ත අර්ථකථනය කිරීමේදී මිශ්‍ර ක්‍රමවේදය එනම් සංඛ්‍යාත්මක හා ගුණාත්මක ක්‍රමවේදය භාවිත කෙරිණ.

## ස්ථානීය ඓතිහාසික පසුබිම

ඓතිහාසික පසුබිම ගැන අධ්‍යයනය කිරීමේ දී එය ප්‍රාග් ඓතිහාසික අවධිය දක්වා දිව යන බව පෙනී යයි. දියබැටේ කන්දට යාබද ව හමුවන යාපහුව ශේෂ කන්දේ D13 ලෙනේ කළ කැණීමකින් හමුවූ අගුරු කොටස් කාබන් කාල නිර්ණයට අනුව මිට අවුරුදු 5000ක් පැරණි ය (පල්ලේතැන්න 2015:46). ඊට අමතර ව යාපහුව ශේෂ කන්දෙන් වගේ ම යාපහුවත් දියබැටේ කන්දත් අතර පවතින මොණරකන්දේ ස්ථාන තුනකිනුත්, යාපහුව කන්දට යාබද ව පවතින කයිකාවල ශේෂ කන්දෙනුත් තිරුවානාවලින් නිර්මිත ක්ෂුද්‍ර ශිලා මෙවලම් හා කහද ගල් කොටස් ද හමු වී තිබේ (දිසානායක 2011:4). ඒවායේ සාපේක්ෂ කාල නිර්ණයන්ට අනුව මෙසොලිතික අවධියට අයත් යයි නිගමනය කර ඇත (Deraniyagala 1992:433).

දියබැටේ කන්දෙනුත් ඒ අසල ම ඇති ගල් තලාවකිනුත් ක්ෂුද්‍ර ශිලා මෙවලම් හමුවෙන බව මධ්‍යම සංස්කෘතික අරමුදලේ යාපහුව ව්‍යාපෘතියෙන් කළ ගවේෂණයක දී ද සොයා ගෙන ඇත (පල්ලේතැන්න 2015:46). මේ පර්යේෂණයේ දී ද කන්ද මුදුනේ ඇති DRC1, DRC2, DRC3, DRC4 යන කටාරම් කොටා නැති ස්වාභාවික ලෙන් හතරක් හා ඒ අවට ප්‍රදේශය ගවේෂණය කළේ ය. එහි දී ශිලා මෙවලම් කීපයක් හා අපද්‍රව්‍ය කැබලි ගණනාවක් ලෙන් ඇතුලේ පස් අතර තිබී සොයා ගැනීමට හැකි විය. ලෙන් ආසන්නයේ ම ලෙන්වලට නැගෙනහිරින් DRQ1 යනුවෙන් දක්වා ඇති තැනිතලා ප්‍රදේශයක ක්වාට්ස් කැබලි විසිරුමක් මීටර් 500*300 ක වැනි කොටසක දැකිය හැකි ය. ඒ අධ්‍යයන කිරීමේ දී ද ශිලා මෙවලම් කීපයක් සොයා ගැනීමට හැකි විය. අනෙකුත් ශිලා මෙවලම් නිර්මාණයේ දී ඉවත ගිය කොටස් වේ. මෙහි ඇති ස්වාභාවික ලෙන්වල පවුල් කීපයකට කාලගුණික තත්ත්වයන්ගෙන් ඇතිවන බාධාවකින් තොර ව ජීවත් විය හැකි ය. වැස්සත් සමග ම නිර්මාණය වන ජල පහරක් වගේ ම කුඩා ප්‍රමාණයේ ස්වාභාවික පොකුණු දෙකකුත් ලෙන් ආසන්නයේ නිර්මාණය වී තිබේ. ඒ වගේ ම දැනට කන්ද පහළ විහාරස්ථානයේ ඇති කුඩා වැව ස්වාභාවික ව නිර්මාණය වූ එකක් බව පෙනේ. ඒ කන්දෙන් එන ජල පහර කුඩා පර්වත තලාවක හරස්වීම නිසා එකතු වූ ස්වාභාවික පතහකි. පසුකාලින ව එයට කුඩා ප්‍රමාණයේ වැව් බැම්මක් යොදා සංවිධිත නිර්මාණයක් බවට පත් කර ඇත. මානව ජනාවාසකරණයට යෝග්‍ය ස්වාභාවික හේතු මත ද නිගමනය කළ හැකි වන්නේ, දියබැටේ කන්දේ මානව ක්‍රියාකාරකම්වල ඓතිහාසිකත්වය ප්‍රාග් ඓතිහාසික අවධිය තෙක් දිව යන බවයි.

දියබැටේ කන්ද පසුබිම් කරගත් ඓතිහාසිකත්වයේ දෙවන අවස්ථාව වන්නේ මුල් ඓතිහාසික යුගයයි. දියබැටේ කන්ද පහළ ඇති කුඩා ගල් පර්වත කීපයක් පසුබිම් කරගෙන කටාරම් කෙටූ ලෙන් 11ක් රැගත් විහාර සංකීර්ණයක් පිහිටා ඇත. එහි ගල් ලෙන් හතක ලෙන් පූජා කිරීමට අදාළ ශිලාලේඛන දැකගත හැකි වේ (Paranavithana 1970:99). දාරක තිස, අමර යනුවෙන් හඳුන්වන පරුමකයන්ගේ ලෙන් පූජා කිරීම් ගැනත්, බ්‍රාහ්මණ මෙග්ගලිගේ පුත් පරුමුක මජ්ජිම යන අයෙකුගේ ලෙන් පූජා කිරීමක් ගැනත් මෙම ලෙන් ලිපිවල සඳහන් වේ (ධීරානන්ද 2004:154). මේවා ක්‍රි.පූ. 3 - ක්‍රි.ව. 3 අතර කාලයට අයත් වේ. මේ ස්ථානයේ ඇති ශිලාලේඛනවලින් දෙකක් හැර අනික් සියල්ල පූර්වබ්‍රාහ්මී ශිලාලේඛන වේ. අනික් ලිපිවලින් එකක්, පුස්ස නම් හිමිනමකගේ උපෝසථාගාර පූජාවක් ගැන සඳහන් ලෙන් ලිපියකි. අනික විහාරස්ථානයේ ඇති කුඩා වැවේ ඇති ගල්තලාවේ ලියා ඇති ගිරි ලිපියකි. එය නක නම් මහරජ කෙනෙක් තිනකන නම් විහාරස්ථානයට කළ පුනොකොදක නම් වැව පරිත්‍යාග කිරීම ගැන සඳහන් වන්නකි (කුරුණෑගල 2008:352). මෙහි සඳහන් රජු අනුරාධපුරයේ රාජ්‍යත්වයට පත් ව සිටි මහල්ලක නාග (ක්‍රි.ව. 136-143) රජු බවට විශ්වාස කරයි (මහාවංශය 2012:152) මේ අවධිය වන විට දියබැටේ කන්ද අයත් මේ ප්‍රදේශය ජනාකීර්ණ ව පවැති බවට සිතිය හැකි ය.

මධ්‍යකාලීන යුගයේ දී පැවතී ශ්‍රී ලංකාවේ සිව්වන රාජධානිය වූ යාපහුව පිහිටා ඇත්තේ දියබැටේ කන්දට අභිමුඛ ව කිලෝමීටර් පහක දුරකිනි. ඒ නිසා මධ්‍යකාලීන අවධිය වන විටත් දියබැටේ කන්ද අයත් භූමිය ජනාවාස ව නොපැවති බව සිතිය නොහැකි ය (දිසානායක 2011). පුරාවිද්‍යාත්මක සාධක අනුව මහනුවර අවධිය වන විටත් දියබැටේ විහාරය නැවත ප්‍රතිනිර්මාණය වී තිබේ. එහි දී කුඩා ලෙන් විහාර ගෙවල් දෙකක් ඒ යුගයේ නිර්මාණය වී තිබේ. ඉන් එකක් සම්පූර්ණයෙන් වැඩ නිම කර ඇති අතර, එහි මහනුවර අවධියේ කලා ලක්ෂණ රැගත් මකර තොරණක්, සැතපෙන පිළිමයක්, දේව පිළිම දෙකක් දැකගත හැකි ය. වැඩ නිම නොකළ මැටි බිත්ති සහිත ලෙන් විහාරයක් ද මෙහි තිබේ. ඒ තුළ මැටියෙන් තනා ඇති සායම් ගා නොමැති සමාධි පිළිම දෙකක්, හිටි බුදු පිළිමයක් හා දේව පිළිම දෙකක් දැකගත හැකි වේ. ඒවායේ ඇති කලා ලක්ෂණ අනුව මෙම වැඩ නිම නොකළ විහාර ගෙය ද මහනුවර යුගයට ම අයත් යැයි නිගමනය කළ හැකි ය.

දියබැටේ කන්ද වටා නිර්මාණය වී ඇති වර්තමාන කට්ටඹුවාව ගම නිර්මාණය වී ඇත්තේ ඉංග්‍රීසි අවධියේ අවසාන කාලයේ දී ය (ධර්මපාල 2011). කන්දෙන් එන ජලධාරා මුල් කරගෙන කන්ද වටා කුඩා ගම් වැව් තුනක් සාදා එය පදනම් කරගෙන වත්මන් මානව ජනාවාසකරණය ගොඩනැගී තිබේ. මේ අනුව දියබැටේ ශේෂ කන්ද පදනම් කරගෙන අඛණ්ඩ මානව ඉතිහාසයක් ගොඩනගා ගත හැකි ය. ඒ වගේ ම දියබැටේ කන්ද පදනම් කරගෙන මානව ක්‍රියාකාරකම් ගණනාවක් සිදු වී තිබෙන බව ද පැහැදිලි වේ.

**තබ්බෝව මරදන්මඩුව සංස්කෘතිය**


ආදිතම අවධියේ සිට මිනිසා මැටි පිළිම නිර්මාණය කරයි. ආගමික සංස්කෘතිය සඳහා මෙය වැඩියෙන් ම යොදාගෙන ඇත. සංවිධිත ආගම නිර්මාණය වන්නට පෙර අවධියේ දී ප්‍රාථමික

අභිචාර විධිවලට මැටි පිළිම බොහොමයක් යොදාගෙන ඇත (Godakumbura 1982:5). මුලින් අතින් නිර්මාණය කරගත් අව්වේ වේලා ගත් මැටි රූප භාවිත කර ඇත. පසුකාලීන ව මැටි බඳුන් සේ ම මැටි රූප ද පුළුස්සා නිර්මාණය කර ගෙන තිබේ. මෙලෙස සෙල්සියස් අංශක 800ක උෂ්ණත්වයකින් නිර්මාණය කරන මැටි පිළිම ටෙරාකොටා යන නමින් හඳුන්වනු ලබයි (Nishanthi 2016:232).

මැටි රූප ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලින් හමු වී තිබේ. විශේෂයෙන් ම උතුරු වියළි කලාපයට අයත් ස්ථාන ගණනාවකින් ටෙරාකොටා පිළිම ලැබී තිබේ. මඩුව, ඉලුක්වැව, මනාවැව, පොලොන්නරුව, අනුරාධපුර, සිගිරිය, තල්ගස්වැව, රාජාංගණය, පාදෙණිය, පඬුවස්නුවර, අම්පාර, තබ්බෝව, මිහින්තලේ හා මරදන්මඩුව යන ස්ථාන ඉන් ප්‍රධාන වේ. ඒ අනුව මෙහි ව්‍යාප්තිය, උතුරු මැද පළාත, වයඹ පළාත හා නැගෙනහිර පළාතට සීමා වී තිබෙන අයුරු දැක ගත හැකි ය. මේ ප්‍රදේශවල දැකිය හැකි අනෙක් පොදු සාධකය නම් එක සමාන භූගෝලීය පසුබිමක් පැවතීමයි. එනම් වියළි කාලගුණය, කෘෂි ආර්ථිකය, රතු දුඹුරු පාංශු කලාපය වැනි සාධකයි. ඒ වගේම මේ ටෙරාකොට හමුවීමේ දී බහුතරයක් හමු වී ඇත්තේ ග්‍රාමීය වැව් හෝ කෘෂිකාර්මික කුඹුරු පසු බිම් කරගෙන ය (Nishanthi 2016:232).


මේ ආකාරයේ ටෙරාකොටා පිළිම ගැන මුලින් ම වාර්තා කරන්නේ 1921 දී හොකාට් ය. ඒ පුත්තලම් දිස්ත්‍රිකයේ තල්ගස්වැව නම් ප්‍රදේශයේ දී හමුවන ටෙරකොටා කීපයක් පිළිබඳව ය (Horkat 1922:23) පසුකාලීන ව තබ්බෝවෙන් හමු වූ ටෙරාකොටා පිළිම ගැන දැරණියගල වාර්තා කර තිබේ (Deraniyagala 1953:133-134). මේ ටෙරාකොටා පිළිම අතර අලියන්ගේ පිළිම කීපයක් ද තිබී ඇත. මීට සමාන ලක්ෂණ ඇති ටෙරාකොටා පිළිම මරදන්මඩුවෙන් ද ලැබුණු නිසා මෙය තබ්බෝව මරදන්මඩුව සංස්කෘතිය ලෙස හඳුන්වයි. කාන්තා රූප, පුරුෂ රූප, සත්ත්ව රූප, ලිංග සංකේත වැනි මැටි රූප මෙම සංස්කෘතියට අයත් ස්ථානවලින් ලැබී තිබේ (Coningham, Gunawardhana 2012:2). විශේෂයෙන් ම තබ්බෝව මරදන්මඩුව සංස්කෘතියට අයත් ටෙරාකොටා පිළිම අතර අලියන්ගේ රූප බොහොමයක් හමු වී ඇත (Nishanthi 2016:232). මෙම ටෙරාකොටා සංස්කෘතික කලාව පිළිබඳ ඓතිහාසික මූලාශ්‍රයවල කිසිදු සඳහනක් දක්නට නොමැති වේ. එමෙන් ම ඒවායේ කලාත්මක ලක්ෂණ අනෙකුත් සම්භාව්‍ය ප්‍රතිමාවල කලා ලක්ෂණවලට වඩා ප්‍රාථමික වේ. මේ නිසා මෙය ග්‍රාමීය ජන කලාවක් ලෙස වර්ධනය වූවක් බව වගේ ම කිසියම් ආගමික අභිචාරාත්මක අරමුණක් උදෙසා යොදා ගන්නට ඇතැයි ද විශ්වාස කරයි (Gunawardhana, Coningham 2007:76).

## දියබැටේ කන්දෙන් හමුවන ටෙරාකොටා රූප




**දියබැටේ කන්ද ආශ්‍රිත සිතියම**

මෙම ටෙරාකොටා හා මැටි බඳුන් කැබලි දියබැටේ කඳු මුදුනේ පිහිටි ලෙන් ආශ්‍රිත ව වේ. පහළ පිහිටි දියබැටේ විහාරස්ථානයට ඉහළින් පිහිටි කඳු මුදුනේ මෙම ලෙන් හතර පිහිටා ඇත. DRC1, DRC2, DRC3, DRC4 යනු ගවේෂණයේ දී ලබා දුන් නාමකරණයෙන් හඳුන්වන ලෙන් කීපයයි. එම ලෙන් කටාරම් කොටා නැති ස්වාභාවික නිර්මාණය වූ ලෙන් වේ. ලෙන්වල මුහුණත බස්නාහිර දිසාවට




***DRC1 ලෙන***




***DRC2ලෙන***

යොමු වී තිබේ. ඒ වගේ ම කීප දෙනෙකුට පහසුවෙන් නොතෙමී සිටිය හැකි ප්‍රමාණයේ වූ ඒවා ය. ඉන් වඩාත් ම වැදගත් වන්නේ DRC1 ලෙනයි. මෙහි DRC1 යනුවෙන් හඳුන්වන මුල් ම ලෙන ආශ්‍රිත ව බහුල ව මැටි බඳුන් කැබලි හමුවේ. ඊට සාපේක්ෂ ව අනෙක් ලෙන්වලින් මැටි බඳුන් මතු පිට පොළොවේ දැකගත නොහැකි ය. සිදු කළ ගවේෂණයේ දී DRC1 ගුහාවේ ජල පහරක් නිසා සේදී ගිය ස්ථානයක තිබී මෙම ටෙරාකොටා රූප සොයාගන්නා ලදී. මෙම ගුහාවේ මතුපිට පස් තට්ටුව යට මැටි බඳුන් කැබලි හා ටෙරාකොටා කොටස් බොහෝ ප්‍රමාණයක් තිබිය හැකි බව එම සෝදා ගිය ස්ථානය අධ්‍යයනය කිරීමෙන් නිගමනය කළ හැකි ය.

මානව රූපී ටෙරාකොටා දෙකක් ද, ලිංග සංකේත යයි සිතිය හැකි ටෙරාකොට දෙකක් ද, හඳුනා ගත නොහැකි ලෙස කැඩී ගිය ටෙරාකොට රූප කොටස් කීපයක් ද මේ සන්දර්භයෙන් හමු වේ. එහි ද සිලින්ඩරාකාරව නිර්මාණය කර ඇති DRC/TF/001, DRC/TF/002 ටෙරාකොටා නිර්මාණ යුගල, අතින් නිර්මාණය කළ ඒවා වේ. ඒවා නිර්මාණය කිරීමේ දී සලකුණු වූ ඇඟිලි සලකුණු පැහැදිලි ව හඳුනාගත හැකි ය. ඉන් DRC/TF/001 ටෙරාකොටා රූපය උස සෙ.මී. 9.5 අතර වට ප්‍රමාණය සෙ.මී. 7.8 වේ. ඒ වගේ ම වට ප්‍රමාණය අනෙකට සාපේක්ෂ ව තරමක් සිහින් ව නිර්මාණය කර ඇති අතර මුදුන කවාකාර ව දෙපසට වන සේ නිර්මාණය කර ඇත. ඒ වගේ ම එහි මුල සිටු විය හැකි වන සේ නිර්මාණය කර තිබේ.




***DRC/TF/001 හා DRC/TF/002***
***වමේ සිට දකුණට***

DRC/TF/002 ටෙරාකොටා රූපය අනෙකට සාපේක්ෂ ව මිටි නිර්මාණයකි. මෙහි උස 7 සෙ.මී. වන අතර වට ප්‍රමාණය 8.5 සෙ.මී. වේ. මෙය ද සිලින්ඩාකාර නිර්මාණයක් වන අතර අතින් නිර්මාණය කළ සලකුණු පැහැදිලි ව දැකගත හැකි ය. එහි මුල මහත වන අතර, ඉහළට යන විට තරමක් සිහින් වී ඇත. මෙම නිර්මාණ දෙක නිර්මාණය කිරීමට ගත් මැටි, වැලි මිශ්‍ර රළු එකක් බව නිරීක්ෂණ පෙනී යයි. ඒ වගේ ම මේවා අතින් නිර්මාණය කර පිළිස්සූ ඒවා ය. මේවායේ වෙනත් කිසිදු සංකේතයක් හෝ රූපයක් ඇතුළත් කර ද නැත. ඒ නිසා මෙම නිර්මාණ පුරුෂ ලිංග සංකේත ලෙස නිගමය කළ හැකි ය (Godakumbura 1982:7). මේ ආකාරයේ ලිංග සංකේත රැසක් ටෙරාකොටා නිර්මාණ ලෙස ස්ථාන ගණනාවකින් ලැබෙන බව චාල්ස් ගොඩකුඹුර වාර්තා කර ඇත (1982:7). ඔහුගේ මතය නම් මැටි රූපවලින් පැරණි යයි කිව හැකි මැටි රූප ලෙස පුර්ෂ ලිංග සංකේත හැඳින්විය හැකි බවයි (1982:7).

මෙයින් හමුවන අනෙක් ටෙරාකොටා රූපය නම් මිනිස් රූපයකි. එය නිර්මාණය කර ඇත්තේ මැටි බඳුනක රිම් එක වටේට ය. එම මැටි බඳුනේ රීම් එකට යටින් ඉරි දෙකක හා තිත් පේළියක රටාවක් ඇති අතර, ඊට පහළින් ටෙරාකොටා රූප නිර්මාණය කර තිබේ. එම රූප මුලින් මැටියෙන් නිර්මාණය කර මැටි බඳුනේ අලවා ඇත. පසු ව මැටි රූපත් සමඟ ම බඳුන පුළුස්සා ඇති බව සිතිය හැකි ය. මැටි රූප අතින් නිර්මාණය කර තිබේ. රූපයේ දැනට දැකගත හැක්කේ අත් දෙකෙන් උඩ කොටසයි.




**DRC1/TF/003**



DRC1/TF/003
SCALE - 1:1
DRAWN BY - Athapththu




**DRC1/TF/004**



DRC1/TF/004
SCALE - 1:1
DRAWN BY - Athapththu

රූපය අත් දෙක දෙපසට වන සේ නිර්මාණය කරගෙන තිබෙන ආකාරයෙන් නිරූපිත ය. එහි අතේ ඇඟිලි පවා ඉරි ඇඳ නිර්මාණය කර තිබේ. ඉන් එක අතක ඇඟිලි හතරක් වන සේ ඇඳ ඇති අතර අනෙක් අතේ ඇත්තේ ඉරි තුනකි. ඒ වගේ ම අත් දෙක ම කෙළවරේ කුඩා වළල්ලක් ද නිර්මාණය කර ඇත. හිස සහ කඳ එක ම මැටි ගුලියකින් නිර්මාණය කරන්නට ඇත. අත් දෙක ම වෙන වෙන ම නිර්මාණය කර අළවා තිබෙන බව පෙනේ. හිස නිර්මාණය කිරීමේ දී ඇස්, කට, නහය පැහැදිලි ව ම පෙනෙන අයුරින් නිර්මාණය කර ඇත. එහි ඇස් කුඩා මැටි බෝල දෙකකින් නිර්මාණය කර තිබේ. නහය, මූණ උල් කිරීම මගින් නිරූපණය කර ඇත. තව ද ඊට පහළින් පැහැදිලි ව දැකගත හැකි වන සේ මුඛය නිර්මාණය කර තිබේ. ඒ වගේ ම මේ මැටි රූපත් සමඟ ම සම්පූර්ණ මැටි

බඳුන ම කළු පැහැයෙන් ආලේප කර ඇත. මැටි බඳුන් කොටසේ දකුණු පස තවත් මැටි රූපෙක අතක කොටසක් දැකිය හැකි ය. ඒ වගේ ම DRC/TF/004 මැටි රූපයේ ලක්ෂණ ද මේ ලක්ෂණ ම වේ. එහි අත් දෙකෙන් පහළට තවත් කොටසක් ඉතුරු වී තිබේ. මෙහි ද අතේ ඇඟිලි හතරක් හා වළල්ලක් පැහැදිලි ව නිර්මාණය කර ඇත. මේ ලක්ෂණ අනුව මේ මැටි රූපය ඉහත මැටි බඳුනෙන් කැඩී ගිය කොටසක් බවට සිතිය හැකි වේ. මේ ඉරියව්වට සමාන ව ඇති ඉරියව්වකින් යුතු ව නිර්මාණය කළ ටෙරාකොටා කොටසක් අනුරාධපුර නිකවැව ප්‍රදේශයෙන් ද ලැබී ඇත. එම මැටි බඳුන වටේට ම මිනිස් හැඩැති මැටි රූප මේ ආකාරයෙන් තියෙන්නට ඇත. මීට සමාන කාන්තා මැටි රූප සමූහයක් අත් ඉහළට ඔසවාගෙන සිටින අයුරින් නිරූපිත සම්පූර්ණ මැටි බඳුනක් කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශය හා එංගලන්තයේ ඩර්ම විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශය එකාබද්ධ ව සිදු කළ ඉහළ මල්වතු ඔය නිම්න ව්‍යාපෘති ගවේෂණයෙන් ලැබී තිබේ.

පැහැදිලි ව හඳුනා ගත හැකි ටෙරාකොටා කොටස් ඉහත සඳහන් ඒවා වන අතර, මීට අමතර ව හඳුනාගත නොහැකි ටෙරාකොටා කීපයක් හමු විය. ඉන් එකක් අර්ධ කවාකාර වේ. අර්ධ කවාකාර කොටස් දෙකක් එකක් මත එකක් තබා මෙය නිර්මාණය කර ඇත. ඊට අමතර අතින් නිර්මාණය කළ කේතුකාකාර කොටස් කීපයක් හමු වේ. මේවා මැද කුඩා කුහර සාදා ඇත. ඒ වගේ ම අලි රූපවලට අයත් යැයි සැක කළ හැකි ටෙරාකොටා කොටස් දෙකක් ද හමු වේ.

## මැටි බඳුන් කොටස්

DRC1 ලෙනෙන් ම මැටි බඳුන් කොටස් ගණනාවක් ද හමු වේ. ඒවා හමුවන්නේ ද ලෙනේ වතුර පාරත් සමඟ සෝදා ගිය ස්තර කොටසින් ම වේ. එහි කාල රක්ත මැටි බඳුන් කොටස් කීපයක් ද, රතු වර්ණ ආලේප මැටි බඳුන් කැබලි කීපයක් ද, කුඩා ඉරිවලින් සැරසිලි කරන ලද මැටි බඳුන් කොටසක් ද හමු විය. එයින් දත්ත ලබා ගැනීමට සුදුසු තත්ත්වයේ රිම් කොටස් හමු නොවන අතර, මතු පිට ගවේෂණයේ දී හමු වූයේ කුඩා මැටි බඳුන් කොටස් පමණකි. මින් හමුවන සමහර මැටි බඳුන් කොටස්වල සිමෙන්ති වැනි ද්‍රාවණයක් ගල්වා තිබෙනවා දැකගත හැකි ය. උඩවලව අඹෙතොටින් හමු වූ ඇති ටෙරාකොටා රූපයක සිමෙන්ති වැනි ද්‍රාවණයක් ගල්වා තිබූ බව වාර්තා වේ. (Godakumbura1982:12). පහත දැක්වෙන්නේ එහි හමුවන මැටි බඳුන් ගණත්වය ගැන අවබෝධයක් ලබා ගැනීම සඳහා සකස් කළ සංඛ්‍යාත්මක විග්‍රහයකි.

**1. වගු සටහන :**

| *Parts of pottery* | *Type* | *painted* | *non painted* | *total* |
|---|---|---|---|---|
| Rim | R | 5 | 20 | 25 |
| Body shape | R | No | NO | 13 |
| sherd | BR | NO | 9 | 9 |
| | | | | |
| | | *painted* | *non painted* | *total* |
| Parts of terracotta figure | | 1 | 6 | 7 |

## නිගමනය

තබ්බෝව මරදන්මඩුව සංස්කෘතිය ගැන ඇති අර්ථකථන අනුව එම ටෙරාකොටා රූප කිසියම් අභිචාරාත්මක කාරණාවකට භාවිත කරන්නට ඇතැයි විශ්වාස කරයි. හොකාර්ට්ගේ විශ්වාසය වූයේ මෙය ශිව වන්දනයත් සමග නිර්මාණය වූවක් බවයි (Horkat 1922:23). මීට එකඟ ව මේවා ප්‍රාග් බෞද්ධ අවධියේ ආගමික ලක්ෂණයන්ගේ ශේෂයන් වූ බවට මතයක් ඉදිරිපත් කර ඇත (Deraniyagala 1953:133). බෞද්ධ ආගමික ලක්ෂණ රැගත් කිසිවක් හමුනොවන ජන ආගමික හා කලා ලක්ෂණයක් රැගත් ප්‍රථමික අභිචාරාත්මක අංගයක් වශයෙන් මෙම ටෙරාකොටා ගැන ඇති මූලික අදහසයි (Coningham, Gunawardhana 2012:12). මහනුවර යුගයේ දී මැටි රූප භාවිත කරමින් සිදු කරන ග්‍රාමීය අභිචාරාත්මක අංගයක් ගැන රොබට් නොක්ස් ද වාර්තා කර ඇත (Knox 2000:153). මෙවැනි ම අභිචාරාත්මක කාර්යයක් වූ ගම්මඩු ශාන්තිකර්මයේ දී මැටි රූ නිර්මාණය කිරීම පමණක් නොව ශාන්තිකර්මයේ අවස්ථාවක් ලෙස ඒවා කඩා බිඳ දැමීමත් සිදු කර ඇත (Coningham,Gunawardhana 2012:12). බොහෝ ටෙරාකොටා හමුවන විට කැඩී බිඳී ඇත්තේ මෙවැනි සිදුවීමක් නිසා බව අර්ථකථනය කරයි.

දියබැටේ කන්දෙන් හමුවන ටෙරාකොටා රූප කිසියම් ආගමික කාරණාවක් සඳහා භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි ය. දියබැටේ කන්ද උඩ පිහිටි මෙම ස්වාභාවික ලෙන් ස්ථිර වාසස්ථානයක් බවට ඓතිහාසික යුගයේ දී පත් කරගන්නට හැකි ද යන්න සැක සහිත කාරණාවකි. එම නිසා මෙම ලෙන් භාවිත කරන්නට ඇත්තේ තාවකාලික මානව ක්‍රියාකාරකම්වලට ය. එසේ ම එම ටෙරාකොටා හා මැටි බඳුන් කැබලි හමුවන්නේ DR1 ගුහාව තුළින් පමණක් වීම ද මීට හේතු වේ. එසේ ම ලිංග සංකේත බොහෝ විට භාවිත කර ඇත්තේ අභිචාරාත්මක ක්‍රියාවලට නිසා මෙයත් අභිචාරාත්මක ක්‍රියාවක අවශේෂ බව සිතිය හැකි ය.

තබ්බෝව මරදන්මඩුව සංස්කෘතියේ කාල නිර්ණයන් ගැන ද විවිධ අදහස් පළ වී තබේ. දැරණියගලගේ අදහස මේවා ක්‍රි.ව. දෙවන සියවසට අයත් බවයි. දියබැටේ ක්‍රි.ව.2 වන විටත් මානව ජනාවාස හොඳින් පැවතී බව වැව එම අවධියේ පූජා කළ එකක් නිසා ම පැහැදිලි වේ. නමුත් ටෙරාකොටා වියළි කලාපිය පුරාණ වැව් ආශ්‍රිත ව හමුවීමත් එතරම් ගැඹුරට වැළලී නොතිබීමත් නිසා මේවා පශ්චාත් පොලොන්නරු යුගයට අයත් බව එච්. ජයතිලකගේ අදහස වේ. ඊට එකඟ වෙමින් මේ සංස්කෘතිය පොලොන්නරු යුගයෙන් පසු හුදකලා ග්‍රාමීය සමාජ මුල් කරගෙන නිර්මාණය වූ අභිචාරාත්මක අංගයක් බව විජේසේකරගේ අදහසයි (Nandadeva 1990:221). මෙම ටෙරාකොටා පිළිබඳ ව වන කාල නිර්ණය සම්බන්ධ වන අනෙක් පිළිගැනීම ක්‍රි.ව. 7-11 අතර කාලයකට අයත් වන්නට ඇති බවයි.

කෙසේ නමුත් මෙම ටෙරාකොටා තබ්බෝව මරදන්මඩුව සංස්කෘතියට ම අයත් බවට මෙම ටෙරාකොටා ඒ පිළිබඳ ව සාධක ලැබෙන අනිකුත් ස්ථානවල දත්ත සමග සාපේක්ෂ ව අධ්‍යයනය කිරීම මගින් නිගමනය කළ හැකි ය. ඒ මෙහි රූපවලට සමාන ලක්ෂණ රැගත් මැටි රූප තබ්බෝව

මරදන්මඩුව සංස්කෘතියට අයත් ටෙරාකොටා ලැබෙන වෙනත් ස්ථානවලින් හමුවන නිසාවෙනි. ඒ වගේ ම ඒ සංස්කෘතියට අයත් අනෙකුත් සාධක ලැබෙන ස්ථාන සියල්ල ම පාහේ වැව් ආශ්‍රිත ව හෝ වෙල් වැනි කෘෂි භූමිවල වේ. මේ ස්ථානය වනස් වන්නේ මීටර් 250ක් පමණ උස කඳු මුදුනක ලෙනකින් මේවා ලැබීමයි. නමුත් මේ ලෙන්වලට පහළින් කන්දෙන් එන වතුර පාර හරස් කර ගල්පොත්තක් සීමා වන ලෙස වැකන්දක් බැඳ වැවක් නිර්මාණය කර තිබෙනවා දැකගත හැකි ය. එම වැවේ ඇති ගිරි ලිපියෙන් එය මහල්ලක නාග රජු විහාරයට පූජා කළ එකකි (කුරුණෑගල 2008: 352). ඒ නිසා මෙම වැව ක්‍රි.ව. දෙවන සියවසේ සිට ම පැවති වැවක් වේ. අද වන විට රොන් මඩ නිසා වැව ගොඩ වී පැවතිය ද ඒ අවධිය වන විට කන්ද අසලට ම මෙම වැව ව්‍යාප්ත තිබූ බවට සාධක ලැබේ. ඒ වගේ ම අද ද මේ වැවෙන් පෝෂණය වන වෙල් යායක් පවතින නිසා ඓතිහාසික යුගයේ පටන් මේ ප්‍රදේශයේ ජනයා භාවිත කළ ප්‍රධාන ජල පෝෂණ අවශ්‍යතාවක් ලෙස මෙය පවතින්නට ඇත. ඒ අනුව තබ්බෝව මරදන්මඩුව සංස්කෘතියට අයත් සාධක හමුවන දිවයිනේ අනික් ස්ථානවලට සමාන භූගෝලීය ලක්ෂණ මෙම ස්ථානයේ ද දැකගත හැකි ය. මේ නිසා මෙම ටෙරාකොටා එම සංස්කෘතියට ම අයිති බව විශ්වාස කළ හැකි වේ. එහෙත් මෙහි සිදු කළ මතුපිට ගවේෂණය මගින් මේ ලැබුණු දත්ත ඒ පිළිබඳ ව නිවැරදි ම නිගමයකට එන්න ප්‍රමාණවත් නොවන නිසා පුළුල් වශයෙන් මේ ස්ථානය අධ්‍යයනය කිරීම කළ යුතු වේ.

### මූලාශ්‍රය


අතපත්තු,ජනක. (2019). **වන්නි හත්පත්තුවේ අභිචාර විශ්වාස හා ජන ඇදහිලි**, මරදානː ගොඩගේ ප්‍රකාශකයෝ.

(2008). **කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහ**, වයඹ පළාත් සභාව, කුරුණෑගලːඅස්ලිය ප්‍රින්ටස්.

දිසානායක, සෙනරත්. (2011). **අසිරිමත් යාපහුව**, කතෘ ප්‍රකාශන

ධීරානන්ද, හගුරන්කෙත. (2004). **රාජ්‍ය රාජ්‍යත්වය හා ආගම**. වරකාපොළː සූරිය ප්‍රකාශකයෝ

(2011). **මහාවංශය.** දෙහිවලː නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
(2001). **යාපහුව**. කොළඹː පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

Coningham,R, Gunawardana,P,Simposon,I,Strickland. (2012) K.M, *Contextualising the Tabbova-Maradanmaduva Culture Excavations at Nikawewa, Tirappane* . Anuradhapura District: Sri Lanka., South Asian Studies

Deraniyagala, P.E.P. (1953). Ferro-Lithic or Early Historic Terracotta Statuary and a Cist from Ceylon', *Spolia Zeylanica*.27.1 Ceylone: The National Museums

Deraniyagala, P.E.P. , (1960) 'The MaradanmaduvaTabbova Culture of Ceylon', *Spolia Zeylanica***.** 29.1, Ceylone: The National Museums.

Deraniyagala, P.E.P. (1961) 'Some New Records of the Tabbova-Maranmaduva Culture of Ceylon', Spolia Zeylanica. Ceylone :The National Museums.

Deraniyagala ,S.U. (1992). *Pre History Of Sri Lanka***.** Colombo: Department Of Archaeology.

Godakumburu,C. (1965). *Terracotta heads*. Colombo: Archaeology Department.

Gunawardhana,P,Coningham,R,Adhikari,G,Katugampola,Mangala,Namalgamuwa,H,Saladin,M,Simpson. (2007). Do Terracotta Figuring Suggest a Burial Pattern, *Annual Resarch Symposium*. Dalugama: Faculty of Graduate Studies, University of Kelaniya.

Hocart.A.M. *Archaeological Survey of Ceylon Annual Report (ASCAR*). Colombo : Department of Archaeology,. 1922-23

https://www.researchgate.net/publication/254359480

Knox, Robert. (2000). *An Historical Relation of the Island Ceylon.* Colombo: M.D. Gunasena.

Manatunga,A, (1990). 'The'Maradanmaduva-Tabbova' Culture terracottas found at Manavava in the vicinity of Inamaluva', *in The Settlement Archaeology of the Sigiriya Dambulla Region.* Colombo: PGIAR.

Nandadeva,B.D. (1990). 'A catalogue of some selected terracotta objects from Manavava', *in The Settlement Archaeology of the Sigiriya-Dambulla Region.* Colombo: PGIAR, ,

# පැරණි වාරි නිර්මාණ ආශ්‍රිත පාෂාණවල දක්නට ලැබෙන සංකේත මඟින් හෙළිවන සමාජ පුරාවිද්‍යාත්මක පසුබිම

පුරාවිද්‍යාඥ මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි[1]

## හැඳින්වීම

පැරණි වාරි නිර්මාණ ආශ්‍රිත ව සිදුකරනු ලැබූ ගවේෂණ කටයුතුවල දී ඉදිකිරීම් සඳහා යොදාගෙන තිබූ පාෂාණ කුට්ටි මත හා පුවරු මත සටහන් කරන ලද විවිධ සංකේත රාශියක් හඳුනාගැනීමට අවකාශ සැලසිණ. එම සංකේත සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන කරුණක් වූයේ බොහොමයක් සංකේත පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛන සමහරක දක්නට ලැබෙන ඇතැම් සංකේතවලට සමාන වන බවයි. මෙවැනි සංකේත වාරි නිර්මාණවල දී භාවිත කිරීමෙන් එම ඉදිකිරීම් සම්බන්ධයෙන් කිසියම් වූ ඓතිහාසික පුවතක් සැඟවී තිබෙන බව සිතිය හැකි ය. එම සංකේත පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලංකාවේ විවිධ තාක්ෂණික සංස්කෘතික අවධි (Techno Culture) තුළ එම සංස්කෘතීන්ට අදාළ ව ජීවත් වූ ජන පිරිස් විසින් භාවිත කරන ලද සංකේතවලට සමාන සංකේත රාශියක් පවතින බව පැහැදිලි වන අතර මෙකී සංකේත සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමෙන් තත්කාලීන ජන සමාජ අතර පැවති අඛණ්ඩ සම්බන්ධතාව මෙන් ම නිර්මාණකරණයේ දී දායක වූ තාක්ෂණික ජන කණ්ඩායම් හඳුනාගැනීමට අවස්ථාව හිමිවේ. මීට අමතර ව තාක්ෂණය භාවිතයේ සමාජ පසුබිම පිළිබඳ ව ද අධ්‍යයනය කිරීමට අවකාශ සැලසේ. මෙම පත්‍රිකාව මගින් මෙම සංකේත සම්බන්ධයෙන් අවධානය යොමුකරනු ලැබේ.

## විමර්ශනය

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන පැවැති බවට ප්‍රබල වශයෙන් සාධක පවතින ආඬියාගල, බිල්ලෑව, බුදුගල, දොරවක, ගමකන්දේ ගල්ගෙය, ගොනාගොල්ල, මණ්ඩාගල්ගේ, තන්තිරිමලේ ආදී ස්ථානවලින් ජ්‍යාමිතික හා ජ්‍යාමිතික නොවන සංකේත රාශියක් වාර්තා වී තිබේ (Nandadeva 1986:173-205). මේ පිළිබඳ අධ්‍යයන කළ පර්යේෂකයන් අතරින් බොහෝ දෙනෙකුගේ මතය වන්නේ මේවා ප්‍රාග් ඓතිහාසික ගණයේ චිත්‍ර වශයෙන් සැලකිය හැකි බව ය (Bandaranayake 1986). කෙසේ වෙතත් විද්‍යාත්මක දින වකවානු ලබාදිය නොහැකි මෙම සංකේත ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන ඇසුරින් පැවැතීම එක් අතකින් ආදිතම අවධියක සංස්කෘතික ක්‍රියාදාමයන් පිළිබිඹු කරන සාධකයක් බව උපකල්පනය කළ හැකි ය.

[1] පුරාවිද්‍යාව සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධියේ ගල් සොහොන් මත වූ පියන්ගල් ආශ්‍රිත ව කාලරක්ත වර්ණ මැටි බඳුන්හි බඳ කොටස් මත බොහෝ සංකේත හඳුනාගත හැකි බැවින් ඒවා ක්‍රිස්තු පූර්ව 1000-300 අතර කාලයට අයත් විය හැකි බව පෙන්වා දී ඇත (Senaviratne 1984:279-93). පූර්ව ඉතිහාසයෙන් ඉක්බිති ශ්‍රී ලංකාවේ මුල්බැස ගත් මුල් ඓතිහාසික අවධියේ ගුහා කටාරයට යටින් කොටා තිබෙන සෙල්ලිපි සමහරක එහි ආරම්භයේ හෝ අවසානයේ හෝ නැතහොත් ඊට යටින් පහළ යොදන ලද තවත් සංකේත රාශියක් දැකිය හැකි ය. මෙවැනි සමාන සංකේත ඊට පෙර පැවැති තාක්‍ෂණික සංස්කෘතික අවධි වන ප්‍රාග් හා පූර්ව (Pre and Proto) ඓතිහාසික සංස්කෘතික අවධිවලින් හඳුනාගත හැකි බැවින් ඒවායෙහි යම් සමානත්වයක් පිළිබිඹු වන බව පැහැදිලි ය (වගු අංක 01 තුළින් එවැනි සමානතා හඳුනාගත හැකි ව තිබේ).

මෙම තත්ත්වයට අනුව තාක්‍ෂණික සංස්කෘතික අවධි අතර එක ම ආකෘතියට අයත් සංකේත පරිහරණය කිරීම මගින් අඛණ්ඩ සමාජ සබඳතාව පිළිබඳ සාක්‍ෂ්‍ය පිළිබිඹු කෙරෙන අතර සමහර විට තමාගේ පැවැත්ම ඊට පෙර පැවැති සංස්කෘතිය සමග සම්බන්ධ වන බවට පෙන්වීමට ගත් උත්සාහයක් ද පිළිබිඹු විය හැකි බව උපකල්පනය කිරීමට පුළුවන. මෙම තත්ත්වය උපයෝගී කොටගෙන පුරාණ වාරි නිර්මාණ ආශ්‍රිත ව හමුවන්නා වූ සංකේත පිළිබඳ ව විමර්ශනය කිරීම මගින් එම නිර්මාණයේ සමාජ සම්බන්ධතාව හඳුනා ගැනීමටත් අනෙක් අතට ඒවා නිර්මාණය කළ ජන කණ්ඩායම හෝ තාක්‍ෂණික කණ්ඩායම හඳුනා ගැනීමටත් උත්සාහයක් දැරිය හැකි ය.

පැරණි වාරි නිර්මාණ අතර සංකේත වැඩි ප්‍රමාණයක් හමු වූ ස්ථානය වන්නේ ඇළහැර පුරාණ අමුණ ය. විශේෂයෙන් ම මෙම අමුණ ආශ්‍රිත ව හමු වූ මෙහි අංක 01 මත්ස්‍ය සංකේතයට සමාන ආකාරයේ සංකේත පූර්ව ඓතිහාසික සමාජ පිළිබඳ සාක්ෂ්‍ය ලැබෙන අම්බලන්තොට, රිදියාගම හා අනුරාධපුර ඇතුළුපුරයෙන් ද වාර්තා වී තිබේ (බණ්ඩාර 2001/2002:60- 1; Senaviratne 1984). මෙම අවධියේ දී තනි සංකේතයක් වශයෙන් හඳුනාගත හැකි මෙම සංකේතය හෙන්නානිගල, කොට්ටදැමූහෙල, බෝවත්තේගල ආදී ස්ථානවල ඇති පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනවල ද දැකිය හැකි වේ (*IC*.vol. I: nos.406,550, 559, 561,562,567,568). ලෙන් පිදීම ප්‍රධාන කොටගත් විවිධ ප්‍රදාන පිළිබඳ සඳහන් කෙරෙන මෙම පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනවල ගමණි, අය, රජ වැනි පුද්ගලයන් එම ප්‍රදාන සිදුකර තිබේ (*එම*.). එසේ ම මෙම සංකේතවලට සමාන සංකේත ඉන්දීය පූර්ව ඓතිහාසික අවධියට අයත් මැටි බඳුන් මත ද වාර්තා වී ඇත (බංඩාර 2002:62). මත්ස්‍ය සංකේතය පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන කාරණයක් වන්නේ එය පූර්ව ඓතිහාසික, මුල් ඓතිහාසික අවධිවල දී පමණක් නොව ඉන්පසු අවධිවල දී එනම් මධ්‍ය ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ ස්තූප සලපතල මලුවල ද තිබී වාර්තා වන බවයි (වජිර 2005/2006:99). මත්ස්‍ය සංකේතය සෞභාග්‍යය හා බැඳුණු සංකේතයක් වශයෙන් පිළිගැනේ. ඒ බව තහවුරු වන්නේ අනුරාධපුර කුට්ටම් පොකුණෙන් හා ජේතවන කෞතුකාගාරය අසල පොකුණෙන් හමු වී ඇති ලෝකඩ මත්ස්‍ය රූප මංජුසාවක බහා පොකුණු පතුලේ තැන්පත් කොට තිබීම මඟිනි. නමුත් අප අදහස් කරන මතයට වඩා වෙනත් මතයක් හබරකඩ වජිර හිමි ඉදිරිපත් කරයි. උන් වහන්සේ ජේතවන ස්තූප සලපතල මළුවේ ඇති මත්ස්‍ය සංකේතය මඟින් ලිංගය සහ යෝනිය අර්ථවත් කරන බව දක්වා තිබේ.

මහායාන මතවාද ප්‍රගුණ කරන ලද විහාරවල යන්ත්‍ර මන්ත්‍ර වැනි අද්භූත බලයකින් යුතු ක්‍රියාවල ප්‍රතිඵල ලෙස මේවා නිරූපණය කර ඇති ආකාරය වජිර හිමි පෙන්වා දී ඇත (එම 2005/2006:94).

මත්ස්‍ය සංකේතය සහිත සෙල්ලිපි පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ ඒවා ගමණිවරුන්ට අයත් ව හෝ ගමික හෝ අයවරුන්ට සම්බන්ධ ව පවතින බවකි. රාජකීයත්වය සමග සම්බන්ධ වන ලේඛන රාශියක ම මෙම මත්ස්‍ය සංකේතය දක්නට ලැබීමෙන් පැහැදිලි වන්නේ ගමණිවරු නියෝජනය කරන පිරිස් අතර මෙම සංකේතය භාවිත වී තිබෙන ආකාරයයි (*IC*. vol. I: nos.406,549,550,551,556-559,562-3,565,567,568,569). සෙල්ලිපි ඇසුරින් පැහැදිලි වන කාරණයක් වන්නේ ගමණිවරු සමග සම්බන්ධ මත්ස්‍ය රූපය කේවල මත්ස්‍ය රුවක් වන බවයි. ශ්‍රී ලංකාවේ පූර්ව ඉතිහාසය තුළ හා මුල් ඉතිහාසය තුළ හමුවන මත්ස්‍ය සංකේතය වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ තනි සංකේත වශයෙනි.

එසේ වුව ද පුත්තලම් දිස්ත්‍රික්කයේ මුල්ලේගම පූර්ව බ්‍රාහ්මී ලිපියක මෙය මෙහි අංක 02 ආකාරයේ යුගල සංකේතයක් ලෙස යොදා තිබෙනු හඳුනාගත හැකි ය (*IC*. vol. I: no. 1074). මෙම සංකේතය බොහෝ සෙයින් ඇළහැර අමුණේ දක්නට ලැබෙන යුගල මත්ස්‍ය සංකේතය සමග සැසඳේ. මුල්ලේගම ලිපියේ දක්නට ලැබෙන යුගල මත්ස්‍ය රූපය පරුමකවරුන් සතු වූවක් බව එම ලිපියේ " *පරුමක උතරහ*........" යනුවෙන් සඳහන් වීමෙන් තහවුරු වේ. අමුණක් ආශ්‍රිත ව වඩු සංකේතයකින් තොර ව මෙවැනි සංකේතයක් තනි වශයෙන් කොටා තිබීමෙන් අදහස් වන්නේ විශේෂයෙන් ම ඇළහැර වැනි සුවිසල් අමුණු නිර්මාණ කාර්යයක දී එහි තාක්ෂණික අංශය ඉතා අනාදිමත් කාලයක සිට ප්‍රගුණ කළ පිරිසක් අතින් සිදු වූ බවට හැඟවීමක් ලෙසින් විය හැකි බවකි. ඇතැම් විට එය අමුණු කර්මාන්තය සමග සම්බන්ධ වූ පරුමකවරුන්ට හෝ ගමණිවරුන්ට අයත් වූවක් විය හැකි ය. විශේෂ ප්‍රාගුණ්‍යතා සහිත ශිල්ප පිරිස්වල සම්බන්ධතාව පෙන්වීමට මෙවැනි සංකේත අමුණු වැනි වාරි නිර්මාණ ආශ්‍රිත ව පිහිටුවන්නට ඇති බවට යම් උපකල්පනයකට පැමිණිය හැකි බව එම සංකේතවල සමානතාව අනුව පෙන්වාදීමට පුළුවන.

ඇළහැර අමුණෙන් හමුවන ශිලා කුට්ටිවල දක්නට ලැබෙන ස්වස්තික සංකේතයට සමාන ආදිතම සංකේත ශ්‍රී ලංකාවේ හමුවන්නේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික අවධි තුළිනි. ප්‍රාග් ඓතිහාසික ජනාවාස පිළිබඳ සාක්ෂ්‍ය හමු වූ ගුහාවක් වන බුදුගල හා පූර්ව ඓතිහාසික ජනාවාස ස්ථාන වන රිදියාගම හා අනුරාධපුර (බංඩාර 2005-2006: 62) මෙම ස්වස්තික සංකේතයට සමාන සංකේත හමු වී තිබේ.

මින් පසු කාල පරිච්ඡේදය වන මුල් ඓතිහාසික සංස්කෘතික අවධිය තුළ දී ස්වස්තික සංකේතය පූර්ව බ්‍රාහ්මී අභිලේඛනවල හා කාසිවල හඳුනාගැනීමට අවකාශ සැලසේ. හෙන්නානිගල සෙල් ලිපියේ ස්වස්තිකය සමඟ මත්ස්‍ය සංකේතය එහි අග කොටසේ දැකිය හැකි ය (*IC*. vol. I: pl. 406). එසේ ම මිහින්තලේ ලිපියක වේදිය සහිත දණ්ඩ හා වෙන ම ස්ථානයක ස්වස්තිකය නිර්මාණය කොට ඇත (*එම* pl. 34). රිටිගල ලිපියක ද ස්වස්තිකය පමණක් (*එම* pl. 268) දක්නට ලැබේ. එම සංකේත අන්තර්ගත ගල් ලෙන් ප්‍රදානය ගමණිවරුන් හා පරුමකවරුන් සිදු කර තිබීම ද කැපී

පෙනේ. මෙම ස්වස්තික සංකේතය මුල් ඓතිහාසික අවධියේ මෙරට භාවිත කරන ලද ලෝහ කාසි වන ස්වස්තික කාසි මත ද දක්නට ලැබේ (Codrington 1924: 22-4). මෙම සංකේතය හමුවන මැටි බඳුන් මත හා අභිලේඛනවල මෙන් ම කාසිවල ද ස්වස්තික සංකේතය වාමාවර්තව හා දක්ෂිණාවර්තව යන දෙයාකාරයට ම දැකගත හැකිවීම විශේෂ වේ. ස්වස්තික සංකේතය පොදුවේ පිළිගනු ලබන්නේ සෞභාග්‍යය හා සමෘද්ධිය පිළිබිඹු කරන සංකේතයක් ලෙසිනි. මේ බව තව දුරටත් පැහැදිලි කළ හැකි වන්නේ පසුකාලීන කලානිර්මාණ සමග හා වාස්තු විද්‍යා ගොඩනැගිලිවල මෙම සංකේතය යොදා තිබීමෙනි. වෙස්සගිරියේ ජන්තාඝරය ආශ්‍රිත ව ගල් පුවරුවක මත්ස්‍ය සංකේතය සමග ස්වස්තිකය දැකගත හැකි අතර ජේතවන සලපතල මළුවේ $N_{13}$ $W_{17}$ පරිශ්‍රයේ ස්වස්තිකය දැකගත හැකිවීම තුළින් එය තව දුරටත් පැහැදිලි වේ.

පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනවල ඇති ස්වස්තික සංකේතය පිළිබඳ විග්‍රහකර ඇති පරණවිතාන එම සංකේතය රජ පරපුරට සම්බන්ධ *ගමිණී තිස* (*IC*.vol. I: nos.406,835,1018,1027) යන නාමය සහිත ශිලාලේඛනවල සඳහන් වන බව දක්වා තිබේ. එසේ ම ඉන්දියාවේ ජෝන් ඇලන්ගේ කාසි එකතුවෙහි ද තිශ නාමය හා ස්වස්තික සටහන සහිත කාසි පිළිබඳ සඳහන් තොරතුරු පවතින බව පවසන පරණවිතාන එමගින් ස්වස්තික සංකේතය *තිශ රාජ* නාමය සමග සම්බන්ධවන බව පෙන්වා දෙයි (එම XXV-XXVI). ඒ අනුව පැහැදිලි වන්නේ ස්වස්තික සංකේතය ස්ථාවර රාජකීය සංකේතයක් වන බවයි.

පරුමකවරුන්ට හා ගමණිවරුන්ට අයත් පූර්ව බ්‍රාහ්මී අභිලේඛනවල බහුල ව මෙම ස්වස්තික සංකේතය දක්නට ලැබෙන බැවින් පාලන බලය මෙහෙය වූ කණ්ඩායම්වල සමාජ තත්ත්වය ඉන් හඳුනාගත හැකි ය. පරුමකවරුන් සෘජු ලෙස පාලකයන් නොවූ අතර ඔවුන් රජවරුන් සමග ඥාති සම්බන්ධතා ගොඩ නගාගෙන තිබූ බව පරණවිතාන පෙන්වා දී ඇත (*එම* LXXIII). එසේ ම ස්වස්තික කාසි අතර තිබෙන ඇතා සහ ස්වස්තික, අශ්වයා සහ ස්වස්තික, සිංහයා සහ ස්වස්තික මෙන් ම ගවයා සහ ස්වස්තික කාසිවල ද සෙල් ලිපිවල මෙන් ම මෙම සංකේතය වේදය සහිත ව දැකිය හැකි බැවින් ඥාති හෝ පාලන සම්බන්ධතාව මැනවින් හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම කාසි නිෂ්පාදනය හා ඒවායේ අදිකාරී බලය හසුරුවනු ලැබුවේ පාලක පිරිස විසිනි. එම පිරිස ඔවුන්ට අනන්‍ය සංකේත බොහෝ විට කාසිවල යෙදූහ. ස්වස්තික සංකේතය ද එබන්දකි. එහි උච්චතම අවස්ථාව වූයේ පසුකාලීන ව ඉන්දු ග්‍රීක සහ ඉන්දු සිතීයන් කාසිවල එම තත්ත්වය තව දුරටත් වැඩි දියුණු වෙමින් පාලක රුව ම කාසියට යොදවා තිබීම මගිනි (Bopearchchi 1993: pl. 1-15).

ඇළහැර අමුණේ දක්නට ලැබෙන අංක 03 ආකාරයේ ස්වස්තික සංකේතයට තරමක් ආසන්න ආකාරයේ සංකේතයක් ගමණිවරයෙකු පිළිබඳ සඳහන් වන නාවලර්කුලම සෙල්ලිපියක දැක්වේ (*IC*. vol.I: no.494). ඒ අනුව ස්වස්තික සංකේතය ගමණිවරු නියෝජනය කරන සංකේතයක් ලෙස සැලකිය හැකි ය.

පරුමකවරුන් හා ගමණිවරුන් තම පාලන අදිකාරී බලය රජවරුන් හා සම්බන්ධ වී ගෙන යාම තුළ ඔවුන්ට විශේෂිත සමාජ තත්ත්වයක් හා බලයක් හිමි වී තිබිණ. මේ නිසා ඔවුන් එවකට ප්‍රදේශගත ව පැවැති සම්පත් හා තාක්‍ෂණය හැසිරවීම තමා යටතේ සිදු කිරීමට පියවර ගෙන තිබේ. විශේෂයෙන් ම ලෝහ සම්පත් හැසිරවීමේ පාලන බලය පරුමකවරුන් රඳවා ගැනීමත් සමඟ ම ඔවුන් නගුල් කෘෂිකර්මාන්තය හැසිරවීම 'පරුමක නගුලි' (*එම* nos.269,809,142) මෙන් ම වැව් පාලනය හැසිරවීම 'වපි හමික' (*එම* nos.1930,1132,1217,1153,1151) යන සඳහන් මගින් හඳුනාගත හැකි ය. සමාජ පුරාවිද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් මේ පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී වැව, කෙත හා නගුල් කෘෂිකර්මාන්තය පරුමකවරුන් පාලනයට ගැනීම නිසා ඔවුන් මුල් ඓතිහාසික සමයේ දී මෙරට ධනවත් ආර්ථික කණ්ඩායමක් වූ බව පෙනේ. විශේෂයෙන් ම වැව මෙන් ම කෘෂිකර්මාන්තය හා බැඳි ක්‍රියාවලින්වල දී පරුමකවරුන් අත තිබූ ලෝහ තාක්‍ෂණය වාරි කර්මාන්තයට ද ඍජු දායකත්වයක් සපයන්නට ඇත. විශේෂයෙන් ම පරුමකවරුන් තඹ ලෝහයේ පාලන බලය හසුරුවා ඇති බව පරුමක තබර (*එම* no.319) වැනි තනතුරු දැරීමෙන් පැහැදිලි වේ. සෙනෙවිරත්න පෙන්වා දෙන ආකාරයට රිටිගලින් හමුවන ලිපියක සඳහන් අරිට්ඨ මාහාගාම පරුමක සහෝදරවරුන් හතර දෙනෙකුගේ සම්බන්ධතාව කෘෂිකාර්මික ක්‍රියාවලියට ඍජු දායකත්වයක් සැපයීමට උපකාරී වී තිබේ (Senaviratne 1989:115). ඒ අනුව වාරි කර්මාන්තයේ ප්‍රධාන කොටසක් වන අමුණු නිර්මාණයට ද ඔවුන්ගේ දායකත්වය ලැබෙන්නට ඇති බව අමුණු ආශ්‍රිත ව මෙම සංකේතය යොදා තිබීමෙන් පෙන්නුම් කරයි.

ඇළහැර අමුණින් හමුවන ස්වස්තික සංකේතය හැරුණු විට දක්නට ලැබෙන සංකේත වැඩි ප්‍රමාණයක් පරුමකවරුන් විසින් භාවිත කරන ලද සංකේතවලට සමාන වේ. එහි දක්නට ලැබෙන අංක 04 ආකාරයේ කතිර සලකුණින් යුතු සංකේතය *'පරුමක නදික පුත.....'* යනුවෙන් සඳහන් වන නැට්ටුක්කන්ද ලිපියේ ද (*IC*. Vol. I:160), *'දෙවනපිය රඣ අබයශ ශෙනපති පරුමක මිතශ.....'* යනුවෙන් සඳහන් වන සිතුල්පව්ව ලිපියේ ද (*එම* 620) දක්නට ලැබෙන අංක 05 සංකේතයට බෙහෙවින් ම සමාන වේ. මීට අමතර ව එහි සඳහන් ව තිබෙන අංක 06 සංකේතය පරුමක ශිව නමැත්තෙකු පිළිබඳ දැක්වෙන පිච්චන්දියාව ලිපියේ තිබෙන අංක 07 සංකේතය සමඟ ගැළපිය හැකි ය (*එම* 1233). මෙහි අංක 08 ආකාරයේ වෘත්තයක් තුළ කතිර සටහනකින් යුතු සංකේතයක් මල්වතු ඔයේ තේක්කම් අමුණේ ද දක්නට ලැබේ. ඇළහැර අමුණේ දක්නට ලැබෙන අංක 09, 10 සහ 11 ආකාරයේ සංකේත තවත් පරුමකවරයෙකු පිළිබඳ සඳහන් වන කන්දකාඩු ලිපියේ තිබෙන මෙහි අංක 12 යන සංකේතය (*එම* no.318) සමඟ සැසඳිය හැකි ය. පුත්තලම දිසාවේ තෝනිගල හා පරමාකන්ද ලිපි ගණනාවක ම දක්නට ලැබෙන මෙහි අංක 13 ආකාරයේ සංකේත (*එම* nos.1051-55) ඇළහැර අමුණ ආශ්‍රිත ව හඳුනාගත හැකි අංක 14, 15 සහ 16 යන සංකේත සමඟ සැසඳීමේ දී බෙහෙවින් ම ආසන්න ස්වභාවයක් ගන්නා බව පෙනේ. මීට අමතර ව එම ප්‍රදේශයේ ම මුල්ලේගම ලිපියේ දක්නට ලැබෙන අංක 17 ආකාරයේ සංකේතය ද (*එම* no.1074) මීට ම ගැළපිය හැකි වේ. එම ලිපිවල කතෘහු පරුමකවරු වූහ. තෝනිගල ලිපි මගින් පරුමකවරුන් වාරි කර්මාන්තය පිළිබඳ දැක්වූ සම්බන්ධතාව පිළිබඳ ව ද අදහසක් ලබාගත හැකි ය. තව ද ඇළහැර අමුණේ දක්නට ලැබෙන අංක 18 සහ 19 සංකේතවලට සමාන සංකේත පරුමකවරුන් පිළිබඳ සඳහන් වන මිහින්තලේ

ආනයිකුට්ටි කන්දේ හා රිටිගල වේවැල්තැන්නේ ලිපියක ද (*එම* no. 72,269) දක්නට ලැබේ. අනුරාධපුර වෙස්සගිරියේ තිබෙන 'පරුමක පලිකද පුත...' යනුවෙන් සඳහන් වන ලිපියේ දක්නට ලැබෙන අංක 20 ආකාරයේ සංකේතයට (*එම* no.81) සමාන වන මෙහි අංක 21 ස්වරූපයේ සංකේතයක් ද ඇළහැරින් හමුවිය. මෙම සංකේතයට තරමක් ආසන්න ස්වභාවයෙන් සංකේතයක් පරුමක නැකතිවරයෙකු පිළිබඳ සඳහන් වන පෙරියකඩු විහාර ලිපියක ද දක්නට ලැබේ (*එම* no.941). රිටිගල වේවැල්තැන්නේ ලිපිය පරුමකවරයෙකුට අයත් වන අතර එහි දක්නට ලැබෙන මෙහි දැක්වෙන අංක 22 ආකාරයේ සංකේතයට (*එම* no.269) ආසන්න ස්වරූපයෙන් යුක්ත අංක 23 ආකාරයේ සංකේත දෙකක් ද ඇළහැර අමුණින් හමු වී ඇත.

ඇළහැර අමුණ ආශ්‍රිත ව හඳුනාගත හැකි මෙම සංකේත මෙරට විවිධ ක්ෂේත්‍රවල නායකත්වය ඉසිලූ පරුමකවරුන් නියෝජනය කරන බව පැහැදිලි ය. මෙරට ප්‍රධාන සමාජ ස්තර නියෝජනය කළ පරුමකවරු සෑම ක්ෂේත්‍රයකට ම නායකත්වය දුන් පිරිසක් ද වූහ. ඒ අතර කෘෂි හා වාරි කර්මාන්ත යන විෂයයන් ද වූ බව තත්කාලීන සෙල්ලිපි විමර්ශනය කිරීමේ දී තහවුරු වේ (*එම* nos.260,869,1130,1132,1151,1153).

මූල ඓතිහාසික අවධිය තුළ ආරම්භ වූ වාරි කර්මාන්තයේ තාක්ෂණික දියුණුව මුල් ඓතිහාසික අවධිය ඔස්සේ ඉදිරියට ගෙන ඒම පිණිස නායකත්වය දුන් පිරිසක් ලෙස පරුමකවරුන් සැලකිය හැකි ය. ඒ වන විට ඔවුන් සමාජය තුළ අත්පත් කරගෙන සිටි උසස් සමාජ තත්ත්වය තුළ සේනාධිපති වැනි රාජ්‍යයත්වයට ඉතාමත් සමීප තනතුරුවල සිට සියලු ක්ෂේත්‍රවල මෙහෙයවීමේ බලය මොවුන්ට හිමිවීමේ ප්‍රතිඵලයක් ලෙස වාරි කර්මාන්තය දියුණුකොට පවත්වා ගෙන යාමේ කාර්යය ද දේශපාලන අධිකාරිය විසින් මොවුන්ට පවරන ලදී. ඒ අනුව ක්‍රිස්තු වර්ෂාරම්භය වන විට මහා පරිමාණ වාරි කර්මාන්තයේ මෙහෙයවන්නන් බවට පරුමකවරුන් පත්වන්නට ඇති බව පෙනේ.

මහා පරිමාණ වාරි කර්මාන්තය උදෙසා පරුමකවරුන්ගේ දායකත්වය පැවති බවට තහවුරු කරගත හැකි වැදගත් ම සාක්ෂියක් ලෙස ඇළහැර අමුණ ආශ්‍රිත ව හඳුනාගත හැකි සංකේත රාශිය දැක්වීමට පුළුවන. පෙර කී සංකේත ඇළහැර අමුණ ආශ්‍රිත ව දක්නට ලැබෙන්නේ එහි බිම් මට්ටමේ හා ඊට ආසන්න ගල් වරිවල වන බැවින් මේවා නිසැක වශයෙන් ම අමුණේ මුල් ඉදිකිරීම් අවධියට අයත් වන බව පැහැදිලි ය. ඒ අනුව මෙම සංකේත මගින් අමුණේ මුල් තාක්ෂණික අවධිය නියෝජනය කරන පිරිස් සංකේතවත් කරන බව උපකල්පනය කළ හැකි ය.

වංසකතාවට අනුව ඇළහැර අමුණ ඉදිකිරීමේ මුල් අවධිය අයත් වන්නේ වසභ රජුගේ කාලයට ය (*මව.* IIIX: 84). වංසකතාවට අනුව පැහැදිලි වන්නේ ඔහු කිසිදු රාජ්‍යය උරුමයක් තිබූ පුද්ගලයෙකු නොවන බවයි. උතුරු දිග වාසය කළ මෙම තරුණයා ලම්බකර්ණ වංශිකයෙකු පමණක් බව එහි සඳහන් කොට තිබේ (*එම* vol. III:59-60). ඒ අනුව වසභ උපතින් ම රාජ්‍යයත්වයට හිමිකම් කියූ පරපුරකට අයත් නොවන බව පැහැදිලි ය. ඔහු රාජ්‍යයත්වයට පත්වීමට හේතු වූ පසුබිම ලෙස

පරණවිතාන දක්වා ඇත්තේ ඔහු අයත් වූ උසස් වංශයත්, සිය මලණුවන් රජුගේ සේනාධිපති වීමත් නිසා ජනතාවගේ සහාය ලබාගැනීමට හැකිවීම නිසා බව ය (*ලවිලඉ.* 1964.i:175). මීට අමතර ව මහා විහාරය ඔහුට සහාය ලබාදීම හා පිළිගැනීම ද (*මව.* IIIV:65-6) මේ සඳහා හේතු වූ ප්‍රබල සාධකයක් ලෙස හඳුනාගත හැකි ය.

වංසකතාව ආගමික හා රාජ්‍යය ස්තර පිළිබඳ හැරුණු විට වෙනත් කිසිදු සමාජ ස්තරයක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකරන බැවින් වසභගේ පූර්ව රාජ්‍යය අවධිය සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය නොවේ. වසභගේ ප්‍රභවය පිළිබඳ මාගේ අදහස වන්නේ මොහු ඒ වන විට ප්‍රබල ව සිටි පරුමකවරුන්ගෙන් වඩාත් දක්ෂ පරුමකවරයෙකු විය හැකි බවයි. සමාජ නායකත්වය හා වෘත්තීය නිපුණත්වය සහිත වූ පරුමකවරුන් තුළ පැවති හැකියාව මත ප්‍රබල ව ඉස්මතු වූ චරිතයක් ලෙස වසභ සැලකිය හැකි ය. වසභ නාමය භාවිත කළ පරුමකවරුන් පිළිබඳ ව සෙල්ලිපි අතරින් අනාවරණය වේ. සේරුවාවිල තිබෙන එක් අපර බ්‍රාහ්මී ලිපියක 'පරුමක යකඩතභ පුත පරුමක වහබව......' යනුවෙන් සඳහන් ව තිබීම මෙයට එක් නිදසුනකි (*IC*.vol. I: no.1171). ඒ අනුව වසභ යන පෞද්ගලික නාමය පරුමකවරුන්ට භාවිත කිරීමේ හැකියාව පැවති බව තහවුරු වේ.

දිවයිනේ විශාල වාරි කර්මාන්ත ඉදිකිරීමේ ආරම්භය වසභ රජුගේ කාලයේ දී සිදුවීමට බලපාන්නට ඇති එක් ප්‍රධාන හේතුවක් ලෙස අනුමාන කළ හැකි වන්නේ ඔහු නියෝජනය කළ බවට උපකල්පනය කළ හැකි පරුමකවරුන්ගේ සමාජ ස්තරය එම කාර්යයෙහි ලා අත්දැකීම් බහුල වීම නිසා විය හැකි ය. එබැවින් පරපුරෙන් ලද ප්‍රාගුණ්‍යතාව ද, රාජ්‍යයත්වය හිමිකර ගැනීම තුළ අත්පත් කරගත් දේශපාලනික නායකත්වය ද නිසා වසභ රජුට විශාල වාරි කර්මාන්තයේ නියැළීමට උවමනා අවකාශය ලැබෙන්නට ඇත. ඇළහැර අමුණ එහි එක් වැදගත් ප්‍රතිඵලයකි. මෙම අමුණේ ඇතැම් ශිලාමය කොටස්වල යොදා තිබෙන සංකේත මඟින් පෙන්නුම් කරන්නේ එම සම්බන්ධතාව බව උපකල්පනය කළ හැකි ය.

ඇළහැර අමුණේ දක්නට ලැබෙන ඇතැම් පරුමක සංකේතවලට ආසන්න හැඩයෙන් යුතු සංකේත ඇතැම් ප්‍රාග් හා පූර්ව ඓතිහාසික ජනාවාස බිම් ඇසුරින් හඳුනාගත හැකි ය (වගුව ඇසුරින් එම සමානතාව ගැළපිය හැකි ය). ඒ අනුව එළඹිය හැකි උපකල්පනය වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසාන භාගයේ ප්‍රභවය වීම ආරම්භ වූ තාක්ෂණය පූර්ව ඓතිහාසික අවධිය තුළ වඩාත් වර්ධනය වෙමින් මුල් ඓතිහාසික අවධිය කරා ගමන්කොට අනතුරු ව ඓතිහාසික අවධිය කරාත් පරපුරෙන් පරපුරට ගමන් කර තිබෙන බවයි. සංකේතවල දක්නට ලැබෙන යම් යම් වෙනස්වීම් ද එම සමාජ විකාශනයේ ම එක් අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. වසභ රජුගෙන් ආරම්භ වන පළමුවන ලම්බකර්ණ රාජවංශය පිළිබඳ ව විමසන විට පැහැදිලි වන්නේ මහා වාරි කර්මාන්තයේ නියැළීම වඩාත් සක්‍රීය කළ රජ කෙනෙකු වන මහසෙන් රජු ද අයත් වන්නේ එම පරපුරට ම වන බවයි. මින්නේරිය වැව ඇතුළු වැව් සොළොසක් ද ඇළ මාර්ග ද ඉදිකළ ඔහුට ඒ සඳහා වන ප්‍රාගුණ්‍යත්වය ඔහුගේ පරපුරේ ආරම්භකයන්ගෙන් ලැබෙන්නට ඇති බව සිතීමට පුළුවන. ඒ අනුව පරුමක පරපුර

ඔස්සේ වසභ රජු දක්වා පැමිණි වාරි තාක්ෂණය වැඩි දියුණු වෙමින් තව දුරටත් ඉදිරියට පැතිරී ගිය බව පැහැදිලි වේ.

විශේෂයෙන් ම පූර්ව බ්‍රාහ්මී සෙල් ලිපිවල සඳහන් සංකේත අතරින් පරුමකවරුන්ට හා ගමණිවරුන්ට අයත් සංකේත තුළින් ස්වස්තික සංකේත සමග සමහර ලිපිවල මත්ස්‍ය සංකේතය සලකුණු කිරීම මගින් අදහස් වන්නේ ගමිකවරුන් හා අයවරුන් අතර පවුල්මය වශයෙන් ඔවුන් සතු ව තිබූ ඥාති සම්බන්ධතාව බව හැඟේ. එසේ ම ලෝහ ඇතුළු ශිල්ප කර්මාන්තවල දී විශේෂ ප්‍රාගුණ්‍යතාවක් පරුමකවරුන් හා ගමණිවරුන් දැරූ නිසා වැව් අමුණු ඉදිකිරීමේ දී ඔවුන් ඉහළ දායකත්වයක් ඒ සඳහා සපයන්නට ඇත. එම නිසා ඇළහැර වැනි අමුණු ඉදිකිරීමේ දී එහි ඇති ශිලා ඛණ්ඩවල එම සංකේත යොදන්නට ඇත්තේ එම අමුණු ඉදිකරවූවන් තමන්ගේ ඥාති සම්බන්ධතාව හා තමන්ට අයත් තාක්ෂණික ශිල්පය ඊට පෙර පැවැති මහා සමාජයට සම්බන්ධ කිරීමේ අරමුණින් විය යුතු ය. තව ද මෙම ශිලා අමුණු නිර්මාණයේ ප්‍රාරම්භක තාක්ෂණය මුල් ඓතිහාසික අවධියේ දී පරුමකවරුන් හා ගමණි හෝ ගමික මෙන් ම අය යන ජන කණ්ඩායම් මඟින් ද හඳුන්වා දීමට ඉඩ තිබෙන අතර ඔවුන්ගේ එම සම්බන්ධතාව මෙම සංකේත යෙදීම මගින් පැහැදිලි වීමට ඉඩ පවතින බව මේ අනුව පෙන්වා දිය හැකි ය.


ඉහත සංකේතවලට අමතර ව ඇළහැර හා කලා ඔය පිටවාන ආශ්‍රිත ව තිබී අක්ෂරවලට සමානතා ඇති සංකේත හමු වී තිබේ. එම සංකේත අතර බ්‍රාහ්මී ක + එලක අක්ෂරයට සමාන සංකේත හඳුනාගත හැකි ය. එහි අපර බ්‍රාහ්මී ලෙස හැඳිනගත හැකි අක්ෂර එලක අංක 10 තුළින් හඳුනාගත හැකි අතර එමඟින් *කාපිදී* යන්න අර්ථ දැක්වේ. මින් යමක් පිදීම යන්න අදහස් වන අතර සමහර විට අමුණ නිර්මාණයේ දී ශ්‍රමය වැයකළ හා මුදල් වියදම් කළ බව ඉන් හැඟෙන බව උපකල්පනය කළ හැකි ය. අක්ෂර විද්‍යානුකූල ව මෙම අක්ෂර ක්‍රිස්තු වර්ෂ 8-9 කාලයට අයත් වේ.

ඉහත සඳහන් සංකේත හා අක්ෂරවලට අමතර ව ඇළහැර හා කලා ඔය පිටවාන ඇසුරින් හමුවන බ්‍රාහ්මී නොවන සංකේත අතර දුන්න සහ ඊතලය වැනි සංකේත ඇතුළු තවත් ස්වස්තික සංකේත කිහිපයක් ම හඳුනාගත හැකි අතර ඉන් සමහරක් සංකේත පශ්චාද්කාලීන අභිලේඛනවල තිබේ. ඒ අතරින් කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති අත්තානි ලිපියක ඉහත සංකේතය දැකිය හැකි අතර මෙම සංකේතයට සමාන සංකේත කලා වැවේ පිටවාන ආශ්‍රිත ව හඳුනාගත හැකි ය. මේ අතරින් සලකුණු කිහිපයක් පමණක් වඩු සංකේත ලෙස යොදාගන්නට ඇති බව පෙනේ.



















**සමාලෝචනය**


මෙම තත්ත්වය පිළිබඳ ව ගැඹුරින් විමර්ශනය කිරීම මගින් පැහැදිලි වන්නේ වාරි නිර්මාණ ආශ්‍රිත ව හමුවන සංකේත හුදෙකලා සංකේත නොවන බවකි. ඒවා බොහෝමයක් පූර්ව ඓතිහාසික යකඩ යුගය තුළ සිටි ජන කණ්ඩායම් තම ජන කණ්ඩායමේ අනන්‍යතාව සහ ශිල්ප කුල සංකේතවත් කිරීමට යොදාගත් නිල සංකේත බව උපකල්පනය කළ හැකි ය. තාක්ෂණය සමග බැඳුණු ශිල්ප පරම්පරාවන් තම අනාගත පරපුර වෙත තම අත්දැකීම් උරුම කරදීමේ දී පරපුරේ අනන්‍යතාව

ආරක්‍ෂා කර ගැනීම පිණිස මෙම සංකේත යොදා ගන්නට ඇති බව සිතීමට පුළුවන. විශේෂයෙන් ම තාක්‍ෂණික ශිල්පය හා බැඳුණු ක්‍රියාවලියේ දී ලෝහ කර්මාන්තය මෙන් ම ශිලා ඉදිකිරීම සඳහා දැක්වූ විශේෂ ප්‍රාගුණ්‍යතාව කරණ කොටගෙන ශිලා විභේදනය, ශිලා නිර්මාණය යන කාරණාවල දී එම ජන පිරිස්වල අනන්‍යතාව මෙයින් පිළිබිඹු වන බව මෙම සංකේත ඇතැම් වාස්තු විද්‍යාත්මක නිර්මාණ ආශ්‍රිත ශිලා කොටස්වල ආදියෙහි සටහන් වී තිබීම මගින් ද පැහැදිලි වේ. ඒ අනුව වාරි නිර්මාණ ආශ්‍රිත ව හමුවන සංකේත මගින් පුරාණයේ සිට ක්‍රියාත්මක තාක්‍ෂණික ක්‍රියාවලියක අඛණ්ඩ සමාජ පසුබිමක් හා තාක්‍ෂණික පියවරයන් ඇළහැර, කලා වැවේ පිටවාන සහ තෙක්කම් අමුණ ආදී වාරි නිර්මාණ ආශ්‍රිත ව හමුවන සංකේත මගින් අධ්‍යයනය කළ හැකි බව පැහැදිලි ය. කෙසේ වෙතත් මෙම අදහස තව දුරටත් පුළුල් විග්‍රහයකට ලක්කළ යුතු ව ඇත.




**පැරණි වාරි නිර්මාණවල දක්නට ලැබෙන සංකේත අතරින් සමහරක ස්පර්ශ පිටපත්**

| ප්‍රාග් ඓතිහාසික යුගය<br>Pre Hisoric Period | | පූර්ව ඓතිහාසික යුගය<br>Proto Historic Period | | මුල් ඓතිහාසික යුගය<br>Early historic Period | | අමුණු ආශ්‍රිත සංකේත<br>Svmbols on Anciant Dams | |
|---|---|---|---|---|---|---|---|
| බුදුගල |  | රිදියගම<br>අනුරාධපුර ඇතුල් නුවර |  | මිහින්තලේ<br>රිටිගල වෙවැල්තැන්න<br>පෙරියපුලියන්කුලම |  | ඇළහැර |  |
| ගොනාගොල්ල |  | රිදියගම<br>අනුරාධපුර ඇතුල් නුවර |  | ගොනාගොල්ල<br>කොට්ටදැමුහෙල<br>කොට්ටදැමුහෙල<br>බෝවත්තේගල<br>වෙහෙරගල්කන්ද<br>කෝන්ගල<br>බෝවත්තේගල<br>මුල්ලේගම |  | ඇළහැර |  |
| ගොනාගොල්ල |  | රිදියගම<br>අනුරාධපුර |  | සිතුල්පව්ව හා<br>නැට්ටුක්කන්ද |  | ඇළහැර<br>කලාඔය යකා බැම්ම අමුණ |  |
| තන්තිරිමලේ |  | ස්ථානය සඳහන් නොවේ |  | පිච්චන්දියාව |  | ඇළහැර |  |
| තන්තිරිමලේ |  | අනුරාධපුර<br>රිදියාගම<br>ඉබ්බන්කටුව |  | කන්දෙගම්කන්ද<br>මිහින්තලේ |  | ඇළහැර |  |
| | | රිදියාගම<br>අනුරාධපුර හා රිදියාගම |  | කෝන්ගල හා පරමාකන්ද<br>මුල්ලේගම<br>පෙරියකඩු විහාරය |  | ඇළහැර<br>ඇළහැර |  |
| තන්තිරිමලේ<br>උස්සංගල<br>කොනත්තේගොඩ |  | රිදියාගම |  | අනුරාධපුර |  | ඇළහැර<br>කලාඔය යකා බැම්ම අමුණ |  |
| බුදුගල |  | රිදිගම |  | නැටටුක්කන්ද<br>රිටිගල වෙවැල්තැන්න<br>එරුපොතාන<br>දඹුල්ල<br>නාවලප්කුලම |  | ඇළහැර<br>ඇළහැර |  |
| | | අනුරාධපුර |  | රිටිගල<br>කන්දකාඩු |  | ඇළහැර |  |
| | | | | වෙස්සගිරිය<br>රිටිගල වෙවැල්තැන්න |  | ඇළහැර |  |




**1**




**2**




**3**




**4**



**5**



**6**




**7**




**8**




**9**




10



11



12




වාරි නිර්මාණ ආශ්‍රිත ව හමුවන සංකේත අතරින් සමහරක චිත්‍ර සටහන්

**මූලාශ්‍රය**

බණ්ඩාර, ටී., 2001/2002, 'හම්බන්තොට ආශ්‍රිත ඓතිහාසික පුරාවිද්‍යාව පිළිබඳ විමසුමක්', ***වැලිපිළ***, කලාපය 05, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී, සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

***මහාවංසය*** (සිංහල), 1967, සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව.

වජිර හිමි, එච්., 2005/2006, 'ස්තූප සලපතළ මලුවලින් හමුවන ලිංග, යෝනි සහ ගර්භ සංකේත', ***වැලිපිළ***, කලාපය 07, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී, සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

Bandaranayake, S., 1986, ***The Rock art and Wall Painting of Sri Lanka***, Colombo.

Bopearachchi, O., 1993, ***Catalogue of Indo-Greek, Indo-Scythian and Indo-Parthian Coins of the Smithsonian Institution***, Washington D.C.

Codrington, H.W., 1924(1994), ***Ceylon Coins and Currency***, Reprint, Asian Educational Services.
***Inscription of Ceylon***, Vol. I. part. I., 1970, eds. S. Paranavitana, Colombo, Department of Archaeology.

Nandadewa, D.B., 1986, Rock Art Sites of Sri Lanka, ***Ancient Ceylon***, No. 06, Colombo, Department of Archaeology.

Senavirathna, S., 1984, The archaeology of the Megalithic-Black and Red Ware complex in Sri Lanka, ***Ancient Ceylon***, The journal of the archaeological Department of Sri Lanka, Colombo, Vol.5: pp.237-307.

Senavirathna, S., 1989, Pre State Chieftain and Servants of the State: A case study of the parumuka, ***The Sri Lanka Journal of Humanities***. Vol. XV. no.1 & 2: pp.99-131.

# රන්මසු උයන, උද්‍යාන සංකල්පය, වාරි තාක්‍ෂණය හා කලා ශිල්ප

ඩබ්.එම්. ඉරේෂා ශ්‍යාමලී වන්නිනායක[1]

ශ්‍රී ලංකාවේ උද්‍යාන සංකල්පය ආරම්භ වූයේ කවදා ද යන්න නිශ්චිත ව ම හඳුනාගත නොහැකි ය. එහෙත් මෙරට වංසකථා විමර්ශනයේ දී එය වසර දෙදහස් පන්සියයකටත් වඩා ඉතිහාසයකට දිවෙන බවට සාධක හමු වේ. මිහිඳු මහරහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජුට අනාගත පූජ්‍ය ස්ථාන නම් කිරීම විස්තර කරන මහාවංස කතුවරයා ශ්‍රී මහා බෝධිය පිහිටුවන ස්ථානය දැක්වීමේ දී මේ කල්පයේ බුදුවරුන් තුන්දෙනෙකුගේ බෝරුක්වල දකුණු ශාඛා ගෙනවුත් මෙහි රෝපණය කළ බව දක්වා ඇත. එහි දී කකුසඳ, කොණාගම, කාශ්‍යප බුදුවරුන්ගේ කාලවල පිළිවෙළින් ඕජදීප, වරදීප, මණ්ඩදීප යන නම්වලින් හැඳින් වූ ලංකාවේ මහාතිත්ථ, මහානාම සහ මහාසාගර යන නම්වලින් හැඳින් වූ උද්‍යානවල එම බුදුවරුන්ගේ බෝ ශාඛා රෝපණය කර තිබේ (ඉලංගසිංහ 2007:200-208). තව ද බුදුන්ගේ පළමු ලංකාගමනය පිළිබඳ විස්තරයේ දී යක්‍ෂයන් අතර ඇතිවීමට ගිය සටනක් වැළැක්වීමට ලංකාවේ ගං ඉවුරක යොදුන් තුනක් දිග යොදුනක් පළල මහානාගවන උද්‍යානයේ වූ සංග්‍රාම භූමියට වැඩම කළ බව දක්වා තිබේ (ඉලංගසිංහ 2007:114). මේ තොරතුරුවලින් පැහැදිලි වන්නේ විජයාගමනයට පෙර ශ්‍රි ලංකාවේ උද්‍යාන සංකල්පය බිහිවී තිබූ බවයි.

මහානාග උද්‍යානය මෙන් ම මෙරට පැවති තවත් උද්‍යාන කිහිපයක් පිළිබඳ ව දේවානම්පියතිස්ස රාජ්‍ය සමය පිළිබඳ විස්තරයේ දී හමුවේ. දේවානම්පියතිස්ස රජ සමයේ (ක්‍රි.පූ.250-210) මහින්දාගමනයෙන් පසු මිහිදු මහරහතන් වහන්සේගේ ධර්ම දේශනා ශ්‍රවණය සඳහා පැමිණි ජනයාට මාළිගාව සහ ඇත්හල පිහිටි පෙදෙස අවකාශය මද වූ හෙයින් නගරයේ දකුණු දොරටුවෙන් බැහැර පිහිටි අතුරු සිදුරු නැති ගණ සෙවණැලි ඇති තණනිල්ලෙන් ගැවැසී ගත් උස්ව වැඩුණු මුදු පහස දෙන තණ බිම් සහිත වූ නන්දන නම් රාජ්‍ය උද්‍යානයෙහි අසුන් පැනැ වූ බව විස්තර වේ (ඉලංගසිංහ 2007:98). නගරයට වඩාත් නුදුරු නොළං වූ මහමෙව්නා උයන හෙවත් මහාමේඝවන උද්‍යානය මෙරට තවත් සුවිශේෂී උද්‍යානයකි. මෙරට ප්‍රථම බෞද්ධ ආරාමය වූයේ මෙම උද්‍යානය වන අතර දෙවනපෑතිස් රජුගේ පියා වූ මුටසිව රජු "නමට ගැළපෙන සිසිල් සෙවණැලි ආදී උද්‍යාන ගුණයෙන් අනූන ඵල මල් බර රුක්වලින් සැදි මහාමේඝ උද්‍යානය කරවූ බව මහාවංසයේ සඳහන් වේ (ඉලංගසිංහ 2007:182).

රාජකීයයන්ගේ සුඛ විහරණය සඳහා පැවති නගරය ආසන්න ව ම වූ මහාමේඝවන උද්‍යානය සඟසතු කර පූජා කිරීමෙන් අනතුරු ව වෙනත් රාජකීය උද්‍යානයක අවශ්‍යතාව පැන නැගෙන්නට ඇත. ඒ සඳහා රන්මසු උයන දේවානම්පියතිස්ස රජතුමා ඉදිකරවූ බව පැවැසුව ද එය සනාථ

[1] *පුරාවිද්‍යා නිලධාරී,*
*මහා විහාර ව්‍යාපෘතිය,*
*මධ්‍යම සංස්කෘතික අරමුදල*
rasal.abadeniya@gmail.com


කිරීමට අවශ්‍ය සාධක හමු වී නැත. නමුත් මෙරට උද්‍යාන සංකල්පයේ ජීවමාන සාධකයක් වශයෙන් රන්මසු උයන ගත හැකි ය. අක්කර 40 ක පමණ භූමි භාගයක පැතිරී පවතින මෙම උද්‍යානය පවතින ප්‍රදේශය උතුරින් මිරිසවැටිය ද දකුණින් වර්තමාන ඉසුරුමුණිය නමින් හැඳින්වෙන විහාරයට ද බටහිරින් තිසා වැවට ද මායිම් වේ.

රන්මසු උයන "මඟුල් උයන" යනුවෙන් හැඳින්වෙන අතර රජතුමාට අයත් උයන යන්න ඉන් අර්ථගැන්වී ඇත. මඟුල් උයන පිළිබඳ මාර්ටින් වික්‍රමසිංහ දක්වන්නේ මෙසේ ය.

> මඟුල් උයන වනාහි පැරණි සිංහලයන්, කෙලෙසුන් තැවූවන් පමණක් නොව ඉන්ද්‍රියයන් පිනවමින් කෙලෙසුන් වැවූවන් ද බව කියන්නකි. සිංහල කවීන් වර්ණනා කළ උයන් දිය කෙළිය ලක්දිව නාගරිකයන්ගේ ජීවිතයෙහි ම අංගයක් වූ බව මේ මඟුල් උයනෙන් දත හැකි ය. කවීන් වර්ණනා කළ දිගුවිල්, ගල් තලා, පොදවැසි මඩු, ගිමන් මැඳුරු, සිරිඟර විමන් ආදියේ නටබුන් මේ මඟුල් උයනෙහි අද ද දැකගත හැකි ය (දිසානායක 2017:64).

ජනප්‍රවාදයේ සඳහන් වන ආකාරයට දුටුගැමුණු රජුගේ පුත්‍ර සාලිය කුමරුට අශෝකමාලා නම් සැඬොල් තරුණිය මුණගැසී ඇත්තේ මෙම රන්මසු උයනේ දී ය. වංසකථාවේ සාලිය කුමරු ඉසුරුමුණි විහාරයට ගොස් සිල් සමාදන් වීම ආදී කටයුතු කළ බවත් අශෝකමාලා විසූ හෙල්ලෝලී නම් සැඬොල්ගම ඉසුරුමුණි විහාරයට ආසන්න ව පැවැති බවත් සඳහන් වීමෙන් මේ දෙදෙනාගේ හමුවීම රන්මසු උයනේ සිදුවූවා යැයි පැවැසීම සිදුවිය හැකි ය. සිව්වන මිහිඳු රජුගේ වෙස්සගිරි (ඉසුරුමුණි) පුවරු ලිපියෙහි සඳහන්වන ආකාරයට තිසා වැවෙහි සිට ඉසුරුමෙණු බෝ උපුල්වන් කසුබගිරි විහාරය අවට වූ කුඹුරුවලට ජලය ගෙනයාමේ දී ජලය සැපයිය යුතු ස්ථාන අතර රන්මසු උයන දක්වා ඇත (මල්සිරි 2013:53).

උද්‍යාන සංකල්පය ශ්‍රී ලාංකිකයන්ට නවමුවක් නොවන බවට වංසකථා තොරතුරු අධ්‍යයනයේ දී පැහැදිලි වන අතර ඒ ඇසුරින් රන්මසු උයන ද නිර්මාණය කරන්නට ඇතැයි සිතිය හැකි ය. වෘක්ෂලතාවන්ගේ සහ අලංකාර ගොඩනැගිලි, පොකුණු ආදීන්ගෙන් යුක්ත ව පරිසරය ක්‍රමානුකූල ව සකස් කිරීම උද්‍යානවල දැකගත හැකි ය. මෙම උයන්හි විශේෂ ලක්ෂණ පැරණි ඉන්දියාවේ රාජකීය උද්‍යාන සමඟ සැසඳීමක් කළ හැකි ය. ඉන්දියානු රාජකීය උද්‍යාන මානෙල් මල් වගාවට හා ස්නානයට පොකුණු නිර්මාණය කිරීම, කෘත්‍රිම කඳු ගුහා, මල් පාත්ති, ලතා මණ්ඩප, කද ලී ගෘහ, දෝලා මණ්ඩප, චිත්‍ර ශාලා, විශ්‍රාම ශාලා, බිසෝවරුන් උදෙසා ප්‍රමද වන ආදී ලක්ෂණවලින් යුක්ත වී ඇත (සෙනවිරත්න 2002:191). රන්මසු උයන නිර්මාණය කිරීමේ දී ගෘහනිර්මාණ ශිල්පීන් අවට විසිර පැවැති පර්වත මනාව භාවිත කළ බව පෙනේ. අසල පිහිටි පර්වත දෙකක් යා කරමින් ගල් පුවරු අතුරා ඒ මත ගොඩනැගිලි ඉදිකර තිබූ බවට සාධක ද අද ද දැකගත හැකි ය. එම ගොඩනැගිලි හුණු බදාම යොදා පිරියම් කර තිබූ බවට ද සාධක ශේෂ වී ඇත.



**ඡායාරූප අංක 01**
**පර්වත දෙකක් යා කරමින් ගොඩනැගිලි ඉදිකර තිබූ ආකාරය**

මෙම ගල් කුළ දෙපස ස්නානය සඳහා ඉදිකළ පොකුණු දෙකකි. ඉන් උතුරු දෙසින් පිහිටි පොකුණ අඩි 34x29 ප්‍රමාණයෙන් යුක්ත ය. බටහිර කොටස කාමරයක් ආකාරයට ඇති අතර එය අඩි 7x6 ප්‍රමාණයේ ආසනයක් ද සහිත ගෘහයකි. මෙම ගෘහය 'ධාරා ගෘහය' යනුවෙන් හැඳින්වෙන අතර එය ජල ක්‍රීඩා කිරීම සඳහා යොදාගත් බව මතයයි. මෙහි ඉදිකිරීම් සඳහා ස්ඵටික හුණුගල් භාවිත කර ඇති අතර ජලයේ උෂ්ණත්වය ආරක්ෂා කිරීමට මෙම උපක්‍රමය යොදාගන්නට ඇත. පර්වතයට දකුණු පසින් ද මෙවැනි ම ගෘහයක් සහිත පොකුණකි. මෙම පොකුණේ ගෘහය සහිත කොටසට ඉහළින් ගඩොලින් කිසියම් ඉදිකිරිමක් කර තිබූ බවට සාධක දැකගත හැකි අතර එහි වූ ජල පිහිලි තුනකින් ගලා ආ ජලය ගෘහයෙහි වහල මට්ටමින් පොකුණට වැටෙන්නට සලස්වා ඇත. ගෘහයෙහි ඇතුළත සිටින්නන් නොපෙනෙන ආකාරයට තිරයක් සේ පහළට ජලය ඇදවැටෙන්නට ඇත.



**ඡායාරූප අංක 2**
**වහලයට ඉහළින් ජලය වැටෙන්නට ඇතැයි සිතිය හැකි සිදුරු**

මෙම පොකුණුවලට ජලය පිරවීමට සහ පිට කිරීමට ඇති සූක්ෂ්ම ශිල්ප ක්‍රම පැරණි වාරි තාක්ෂණයේ විශිෂ්ටතාව නිරූපණය කරයි. තිසා වැවේ සිට ගඩොලින් තැනූ ජල කාණු මඟින් පොකුණු දක්වා ජලය රැගෙන ආ බවට සාධක අද ද දැකගත හැකි අතර එම කාණු පද්ධතිය අඩි 2650ක් පමණ දිගැති ය.



**ඡායාරූප අංක 03**
**ගඩොලින් ඉදිකර ඇති කාණු පද්ධතිය**

මෙම ජල කාණුවෙන් පොකුණුවලට ජලය ලබාගෙන ඇත්තේ උමං ජල මාර්ගවලිනි. ජල කාණුව හරහා ඉදිකළ කුඩා සොරොව්වක් අද ද දැකගත හැකි ය. ඒ හරහා ලබාගන්නා ජලය උමං මාර්ගයක් ඔස්සේ පොකුණුට ලබාගෙන ඇත. ප්‍රධාන පොකුණෙහි දැකගත හැකි සිදුර සහ කුහරය උමං මාර්ග ඔස්සේ ජලය ලබාගත් සහ පිටකළ බවට කදිම නිදසුන් ය.




**ඡායාරූප අංක 04**
**පොකුණට ජලය ලබාගත් සහ පිට කළ බවට ඇති සිදුරු**

කැටයම් සහිත ගල් පර්වතය මත හාරා සකස් කර ඇති ජල කාණු මඟින් පර්වතයෙහි බෑවුම භාවිත කරමින් ජලය ගලා යාමට නිදහස් ජල මාර්ග සැකැසීම සිදුකර ඇත.



**ඡායාරූප අංක 05**
**ජල මාර්ගය හරහා ඉදිකර ඇති සොරොව්ව**




ඡායාරූප අංක 06
**පර්වතය මත ඇති ජල කාණුව**

මෙම උයන්හි පිහිටි පොකුණු එකිනෙක භූගත ව සම්බන්ධ කර තිබීම තවත් සුවිශේෂීත්වයකි. එක් පොකුණක අතිරික්ත ජලය අනෙක් පොකුණට ගලායාමට සැලැස්වීම එහි අරමුණ වී ඇත. රන්මසු උයනේ උමං ජල මාර්ග පද්ධතිය හා පිටත ජල මාර්ග පද්ධතිය ශරීරයේ ඇති ස්නායු පද්ධතිය සේ ක්‍රමානුකූල ව ඉදිකළ බවට එච්.සී.පී.බෙල් කළ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ හෙළ තාක්ෂණික නෛපුණ්‍යතාවයි.





ඡායාරූප අංක 07-08
**දිය අගලෙන් වට වූ ගොඩනැගිල්ල**

මෙම පොකුණුවලට අමතරව උයන්හි උතුරු කෙළවරේ දැකගත හැකි දිය අගලකින් වට වූ ගොඩනැගිල්ල තවත් සුවිශේෂී නිර්මාණයකි. මෙහි ඇතුළත අෂ්ටාශ්‍රාකාර හැඩයේ තවත් කුඩා ගොඩනැගිලි තුනකි. මෙහි භාවිතය කුමක් ද යන්න නිශ්චිත නොවූවත් රාජකීයයන් නිදහස් සුව විඳීම සඳහා භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි ය. මෙම දිය අගල වර්තමානය වනවිටත් ජලයෙන් පිරී තිබෙනු දැකගත හැකි ය.

මෙම පොකුණු ඉදිකිරීමේ දී මනාව ඔප මට්ටම් කරන ලද ගල් පුවරු යොදාගෙන ඇති අතර අලංකාරය වැඩි කිරීමට බොරදම් යෙදීම, ලීස්තර යෙදීම ආදිය සිදුකර ඇත. එසේ ම කුටිවල පියැස්ස ඉදිකිරීමේ දී හරස් කළ ගල් තලාද මත ගල් පුවරු යෙදීමෙන් එය සකස් කර ඇත. එය මෙරට ගොඩනැගිලි ඉදිකිරීමේ තාක්ෂණයේ ඉතා සුවිශේෂී අවස්ථාවක් වශයෙන් ගත හැකි ය.




ඡායාරූප අංක 09-10
ගල් පර්වතය දෙපස ඇති පොකුණු දෙක



ඡායාරූප අංක 11
ගල් තලාද මත ගල් පුවරු අතුරා ඇති ආකාරය

උද්‍යාන සංකල්පය පිළිබඳ ව විමසීමේ දී නිර්මාණ තාක්ෂණය ජල තාක්ෂණය මෙන් ම එහි කලා ශිල්ප ද සුවිශේෂි ස්ථානයක් ගනී. මාර්ටින් වික්‍රමසිංහ දක්වන පරිදි "ගරුඬගල් වැනි ගල් පෝරුවෙන් වැසුණු පතුල් ඇති පොකුණු බිත්ති, වීනිත ලකුණු විසින් නම් අනුරපුරයේ අනික් ගල් කැටයම් පරාදයි. පොකුණු ඉදිරියෙහි නැගී සිටින කුටි, පර්වත හාරා අනතුරු ව සිත් අදින ගල් ටැඹින් උසුලාගත් ගල් වියනින් අලංකාර කරන ලද සුන්දරතම නිර්මාණයකි" (දිසානායක 2017:64). රන්මසු උයනෙහි ධාරා ගෘහය නම් කුටිය සහිත පොකුණෙහි දෙපස ගල් තලාවේ ඇති කැටයම මෙරට කැටයම් කලාවේ අග්‍රගණ්‍ය කැටයමක් සේ ගත හැකි ය. ගල් කැටයමින් දැක්වෙන්නේ නෙළුම් විලක දිය කෙළියේ යෙදෙන ඇත් සමූහයකි. දියෙන් නැගුණු නෙලුම් කොළ සහ මල් අතර

දිය කෙළින ඇතුන්ගේ ජීවමාන ස්වරූපය ඉදිරිපත් කිරීමට කැටයම්කරුවා දක්වා ඇත්තේ සුවිශේෂී දක්ෂතාවකි. මෙම කැටයම හා සමාන කැටයමක් වර්තමාන ඉසුරුමුණි විහාරයේ පොකුණක ද දැකගත හැකි අතර එක ම ශිල්පියා විසින් කරවන ලද්දක් ද විය හැකි ය.




**ඡායාරූප අංක 12**
**පොකුණ දෙපස ඇති ඇත් රූ කැටයම**



**ඡායාරූප අංක 13-14**
**ගල්තලාව මත කැටයම් කර ඇති දිය කෙළින ඇත් රූ**

කැටයම්වලට අමතර ව චිත්‍ර කලාවෙන් ද රන්මසු උයන අලංකාර කර තිබූ බවට සාධක මෙහි ශේෂ ව දැකගත හැකි ය. කදලි ගෘහය නමින් හැඳින්වෙන ගෘහය සහිත පොකුණෙහි කදලි ගෘහයේ බොරදම් ලීස්තර අතර තවමත් ශේෂ ව පවත්නා වර්ණ කොටස් අද ද දැකගත හැකි ය. ගල් පෘෂ්ඨයෙහි සුදුපැහැ බදාමයක් මත ගඩොල් රතු හා කොළ පැහැ ආලේප කර තිබූ බව පෙනෙයි. ඒ අනුව මෙම ගෘහය වර්ණාලිප්තයෙන් අලංකාර කර තිබෙන්නට ඇත.






**ඡායාරූප අංක 15-16**
**වර්ණ කොටස් ශේෂ ව ඇති ආකාරය**

රන්මසු උයනෙහි දැකගත හැකි සුවිශේෂි ම නිර්මාණය වශයෙන් සැලකෙන්නේ සක්වල ගල, තාරකා දොරටුව, සක්වල යතුර, සක්වල චක්‍රය ආදී නම්වලින් හැඳින්වෙන සංකේත 53 ක් සහිත ශිලාමය පසුතලයක ඇති චක්‍රයකි.



**ඡායාරූප අංක 17**
**සංකේත සහිත චක්‍රය**



අංක 34 ලෙනේ සටාර් ගේට් යැයි සලකන නිර්මාණය ඇසුරින් කරලන ලද චිත්‍රයක් (අන්තර්ජාලය ඇසුරින්)

මෙහි විෂ්කම්භය මීටර් 1.8 කි. කටාරම් සහිත ගල් ලෙනෙක පිටුපස මෙම කැටයම දැකගත හැකි අතර මෙම චක්‍රයෙහි පිට ම වටයේ දියෙහි වාසය කරන සතුන්ගේ රූප 20කි. ඒ අතර මාළුවන්, ඉබ්බන්, දියබරියන්, බෙල්ලන්, කැස්බෑවන්, කකුළුවන් පමණක් නොව මුහුදු අශ්වයන්, මුහුදු සිංහයන් වැනි සත්ව විශේෂ ද වෙති. චක්‍රය ඇතුල සිරස් අතට යන රේඛාවලින් පේළි දොළහකට වෙන් කර ඇත. මධ්‍යයෙහි හතරැස් කොටුවක් තුළ එකවටා යන චක්‍ර හතකි. එවැනි ම සංකේතයක් චක්‍රයේ වයඹ දිශාවෙන් ද ඇත. චක්‍රය පුරා ම එක හා සමාන කුඩා චක්‍ර 22 ක් ඇති අතර ඒ සෑම එකක් ම කතිරයකින් කොටස් හතරකට වෙන් කර ඇත. චක්‍රයෙහි දෙපස පිට වළල්ල ආසන්නයෙන් අඬ සඳක් වැනි කවයක් ඇති අතර එහි ඇතුළත කුඩා චක්‍රයයි හින්දු කොවිල්වල ඇති ආකාරයට ලිංගයක් සහ යෝනි සංකේතයක් දැකගත හැකි ය. සමස්තයක් ලෙස ගතහොත් මෙහි සංකේත 53ක් ඇති අතර මේ අසල ඇති සෙල්ලිපියක බ්‍රාහ්මී අක්ෂරයෙන් "පනති පනශ" යනුවෙන් ඇති සටහන සමඟ ද එය මනාව ගැළපෙන බව පෙනෙයි. මෙම චක්‍රයෙන් නිරූපණය වන්නේ කුමක් ද යන්න පිළිබඳ ව විවිධ අදහස් ඉදිරිපත් වී ඇති අතර එච්.සී.පී බෙල් මහාමේරුව සහ සප්ත සාගරය බවත් ඉන් ලෝකය නිරූපණය වන බවත් දක්වා ඇත. ඩබ්.යූ.ඒ. ද සිල්වා මෙය කුවේර මණ්ඩලය බව දක්වයි. මාර්ටින් වික්‍රමසිංහයන් දක්වන්නේ මෙය තාන්ත්‍රික ගුප්ත චක්‍රයක් බවයි. සෙනරත් දිසානායකට අනුව මින් කසිණ මණ්ඩලයක් නිරූපණය වේ. වඩාත් ජනප්‍රිය අදහස වන්නේ මෙය විශ්වයේ ස්ථාන දෙකක් අතර ගමන් කිරීමට යොදාගත් විශ්ව දොරටුවක් හෙවත් තාරකා දොරටුවක් යන්නයි. එය කෙසේ ද යන්න නිශ්චිත සාධක ඉදිරිපත් නොවූවත් රාවණ යුගය හා සම්බන්ධ කරමින් මෙය විශ්ව දොරටුවක් යන්න ජනප්‍රිය වී ඇත. තාරකා දොරටු වශයෙන් සැලකෙන ස්ථාන කිහිපයක් ලෝකයේ දැකගත හැකි අතර ඒ සෑම ශිෂ්ටාචාරයක් ම මේ වන විට බිඳ වැටී ඇත. මිසරයේ දොන් හැතෝර් දේවස්ථානයේ සිවිලිමක ඇති චක්‍රාකාර සටහන, දකුණු පේරු රාජ්‍යයේ නැස්කා කාන්තාරයේ ඇති රේඛා සටහන්, සුමේරියාන් සිප්පාර් දේවස්ථානයේ ලෝක සිතියම වශයෙන් ගැනෙන මැටි පුවරුව, ටිටිකාවිල අසල ඇති ගල් දොරටුව හා කුහරය, බ්‍රිතාන්‍යයේ ස්ටොන්හෙන්ජ්, බොලීවියාවේ සූර්ය දොරටුව එවැනි විශ්ව දොරටු වශයෙන් ප්‍රසිද්ධ ස්ථාන වේ.

මේ සියලු කරුණු සලකා බලන කල රන්මසු උයන මෙරට උද්‍යාන කලාව තුළ සුවිශේෂී ඉදිකිරීමක් වශයෙන් ගත හැකි ය. සේනක බණ්ඩාරනායකට අනුව මුළු මහත් ආසියාවේ ම ක්‍රි.ව 1000 ට පෙර කාලයේ ඉදිකර මේ වන විටත් හොඳ මට්ටමින් සුරකි තිබෙන පැරණි උද්‍යාන ඇත්තේ දෙකකි. එනම් 5 වන ශත වර්ෂයට අයත් සීගිරිය හා 10 වන ශතවර්ෂයට අයත් රන්මසු උයනයි.

### මූලාශ්‍රය


අමරවංස, අකුරැටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර. (1994). **වංසත්ථප්පකාසිනී**. කැලණිය විශ්ව විද්‍යාලයඃපාලි සහ බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය, .

ඉලංගසිංහ, මංගල. (2007). **සවිස්තර මහාවංස අනුවාදය (පළමු කොටස)**. කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුලතුංග, ටී.ජී. (2018). **අනුරාධපුර මහාවිහාරය**. නුගේගොඩඃ සී/ස සරසවි ප්‍රකාශකයෝ.

පරණවිතාන, සෙනරත්. 2001, **පුරාවිදු පරියේසණ**. බොරලැස්ගමුවඃ විසිදුණු ප්‍රකාශකයෝ.

මල්සිරි, ඉසංඛ. (2011). **ඉසුරුමුණිය සහ වෙනත් ලිපි**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, ජේ.බී. (2017). **ඉසුරුමුණි රජමහ වෙහෙර**. සුමිත ප්‍රකාශකයෝ.

රණවැල්ල, සිරිමල්. (2004). **සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සුමංගල හික්කඩුවේ සහ දේවරක්ෂිත බටවුන්තුඩාවේ. (2006). **මහාවංසය (ප්‍රථම භාගය).** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෙනෙවිරත්න, අනුරාධ. (2002) **පුරාණ අනුරාධපුරය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ,

හෙට්ටිආරච්චි, ඩී.ඊ. (1970) **සිංහල විශ්වකෝෂය 4 වන බාණ්ඩය (සංස්).** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

# කොක්එබේ මෙගලිතික සුසානය ආශ්‍රිත නව සොයා ගැනීම් හා තදාශ්‍රිත ප්‍රදේශයේ මානව ජනාවාසකරණය

**මහාචාර්ය ඩී. තුසිත මැන්දිස්[1]**

මධ්‍ය යාන්ඔය නිම්නයට ආශ්‍රිත ව මානව ජනාවාසකරණය පිළිබඳ ව තතු විමර්ශනය කිරීමේ දී එම නිම්නයේ ආරම්භක මානව පැලපදියම් වීම මධ්‍ය ශිලා යුගයේ (Mesolithic period) සිදුවන බව දැනට සිදුකර ඇති මූලික ගවේෂණවලින් තහවුරු කර ගෙන තිබේ. සිරාන් දැරණියගල මධ්‍ය යාන්ඔය නිම්නයේ කොක්එබේට නුදුරු සංගිලිමලෙයි කන්දේ ඇති ලෙනකින් හා කොක්එබේ ප්‍රදේශයේ ම පිහිටන වවුල් ලෙන ආශ්‍රිත ව එම සාධක පවතින බව උපකල්පනය කර තිබේ. මධ්‍ය යාන්ඔය නිම්නයේ වර්ග කිලෝමීටර් 1400ක හූ වපසරිය තුළ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන ස්ථාන 26 ක්, කාල රක්ත වර්ණ මැටි මෙවලම් හමුවන ස්ථාන හයක් පමණ පවතින බව මේ වන විට වාර්තා කර ඇත. ඒ අතරින් පූර්ව ඓතිහාසික සංස්කෘතියට අයත් සුසාන ස්ථාන රාශියක් වාර්තා වී තිබෙන අතර ඒවා වඩිගවැව, ගුරුගල්හින්න, කොක්එබේ, රඹෑව, තම්මැන්නාගොඩැල්ල, වළහවිද්දවැව, දිවුල්වැව, මරදන්මඩුව, පරංගියාවාඩිය ආදී ස්ථානවල ස්ථාන ගත වී ඇත. අනුරාධපුර නගරයෙන් නැගෙනහිර දිශාවට පූර්ව ඓතිහාසික සංස්කෘතිය විහිදීම පිළිබඳව විමර්ශනයේ දී එම තත්ත්වය ක්‍රි.පූ. 800 දක්වා ඈතට දිවෙන බව මෑතක දී කොක්එබේ මෙගලිතික සුසානය ආශ්‍රිත ව සිදුකරන ලද පර්යේෂණවලින් තහවුරු කරගෙන තිබේ. එම සුසානයෙන් ලැබී ඇති කාලනීර්ණ ශ්‍රී ලංකාවේ මෙගලිතික සුසානයකින් මෙතෙක් ලැබී ඇති පැරණිතම කාලනීර්ණය වේ.

ආර්. ඩබ්. ලීවර්ස් 1885, රාජා ද සිල්වා සහ එස්. කේ සිත්‍රම්පලම් 1965/66, සුදර්ශන් සෙනෙවිරත්න 1984, රංජිත් දිසානායක 2013, තුසිත මැන්දිස් 2016 ආදී විද්වතුන් මධ්‍ය යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික යුගය ආශ්‍රිත ව සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණ පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී මධ්‍ය යාන්ඔය නිම්නයට අයත් වර්ග කිලෝමීටර් 1400 හූ වපසරිය තුළ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන ස්ථාන 26 ක් කාල රක්ත වර්ණ මැටිමෙවලම් හමුවන ස්ථාන 6 ක් පමණ පවතින බව වාර්තා කර තිබේ (Nicholas 1963; ASCAR 1963; Senaviratne 1984; මැන්දිස් 2016; Dissanayake 2018). හොරොව්පොතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් කොක්එබේ ප්‍රදේශයේ මානව ජනාවාසකරණය සම්බන්ධ ව පර්යේෂණ 1960 දශකයේ දී පමණ ආරම්භ වේ. 1963 වර්ෂයේ දී සී. ඩබ්. නිකලස් මෙම ප්‍රදේශයේ ගවේෂණය සිදුකර ඇත (Nicholas 1963). ඉන් අනතුරු ව රාජා ද සිල්වා සහ එස්. කේ සිත්‍රම්පලම් කොක්එබේ මෙගලිතික සුසානය ආශ්‍රිත ව ගවේෂණය කර එහි මෙගලිතික සුසාන 200 පමණ පවතින බව හඳුනාගෙන ඇති අතර රාජා ද

[1] අධ්‍යයනාංශ ප්‍රධාන,
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

සිල්වා සුසාන කිහිපයක් කැණීම් කර ඇත (De Silva 1981). එසේ ම කොක්එබේ ප්‍රදේශය ආශ්‍රිත ව සුදර්ශන් සෙනවිරත්න සිදුකර ඇති පුරාවිද්‍යා පර්යේෂණවල දී අක්කර 10-15 අතර ප්‍රදේශයක ව්‍යාප්තවන ශිලා මංජුසා වර්ගයේ සුසාන මෙගලිතික සුසාන භූමියක් පවතින බව වැඩි දුරටත් පෙන්වා දී ඇත (Seneviratne 1984). රංජිත් දිසානායක විසින් 2012 වර්ෂයේ දී සිදු කරන ලද ගවේෂණවල දී එහි සුසාන 250-300 අතර ප්‍රමාණයක් පවතින බව උපකල්පනය කර තිබේ (Dissanayake 2018). 2016 වර්ෂයේ තුසිත මැන්දිස් හා තවත් අය විසින් එම සුසානය ආශ්‍රිතව සිදු කරන ලද ගවේෂණවල දී එම සුසාන භූමියේ සුසාන 267ක් පවතින බව වාර්තා කර තිබේ (මැන්දිස් 2016).

## කොක්එබේ මෙගලිතික සුසානය ආශ්‍රිත නව සොයා ගැනීම්

2016 වර්ෂයේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය විසින් කොක්එබේ මෙගලිතික සුසාන භූමිය ආශ්‍රිත ව පර්යේෂණ ආරම්භ කරනු ලැබූ අතර, එහි දී මතුපිට සිදු කරන ලද ගවේෂණ අනුව අක්කර 10ක පමණ භූමිය පුරා ව්‍යාප්ත වන ගල් සොහොන් 267ක් පමණ පවතින බව හඳුනාගන්නා ලදී. එසේ ම යථෝක්ත ගවේෂණයේ දී එම සුසාන භූමිය ආශ්‍රිත ව එතෙක් හඳුනාගෙන තිබූ ශිලා මංජුසා සුසාන ආකෘතියට අමතර ව තවත් සුසාන ආකෘති ගණනාවක් පවතින බව මුල්වරට හඳුනා ගන්නා ලදී. ගවේෂණ ප්‍රතිඵල අනුව කොක්එබේ මෙගලිතික සුසාන භූමිය තුළ සුසාන ආකෘති පහක් පවතින බව හඳුනාගෙන තිබේ. එම සුසාන ආකෘති අතර,

i. ශිලා මංජුසා සූසාන ( Cist burial)
ii. ශිලා කේතුක සූසාන ( Cairn heap /Cairn mounds).
iii. ශිලා මණ්ඩල සූසාන ( Cairn circle)
iv. ශිලා පෙළ සූසාන (Allingment)
v. බරණි සුසාන ( Urn pot ) දක්නට ලැබේ (මැන්දිස් සහ තවත් අය 2016 ).

කොක්එබේ මෙගලිතික සොහොන් භූමිය ආශ්‍රිත ව සිදු කළ මූලික ගවේෂණයෙන් පසු ව ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය පරිදි 2016 වර්ෂයේ තෝරා ගත් සුසාන තුනක පර්යේෂණ පුරාවිද්‍යා කැණීම්, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය විසින් සිදුකරන ලදී. එම කැණීම්වල දී හඳුනාගත් භෞතික සංස්කෘතික තොරතුරුවලින් පූර්ව ඓතිහාසික යුගයේ මධ්‍ය යාන්ඔය නිම්නයේ ජීවත් වූ මිනිසුන් විසින් නිර්මාණය කරන ලද විවිධ හැඩයන්ගෙන් යුත් කාල රක්ත වර්ණ මැටි බඳුන් (Black and Red Ware) හා නිල්, කොළ, දුඹුරු ආදී වර්ණයන්ගෙන් නිර්මිත 100කට අධික වීදුරු පබළු හා දළවලින් නිර්මාණය කළ පබළු කිහිපයක් හා කානීලියන්වලින් නිර්මිත පබළු සොයා ගනු ලැබූ අතර එම ද්‍රව්‍ය සියල්ල ම සුසාන තැන්පතු ලෙස සුසාන අභ්‍යන්තරයේ තැන්පත් කර තිබූ ඒවා ය. මෙම සුසාන

ද්‍රව්‍ය (Grave goods) මානව අස්ථි සමග සුසාන බරණි තුළ තැන්පත් කර තිබිණ. සුසාන බරණි අභ්‍යන්තරයෙන් ලබාගත් අඟුරු සාම්පල තුනක් ඇමරිකාවේ මියාමිහි පිහිටි **බීටා ඇනලිටික්** ආයතනයට යවා රේඩියෝ කාබන් කාලනිර්ණ ක්‍රමය අනුව කාලනිර්ණය කරන ලදී. එම අඟුරු සාම්පල සඳහා ලැබී තිබූ කාලනිර්ණ අතර ශිලා මංජුසා සුසානය සඳහා ක්‍රි.පූ 790 (අදින් අවුරුදු 2790), ශිලා පෙළ සුසානය සඳහා ක්‍රි.පූ. 770 (අදින් අවුරුදු 2770) හා ශිලා මංජුසා සුසානය සඳහා ක්‍රි.ව 50 (අදින් අවුරුදු 1967) යන කාලනිර්ණ ලැබී තිබේ. මේ අනුව කොක්එබේ ගල් සොහොන් කනත්ත ක්‍රි.පූ 790 සිට ක්‍රි.ව 50 දක්වා වූ අවම වශයෙන් අඛණ්ඩ ව අවුරුදු 840ක් භාවිත කර ඇති බව මෙම කාලනිර්ණවලින් තහවුරු කරගත හැකි විය. එසේ ම මෙගලිතික සුසානයක් ආශ්‍රිත ව මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමු වූ පැරණිතම කාලනීර්ණය ද මෙය වන අතර අතිශයින් ම වැදගත් වන්නේ යාන්ඔය නිම්නය ආශ්‍රිත පූර්ව ඓතිහාසික යුගයේ සංස්කෘතිය අනුරාධපුරය තරම් ම පැරණි බව මෙම දත්තවලින් හඳුනාගත හැකි වන බැවිනි. පූර්ව ඓතිහාසික සංස්කෘතියට අයත් සුසාන විශාල ප්‍රමාණයක් මධ්‍ය යාන්ඔය නිම්නයේ ස්ථානගත වීම සඳහා ජීවනෝපාය ක්‍රමය (Subsystem Pattern), ලෝහ තාක්ෂණ ශිල්පයේ දියුණුව (Iron Technology), ජනාවාස රටාව (Settlement Pattern), බහු සම්පත් යැපුම් රටාව (Multi Resource use Pattern) බලපාන්නට ඇති බව මෙම පර්යේෂණ අනුව ද පෙන්වාදිය හැකි ය (Senaviratne 1996;මැන්දිස් 2016).

යාන්ඔය මධ්‍ය නිම්නය තුළ ස්ථානගත වන පූර්ව ඓතිහාසික ජනාවාස එම නිම්නයේ ස්ථාවර වීම සඳහා කාලය හා අවකාශය තුළ ගොඩනැගෙන්නා වූ බහුවිධ කාරණා බලපාන්නට ඇත. විශේෂයෙන් ම දැනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ පූර්ව ඓතිහාසික සංස්කෘතියේ පැරණිතම සාධක අනුරාධපුර ඇතුළුපුරය ඇසුරින් හඳුනාගෙන ඇති අතර මෙගලිතික සුසාන ආශ්‍රිත ව පැරණිතම කාලනිර්ණ දැනට කොක්එබේ ප්‍රදේශයෙන් ලැබී තිබේ. එම නිසා කොක්එබේ ප්‍රදේශයේ ජනාවාස අනුරාධපුර ඇතුළුපුරයේ ජනාවාස තරම් ම පැරණි වීමට ඉඩ පවතින බව උපකල්පනය කළ හැකි බැවින් වඩාත් තර්කානුකූල ව පිළිගත හැකි වන්නේ අනුරාධපුරයේ සිට නැගෙනහිර කලාපය දෙසට පූර්ව ඓතිහාසික සංස්කෘතිය ප්‍රසාරණය වීම සිදු වූවාට වඩා සමකාලීන අවධියේ දී මෙම ප්‍රදේශ දෙක තුළ ම ජනාවාසකරණය සිදු වී ඇති බව උපකල්පනය කිරීම වඩාත් සාධාරණවන බව ය. මෙම කාරණා සැලකිල්ලට ගතහොත් පැහැදිලි වන්නේ හැඩගැසෙමින් ඇති සමාජය, එවක පැවති ආර්ථික කරුණු පදනම්කර ගෙන ඇති වන ජනරේඛනයේ ප්‍රසාරණය සමග සාරවත් නිම්නවල වැඩි වශයෙන් මුල්බැස ගන්නට ඇති බව ය. ඒ අනුව යාන් ඔය මධ්‍ය නිම්නය අතිශයින් ම සාරවත් භූමියක් වන අතර එම නිසා ම එම නිම්නයේ පූර්ව ඓතිහාසික යුගය තුළ දී සාර්ව ආකාරයට ජනාවාස වීම සිදුවී තිබේ. දැනට සිදුකර ඇති පර්යේෂණවලට අනුව ක්‍රි. පු. 600-500 කාලය වන විට අනුරාධපුරය නාගරික තත්ත්වයට පත් වී ඇත (Deraniyagala 1992). ඒ අනුව නාගරික ජනාවාසය ලෙස අනුරාධපුරය ඉස්මතු වීමත් සමග එම ජනපදයට අවශ්‍ය ගාමක බලය සැපයීම, ඊට හාත්පස ප්‍රදේශවල විශේෂයෙන් මධ්‍ය යාන්ඔය නිම්නයේ පිහිටුවා ගන්නා පූර්ව ඓතිහාසික ජනපද මඟින් සිදුවීමට බොහෝ ඉඩකඩ තිබේ. මධ්‍ය යාන්ඔය නිම්නය ආශ්‍රිත පූර්ව ඓතිහාසික ජනාවාස සාර්ව ලෙස ගෙන අධ්‍යයනය කර බැලුවහොත් මේ බව මැනවින් පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ ගංගා

නිම්නයක් ආශ්‍රිත ව වැඩි ම පූර්ව ඓතිහාසික යුගයට අයත් ජනාවාස හා සුසාන යාන් ඔය නිම්නය තුළ ස්ථානගත වීම හඳුනාගත හැකි ය.

මධ්‍ය යාන්ඔය නිම්නය තීරණාත්මක වැදගත්කමකින් යුත් සම්පත් ඇති ප්‍රදේශයකි. මෙම ප්‍රදේශය විජයානු සංකීර්ණයට හා උස් භූමි සංකීර්ණයට අයත් අන්තර් භූ කලාපයක පිහිටා ඇත (Cooray 1984). ප්‍රදේශය පුරා හඳුනාගත හැකි ප්‍රධාන පස් වර්ගය රතු දුඹුරු පස (Reddish Brown Earth) වන අතර ඊට අමතර ව ඇලුවියල් පස්වලින් (Alluvial Soil) ද යුක්ත වේ. මෙ වැනි පරිසරයක් තුළ ද හැඩ ගැසෙමින් ඇති එඬේර අවධියක ජීවත් වන ප්‍රාථමික ජන සමාජයක් මුල්බැස ගැනීම සඳහා ප්‍රධාන කාරණා කිහිපයක් බලපා තිබේ. ඒ අතර ප්‍රධාන වශයෙන් ම යාන්ඔය නිම්නය තුළින් හඳුනා ගත හැක්කේ ග්‍රාමීය ජනපද පිහිටුවා ගැනීමට අවශ්‍ය කරන පාරිසරික කරුණු හා ඒ ප්‍රදේශයට ආසන්නතම ස්ථානවල පිහිටන ඛනිජ සම්පත් බව පෙන්වාදිය හැකි ය. මධ්‍ය යාන්ඔය නිම්නය ආශ්‍රිත පූර්ව ඓතිහාසික අවධියේ පුළුල් පරිසරය සැකසී ඇත්තේ හුදෙකලා කඳු කිහිපයකින් යුතු සරුපස සහිත පරිසර පද්ධතියක් තුළ ය. මෙවැනි හුදෙකලා කඳු හෝ ගොඩැලි නිර්මාණය වීම නිසා එම භූමි ආශ්‍රිත ව සමෝච්ඡ විවිධත්වයක් (Contour) නිර්මාණය වී තිබේ. එම නිසා ම මෙවැනි පරිසර පද්ධතිය තුළ ස්වාභාවික භූ පතන (Hollow) නිර්මාණය වීම හඳුනාගත හැකි අතර එම භූ පතන ඊසාන දිග මෝසම් වර්ෂාව සක්‍රීය වීම සමග අහස් ජලය රැඳෙන ස්ථාන බවට පත්වේ. පූර්ව ඓතිහාසික අවධියේ මධ්‍ය යාන් ඔය නිම්නයේ ජනාවාසවල ස්ථානගත වීම පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී මෙවැනි භූ පතන සහිත ස්ථානවල එම ජනාවාස ස්ථානගත වී ඇති බව ගුරුගල්හින්න, කොක්එබේ, තම්මැනාගොඩැල්ල, රබෑව, පරංගියාවාඩිය වැනි ස්ථාන ඇසුරින් දැකගත හැකි අතර ම මධ්‍ය යාන් ඔය නිම්නයට පරිබාහිර ප්‍රදේශ වන ඉබ්බන්කටුව, පොම්පරිප්පුව වාටිකා ස්ථානය යන ස්ථාන තුළින් ද මෙවැනි තත්වයන් හඳුනාගත හැකි ය (සෙනවිරත්න 1996;Senaviratne 1996).

මධ්‍ය යාන්ඔය නිම්නයේ පරිසර පද්ධතිය ආශ්‍රිත ජලයේ උපයෝගීතාවය පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී ද සෑම පූර්ව ඓතිහාසික ස්ථානයක් ආශ්‍රිත ව කුඩා වැවක් වර්තමානයේ දී ද හඳුනාගත හැකි ය. ඒ බව ගුරුගල්හින්න, කොක්එබේ, පරංගියාවාඩිය, තම්මැන්නාගොඩැල්ල, පාලිප්පොතාන, මරදන්මඩුව ආදී ස්ථාන ඇසුරින් දැක ගත හැකි අතර එවක පැවති කුඩා වැව් මේ වන විට බෙහෙවින් වෙනස්වීම්වලට ලක් වී ලොකු කුඩා වී තිබෙන නමුදු පුරාණයේ මෙම වැව් ස්ථාපිත කර ඇත්තේ භූ පතන ඇසුරින් බව හඳුනාගත හැකි ය. ඊසාන දිග මෝසමින් මෙම ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනය මිලිමීටර් 1000-1500 ප්‍රමාණයක් ගන්නා බැවින් මෙවැනි කුඩා වැව් ආශ්‍රිත ව ජලය ගබඩාකර ගැනීමට වැඩි පහසුකමක් සැලසේ. සීමිත කෘෂිකර්මාන්තය හා හේන් ගොවිතැන පවත්වාගෙන ගිය පූර්ව ඓතිහාසික මිනිසුන්ට මෙවැනි කුඩා භූ පතන තරමක් විශාල කර අතින් තැනූ වේලිබැඳ වැවක් සකස් කර ගැනීම සඳහා හැකියාව පැවතියේ ලෝහ තාක්ෂණය මෙම සංස්කෘතියේ ප්‍රධානතම තාක්ෂණය නිසා ය. අතින් තැනූ වේලි බැඳ වැව් නිර්මාණය කර ගැනීම නිසා එමඟින් වියළි සමයෙහි මඩ ගොවිතැන සිදු කරගැනීමට පහසු වේ. යාන්ඔය නිම්නය තුළ ජීවත් වූ පූර්ව ඓතිහාසික ජනතාවට මඩ ගොවිතැනට අවශ්‍ය කරන ඇලුවියල් පස් (Alluvial Soil) යාන්ඔය නිම්න ප්‍රදේශය පුරා ම ව්‍යාප්ත ව පවතී (Cooray 1984). එසේ ම වියළි ගොවිතැන සඳහා

අවශ්‍ය කරන රතු දුඹුරු පස් (Reddish Brown Earth) පුළුල් ව්‍යාප්තියකින් යුක්ත ව මෙම ප්‍රදේශය පුරා හඳුනා ගත හැකි ය. එම නිසා මෙම භූමි ප්‍රදේශය පූර්ව ඓතිහාසික සමයේ දී ආකර්ෂණීය භූමියක් වීම සඳහා ජලය හා පසෙහි උපයෝගීතාව ඍජු ව බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. එසේ ම පූර්ව ඓතිහාසික ජනයා කෘෂිකර්මාන්තයට අමතර ව පශු පාලනය සිදුකළ ජන පිරිසක් ද වූ හ. විශේෂයෙන් ම ගවයා කෘෂිකාර්මික කටයුතුවලට මෙන් ම කිරි හා මස් ලබා ගැනීම සඳහා ද ඇති කිරීම සිදු කරන්නට ඇත. ආරම්භක සමයේ දී එඬේර පිරිසක් වූ මොවුන් පසු ව ස්ථාවර ජනාවාස පිහිටුවා ගැනීම සමඟ යාන්ඔය මධ්‍ය නිම්නය තුළ පශු පාලනය පවත්වා ගෙන යන්නට ඇති බව පැහැදිලි වන්නේ කුළු හරකුන් හීලෑ කරන ජනයා අදටත් මෙම ප්‍රදේශයේ ජීවත්වන බැවිනි. වර්තමානයේ ඔවුන් **මරිකරුවන්** ලෙස හඳුන්වන අතර මරිකරුවා වනය තුළ වසන හීලෑ නොවූ මී ගවයන් සම්ප්‍රදායික ක්‍රමවේද භාවිත කර අල්ලා ගනියි. ගවයන් හීලෑ කර තම කෘෂි කටයුතු හා කිරි ලබා ගැනීම සඳහා යොදා ගැනීම සිදු කරන සිසිර නමැති පුද්ගලයා අදටත් පාලිප්පොතාන ප්‍රදේශයේ ජීවත් වෙයි. වරමන්ද භාවිත කර කුළුමීමා අල්ලා ගැනීමට හැකියාව ඇති වර්තමායේ ජීවත් වන ගැමියෙකි. වර්තමාන යාන්ඔය නිම්න තුළ මී හරක් පට්ටි වශයෙන් ඇති කරන ජනතාව තවමත් ජීවත් වන බැවින් මේ අය අතර මරිකාරකම දන්නා අයවලුන් ඒ නිම්න භූමිය තුළ ජීවත්වීමෙන් සත්ව ගෘහස්තකරණය මැනවින් පැහැදිලි වේ. විශේෂයෙන් ම එඬේර කටයුතු සිදු කිරීමේ දී අධික වර්ෂාව සහිත පරිසරය ඒ සඳහා නො ගැළපේ. යාන්ඔය නිම්නයේ ඇති ස්වාභාවික ජලය රැඳෙන ස්ථාන හඳුන්වන්නේ **එබ** වශයෙනි. **කොක්එබේ** ද මෙවැනි එබක් හඳුනාගත හැකි ය. මිනිසුන් විසින් නිර්මාණය කරන ලද එබ තුළ වර්ෂය පුරා ම ජලය නොසිඳෙන අතර මෙවැනි එබ ගංගාවට ඉහළ සම සමෝච්ඡ රේඛාවක් උපයෝගී කර ගනිමින් නිර්මාණය කරනු ලැබූ නිර්මාණයකි. පූර්ව ඓතිහාසික යුගයේ දී ආරම්භ කළ මෙවැනි නිර්මාණ වර්තමානය දක්වා ම එම ප්‍රදේශවල දක්නට ලැබෙන බව පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති. මෙවැනි එබ අවට ගවයන් ඇතුළු තෘණ වර්ග ආහාරයට ගන්නා සතුන්ට අනගි තෘණ භූමි නිර්මාණය වී තිබෙන අතර අතීතයේ ද මෙවැනි භූමි එම කටයුතු සඳහා වැදගත් වන්නට ඇත (මැන්දිස් 2016). ඒ අනුව මධ්‍ය යාන්ඔය නිම්නය තුළ පූර්ව ඓතිහාසික ජනාවාස පිහිටුවීමේ දී කෘෂි, වාරි හා එඬේර කටයුතු සඳහා යෝග්‍ය පරිසර පද්ධතිය අතිශයින් ම වැදගත් වී ඇති බව පෙන්වාදිය හැකි ය.

මධ්‍ය යාන්ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික ජනාවාස රටාව අධ්‍යයනයේ දී එම ජනපද එම භූමියේ ස්ථානගත වීම උදෙසා ඛණිජ සම්පත්වල පිහිටීම ද බලපා ඇති බව පෙන්වාදිය හැකි ය. ඒ අතරින් ලෝහ සම්පත් යාන් ඔයට ඉතා ආසන්න ප්‍රදේශවල ස්ථානගත වී තිබේ. යකඩ හා තඹ යන ඛනිජ සම්පත් ශ්‍රී ලංකාවේ භාවිතය ආරම්භ වන්නේ පූර්ව ඓතිහාසික අවධියේ දී බව සෙනවිරත්න පෙන්වා දී ඇත. යාන්ඔය මධ්‍ය නිම්නයට ආසන්න ව නිධිගත වී ඇති ඛනිජයක් ලෙස තඹ ලෝහය සේරුවිල ප්‍රදේශයේ දී හමු වේ. 1971 දී ශ්‍රී ලංකා භූ සමීක්ෂණ දෙපාර්තමේන්තුව සේරුවිල සිදුකර ඇති භූ විද්‍යා අධ්‍යයනවලට අනුව මැග්නටයිට් තඹ (Copper Magnetite) සේරුවිල නිධි ගත වී ඇති බව හඳුනා ගෙන තිබේ (Senaviratne 1995). මීට පෙර බ්‍රිතාන්‍ය ජාතික ඩේවි (Davy) ද මැග්නටයිට් පස් සේරුවිල පවතින බව ද හඳුනා ගෙන තිබේ. මෙම මැග්නටයිට් තඹ නිධිය සම්භවය ලබා ඇත්තේ නැගෙනහිර විජයානු සංකීර්ණය හා උස් භූමි සංකීර්ණයට අයත් අන්තර් භූ කලාපයේ ය (Cooray 1984). සේරුවිල භූමි ප්‍රදේශයේ දී මතු පිටට ප්‍රවිෂ්ට වී ඇති මෙම ධනවත් ඛණිජ තීරය

සැතපුම් 250ක් දිගින් යුක්ත ව සේරුවිල සිට හම්බන්තොට දක්වා ම ව්‍යාප්ත වේ (ibid). මෙම ධනවත් ඛනිජ නිධිය තුළ මැග්නටයිට්, රිදී, බිස්මත්, සින්ක්, මයිකා, ක්‍රෝමියම්, නිකල් යන ඛනිජ ද්‍රව්‍යය ද ගැඹුරු කොටස්වල රත්‍රං‍ද පිහිටා ඇත (ibid). සේරුවිල ප්‍රදේශයේ දී මතු පිටට ප්‍රවිෂ්ට ව ඇති මැග්නටයිට් තඹ ටොන් මිලියන හතක් එම භූමියේ මතු පිට මට්ටමේ සිට අඩි 200ක් පොළව අභ්‍යන්තරයට විහිදෙන බව ශ්‍රී ලංකා භූ සමීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කළ පර්යේෂණවලින් තහවුරු කර තිබේ (ibid).


ලෝහ මුල් යකඩ යුගයේ ජනතාවගේ ජීවන පැවැත්මට අදාළ සම්පත් පරිහරණ රටාවේ මූලික අංගයක් වී ඇත. මේ නිසා ම යාන්ඔය නිම්නයෙන් නැගෙනහිර සීමාව තුළ එනම්, කදිරවේලි හා මහින්දපුර ප්‍රදේශයේ සිට මුල් යකඩ යුගයේ ජනාවාස ස්ථානගත වීම ද සිදු වී ඇත්තේ ඉහත කාරණය මුල් කර ගෙන ය (තන්තිලගේ සහ තවත් අය 2016). පූර්ව ඓතිහාසික අවධියේ දී සේරුවිල ලෝහ නිධියේ යපස් පරිහරණය සිදු වී ඇති බව පර්යේෂණ තුළින් තහවුරු කර ඇත. අනුරාධපුර ඇතුළුපුර පූර්ව ඓතිහාසික අවධියට අයත් ජනාවාස ස්තරවලින් හමු වී ඇති ලෝහ අමුද්‍රව්‍යය හා ලෝහ මෙවලම් ආශ්‍රිත ව සිදු කර ඇති රසායනික හා සූක්ෂම මූලද්‍රව්‍ය විශ්ලේෂණයට අනුව එම මෙවලම් නිර්මාණයට භාවිත කර ඇති ලෝහ ඉතා ම සමීප වන්නේ සේරුවිල ලෝහ නිධියේ ලෝහ පස්වලට බව හඳුනාගෙන තිබේ (Senaviratne 1995). මීට අමතර ව ගුරුගල්හින්න, දිවුල්වැව, වඩිගවැව, කොක්එබේ, පාලිප්පොතාන, කදිරවේලි යන මධ්‍ය යාන්ඔය නිම්නයේ පිහිටි සුසාන ස්ථානවල කැණීම් සිදු කර ඇති රාජා ද සිල්වා, රංජිත් දිසානායක, අර්ජුන තන්තිලගේ හා තුසිත මැන්දිස් යන අය එම ස්ථාන ආශ්‍රිත ව යකඩ හා තඹවලින් නිර්මිත පුරාවස්තු හමු වූ බව ප්‍රකාශ කර ඇත (Senaviratne 1984; තන්තිලගේ සහ තවත් අය 2016; මැන්දිස් 2016). මේ පිළිබඳ ව වැඩිදුර අධ්‍යයනය කර ඇති තන්තිලගේ ප්‍රකාශ කර ඇත්තේ 70 දශකයේ කැණීම් සිදු කර ඇති රාජා ද සිල්වා මේවා තඹ ද ලෝකඩ ද යන්න නිශ්චිත ලෙස ප්‍රකාශයට පත්කර නොමැති බවය (Thanthilage 2008:202). මේ අතරින් ගුරුගල්හින්න ආශ්‍රිත ව තඹ උපකරණ ලැබී ඇති බව රාජා ද සිල්වා 1970 වර්ෂයේ වාර්තා කර ඇති බව පෙන්වා දෙයි (Senaviratne 1984:2007). එසේ ම වඩිගවැව ශිලා මංජුසා සුසානයක් ආශ්‍රිත ව යකඩ වාර්තා වී ඇති බව පෙන්වා දී ඇත (Sithrampalam 1982 in Senaviratne 1984). තන්තිලගේ පෙන්වා දී ඇති ආකාරයට ගුරුගල්හින්න ආශ්‍රිත ව වාර්තා වී ඇති ලෝහ මෙවලම් අතර තඹවලින් පමණක් නිර්මාණය කරන ලද ඒවා හමු වී තිබේ. එසේ ම කොක්එබේ, වඩිගවැව, දිවුල්වැව යන ස්ථාන ආශ්‍රිත ව යකඩ හා තඹ යන මාධ්‍ය දෙකෙන් ම නිර්මිත උපකරණ හමු වී තිබේ (Thanthilage 2008:202-203). මෙයට අමතර ව පාලිප්පොතාන සුසානය ආශ්‍රිත කැණීම්වල දී ද තඹවලින් නිර්මිත අංජන කූරු හා යකඩවලින් නිර්මිත කූරු මෙන් ම පිහි තල ද වාර්තා වී තිබේ (මැන්දිස් 2020).

තම්මැන්නාගොඩැල්ල ආශ්‍රිත සුසාන 2013 වර්ෂයේ කැණීම් කළ රංජිත් දිසානායක එම සුසාන තුළ තැන්පත් කර තිබූ රන් පබලු, යකඩවලින් නිර්මිත වළලු කරාබු, ඊතල හා කෘෂි උපකරණ ද තඹවලින් කරනු ලැබූ ඇස් අලංකරණයට භාවිත කරන අංජන කූරු හා වළලු ද හමු වූ බව ප්‍රකාශ කර ඇත (මනමේන්ද්‍රආරච්චි සහ අදිකාරි 2014). ඒ අනුව ක්‍රි.පූ. 800-400 පමණ කාලය වන විට මධ්‍ය යාන්ඔය

නිම්නය තුළ යකඩ හා තඹ කර්මාන්තය මෙන් ම රන් කර්මාන්තයට අදාළ තොරතුරු ලැබීම ඉතා ම වැදගත් වේ. මෙම කාල පරාසය හා අනුරාධපුර ඇතුළුපුර තඹ අමුද්‍රව්‍ය උණු කිරීමට අදාළ ව ලෝහ සම්බන්ධ ව ලැබෙන තොරතුරු 3A ස්තරයෙන් වාර්තාවන අතර විකිරණමාණ දින නියම කිරීම්වලට අනුව එම ස්තරය ක්‍රි.පූ. 600-500 කාලයට අයත් වන බව පෙනේ (Deraniyagala 1972; Senaviratne 1995). ඒ අනුව සමකාලීන අවකාශයක් තුළ මෙම තාක්ෂණය මධ්‍ය යාන්ඔය නිම්නයේ මෙන් ම අනුරාධපුර ඇතුළුපුරයේ ද භාවිත වී ඇති ආකාරය මේ අනුව පෙන්වා දිය හැකි අතර මධ්‍ය යාන්ඔය නිම්නය තීරණාත්මක ලෙස වැදගත් වී ඇති අකාරය ද පැහැදිලි වේ.

මධ්‍ය යාන්ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික සංස්කෘතිය ඇසුරින් හඳුනාගත හැක්කේ මෙගලිතික සොහොන් සංකීර්ණ රාශියක් පමණි. විශේෂයෙන් එම සොහොන් සංකීර්ණවල වපසරිය පිළිබඳ විමර්ශනය කිරීමේ දී ඒ හා සබැඳී ජනාවාස එම ප්‍රදේශය ඇසුරින් තිබිය යුතු ය. සෑම සුසානයක් ආශ්‍රයෙන් ම කුඩා පරිමාණයේ වැවක් දක්නට ලැබෙන අතර වර්ෂා කාලයේ දී මෙම වැව් පිරී ඉතිරී සුසාන සංකීර්ණ ජලයෙන් යට වන අතර එමගින් පැහැදිලි වන්නේ එම වැව් පසුකාලයේ දී විශාල කිරීම්වලට හෝ වෙනස් කිරීම්වලට ලක් වී ඇති බව ය. එසේ ම ජනාවාස ආශ්‍රිත තොරතුරු මේ වන විට නිශ්චිත ව තහවුරු වී නොමැත්තේ එම ප්‍රදේශ තුළ කෘෂි බිම් සකස් කිරීම් හා වැව් ඉදි කිරීම මෙන් ම නව ජනපද ස්ථානගතවීම නිසා යැයි උපකල්පනය කළ හැකි ය. කෙසේ වෙතත් මධ්‍ය යාන්ඔය නිම්නයේ කොක්එබේ මෙගලිතික සුසානය ආශ්‍රිත ව ලැබී ඇති කාලනිර්ණ අනුව මධ්‍ය යාන්ඔය නිම්නයේ දියුණු මානව ජනාවාසකරණය බුදුන් වහන්සේ ලොව පහළවීමට සියවස් දෙකහමාරකට පෙර සිදු වී ඇති බව මෙම පර්යේෂණ අනුව පෙන්වා දිය හැකි අතර මෙම ප්‍රදේශයේ මානව ජනාවාසකරණය අනුරාධපුර පූර්ව ඓතිහාසික සංස්කෘතියට සමකාලීන ව සිදු වීමට බොහෝ ඉඩකඩ පවතින බව මෙම තොරතුරුවලින් තහවුරු වේ.

පූර්ව ඓතිහාසික යුගයෙන් අනතුරු ව මධ්‍ය යාන්ඔය නිම්නයේ ස්ථානගත වන සංස්කෘතිය වන්නේ එම සංස්කෘතියේ ම ප්‍රතිච්ඡින්න පැතිකඩක් වන මුල් ඓතිහාසික (Early history) සංස්කෘතිය වේ. බ්‍රාහ්මණයාගම, නැට්ටුක්කන්ද, හඳගල, රස්නක වැව, කොක්එබේ, විහාර හල්මිල්ලෑවල බෙරවාගම, වලස්කුණු වැව, අලියාකඩ ආදී ස්ථාන ගණනාවක මෙම කාල පරාසයට අයත් මුල් බ්‍රාහ්මී අභිලේඛන හමුවන අතර එම අභිලේඛන ගමික, පරුමක, ගපති, බත, කබර, තබර ආදී ජන පිරිස් පිහිටුවා ඇති අතර ඒවා තුළින් ද ලෝහ කර්මාන්තයට අයත් තොරතුරු **කබර** (යකඩකරු) හා **තබර** (තඹකරුවන්) පිළිබඳ ව තොරතුරු සඳහන් වේ (*Ic*.vol. I,1970). එබැවින් මධ්‍ය යාන්ඔය නිම්නය ප්‍රාග්, පූර්ව හා මුල් ඓතිහාසික යුගයන්හි දී මානව ජනාවාසකරණය සඳහා අතිශයින් ම වැදගත් භූමියක් වන බව පෙන්වාදිය හැකි අතර පූර්ව ඓතිහාසික යුගය එම නිම්නයේ සාර්ව ජනාවාසකරණය පෙන්වන සංස්කෘතික අවධියක් බව වැඩිදුරටත් පෙන්වාදිය හැකි ය.




**කොක්එබේ මෙගලිතික සුසානයේ පිහිටීම**



**කොක්එබේ ශිලා මංජුසා සුසානයේ පියන්ගල ඉවත් කිරීම**



**කොක්එබේ ශිලා පෙළ සුසානයේ කැනීම් අවස්ථා**

## මූලාශ්‍රය


මනමේන්ද්‍ර, ආරච්චි සහ ගාමිණී, අදිකාරි. (2014). **අනුරාධපුර පුරා ජෛව විවිධත්වය හා වර්තමාන ජෛව විවිධත්වය.** කොළඹ : ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය.

මැන්දිස්, ඩී.ටී. (2016). **මධ්‍ය යාන්ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික අවධියේ සුසාන ආශ්‍රිත වාස්තුවිද්‍යාව.** 151-153පිටු. ***The Proceeding of Second Archaeology Research Symposium,*** Mihinthale: Department of Archaeology and Heritage Management, Rajarata University of Sri Lanka,

සෙනෙවිරත්න, සුදර්ශන්. (1996). උත්තර මලය රට්ඨයේ ප්‍රාථමික යකඩ යුගයේ ඛනිජ සම්පත් පරිහරණයේ ඓතිහාසික පුරාවිද්‍යාව, **ඓතිහාසික මහනුවර.** මහනුවර : ශ්‍රී සුමංගල විද්‍යාලයීය බෞද්ධ සංගමය: 184-199 පිටු.

(1996). **පර්යන්ත ප්‍රදේශය හා ආන්තික ප්‍රජාවෝ, ශ්‍රී ලංකාවේ මුල් අයස් සමයේ ද්‍රව්‍ය හා සමාජ සැදුම් පිළිබඳ විකල්ප තේරුම් කිරීමක් කරා.** පේරාදෙණිය විශ්වවිද්‍යාලය: පුරාවිද්‍යා අධ්‍යයන අංශය.

De Silva, R. (1965). *Archaeology Commisioner Annual Report*. Sri Lanka : Department of Archaeology.

(1970). *Archaeology Commisioner Annual Report*. Sri Lanka :Department of Archaeology.

Dissaanayake, R.B. (2018), *Travasing the Megalitic Funarary Landscape, The yan Oya Middle Basing Archaeology Survey*. a, PGIAR, Publication.

Cooray, P.G. (1984). *An Introduction to the Geology of Sri Lanka (*Ceylon), Colombo: National Museums of Sri Lanka.

Nicholas, C.W. (1963). *Historycal Topography of Ancient and Medival Sri Lanka*. (special No. JRASCB,NS,Vol. vi.)

Seneviratne, S. (1984). The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka, ***Ancient Ceylon*** No.5: 237-305 p. Colombo:Archaeological Survey Department,

(1995). The Ecology and Archaeology of the Seruwila: Copper Magnetite prospect North- East Sri Lanka In *Sri Lanka Journal of Humanities*. Vol xxi (1&2):114-146p

(1996). Peripheral Regions and Marginal Communities: Towards an Alternative Explanation of Early Iron age Maternal and social Organization in Sri Lanka *Tradition Dissent and Ideology: Essay in Honor of Romila Thapar*. ed. K. Campakalakshmi and S.Gopal, Delhi: Oxford University Press. 265-312p

(2007)., The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka. *The Art and Archaeology of Sri Lanka.* 135-202p. Colombo: Central Cultural Fund, Ministry of Cultural Affairs.

Thanthilage, A. (2007). *An Archaeo-Metallurgical Investigation of Sri Lankan Historical Bronzes,* Unpublished PhD Thesis.

# ශ්‍රී ලංකාවේ ස්තූප සංරක්ෂණ ඉතිහාසය

වාස්තු විද්‍යාඥ දීපාල් විජේතිලක[1]

ශ්‍රී ලංකාවේ වාස්තුවිද්‍යාත්මක උරුමයන් අතර මුදුන් මල්කඩ ලෙස ස්තූප නිර්මාණය අවිවාදයෙන් නම් කළ හැකි ය. ස්තූප නිර්මාණයේ ඉතිහාසය ප්‍රාග් බෞද්ධ අවධිය දක්වා දිවයයි. එය පෙරදිග අපරදිග පොදු උරුමයක් වන අතර, හින්දු, ජෛන හා බෞද්ධ සම්ප්‍රදායන් ස්තූප ඔවුන්ගේ ගොඩනැගිලි අතර මුල්තැනට ගෙනවිත් ඇත. බුදුන් වහන්සේ ජීවමාන කාලයේ දී ම පිරිනිවි සැරියුත්, මුගලන් අගසව් දෙනමගේ භෂ්මාවශේෂ තැන්පත් කොට බුදුන් වහන්සේගේ උපදෙස් පරිදි ස්තූප තනන ලදී (වික්‍රමගමගේ 1990:11). එලෙස ම සිදුහත් කුමරු මහාභිනිෂ්ක්‍රමණ අවස්ථාවේ කපා දැමූ කෙස් වැටිය නිධන් කොට ශක්‍ර දෙවියන් විසින් තව්තිසා දෙව්ලොව සිළුමිණිසෑය නමින් ස්තූපයක් නිර්මාණය කෙරිණි (විදානපතිරණ 2008:47; බුද්ධවංශටඨකථා:290). එසේ ම බුදුන් වහන්සේට පළමු දානය පිරිනැමූ තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් ද, බුදුන් මුලින් ම ලංකාවට වැඩමකළ අවස්ථාවේ දී සුමන සමන් දෙව්රජු ද උන්වහන්සේගෙන් කේසධාතු ලබාගෙන ඒවා නිධන් කර ස්තූප තනා පිදූ බව විවිධ මූලාශ්‍රයවල සඳහන් වේ (Epigraphia Zelanica 1912: 312-319; වික්‍රමගමගේ 1990:13).

බුද්ධ, ප්‍රත්‍යෙක බුද්ධ, අරහත්ත, චක්‍රවර්ති මහාරාජ යන සතර කොට්ඨාසයට අයත් පුද්ගලයන්ගේ ධාතූන් තැන්පත් කර ස්තූපයන් තැනීමෙන් ඔවුන්ට ගෞරව සම්මාන දැක්වීම සුදුසු යැයි බුදුන් වදාළ බවත් මහා පරිනිර්වාණ සූත්‍රයේ සඳහන් වේ (පරණවිතාන 1963:2). බුදුන් වහන්සේ පිරිනිවන් පෑමට කලින් ආනන්ද හිමියන් විසින් විමසනු ලදුව තමන් වහන්සේ පිරිනිවි පසු මෘතදේහය සක්විති රජ කෙනෙකුගේ මෘතදේහයට මෙන් සලකා ආදාහනය කර සිව්මං සන්ධියක ස්තූපයක් තනා ප්‍රදක්ෂිණා කිරීමෙන්, මල්දම් පැලඳවීමෙන් සුවඳ හෝ සුණු ගැල්වීමෙන් එයට පූජාකරන ලෙස කීහ (වික්‍රමගමගේ 1990:13). මේ අයුරින් බුදුන් ජීවමාන කාලයේ දී ම ඇරඹි බෞද්ධ ස්තූප වන්දනාව බුද්ධ පරිනිර්වාණයෙන් පසුවත් ඉන්දියාවේ හා වෙනත් බුදුදහම පැතිර ගිය බොහෝ රටවල ව්‍යාප්ත වූ අතර ක්‍රි.පූ. 3 වන සියවසෙහි මිහිඳු මාහිමියන් ලක්දිවට බුදුදහම හඳුන්වාදීමත් සමඟින් මෙරටෙහි ද ප්‍රචලිත විය.

ශාසන ඉතිහාසයට අනුව ශ්‍රී ලංකාවේ පළමු ව ඉදිකළ ස්තූප වනුයේ තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් ඉදිකළ ගිරිහඬුසෑය හා සමන් දෙවිඳුන් ඉදිකළ මහියංගණ ස්තූපයයි (පරණවිතාන 1963:4). බුදුදහම ලක්දිවට හඳුන්වාදීමෙන් පසු ව ඉදිකළ ප්‍රථම දාගැබ ලෙස සැලකෙනුයේ දෙවනපෑතිස් රජතුමා (ක්‍රි.පූ. 250-210) විසින් ඉදිකරවන ලද ථූපාරාමයයි. වී ගොඩක හැඩය (ධාන්‍යාකාර) ඇති ව ඉදි කළ එම ස්තූපය සහ මුල් යුගයේ ලංකාවේ තනන ලද ස්තූප තැනීමට යොදාගෙන ඇත්තේ මැටි හා ගඩොල් ය (වික්‍රමගමගේ 1990:126). මෙම හේතුවෙන් කලින්කලට මෙම ස්තූප සංරක්ෂණය

[1] පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
deepalwijet@yahoo.com

කිරීමේ අවශ්‍යතාව පැනනැගිණි. එබැවින් මෙම ස්තූප සංරක්ෂණ කාර්යය ඉටු කිරීම තත්කාලීන රජවරුන්ගේ ආගමික වැඩ අතර ප්‍රධාන කාර්යයක් බවට පත්වී තිබුණි. ආගමික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමෙන් එසේ කරන්නාගේ ආයුෂ වැඩිවන බවට එකල පිළිගැනීමක් ද විය (මහාවංශය 35.75).

කාලයත් සමඟ සිදුවූ ස්තූප නිර්මාණකරණයේ විකාශයත් සමගින් ථූපාරාමය වැනි බොහෝ පැරණි ස්තූපවල මුල් හැඩය හා ලක්ෂණ මුල් ස්වරූපයෙන් වෙනස් වී ඇති බව දක්නට ලැබේ. මුල් යුගයේ දී සාංචි ස්තූපය වැනි ඉන්දීය ස්තූප සම්ප්‍රදායයේ බලපෑමත් සමගින් එක් ඡත්‍රයක සිට ඡත්‍රාවලියක් දක්වා විකාශනය වූ ස්තූප උපරිභාගය පසුකලෙක හතරැස් කොටුව, දේවතාකොටුව සහිත කොත් කැරැල්ලක් හා කොතක් හා ඒ මත පිහිටු වූ සිළුමිණක් දක්වා වර්ධනය වූ අතර ස්තූපයේ පහළ කොටසේ තිබූ සෝපාණ, පාදවේදී, කුච්ඡවේදී, හත්ථිවේදී, මුද්ධවේදී වැනි අංග පසුකලෙක ස්තූප නිර්මාණයෙන් ඉවත් වී ඇති බවත් දක්නට ලැබේ (වික්‍රමගමගේ 1990:49-53). දැවයෙන් කළායැයි සැලකිය හැකි මෙම වේදී (වැට) ඉවත්වීමට ඒවා ඉක්මනින් දිරාපත් වී නැවත යෙදීමට සිදුවීම ද හේතු විය හැකි ය. පැරණි ස්තූප පසුකාලීන ව රජ පැමිණි රජවරුන් ස්වකීය සංරක්ෂණ කාර්යයන්හි දි තත්කාලීන ව පැවැති ස්තූප නිර්මාණ සම්ප්‍රදායට අනුව යමින් ස්වරූපය වෙනස්කරමින් සංරක්ෂණය කර ඇති අතර එහි දී චෛත්‍යය මුල් මිනුම් පමණක් නොව මුල් හැඩය හා ලක්ෂණ ද බොහෝ දුරට වෙනස් වී ඇති අවස්ථා බෙහෙවින් දක්නට ලැබේ.

පැරණි චෛත්‍යය ගරා වැටී විනාශ වී යාම වැළැක්වීමට ඒ වටා ගල්, ගඩොල් වැනි විවිධ ද්‍රව්‍යවලින් කඤ්චුක කරවීම ලක් රජවරුන් විටින් විට සිදුකර ඇත. ලඤ්ජිතිස්ස (ක්‍රි.පූ. 119-109) ථූපාරාම ස්තූපයට සිලා කඤ්චුකයක් කරවී ය (මහාවංශය 23.33). වසභ රජු (ක්‍රි.ව. 65-109) ගලම්බතිත්ථයෙහි ස්තූපයට ඉට්ඨක (ගඩොල්) කඤ්චුකයක් කරවී ය (මහාවංශය 38.85). 1 වන උපතිස්ස රජු ථූපාරාම ථූපයට හේම (රන්) චුම්බට කඤ්චුකයක් කරවී ය (මහාවංශය 34.74). මෙසේ පැරණි ස්තූප ආරක්ෂා කිරීමට සංරක්ෂණ උපාය වශයෙන් ඔවුන් අනුගමනය කර ඇති උපක්‍රමය වඩා වැදගත් වනුයේ පැරණි ස්තූපය හැකිතාක් පවතින තත්වයෙන් ම සුරැකෙන පරිදි මෙමගින් සංරක්ෂණය වන හෙයිනි. කෙසේ වෙතත් මෙම උපක්‍රමය මගින් බොහෝවිට ස්තූපවල මුල් හැඩය වෙනස් වී ඇත. උදාහරණ ලෙස මුල දී ධාන්‍යාකාර ව තිබූ ථූපාරාමය මේ වනවිට දක්නට ලැබෙන්නේ ඝණ්ඨාකාර ස්වරූපයෙනි. මෙම කඤ්චුක සෑදීමේ දී ඒවා කඩා වැටුණු බවට වාර්තා නොවන්නේ එකල සිංහල ඉංජිනේරු ශිල්පීන්ගේ උපදෙස් පරිදි ඒවා සිදුකර ඇති නිසා බව සිතිය හැකි ය.

පැරැන්නන් විසින් ස්තූප අබලන් වී ගරා වැටීයාම වළක්වා ගැනීමට යොදාගත් තවත් ප්‍රමුඛතම සංරක්ෂණ උපක්‍රමයක් වනුයේ එම ස්තූප ආවරණය වන පරිදී ථූපඝර, චේතියඝර යන නම්වලින් හැඳින්වෙන ගොඩනැගිලි ඉදිකිරීමයි. ඇතැම් ථූපඝර ස්තූපය ඉදිකරන අවස්ථාවේ දී ම ඉදිකර ඇති අතර, පැරණි ස්තූප සඳහා පසුකාලීන ව ඉදිකරන ලද ථූපඝර ඒවා සංරක්ෂණයට ගත් ක්‍රියාමාර්ගයන් වශයෙන් දැක්විය හැකි ය. ථූපාරාම හා ලංකාරාම ස්තූපවලට මුල දී ථූපඝර නොවී ය. වසභ රජු (ක්‍රි.ව. 65-109) ථූපාරාම ස්තූපයට ථූපඝරයක් කරවී ය (මහාවංශය 35.87). දෙවැනි අග්ගබෝධි රජු (ක්‍රි.ව. 608-618) ථූපාරාම ථූපයේ වූ අකුධාතුව එයින් ඉවත් කොට ලෝහපාසාදයේ තබා ථූපාරාමයේ

ස්තූපයත්, ධාතුගෙයත් දෙක ම ප්‍රතිසංස්කරණය කරවී ය (චූලවංශය 42. 53-61). දෙවැනි අග්ගබෝධි රජුගේ මෙම ප්‍රතිසංස්කරණයේ දී ස්තූපය වටා පයඞ්කාසන තනවා ඒවා මත බුදුපිළිම 4 ක් තැන්පත් කළ බැවින් මෙම ථූපඝර යන සංකල්පය වෙනස් වී එය ධාතුඝරයක් ලෙස හැඳින්වේ. එසේ වන්නේ ථූපඝරයක තේමාවට අයත් වනුයේ මැද ස්තූපය පමණක් වන අතර මැද ස්තූපයත් එය වටා සතර දිසාවට මුහුණ ලා වැඩහිඳින බුදුපිළිම 4 ක් ද අයත් වන බැවින් එය මහායාන විශ්වව්‍යාපී ධර්මකාය සංකේතවත් කරන පංචධ්‍යානි බුද්ධ මණ්ඩලය ගුරුකොටගෙන ඉදිරිපත් කරන ලද නව තේමාවක් වීමෙනි (වික්‍රමගමගේ 1990:129). මේ අනුව පැරණි සංරක්ෂණ කාර්යයවල දී ස්තූපවල මූලික සංකල්පමය හා තේමා වෙනස්වීම් ද සිදු වී ඇති බව පැහැදිලි වේ. මේ ආකාරයට ගත්කල ස්තූපවලට ආදී කාලීන මැදිහත්වීම්වල දී ස්තූපය තිබූ ස්වරූපයෙන් ම එම ලක්ෂණ ආරක්ෂා වන සේ සංරක්ෂණය හෝ එයට තත්කාලීන නවාංග එක්කරමින් ප්‍රතිසංස්කරණය යන දෙයාකාරයේ ම ක්‍රියාදාමයක් දක්නට ලැබේ. පැරණි ස්තූපය ඒ ආකාරයෙන් ම සංරක්ෂණය තුළින් එහි තේමාව, සැලැස්ම, ශිල්පක්‍රම හා ද්‍රව්‍ය සංරක්ෂණය වේ. මැටියෙන් සකස් කරන ලද මුල් ස්තූප මත ස්වභාවධර්මයාගේ බලපෑමෙන් සිදුවන හානි මෙතුළින් වළක්වා ගැනීම සිදුවිණ. කෙසේ නමුත් මෙම සංරක්ෂණ ක්‍රමය යොදාගත හැකිවූයේ ප්‍රමාණයෙන් කුඩා ස්තූපවලට පමණි. තත්කාලීන වෙනස්කිරීම් සහිත ව ප්‍රතිසංස්කරණ කිරීමෙන් පසු එම ප්‍රතිසංස්කරණය සිදුකරන ලද අවධියේ පිළිගැනීම්වලට අදාළ තේමා, ශිල්පක්‍රම හා ද්‍රව්‍ය එක්කර ගැනීමක් සිදුවේ. කෙසේ වෙතත් මෙම සිද්ධීන් දෙක ම අතීතයේ සිදු වූ ලෙස සලකා බැලීමේ දී අතීතයේ යුග දෙකක් පිළිබඳ ව තොරතුරු ඇතැම් විට ඒ තුළින් ස්මාරකයට එකතු වීමෙන් ද එයට වටිනාකමක් එක් වී තිබෙන බව පැවසිය හැකි ය. ප්‍රතිසංරක්ෂණය කරන කාලයේ ස්තූපවල පවතින තේමා, සැලසුම්, ද්‍රව්‍ය ආදී දෑ එම කාලය තුළ දී නිර්මාණය කරන අළුත් නිර්මාණවල අන්තර්ගතවන බැවින්, තත්කාලීන තොරතුරු ගෙන ඒමට මෙතුළින් විශාල සේවයක් සිදුවූවායැයි කිව නොහැකි ය.

ලංකාවේ විශාලතම ස්තූප වන මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය හා ජේතවන ස්තූපවල දී මුල දී වූයේ හතරැස් ගරාදිවැට හා එය මැදින් පිහිටු වූ ඡත්‍ර දණ්ඩ හා ඡත්‍රයයි. 12 වන සියවසේදී 1 වන පරාක්‍රමබාහු රජු විසින් මේ ස්තූප සංරක්ෂණය කරන ලද අවධිය වනවිට ස්තූපයේ මුදුනේ හතරැස් ඝනයක්, දේවතාකොටුව, කොත්කැරැල්ල හා කොතක් යෙදීම ජනප්‍රිය වී තිබුණි. ඒ නිසා එම ජනප්‍රියත්වය අනුව එම ස්තූප තුන ප්‍රතිසංස්කරණය කර තිබේ. එසේ කිරීම නිසා ඒ ස්තූප දොළොස්වන සියවස් කාලයේ ස්තූප මෙන් විය (වික්‍රමගමගේ 1990 : 130).

වංසකතා පරිශීලනයේ දී රජවරුන් විසින් විවිධ ස්තූප සඳහා සිදුකරන ලද නොයෙකුත් මැදිහත්වීම් පිළිබඳ තොරතුරු දැකිය හැකි ය. අළුතින් ම අංග එකතු කිරීම හෝ පවතින අංගවල වෙනස් කිරීම් සිදුකිරීම හැර තිබෙන ආකාරයට ම ස්තූපවල විවිධ අංග අළුත්වැඩියා කර සංරක්ෂණය කිරීම් පිළිබඳ තොරතුරු ඒ අතර දක්නට ලැබීමෙන් පෙනීයන්නේ එකල බොහෝ රජවරුන් පුරාණ ස්මාරක ආරක්ෂා කිරීමේ ඔවුන්ගේ වගකීම දිගින් දිගටම ඉටුකර ඇති බවයි.

කණිට්ඨතිස්ස රජතුමා (ක්‍රි.ව. 167-186) අභයගිරි විහාරයේ මණිසෝම පිරිවෙනේ චේතියඝරය ද අම්බස්ථලයෙහි චේතියඝරය ද, නාගදීපයෙහි චේතියඝරය ද ප්‍රතිසංස්කරණය කරවී ය (මහාවංශය

36. 8-9). මෙහි දී සිදුවී ඇත්තේ අළුත් අංග කරවීමක් නොව කැඩුණු කොටස් අළුත්වැඩියා කරවීමයි. කණිට්ඨතිස්ස රජු අභයගිරි විහාරයේ දක්ඛිණ මූල ආරාමයේ ද, මිරිසවැටි විහාරයේ කුලාලතිස්ස ආරාමයේ ද කල්‍යාණි විහාරයේ ද ථූපවල ඡත්‍ර කරවී ය (මහාවංශය 36. 33-35) යන්නෙන් අදහස් වන්නේ ද එම ස්තූපවල මුලින් තිබූ ඡත්‍ර විනාශ වී ගිය පසු නැවත අලුතින් ඒවා කරවීමයි (වික්‍රමගමගේ 1990:131).

ලංකාවට බුදුදහම හඳුන්වා දුන් දින සිට අද දක්වා ම ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික ගොඩනැගිලි ඒවා පවතිනුයේ සර්ව සම්පූර්ණ ව ද නැතිනම් නටබුන් වශයෙන් ද යන්න නොසලකා ලාංකේය බොදුනුවන්ගේ නොමඳ ගරු බුහුමනට පාත්‍ර වෙමින් පවතී. මෙය ජීවමාන උරුමය (Living Heritage) ලෙස හඳුන්වනු ලැබේ. පැරණි යුගයේ දී ද ස්තූප සංරක්ෂණයේ දී ඒවා ජීවමාන ස්මාරක ලෙස සලකා කටයුතු කරන්නට ඇත. එබැවින් එම සංරක්ෂණ හා නඩත්තු මැදිහත්වීම්වල දී වඩාත් මූලික වන්නට ඇත්තේ ඒවායේ පූජනීය අගයට අගෞරවයක් හෝ හානියක් සිදුනොවන ආකාරයට මෙම කටයුතු සිදු කිරීමයි. මෙම පරමාර්ථය ම ඓතිහාසික ස්මාරකවල ඓතිහාසිකත්වය රැක ගැනීමෙහි ලා බෙහෙවින් පාදක වන්නට ඇතැයි සිතිය හැකි ය. මෙබඳු මැදිහත්වීම්වල දී කිසියම් වෙනස් කිරීමක් සිදුකළ ද ඒවා සිදුකරන්නට ඇත්තේ ස්මාරකයටත් එහි අන්තර්ගත ආධ්‍යාත්මික අර්ථයටත් වැඩි අගයක් එකතුවීම මිස කිසිදු ආකාරයක හානියක් සිදුනොවන බවට සම්පූර්ණයෙන් ම තහවුරු කර ගැනීමෙන් පසු ව විය යුතු ය. රුවන්වැලිසෑය, අභයගිරි ස්තූපය හා ජේතවන ස්තූපය අසලින් කුඩා ආදර්ශ ස්තූප පිහිටුවා තිබීමෙන් ද පැහැදිලි වනුයේ ස්තූපයේ පැරණි ස්වරූපයට හානියක් සිදු වන මැදිහත්වීම්වලින් වැළැක්වීමට එහි මුල් ස්වරූපය පිළිබඳ සාක්ෂි සැපයීම විය හැකි ය. රුවන්වැලිසෑයේ මෑතකාලීන ප්‍රතිසංස්කරණයේ දී මෙම ආදර්ශ අනුරුව ඉතා වැදගත් සාක්ෂි සපයන්නට ඇත. මෙය ස්තූප සැලැස්ම ඒ ආකාරයෙන් ම සංරක්ෂණය සඳහා පැරැන්නන් යෙදූ ඉතා විශිෂ්ට උපාය මාර්ගයකි.

පැරැන්නන් ස්තූප සංරක්ෂණයේ දී අනුගමනය කර ඇති තවත් උපාය මාර්ගයක් වනුයේ ඉක්මනින් දිරීමට භාජනය වන ද්‍රව්‍යවලින් සකස් වූ කොටස් වඩාත් කල් පවතින ද්‍රව්‍යවලින් එම මුල් සැලැස්ම පිළිබිඹු කරන ආකාරයට සකස් කිරීමයි. උදාහරණ වශයෙන් අභයගිරි ස්තූපයේ හතරැස් කොටුවේ පිට පැත්තේ ගරාදි වැටක බදාම මෝස්තරය එහි මුලින් තිබුණු උද්ධවේදිය සංකේතවත් කරන ආකාරයට සකස් කර ඇත. රුවන්වැලිසෑයේ උඩ පේසාවේ ද ගරාදිවැටක බදාම කැටයමක් දක්නට ලැබෙන අතර එය මුලින් තිබූ අධෝවේදී නමින් හඳුන්වන ලද ගරාදිවැට පිළිබිඹු කරයි (වික්‍රමගමගේ 1990:133).

සෙනරත් පරණවිතාන ඔහුගේ 'ලංකාවේ ස්තූපය' පොතෙහි දක්වා ඇති පහත විස්තරවලින් ශ්‍රී ලංකාවේ ස්තූප ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණයට අදාළ ව ඉතිහාසයේ කලින්කලට සිදුවූ බාධා හා නැගීම්, වැටීම් විස්තර වේ.

> පස්වන හා දසවන සියවස් අතරතුර කාල පරිච්ඡේදයේ දී නිමවන ලද සැලකිය යුතු විශාලත්වයකින් හෝ පූජනීයභාවයෙන් හෝ යුක්ත කිසිදු ස්තූපයක් අපට හමු වී

නැත. වරින්වර සිදුවූ පරදේශී ආක්‍රමණ නිසාත්, අභ්‍යන්තර වියවුල් නිසාත් මේ යුගයේ කරදර සහිත කාලයක් විය. කලබලවලින් තොර, සාමය පැවැති අතරතුරු කාලයන්හි ඊට පෙර යුගයේ දී සැදැහැති රජවරුන් විසින් තනවන ලද විවිධ ප්‍රමාණවලින් යුත් ස්තූප සිය ගණනාවකට සුදුසු පිළිසකර යොදා ඒවා පවත්වාගෙන ඊමට එවක රජුන්ට හා මහජනයාට සිදුවිය (පරණවිතාන 1963:7).

එකොළොස්වන සියවසේ දී ලංකාවේ වැඩි කොටසක් සොළීන් විසින් යටත් කොට ගනු ලැබී ය. ස්තූපයක් අලංකාර කළ රන් හා රිදී ද ධාතු ගර්භයක් තුළ තැන්පත් කොට තිබිණැයි ප්‍රසිද්ධ වූ වස්තු සම්භාරය ද ශෛවාගමිකයන් වූ සොළී ආක්‍රමණකයන්ගේ ආශාව දියුණු කළේ ය. එහෙයින් එකොළොස්වන සියවසේ වැඩි කොටසක් තුළ පැවැත්තා වූ මෙම දකුණු ඉන්දියානු ආධිපත්‍ය යුගයේ දී ලක්දිව උතුරු පෙදෙස්වල පිහිටි අලංකාර ස්තූප බොහොමයක් ම කඩා බිඳ දමන ලදී. පළමුවන විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1058-1114 පමණ) සිංහල රාජ්‍යය නැවත පිහිටුවීමෙන් පසු සොළීන් විසින් හානි පමුණුවන ලද පූජනීය ස්තූප ප්‍රතිසංස්කරණය කිරීමට රජු සහ රටවාසීහු කටයුතු කළහ. ක්‍රි.ව. 1153 දී පරාක්‍රමබාහු රජු අභිෂේකය ලැබීමෙන් පසු තමන් රජ පැමිණීමට ප්‍රථම වියවුල් කාලවල දී හානි සිදුවූ ස්තූප වැඩි ගණනක් ම පරාක්‍රමබාහු රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලදී (පරණවිතාන 1963:7).

දහතුන්වැනි සියවසේ මුල් භාගයේ දී පොළොන්නරු රාජධානිය ඇදවැටීමෙන් පසු සිංහල ශිෂ්ටාචාරය ශීඝ්‍රයෙන් පිරිහෙන්නට පටන් ගති. මෙම අවනතිය සොළොස්වන සියවසේ දී පෘතුගීසීන්ගේ ආගමනය තෙක් පැවතිණ. දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන්ට විරුද්ධ ව දරන ලද අඛණ්ඩ පරිශ්‍රමය හේතුකොටගෙන අනුරාධපුරය හා පොලොන්නරුව යන පැරණි රාජධානි අතහැර දමන්නට සිදුවිය. පසුකාලයේ දී ඇති වූ රාජධානි වඩ වඩා දකුණු දෙසට ගෙනයන ලදී. වියවුල් රහිත ව සාමය පැවැති කෙටි පරිච්ඡේදවල දී බෞද්ධයන්ට වැඳුම් පිදුම් කිරීම පිණිස ස්තූප ඉදිකරන ලද්දේ වුව ද, දැන් ඒවායේ නටබුන් ගොඩැලිවලට වඩා දෙයක් නොමැත. යුද්ධ කොලාහල හා මැලේරියා වසංගතය හේතුකොටගෙන අනුරාධපුර සහ පොලොන්නරුව යන පැරණි රාජධානි හා අවට ප්‍රදේශවල වාසය අත්හැර දමන ලදින් එම රාජධානි සර්ම කලාපිය කැලෑවලට ගොදුරු විය. මහා ස්තූපයෝ ක්‍රමයෙන් පිරිහෙන්නට පටන් ගත්හ. ඒවා හැඩ නොමැති ගොඩැලි බවට පත් කිරීම සඳහා ස්වාභාවිකත්වය නිදන් සොරුන්ගේ පරිශ්‍රමයට එක් විය (පරණවිතාන 1963 : 8).

පෘතුගිසීන්ගේ ආගමනයේ සිට ක්‍රි.ව. 1815 දී මුළු දිවයිනේ ම බ්‍රිතාන්‍ය ආධිපත්‍ය පිහිටුවීම දක්වා උඩරට හා පහතරට බටහිර ජාතීන් අතර යුද්ධ ඇති විය. බුදුසමය අඳුරු යුගයකට මුහුණපෑ ය. අලුතින් ස්තූපයක් ඉදිකිරීම හා පැරණි ස්තූපයක් ආරක්ෂා කිරීම එකසේ අතපසුවිණි. කෙසේ වුව ද, අටළොස් වන සියවසේ

අවසානය පමණේ දී බුදුසමයේ පුනරුත්ථාපනයත් ඒ සමඟ ම සියම් රට හා ආගමික සම්බන්ධතාවක් ද ඇති විය. පැරණි චෛත්‍යයන් කිහිපයක් ම ප්‍රතිසංස්කරණය වූ අතර අලුතින් ස්තූප කිහිපයක් ඉදිවිණ (පරණවිතාන 1963:8).

බ්‍රිතාන්‍ය ආධිපත්‍ය නිසා ඇති වූ සාමය හේතුකොටගෙන සිංහල බෞද්ධයා වර්තමාන කාලයෙහි ඔවුන්ගේ පැරණි ස්තූපයන් ප්‍රකෘතිමත් කිරීමටත් අලුත් ස්තූපයන් සෑදීමටත් සැලකිල්ලක් දක්වයි. කෙසේ වුව ද පුරාවිද්‍යාඥයන්ගේ අදහස අනුව ශතවර්ෂ සතකට වඩා වැඩි කාලයක් පැවැති අතපසුවීමට වඩා අධික වූ හානිකර ප්‍රතිඵල මේ ප්‍රතිසංස්කරණයන් නිසා සිදු වී ඇත. අනුරාධපුරය හා අනෙකුත් ස්ථානවල පිහිටි පැරණි ස්තූපයන් ප්‍රතිසංස්කරණය කොට ඇත්තේ ඒවායේ ආදී ස්වරූපයන් වනසාලමින් බැවින් අලංකාර කලාකෘති විනාශ වී තිබේ (පරණවිතාන 1963:9).

ශ්‍රී ලංකාවේ පැරණි ස්තූප සඳහා සිදුකළ මෑතකාලීන මැදිහත්වීම් රැසක් පවතී (ඡායාරූප අංක 1 හා 2). ඒ අතරින් රුවන්වැලිසෑය වර්තමානයේ පවතින අයුරින් ප්‍රතිසංස්කරණය කිරීම වැදගත් තැනක් උසුලයි. 1893 දී නාරංවිට සුමනසාර ස්ථවිරයන් වහන්සේ ප්‍රදේශවාසී බෞද්ධ ජනයාගේ ද සහාය ඇති ව රුවන්වැලි ස්තූපයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළහ. මෙම ක්‍රියාදාමය පසුව ශ්‍රී රත්නමාලී චෛත්‍යය වර්ධන සමාගම විසින් කරගෙන යනු ලැබී ය. නැගෙනහිර හා දකුණු වාහල්කඩ මේ ප්‍රතිසංස්කරණවල දී අලුතින් පිහිටුවන ලදී. එසේ කරන ලද්දේ පැරණි වාහල්කඩවල් ප්‍රතිසංස්කරණවල දී බිඳදමන ලද බැවිනි. වාසනාවකට මෙන් පැරණි බස්නාහිර වාහල්කඩ පමණක් රැකගත හැකි විය. එය ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම නිසා සිදුවිය. මෙම ප්‍රතිසංස්කරණයෙන් පසු මහාථූපය අඩි 350ක උසින් හා අඩි 300ක විෂ්කම්භයෙන් යුතු විය. කොත පළඳවන ලද්දේ 1940 ජූනි 17 වැනිදා ය (සෙනවිරත්න 1995:107). ථූපාරාමය ලක්දිව බුදුසසුන පිහිටුවීමෙන් පසු ගොඩනැගූ පළමු දාගැබ වුව ද එය නොයෙක් වකවානුවල දී අළුත්වැඩියා කිරීම් හා ප්‍රකෘති කිරීම්වලට භාජනය විය. අද එය දක්නට ලැබෙනුයේ 1842 දී අන්තිමට කරන ලද ප්‍රකෘතිමත් කිරීමේ ප්‍රතිඵලයකි (පරණවිතාන 1963:11) (ඡායාරූප අංක 3 හා 4).

මෙම විස්තර අනුව ගත්කල 19, 20 සියවස්වල විවිධ පුද්ගලයන් හා මහජන සංවිධානවල දායකත්වයෙන් සිදු වූ ප්‍රතිසංස්කරණවල දී එසේ සිදු වුව ද 19 වන සියවස අගභාගයේ දී ඇරඹි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම යටතේ පුරාවස්තු ආඥා පනත ගෙන ඒමත් සමඟින් ලංකාවේ පැරණි ස්තූපවල සංරක්ෂණ කටයුතු මුළුමනින් ම පාහේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සිදුකරන්නට විය. ඒ අනුව විද්‍යානුකූල කැණීම් හා ගවේෂණවලින් ලැබෙන සාධක හා තොරතුරු පදනම් කර ගනිමින් ලංකාවේ පැරණි ස්තූප ඒවායේ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික අගයට හානියක් සිදුනොවන පරිදි සංරක්ෂණයට පියවර ගන්නා ලදි. මෙහි දී වැනිස් ප්‍රඥප්තිය වැනි උරුම සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ලෝක සම්මුතින්ට ද අවශ්‍ය පරිදි අනුගත වෙමින් අප රටේ සන්දර්භයට අනුකූල ව මෙම කටයුතු සිදු කෙරේ (සැලසුම් අංක 1 සහ 2). මේ අතරින් මිරිසවැටිය වැනි ස්තූප සංරක්ෂණයේ දී ඒ සඳහා වූ දේශපාලනික දායකත්වය පුරාවිද්‍යාඥයන් විසින්


එම තත්ත්වය උපක්‍රමශීලී ව සුදුසු මාර්ගයට ගෙන ඒමට කටයුතු කරන ලදී (ඡායාරූප අංක 5 සහ 6). නිසි ඉංජිනේරුමය න්‍යායන් පිළිනොපැදීම වැනි හේතු පාදක කරගෙන මිරිසවැටිය, සඳගිරිය, දැලිවල වැනි ස්තූප සංරක්ෂණ කාර්යයන් අතර කඩා වැටුණු අවස්ථා ද වූ අතර එම අත්දැකීම් ද ගුරු කරගනිමින් වඩාත් හොඳින් ස්තූප සංරක්ෂණයට කටයුතු කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල මේ වන විට කටයුතු කරමින් සිටී. මෙම සංරක්ෂණ කාර්යයවල දී එම ස්තූපවලට ඉතිහාසය පුරා කලින් කලට සිදු වී ඇති මැදිහත්වීම් දර්ශනය වන පරිදි එම අවධීන්ට අයත් පැතිකඩ අධ්‍යයනයට ඉඩ තබමින් සංරක්ෂණය කිරීම සිදුවේ (ඡායාරූප අංක 7).

දිවයින පුරා විසිරී ඇති මේ වන විටත් කැලයෙන් වැසීගිය ස්තූප ගොඩැලි ලෙස හමුවන කුඩා ස්තූප සංරක්ෂණය සඳහා ප්‍රධාන බාධාව වන්නේ ඒවා බොහොමයක් නිදන් සොරුන්ගේ ග්‍රහණයට බඳුන් වී ඒවායේ සාධක විනාශ වී තිබීමයි. එහෙත් කැණීම් මගින් ලැබෙන දත්ත ආදිය පදනම් කරගෙන එවැනි ස්තූප විශාල ගණනක් මේ වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සංරක්ෂණය කර ඇත.

වඩා විශාල ස්තූප ලෙස ගැනෙන ජේතවනාරාම ස්තූපය, අභයගිරිය, දීඝවාපිය, නිලගිරියසෑය, යුදගනාව ආදී ස්තූප සංරක්ෂණයේ දී පැනනැගෙන ප්‍රධානම ගැටලුව වන්නේ ඒ සඳහා අපේ පැරැන්නන් විසින් භාවිත කරන ලද ආකාරයේ සවිශක්තියෙන් යුතු ගඩොල් එම පිරිවිතරවලින් ම අවශ්‍ය ප්‍රමාණයට සපයා ගැනීමට නොහැකිවීමයි.

ශ්‍රී ලංකාවේ ජීවමාන බෞද්ධ උරුමයක් පවතින බැවින්, පැරණි ස්තූප කෙතරම් සාධක නොමැති තත්ත්වයට ගරා වැටී තිබුණ ද ඒවා සම්පූර්ණ කර සුදුහුණු පිරියම් කර කොත පලඳවා වැඳුම් පිදුම් කිරීමට සම්පූර්ණ කර දෙන ලෙස ස්වාමීන් වහන්සේලා හා දායකකාරකාදීන්ගෙන් වන ඉල්ලීම් ද මේ වන විට බහුල ව ඉදිරිපත් වේ (ඡායාරූප අංක 08 සහ සැලසුම් අංක 3).

පුරාවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් 'ස්තූපය ඓතිහාසික ස්මාරකයකි' යන අදහසින් බලා දැඩි සංරක්ෂණ තීරණ ගැනීම වෙනුවට ජීවමාන උරුමය යන සංකල්පය ද සලකා බලමින් වඩාත් නම්‍යශීලී මැද මාවතක් තුළින් ස්තූප ඒවායේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අගය මෙන් ම ඒවටා බැඳි අස්පර්ශ උරුමය ද සුරැකෙන සේ සංරක්ෂණය කිරීම බලධාරීන්ගේ වගකීමක් බවට පත් වී තිබේ.



ඡායාරූප අංක 1 - රුවන්වැලිසෑය 20 වන සියවසේ මුල් අවධියෙහිදී උපුටා ගැනීම - **H.W. Cave** 1909 : 552




ඡායාරූප අංක 2 - රුවන්වැලිසෑය



ඡායාරූප අංක 3 - ථූපාරාමය ස්තූපය 20 වන සියවසේ මුල් අවධියේ දී



ඡායාරූප අංක 4 - ථූපාරාමය ප්‍රතිසංස්කරණයට පසු




ඡායාරූප අංක 5 - මිරිසවැටිය සංරක්ෂණය අතරතුර




ඡායාරූප අංක 6 - මිරිසවැටිය සංරක්ෂණයට පසු



ඡායාරූප අංක 7 - සෝමාවතීය ස්තූපයෙහි සංරක්ෂණ අවධි




සැලසුම් අංක 1 - නිලගිරිය දාගැබ සංරක්ෂණයට පෙර




**සැලසුම් අංක 2 - නිලගිරිය දාගැබ සංරක්ෂණ යෝජනාව**



**ඡායාරූප අංක 8 - දීඝවාපී දාගැබ සංරක්ෂණය කිරීමට පෙර**




**සැලසුම් අංක 2 - දීඝවාපී දාගැබ සංරක්ෂණ යෝජනාව**

## මූලාශ්‍රය


**චූලවංසය.** (1925). ඩබ්. ගයිගර් (සංස්.) (පී.ටී.ඇස්.), ලන්ඩන්.

පරණවිතාන, එස්. (1963). **ලංකාවේ ස්තූපය.** කොළඹ : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

සෙනෙවිරත්න, අනුරාධ. (1995). **පුරාණ අනුරාධපුරය.** කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**බුද්ධවංසටඨකථා.** (2007). කීර්ති නාරම්පනාව (පරි.) කොළඹ.

**මහාවංසය.** (1958). ඩබ්. ගයිගර් (සංස්.) (පී.ටී.ඇස්.), ලන්ඩන්.

වික්‍රමගමගේ, සී. (1990). **ස්තූප.** නුගේගොඩ : ද කොලිටි ප්‍රින්ටර්ස්.

විදානපතිරණ.පී.සී. (2008). **ධාතු විස්තරය.** කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

Wickramasinghe, D. M. de Silva. (1912) *Epigraphia Zeylanica Vol I*. Colombo : Department of Archaeology

# වෘෂභ කුඤ්ජරය

**නලින් විශ්වනාත්**[1]

## හැඳින්වීම

වෘෂභ කුඤ්ජරය ශ්‍රී ලංකාවේ පැරණි සිතුවම් සහ කැටයම් ආශ්‍රිත ව හමුවන කලා නිර්මාණයකි. වෘෂභ යනු ගවයා සඳහා සංස්කෘත භාෂාවෙන් යෙදෙන පදයකි. කුඤ්ජර යනු ඇතා සඳහා යෙදෙන සංස්කෘත පදයයි. වෘෂභ කුඤ්ජරය යන්නෙන් අදහස් වනුයේ මෙම සත්ව විශේෂ දෙක යොදා ගෙන බිහි කරන ලද සංයුක්ත නිර්මාණයකි. ආනන්ද කුමාරස්වාමි මෙය හඳුන්වා ඇත්තේ "උසභ කුඤ්ජරය" යනුවෙනි. එසේ ම ඔහු තව දුරටත් සඳහන් කරනුයේ දකුණු ඉන්දියාවේ තංජෝරයේ මහලු දෙමළ කාර්මිකයෙකුගේ කඩුත්තම් පුස්තකයක ද මෙම නිර්මාණය දුටු බවත් එය "වීර සුභ කුංචරම්" යන නමින් හැඳින්වූ බවත් ය (කුමාරස්වාමි 1962:88). දිසානායක දක්වන්නේ උසභ යනු වෘෂභයා සඳහා යෙදූ සංස්කෘත පදය ගැමි සිත්තරාගේ මුවින් පිට වූ ආකාරය වන බව යි (2000:42). එසේ ම මෙම නිර්මාණය සඳහා "ගජ වෘෂභ" යන යෙදුම ද ඇතැම් තැනක භාවිත වී තිබේ. සිංහල චිත්‍රය සහ මෝස්තර සම්ප්‍රදාය කෘතියේ දෝව විහාරයේ මෙම ගණයේ සිතුවමක් සඳහා ගජ වෘෂභ යන්න භාවිත කර තිබේ (සිල්වා 1990:121). මෙම නිර්මාණයේ දී ඇතා දක්වා ඇත්තේ වම් පසින් වන අතර වෘෂභයා දකුණු පසින් දක්වා තිබේ. සාමාන්‍යයෙන් වෘෂභ කුඤ්ජරය නිරූපණය කරන ලද බොහොමයක් අවස්ථාවල වෘෂභයා වම්පසින් හා ඇතා දකුණු පසින් දැක්වීම සිදු කර ඇත. ගවයා මුලින් දක්වා ඇති විට වෘෂභ යන්න මුලට යෙදීම උචිත ය. වෘෂභ කුඤ්ජරය යන්න යෙදීමේ දී ඒ පිළිබඳ ව සැලකිලිමත් වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. පැරණි කැටයම් ආශ්‍රිත ව හමුවන ගජ ලක්ෂ්මී හා ගජ වෘෂභ යන්නෙහි නාමකරණයේ යම් සම්බන්ධතාවක් බාහිර වශයෙන් දැකිය හැකි ය.

## සංයුක්ත කලා නිර්මාණ

වෘෂභ කුඤ්ජරය ඒකාබද්ධ කලා නිර්මාණයකි. රූප දෙකක් හෝ කිහිපයක් සංයෝජනය කිරීම ඇතුළු ක්‍රම කිහිපයක් ම භාවිත කරමින් කලා නිර්මාණ බිහි කිරීමට පැරණි නිර්මාණ ශිල්පීන් ඈත අතීතයේ සිට ම ක්‍රියා කර ඇති බව ලැබී ඇති පුරාවිද්‍යාත්මක සාධක හා සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරුවලින් හෙළිවේ.

සංයුක්ත නිර්මාණ බහු හිස් සහිත සහ බහු ශරීර සහිත ව බිහි කර තිබේ. විවිධ සතුන්ගේ ශරීර කොටස් එකතු කිරීමෙන් බිහි කරන ලද සංයුක්ත කලා නිර්මාණ රැසක් ද වාර්තා වී ඇත. සත්ව රූප සමූහයක් යොදා ගනිමින් යම් සත්වයෙකු හෝ වස්තුවක් නිරූපණය ද මෙහි දී අනුගමනය කර ඇති

[1] *ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යා නිලධාරී*
*ජේතවන වනපෘතිය,*
*මධ්‍යම සංස්කෘතික අරමුදල*

තවත් ක්‍රමවේදයක් වශයෙන් සැලකිය හැකි ය. මෙම වර්ගයේ බහු සංයුක්ත සිතුවම් ප්‍රහේලිකාකාර චිත්‍ර වශයෙන් ද හඳුන්වා තිබේ. මෙම සංයුක්ත නිරූප ගණයේ සිතුවම් බැලූ බැල්මට ද තේරුම් ගත නොහැකි ය. සංකීර්ණ බවක් පෙන්නුම් කරයි. ඇතැම් සිතුවම් එකවර ම අවබෝධ කර ගැනීමට ද නොහැකි ය. කලාකරුවන් මනස වෙහෙසවා කළ නිර්මාණයක් ද වූ බැවින් මේවා ඒක්තරා දුරකට ප්‍රහේලිකාකාර චිත්‍ර ස්වරූපයක් බවට ඇතැම් උගතුන් මත පළ කර තිබේ (සෝමතිලක 2013:328).

සංයුක්ත නිර්මාණ බිහි කිරීමේ ඉතිහාසය ලෝකයේ පැරණි සංස්කෘතීන් දක්වා අතීතයකට ගමන් කරයි. මිසරයෙන් වාර්තාවන සංයුක්ත නිර්මාණයක් වන ස්පිනික්ස් රුව පාරාවෝ කෆ්රේ (ක්‍රි:පූ: 2558-2532) සමයේ ඉදිකළ බවට විශ්වාස කෙරේ. (ඡායාරූප අංක-1) විවිධ සතුන්, මානවයන්ගේ ශරීර කොටස් එක්කර බිහිකරන ලද නිර්මාණ අතර පැරණි ම නිදර්ශන අතර ස්පිනික් රුව සහ මකරා යන නිර්මාණ වඩාත් ප්‍රචලිත පැරණි නිර්මාණ වශයෙන් සැලකිය හැකි ය. බටහිර සංස්කෘතීන් ද්වි හිස් රාජාලියා වශයෙන් නම් කෙරෙන ඉන්දියාවේ දී ගන්ධ භේරුණ්ඩ ලෙස නම් කෙරෙන්නේ ද පැරණි සංයුක්ත නිර්මාණයකි. (ඡායාරූප අංක-2) මෙසපොතේමියානු හිට්ටිටස් (*hittites*) අධිරාජ්‍ය සමයට අයත් (ක්‍රි:පූ: 1700-1200) තුර්කියේ ඇලකා හොයුක්හි ස්පිනික්ස් ද්වාරය අසල කොටන ලද දෙ හිස් රාජාලි රුවක් දක්නට ලැබේ. මෙසපොතේමියානු මුද්‍රාවල ද මෙම සත්වයාගේ රුව දක්නට ලැබෙන අතර මෙම පක්ෂි රුව හමුවන පැරණි ම ශිෂ්ටාචාරය මෙසපොතේමියාව බවට ද ඇතැම් පර්යේෂකයෝ විශ්වාසය පළ කරති. මෙම නිර්මාණ සේ ම තවත් සංයුක්ත නිර්මාණ රාශියක් පිළිබඳ තොරතුරු ලෝකයේ වෙනත් රටවලින් මෙන් ම ඉන්දියාවෙන් හා ලංකාවෙන් ද වාර්තා වී තිබේ.



**ස්පිනික්ස් රුව**
**(ඡායාරූප අංක -1)**



**ගන්ධ භේරුණ්ඩ**
**(ඡායාරූප අංක -2)**

බහු හිස් සංයුක්ත කලා නිර්මාණ අතර පෙණ 3, 5, 7 යනාදී වශයෙන් යොදා ගන්නා ලද පැරණි නාග රූප නිර්මාණ රැසක් ඉන්දියාවෙන් මෙන් ම ලංකාවෙන් ද තවත් රාජ්‍ය රැසකින් ද වාර්තා වී ඇත. බහු හිස් සහිත දේව රූප නිර්මාණ ද පැරණි භාරතයේ කලා නිර්මාණ ඇසුරෙන් හඳුනාගත හැකි ය. බෞද්ධ, හින්දු, ජෛන ආගමික ප්‍රතිමා හිසට ඉහළින් විවිධ සංඛ්‍යාවෙන් යුත් පෙණ ඇති නාග රූප නිමවා තිබේ. ආගමික විශ්වාස සහ ශිල්පීන්ගේ සංකල්පනා ඇසුරෙන් වර්ධනය වූ නිර්මාණ වශයෙන් බහු ශරීර සහිත මෙම සංයුක්තයන් දැක්විය හැකි ය.



**(ඡායාරූප අංක - 3)**
**එක් හිසක් සහ විලාස තුනක් නිරූපණයකෙරෙන ශරීර සහිත ගව රූපය**

දකුණු ඉන්දියාවේ ලෙපාක්ෂි කෝවිලේ ඇති ක්‍රි:ව:14-15 සියවස්වලට අයත් එක් ශරීරයක් සහ විලාස තුනක් නිරූපණය කෙරෙන හිස් සහිත ගව රූපය කාල්පනික ශක්තියෙන් බිහි වූ නිර්මාණයක් වශයෙන් දැක්විය හැකි ය. (ඡායාරූප අංක -3) විජය නගර් අධිරාජ්‍ය අවධියේ වර්ධනය වූ කලා නිර්මාණ අතරින් හමුවන ද්වි සිංහ, ත්‍රී සිංහ ඇතුළු කලා නිර්මාණ රැසක් ඉන්දියාවෙන් සහ තවත් රටවල් රැසකින් වාර්තා වී තිබේ. මෝගල් අධිරාජ්‍ය සමයේ වර්ධනය වූ ඉස්ලාම් දහමේ බලපෑමත් සමඟ ම ඉරාණීය ප්‍රදේශවල භාවිත වූ සංයුක්ත නිර්මාණ ඉන්දියාවේ කලා නිර්මාණ කෙරෙහි බලපෑ බවට විශ්වාස කෙරේ. විශේෂයෙන් ඉස්ලාමීය පශු සංයුක්ති නිර්මාණ මීට කදිම නිදර්ශනයකි. මෙම නිර්මාණ ඉන්දියාවේ බෙංගාලය, ගුජරාටය ඇතුළු ප්‍රදේශ රාශියක ප්‍රචලිත විය.

ඉන්දියාවේ නාරි සංයුක්ත නිර්මාණ බිහිවීම සඳහා මේ නිර්මාණ බලපා ඇති බව පෙනේ. මේ ඔස්සේ නාරි කුඤ්ජර, නාරි පල්ලැක්කි, නාරි තුරඟා වැනි නිරූඪ ගණයේ නිර්මාණ රාශියක් හින්දු ආගමේ පවතින විශ්වාසවලට ද අනුරූප ව බිහිවී ඇත.

**වෘෂභ කුඤ්ජරය**

මෙහි දී අප සාකච්ඡාවට බඳුන් කෙරෙන වෘෂභ කුඤ්ජරය, සතුන් විශේෂ දෙකක් ඒකාබද්ධ කිරීමෙන් බිහිකර ගන්නා ලද සංයුක්ත නිරූඪ ගණයේ කල්පිත නිර්මාණයකි. වෘෂභ කුඤ්ජරය ඉන්දියාවේ පැරණි ස්ථාන රාශියකින් වාර්තා වි තිබේ. ඒවායින් බොහොමයක් දකුණු ඉන්දියාවේ දේවාලවලින් ලැබී ඇත. දකුණු ඉන්දියාවේ හම්පි විජය විත්තල දේවාලයේ ක්‍රි:ව: 14-15 සියවස්වලට අයත් බවට සැලකෙන කැටයම් අතර වෘෂභ කුඤ්ජරය ද දක්නට ලැබේ. මෙම දේවාල විජය නගර අධිරාජ්‍ය සමයේ සංවර්ධනය වූ ස්ථාන වශයෙන් හඳුනාගත හැකි ය. තමිල්නාඩු ප්‍රාන්තයේ තිරිබුවනම්හි කම්පහේෂවර දේවාලයේ ද වෘෂභ කුඤ්ජරය ශිලා කැටයමක් දක්නට ලැබේ. (ඡායාරූප අංක-4) මෙම දේවාලය iii වන කුලෝත්තුංග රජු (ක්‍රි:ව: 1176-1218) විසින් ගොඩනගන ලද්දකි. මෙහි ඇති කලා නිර්මාණ ඒ යුගයේ දී හෝ ඊට ආසන්න කාල සීමාවක දී එක් වූ බවට විශ්වාස කෙරේ. මෙහි වෘෂභ කුඤ්ජරය නිර්මාණයේ දී ඇතාගේ දළ යුගලය වෘෂභයාගේ දෙකනින් සහ ඇතාගේ හොඬවැල වෘෂභයාගේ මොල්ලියෙන් දැක්වෙන පරිදි සාර්ථක ව නිර්මාණය කර ඇත. දෙදෙනාට ම

ඇත්තේ එක ඇසකි. හමු වූ සෑම නිර්මාණයක ම මෙම සාර්ථකත්වය දක්නට නොලැබේ. හස්තියා වලිගය ඔසවා ගෙන පොරයකට එක්වන අයුරින් නිර්මාණය කිරීමට යත්න දරා ඇති බව පෙනේ. සත්ත්ව රූප දෙකෙහි ම මැනවින් ආභරණ පැලඳ සිටින ආකාරයෙන් නිරූපණය කර තිබේ. තමිල්නාඩුවේ තංජෝරයේ අයිරාවතේශ්වර කෝවිලෙහි ද වෘෂභ කුඤ්ජරය ශිලාමය කැටයමක් දක්නට ලැබේ. (ඡායාරූප අංක-5) මෙම සිද්ධස්ථානය ද විජය නගර් අධිරාජ්‍ය සමයේ දී සංවර්ධනය වූ ස්ථානයක් වශයෙන් සැලකේ. මෙම කැටයම ඉතා කලාත්මක ව නිර්මාණය කර ඇත. සත්ත්ව රූ දෙක ම ආභරණින් සරසා ඇත. බාහිර අවකාශය ද ලියකම්වලින් අලංකාර කොට තිබේ. කැටයම ගල් පුවරු දෙකක් එක් කර නිමවන ලද්දක් බව පෙනේ. මීට අමතර ව දකුණු ඉන්දියාවේ තවත් ස්ථාන රාශියක ම මෙම නිර්මාණය දැක ගත හැකි ය.



**තමිල්නාඩු ප්‍රාන්තයේ තිරිබුවනම්හි කම්පහේෂවර දේවාලයේ ද වෘෂභ කුඤ්ජරය ශිලා කැටයම**
**ඡායාරූප අංක - 04**




**තමිල්නාඩුවේ තංජෝරයේ අයිරාවතේශ්වර කෝවිලෙහි ද වෘෂභ කුඤ්ජරය ශිලාමය කැටයම**
**ඡායාරූප අංක - 05**



**ශ්‍රී ලංකාවේ ඇම්බැක්ක දේවාලයේ වෘෂභ කුඤ්ජර කැටයම**
**ඡායාරූප අංක - 06**

ශ්‍රී ලංකාවේ ඇම්බැක්ක දේවාලයේ වෘෂභ කුඤ්ජර කැටයමක් දක්නට ලැබේ. (ඡායාරූප අංක-6) මෙය ලංකාවේ හමුවන පැරණි ම නිදර්ශනයක් සේ සැලකිය හැකි ය. දැව කණුවක පනේලයක කෙටුම් ගත කර ඇති මෙම කැටයම මේ වන විට තරමක් හානියට ලක් ව ඇති ආකාරයක් නිරීක්ෂණය කළ හැකි විය. මෙහි හස්තියාගේ පිට මත ඇතිරිල්ලක් දක්වා ඇති අතර ගෙලෙහි යම් ආභරණ පැළඳ ගෙන සිටින ආකාරයෙන් දක්වා තිබේ. හස්තියා ඉදිරියට බර දී සිටින ආකාරයෙන් දක්වා තිබේ. වෘෂභයා චලනයෙන් තොර ව රැඳී සිටින අයුරින් නිර්මාණය කර තිබේ. දැව ඇතුලට හාරා රූප මතු කර ඇති අතර පනේලයේ මධ්‍යයේ ජීර්ණය හේතුවෙන් හස්ති රූපය මධ්‍යයේ පැල්මක් වර්ධනය වී ඇති අතර ඊට යම් සංරක්ෂණ මැදිහත්වීමක් ද සිදු කර තිබේ. පනේලය වටා අරිම්බු මෝස්තරයක් යොදා ඇති අතර කැටයමට ඉහළ අවකාශයට ලියකම් යොදා ඇත. මෙවැනි ම තවත් දැව කැටයම් ලංකාවේ ස්ථාන කිහිපයකින් වාර්තා වී තිබේ (සිල්වා 2009:154).



.

**මහනුවර පල්කුඹුර විහාරයේ දික් ගෙය කැටයම් අතර නිර්මාණ දෙකක්**
**(ඡායාරූප අංක -07-08)**

මේ අතර මහනුවර පල්කුඹුර විහාරයේ දික් ගෙය කැටයම් අතර නිර්මාණ දෙකක් දක්නට ලැබේ. (ඡායාරූප අංක 7, 8) මෙහි රූප දෙකෙහි බාහිර ස්වරූපය සමාන වුව ද ආකාර දෙකක නිර්මාණ දෙකක් සේ සැලකිය හැකි ය. මෙහි එක් අවස්ථාවක හස්තියා වම් පසත්, අනෙක් අවස්ථාවේ දකුණු පසින් යෙදී තිබේ. ගව රූපය ද ඊට අනුව වෙනස් වී ඇත. මෙහි වම් පසින් ගව රූප යෙදී ඇති අවස්ථාව වෘෂභ කුඤ්ජරය ලෙසත් හස්තියා වම් පසට යෙදී ඇති අවස්ථාව ගජ වෘෂභ ලෙසත් නම්

කළ හැකි ය. මෙම කැටයම් දෙකෙහි ම ඇතා පිටුපස පයක් නවා ඔසවා සිටින අයුරින් දක්වා තිබේ. මේ නිර්මාණ ද මහනුවර යුගයට අයත් පැරණි නිර්මාණ ලෙස සැලකිය හැකි ය.

වෘෂභ කුඤ්ජරය සිතුවම් කළ අවස්ථා රැසක් ද ශ්‍රී ලංකාවෙන් වාර්තා වී ඇත. මෙයින් පැරණි හා කලාත්මක නිර්මාණයක් රිදී විහාරයේ පවතී. (ඡායාරූප අංක-9) මෙම සිතුවම උඩ විහාරයේ ඉඳි පිළිමය තැන්පත් කර ඇති ආසනයේ ඇඳ තිබේ. මේ නිසා එය පහසුවෙන් දැක බලා ගත හැකි නොවන අතර බලා ගැනීමට අවශ්‍ය නම් වාඩි විය යුතු වේ. රතු පසුබිමක ගවයා සුදු පැහැයෙන් සහ ඇතා අඳුරු රත් පැහැයෙන් දක්වා ඇත. මේ වන විට ඇතා සහ ගවයා සන්ධි වන ස්ථානය හායනයට පත් ව ඇති බැවින් නිර්මාණයේ කලාත්මක අගයට හානි වී ඇත. මෙම නිර්මාණය ඉතා විසිතුරු යැයි එච්. ජී. චාල්ස් සඳහන් කර ඇත (විජේසේකර 1990:96). මේ අනුව පසුකාලීන ව සිතුවම හායනයට ලක් ව ඇති බව උක්ත ප්‍රකාශය වර්තමාන ස්වරූපය හා ගැළපීමෙන් පැහැදිලි වේ. සිතුවම පිහිටි අවකාශය තුළ මල් මෝස්තර යොදා පසුතලය අලංකාර කිරීමට යත්න දරා ඇත.
දළදා මාලිගය පරිශ්‍රයේ ද වෘෂභ කුඤ්ජරය සිතුවමක් දක්නට ලැබේ. වැඩසිටින මාලිගයේ යටි මාලයේ සීලිමට පහළින් මෙම සිතුවම චිත්‍රණය කර ඇත. (ඡායාරූප අංක -10) මෙහි විශේෂත්වය සත්ව රූප මත ආශිර්වාද මුද්‍රාවෙන් යුක්ත කොණ්ඩය බැඳි උඩුකය නිරුවත් මානව රූප දෙකක් ද දක්වා තිබීමයි. දකුණු ඉන්දියාවේ තිරුබුව නම් කෝවිලේ ගෝපුරයක වියනේ වෘෂභ කුඤ්ජරය මූර්තියක ශිව දෙවියන් වෘෂභයා මත ද විෂ්ණු දෙවියන් ඇතා මත ද සිටින ආකාරයෙන් දක්වා තිබේ. රතු පැහැ පසුබිමෙහි චිත්‍රණය කරන ලද සිතුවමෙහි අවකාශය අන්නාසි මල් සැරසිල්ලක් යොදා ඇත. මරළුවාව රජ මහා විහාරයේ ද වෘෂභ කුඤ්ජරය සිතුවමක් දක්නට ලැබේ. (ඡායාරූප අංක -11) මෙම නිර්මාණය සිතුවම් කොට ඇත්තේ විහාරයේ පැරණි ලෙන් විහාරය ආශ්‍රිත ව ය. එම ලෙන කිර්ති ශ්‍රී රාජසිංහ රජ (ක්‍රි:ව: 1747-1781) දවස නිර්මාණය කරන ලද්දක් බවට සැලකෙතත් පසු ව ප්‍රතිසංස්කරණය වී තිබේ. මෙහි ඇති වෘෂභ කුඤ්ජරය සිතුවම ද මෙම ප්‍රතිසංස්කරණයට ලක් වී ඇත. එය දක්වා ඇත්තේ පංචනාරී ඝටය දැක්වෙන සිතුවමට පහළිනි. ප්‍රතිසංස්කරණය හේතුවෙන් සිතුවම් හොඳින් දැකගත හැකි ය. රත් පැහැ පසුබිමෙහි ලා රත් පැහැයෙන් යුක්ත වන පරිදි වර්ණ ගන්වා තිබේ. ඇතාගේ දළ යුගලය සහ ඇහැ ආශ්‍රිත ව පමණක් සුදු වර්ණය යොදාගෙන තිබේ. සිතුවමට ඉහළින් සුදු පැහැයෙන් යුක්ත වන පරිදි ලියවැල් මෝස්තරයකින් සමන්විත ය. මෙම නිර්මාණය පෙර පැවති නිර්මාණයකට අනුව ප්‍රකෘතිමත් කරන ලද්දක් සේ සැලකිය හැකි ය. බදුල්ල දිස්ත්‍රික්කයේ දෝව විහාරයේ ද ගජ වෘෂභ නිර්මාණයක් තිබේ. (ඡායාරූප-12) මෙය තරමක් නූතන නිර්මාණයක් වශයෙන් සැලකිය හැකි ය. මෙම විහාරය මහනුවර යුගයට අයත් වුවත් මෙහි නිර්මාණ පසුකාලීන ප්‍රතිසංස්කරණවලට ලක් වී ඇත. ක්‍රි:ව: 1880 සහ ක්‍රි:ව: 1940 ගණන්වල දී එය නවීකරණය වී ඇත. මෙහි ඇති ගජ වෘෂභ ද එකල නිර්මාණය කළ හෝ නවීකරණය කළ නිර්මාණයක් බවට අනුමාන කළ හැකි ය. මෙම සිතුවම විහාර මන්දිරයේ සිවිලිමෙහි ඇඳ තිබේ. ඇතා සහ වෘෂභයා සටනක නිරත වන ආකාරයෙන් ඉදිරිපත් කර තිබේ. මෙය ලංකාවේ දුර්ලභ යෙදුමක් වශයෙන් සැලකිය හැකි ය. විශාල පද්ම චක්‍ර දෙකක් අතර වන අවකාශය ප්‍රයෝජනයට ගෙන මෙම නිර්මාණය බිහි කර තිබේ. සුදු පැහැයෙන් සත්ත්ව රූප සේ ම එහි පසුබිම අලංකාර කිරීමට සමන් ලතාවන් භාවිත කර තිබේ. පසුබිම රත් පැහැයෙන් යුක්ත බැවින් සිතුවම කැපීමට මතු වී තිබේ. මාතලේ දිස්ත්‍රික්කයේ ඇඹිල්ල රජ මහා විහාරයේ ද වෘෂභ කුඤ්ජරය කැටයමක් දක්නට ලැබේ.

මෙය ද තරමක් වෙනස් ආකාරයක් ගන්නා හා නවීකරණය වූවක් වශයෙන් සැලකිය හැකි ය. මෙය ලෙන් විහාරයේ කෙළවරකට වන්නට කෙටුම් ගත කරන ලද නිර්මාණයක් වශයෙන් සැලකිය හැකි ය. මෙහි වෘෂභයා දෙපා පසුපසට නවා වැතිරී සිටින ඉරියව්වෙන් දක්වා තිබේ. මෙම සිතුවම සුදු පැහැ පසුබිමක චිත්‍රණය කර ඇති අතර සත්ව රූප මතුකර ඇත්තේ කළු පැහැ රේඛා සටහන් අනුසාරයෙනි. මෙම නිර්මාණය පැවති පැරණි චිත්‍රයක් අනුකරණයකර අඳින ලද සිතුවමක් විය හැකි ය.



රිදී විහාරයේ වෘෂභ කුඤ්ජරය
**(ඡායාරූප අංක - 9)**



දළදා මාලිගය පරිශ්‍රයේ වෘෂභ කුඤ්ජරය
**(ඡායාරූප අංක - 10)**



මරළුවාව රජ මහා විහාරයේ වෘෂභ කුඤ්ජරය
**(ඡායාරූප අංක - 11)**



බදුල්ල දිස්ත්‍රික්කයේ දෝව විහාරයේ
ගජ වෘෂභ නිර්මාණය
**(ඡායාරූප අංක - 12)**

**සාරාංශය**

සංයුක්ත කලා නිර්මාණ පැරණි ලෝකයේ සභ්‍යත්වයන් අනුසාරයෙන් ද වාර්තා වී ඇත. ඉන්දු නිම්න සභ්‍යත්වය, පර්සියාව, වෛදික සභ්‍යත්වය, මිසරය මෙන් ම පැරණි ග්‍රිසිය සහ රෝමයෙන් මෙබඳු සංයුක්ත සහ සංයුක්ත කල්පිත නිරූඪ ගණයේ මෝස්තර නිර්මාණ ලැබී තිබේ. මේ අතරින් පර්සියානු බලපෑම ඉන්දියානු ඇතැම් සංයුක්ත කලානිර්මාණ බිහිවීම කෙරෙහි බලපෑ බවට විශ්වාස කෙරේ. හින්දු ආගමික විශ්වාස ද මෙබඳු කලානිර්මාණ බිහිවීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කර තිබේ. පැරණි සභ්‍යත්වවල දී පවා මෙබඳු නිර්මාණ බිහිවීම සඳහා බලපා ඇත්තේ විවිධ මිථ්‍යා විශ්වාස බව පෙනේ. ස්පිනික් රූව සහ හින්දු ආගමේ විෂ්ණු අවතාරයක් ලෙස සැලකෙන නව ගුන්ජර මීට උදාහරණ වශයෙන් දැක්විය හැකි ය. මේ අතරින් ස්පිනික් සංයුක්ත නිර්මාණය ලොව

බොහෝ රටවල ව්‍යාප්ත වූ ආගමික විශ්වාස හා සම්බන්ධ වූ නිර්මාණයක් විය. ආසියානු රටවලින් ද හමුවන නරසිංහ රුව ද මෙහි බලපෑමෙන් බිහිවූවක් සේ සැලකේ. මකරා ද මෙබඳුම කල්පිත නිරුඪ ගණයේ නිර්මාණයකි. වෘෂභයා මෙන් ම හස්තියා ද ආගමික විශ්වාස හා බැඳි සතුන් වන අතර ම මොවුන් හින්දු ආගමේ ප්‍රබල දෙවිවරුන්ගේ රථ වශයෙන් ද යොදා ගැනේ. වෘෂභ කුඤ්ජරය තුළ ද ආගමික විශ්වාසයක් ගැබ් වී ඇති බවට විශ්වාස කළ හැකි අතර එය කාල්පනික ශිල්පියකු නිර්මාණ කෞශල්‍ය තුළින් බිහි ව අනුකරණ තුළින් වර්ධනය වී කාලයත් සමඟ ප්‍රචලිත වූ නිර්මාණයක් විය හැකි ය.

පොදුවේ ගත් කල දකුණු ඉන්දියාවෙන් හමුවන වෘෂභ කුඤ්ජරය වඩා පැරණි නිර්මාණ වන අතර ම විජය නගර් පාලන සමයේ දී ප්‍රචලිත වී ඇති බව පෙනේ. නමුත් මෙරට හමුවන නිර්මාණ මහනුවර යුගයට වඩා පැරණි නිර්මාණ වශයෙන් සැලකිය නොහැකි ය. ඇම්බැක්ක දේවාලය ගම්පොළ යුගයේ ඉදි කරන ලද නිර්මාණයක් වුවත් මෙහි දික්ගෙය ඇතුළු තවත් නිර්මාණ රැසක් බිහි කොට ඇත්තේ මහනුවර සමයේ රාජාධි රාජසිංහ (ක්‍රිඃවඃ1782-1798) රජ සමයේ දී ය. මෙහි නිර්මාණ කටයුතු සඳහා දායක වී ඇත්තේ දෙල්මඩ මූලාචාරී නම් අයෙකි (පතිරාජ 2007:38). මොහු පැරණි ශිල්පී පරපුරකට අයත් පුද්ගලයකු වන අතර දකුණු ඉන්දියාවේ සිට සංක්‍රමණය වූ පරපුරකට අයත් වන්නකු සේ සැලකේ. ගම්පොළ අවධියේ මෙන් ම මහනුවර අවධියේ දී ද දකුණු ඉන්දීය ශිල්පීන් උඩරට පදිංචි වී ඇති අතර ඇතැම් රජවරුන් ඔවුන්ට ගම්වර ඇතුළු වරප්‍රසාද ද පිරිනමා ඇත. ලංකාවේ පදිංචි වූ මේ ද්‍රවිඩ ශිල්පීන් හුරු පුරුදු කලා නිර්මාණ කැටයම්කරණයේ දී යොදා ගෙන ඇති බවට අනුමාන කළ හැකි ය. ඒ අනුව ඔවුන් එරට සිදු කළ කලා නිර්මාණ ලංකාවේ දී ද භාවිතයට ගෙන තිබේ. එසේ ම ඔවුන් විසින් පරිශීලනය කරන ලද ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථ ද ඉන්දියානු මූල ග්‍රන්ථ විය. දේශීය ශිල්පීන් විසින් ද පරිශීලනය කරන ලද්දේ මෙම මූල ග්‍රන්ථ ය. එහි ප්‍රතිඵලයක් ලෙස වෘෂභ කුඤ්ජරය වැනි නිර්මාණ පසුකාලීන ව මෙරට ශිල්පීන් අතින් ද බිහි වන්නට ඇත. ගම්පොළ රාජධානි සමය දකුණු ඉන්දීය කලා නිර්මාණවල ආභාසය ලද අවධියකි. එම යුගයේ දී දකුණු ඉන්දීය විජයනගර් ගෘහනිර්මාණ ශිල්පයෙහි සහ කලා ශිල්පයන්හි ආභාසය මෙරටට හොඳින් ම ලැබී ඇත. ශිල්ප කර්මාන්ත සඳහා ද විදේශීය ශිල්පීන් බහුල ව සම්බන්ධ වී ඇත. ලංකාතිලක විහාරය, ගඩලාදෙණිය විහාර මේ සඳහා වන කදිම නිදර්ශන වශයෙන් සැලකිය හැකි ය. මීට අමතර ව නියම්ගම්පාය, මහනුවර නාථ දේවාලය, අළුදෙනිය වැනි ස්ථානවල ද මෙම අවධියට අයත් නිර්මාණ ශේෂ වී තිබේ. මේවායේ පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මෙන් ම ප්‍රතිමා නිර්මාණ ලක්ෂණ, හින්දු මිථ්‍යා රූප කැටයම් දකුණු ඉන්දීය ආභාසය ඇති හොඳ ම නිදර්ශන වේ. පරණවිතාන සඳහන් කරන පරිදි පූට්ටු ගණයේ සංයුක්ත නිර්මාණ අතරින් පැරණි ම නිර්මාණය යාපහුවේ ඇති පාද හතරක් සහිත තුන් දෙනෙකුගේ ඉරියව් නිරූපිත කැටයමයි (පරණවිතාන 1972:746). 13වන සියවසට පමණ අයත් මෙම නිර්මාණ පැරණි දකුණු ඉන්දීය ආභාසය ලද නිර්මාණ වශයෙන් සැලකිය හැකි ය. මෙබඳු පූට්ටු නිර්මාණ විජය නගර් අධිරාජ්‍ය සමයේ සංවර්ධනය වූ හම්පි චන්ද්‍රකේශ්වර සහ තිරුකුඩිසුණ්ඩි වෙෂ්ණව නම්බි දේවාලය ආදී ස්ථානවල දක්නට ලැබේ. මේ අනුව 13 වන සියවස වන විටත් විජය නගර් අවධියේ බිහි වූ ඇතැම් දකුණු ඉන්දීය සංයුක්ත නිර්මාණ ලංකාව තුළ භාවිතයට පත් ව ඇත. ඉහත සඳහන් පූට්ටු සේ ම හම්පි දේවාලවලින් හමුවන සිංහ රූප ද යාපහුවේ සිංහ රූප ද අතර ඇත්තේ දැඩි සමානතාවකි. නමුත් හම්පි ආශ්‍රිත ව වෘෂභ

කුඤ්ජරය හමුවී ඇති මුත් යාපහුව හෝ ගම්පළ අවධියට අයත් නිර්මාණ අතරින් වෘෂභ කුඤ්ජරයේ පැරණි නිදර්ශන හමු වී නැත. මහනුවර සමය වන වෘෂභ කුඤ්ජරය ඇතුළු සංයුක්ත නිර්මාණකරණය උඩරට ප්‍රදේශවල ජනප්‍රිය වූ බව පෙනී යයි. දළදා මාලිගයේ ඇති සිතුවම් 19වන සියවස අග හෝ 20වන සියවස මුල් භාගයට අයත් විය හැකි බවට විශ්වාස කෙරේ. මේ අවධියේ නාරි සංයුක්ත, හංස පූට්ටුව වැනි නිර්මාණ ද ජනප්‍රිය වූ බව හමුවන සාධක තුළින් ද තහවුරු වේ. මෙම නිර්මාණ බහුල ව උඩරට ප්‍රදේශවලින් හමුවීම සඳහා බලපා ඇත්තේ ද උඩරට ප්‍රදේශයේ පැවති ද්‍රවිඩ සබඳතාව බවට අනුමාන කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ වෘෂභ කුඤ්ජරය හමුවන්නේ සිතුවම් හා දැව කැටයම්වල දී ය. මෙම නිර්මාණවල නිමාව පිළිබඳ ව සැලකීමේ දී දකුණු ඉන්දියාවේ මෙන් සාර්ථකත්වයට පත් වූ බවක් නොපෙනේ. ශිලා මාධ්‍ය කැටයම්කරණය ට ප්‍රවේශ වී නැත. එසේ ම මෙම නිර්මාණයේ සාර්ථකත්වය පවතිනුයේ එහි පවතින කාල්පනික හා තාක්ෂණික සන්දර්භය ආරක්ෂා කිරීම තුළිනි. මෙම නිර්මාණයේ දී සත්ව රූප සංයුක්ත කිරීමේ දී වෘෂභයාගේ සහ ඇතාගේ හිසෙහි සම්බන්ධය රැක ගැනීම අවශ්‍ය වේ. ඒ නිසා පොදු ඇසක් යෙදීම, දෙ දළ වෘෂභයාගේ අං ලෙසත් හොඬය වෘෂභයාගේ මොල්ලිය සඳහා යොදා ගැනීම සාර්ථක ව සිදු කළ යුතු වේ. මේ නිසා ම ලාංකික ඇතැම් සිත්තරුන් සත්ව රූප දෙක සඳහා ම එක ම වර්ණයක් භාවිත කිරීමට උත්සාහ කර තිබේ. නමුත් රිදී විහාරය සහ දළදා මාලිගයේ පැරණි චිත්‍රවල දී වර්ණ දෙකක් භාවිත කරමින් සාර්ථක ව චිත්‍රණය කර ඇත. මෙම ලක්ෂණ ඉතා උසස් අයුරින් ආරක්ෂා කර ගනිමින් බිහි කළ නිර්මාණ ලෙස මහනුවර පල්කුඹුර විහාරයේ කැටයම් හැඳින්විය හැකි ය.

ශ්‍රී ලංකාවේ හමුවන වෘෂභ කුඤ්ජර දකුණු ඉන්දීය කලා ශිල්පීන් මෙරට කලා නිර්මාණයට සම්බන්ධ කර ගැනීම, පැරණි ඉන්දීය ශිල්ප ශාස්ත්‍ර මගින් පුහුණුව ලැබීම වැනි හේතු ද මෙම නිර්මාණ මෙරටට බිහි වීමට හේතු වන්නට ඇත. වෘෂභ කුඤ්ජරය පසුකාලීන නිර්මාණවල දී විවිධ කාල්පනික සංයෝජන තුළින් යම් යම් වෙනස්කම්වලට ද භාජනය වී තිබේ. වෘෂභ කුඤ්ජරය දකුණු ඉන්දීය භෙරුණ්ඩ පක්ෂියා, සරපෙන්දියා, නාරි කුඤ්ජර, හංස පූට්ටුව වැනි නිරූඪ සහ අර්ධ නිරූඪ ගණයේ කලා නිර්මාණ සමඟ ම එක් වී ඇති නිර්මාණයක් ලෙස සැලකිය හැකි ය. වෘෂභ කුඤ්ජර විශේෂයෙන් මහනුවර යුගයේ දී ලංකාවේ නිර්මාණ අතරට එක් වී ඇති බවට අනුමාන කළ හැකි ය. දකුණු ඉන්දීය සංයුක්ත නිර්මාණ යාපහුව වැනි ස්ථානවල හමු වී ඇතත් සෑම නිර්මාණයක් ම එකවර දේශීය කලාවට එක් වූ බවක් නොපෙනේ. ඇතැම් නිර්මාණ පසුකාලීන ව එක් වී තිබේ. වෘෂභ කුඤ්ජර ද එසේ පසු ව එක් වූ නිර්මාණයක් සේ සැලකිය හැකි ය. එසේ ම යම් සරල වෙනස්කම් ද සහිත ව නිර්මාණයට ප්‍රවේශ වී ඇති බව ඇඹිල්ල සහ දෝව සිතුවම් ඇසුරෙන් පැවසිය හැකි ය.

## මූලාශ්‍රය


කුමාරස්වාමි, ආනන්ද. (1962). **මධ්‍යකාලීන සිංහල කලා.** (පරි)එච්. එම්, සෝමරත්න, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

ද සිල්වා, නිමල්. (2009). **සිංහල චිත්‍රය සහ මෝස්තර සම්ප්‍රදාය.** කොළඹ 8: පද්මපාණි නිර්මාණ සහ ප්‍රකාශකයෝ.

දිසානායක, ජේ.බී. (2000). **රිදීවිහාරෙ.** කොළඹ 10: එස් .ගොඩගේ .සහ සහෝදරයෝ.

දිසානායක,ජේ.බී. (2003). **සිරි දළදා මාලිගාවේ සිතුවම්.** කොළඹ 10: එස් .ගොඩගේ .සහ සහෝදරයෝ.

පතිරාජ, සමරකෝන්. (2007). **ඇම්බැක්ක.** මුදුන්ගොඩ: තරංග ප්‍රකාශන.

ප්‍රනාන්දු,පී.එස්. (2012). **සිංහල සැරසිලි සිතුවම් කලාව.** කොළඹ 11: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

රතනපාල, දේදුනුපිටියේ. සහ කුමාරතුංග,ඩී. ජී. (2007). **ඓතිහාසික මරළුවාව රජ මහා විහාරය.** කුරුණෑගල: අස්ලිය ප්‍රින්ටර්ස්.

විජේසේකර,නන්දදේව. (1990). **පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය.** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

සෝමතිලක, මහින්ද. **මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම් කලාව.** කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ,

හේවාපතිරණ, දයා. (2010). **ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව.** කොළඹ-05: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1භාගය.** (1972). (සංස්.) සෙනරත් පරණවිතාන, (පරි) විද්‍යාලංකාර විශ්ව විද්‍යල පර්යේෂණ අංශය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
DEPARTMENT OF ARCHAEOLOGY
SRI LANKA
ශ්‍රී ලංකා